**RECEIVING OFFICER** – Mr. B. K. Sampath

**SHROFF** – Mr. M.G.N.G. Dharmasena

**STOREKEEPER (TECHNICAL)** - Mr. M.P.P. G. Silva

**PURCHASING OFFICER** – Mr. A.E.S.P. Perera

**STOREKEEPER** –

## DEPARTMENT OF THE CO-ORDINATING ENGINEER

**CO-ORDINATING ENGINEER** – Mr. D.L.D. Adikari

**DEPUTY CO-ORDINATING ENGINEER** –

**CHIEF INSPECTOR (CIVIL)** – Mr. C.S. Balasooriya

**SENIOR CHIEF INSPECTOR (ELECTRICAL)** – Mr. W.G.W.M.P.P.B. Weerakoon

**INSPECTOR (CIVIL)** –

**SENIOR IINSPECTOR (ELECTRICAL)** - Mr. S.S. Elvitigala

**ASSISTANT PRINCIPAL OFFICER** – Mrs. A.L.A.U. Amarasinghe

**SENIOR TECHNICAL OFFICER (ELECTRICAL)** - Mr. W.R.A. de Mel, Mr. P.W.A.U.K. Dayaratne, Mr. P.R. Karunathilake, Mr. P.A.S. Lalith Kumara

**TECHNICAL OFFICER (CIVIL)** - Mrs. H.D. Jayakody

## CATERING AND HOUSEKEEPING DEPARTMENT

**DIRECTOR (CATERING AND HOUSEKEEPING SERVICES) -**

**EXECUTIVE CHEF -** Mr. K.D.S. Patroneous

**EXECUTIVE HOUSEKEEPER** - Mr. D.D.I. Thushara

**F & B MANAGER -** Mr. K.M.H. Nalin Rodrigo,

**DEPUTY F & B MANAGER -** Mr. W.M.R. Jinendrasinghe

**SOUS CHEF** - Mr. W.D.J.D. Wickremasinghe

**ASSISTANT HOUSEKEEPER** - Mr. M.D. Perera

**SENIOR RESTAURANT MANAGER -**

**RESTAURANT MANAGERS** - Mr. W.S.S. Perera, Mr. K.A.D.A. Wijesiri, Mr. K.A.A. Jayantha, Mr. L.P. Perera, Mr. M.P.N. Chandrasiri, Mrs. S.C. Renuka, Mr. M. K. N. Daminda

**GARDEN SUPERVISOR** – Mr. R.M.J. Rajapaksha

**SENIOR HOUSEKEEPING SUPERVISORS** - Mr. M.D.E.M.N. Karunarathna, Mr. K.N. Basnayake

**HOUSEKEEPING SUPERVISORS** – Mr. S.D. Rathnasiri, Mr. G.R.S.K.D. Gamlath

**F & B SUPERVISORS -** Mr. M.G.U. Jayasiri, Mr. K.S. Sumanaweera, Mr. K.P.S. Wajirapani, Mr. S.A.N. Senadhira, Mr. B.M.C. Perera, Mr. G.D. Anil, Mr. W. N. R. Wijewardena, Mr. D. H. B. B. Pathamasiri, Mr. N. W. M. Turin, Mr. H. D. T. Priyantha, Mr. A.D.D.S. Gunasekara, Mr. S.J. Gamage, Mr. H.R.K.S.K.Peiris

**KITCHEN STEWARDING SUPERVISOR** - Mr. G.A. Wijesinghe

**CHEF-DE-PARTIE -** Mr. L.K.C.S. Gajanayake, Mr. D.M.M.B. Ulapane, Mr. P.R. Wijesinghe, Mr. B.T.R. Hewamana

**SENIOR LEADING COOK** - Mr. K.D.U. Gunarathna

**LEADING COOKS** - Mr. J.M.R. Premalal, Mr. K.D. Piyasiri, Mr. D.H.A.A. Kumarasiri, Mr. H. Wijesiri, Mr. M.W.M.P.C.C. Walgama, Mr. R.P. Helambage, Mr. A.A.D. Suranga, Mr. K.V.A. Jayawardene

**PARLIAMENTARY OFFICER** - Mr. M.M. Dharmasena

## DEPARTMENT OF LEGISLATIVE SERVICES

**DIRECTOR (LEGISLATIVE SERVICES)** - Mr. H.E. Janakantha Silva

**TABLE OFFICE** - Mr. M.J. Perera (Assistant Director - Administration); Mr. P.H. Kumarasinghe, Mr. K.R. Herath (Principal Officers); Mrs. V.P.G.S. Vidanapathirana, Mr. R.A.R.L. Ranawaka (Deputy Principal Officers); Mrs. A.C.F. Nusrath (Assistant Principal Officer); Mrs. H.E.C. Silva, Mr. U.P.B.M. Undugoda, Mrs. N.N. Hettige, Miss E.H. Jayaweera, Mr. K.D.G.M. Krishantha (Parliamentary Officers)

**BILLS OFFICE** - Mr. M. M. M. Mabrook (Assistant Director - Administration); Mr. K. P. Chandana (Principal Officer); Mr. J. Naseerdeen, Mrs. K.C.K. Peiris, Mrs. R.A.D.N. Geyowanee (Assistant Principal Officers); Mr. J.T.L.P. Sameera, Miss. D.R.K. Ranasinghe (Parliamentary Officers)

**COMMITTEE OFFICE** - Mrs. C.I. Dissanayake (Assistant Director- Administration); Mr. N.N. Wewelwela, Mrs. S.P. Gamage (Principal Officers); Mrs. R.A.N.D. Alwis, Mr. R.C. Wijeyathilake, Mrs. W.M.L.M. Weerasinghe (Assistant Principal Officers); Mrs. E.A.N.M. Edirisinghe, Mrs. H.N. Fernandopulle (Parliamentary Officers)

**PUBLIC ACCOUNTS AND PUBLIC ENTERPRISES COMMITTEE OFFICE -** Mrs. N.S. Wickramarathne, Mrs. A.C.P. Suriyapperuma (Assistant Directors - Administration); Mrs. C.M. Bulathsinhala (Principal Officer); Mr. A.S. de Silva, Mrs. B.J. Abeysinghe (Deputy Principal Officers); Mr. S. A. M. Shaheed, Mrs. W. L. S. D. de Alwis (Assistant Principal Officers); Mr. K.M.G.K. Jayawardana, Mrs. U.M.S. Prabashini, Mrs. J.M.S. Nirmani, Miss G.K.C. Thilakarathna, Mrs. R.C. Kulathilaka, Miss. H.M.D. Lakmali , Mrs. M. S. Bandulahewa (Parliamentary Officers)

**PUBLIC PETITIONS COMMITTEE OFFICE -** Mr. S.B. Kulugammana (Assistant Director - Administration); Miss. S.R.M.H.G. Samaradiwakara (Principal Officer); Mr. H.R.C. Silva, Mrs. S.W.T.R. de Silva (Deputy Principal Officers); Mrs. B.S. Rangika, Mrs. G.M.H.S. Gamlath, Mrs. H.G.K. Buddhika (Parliamentary Officers)

**MINISTERIAL CONSULTATIVE COMMITTEE OFFICE -** Mr. A.A.S.P. Perera (Assistant Director - Administration); Mr. W.W.N.N.C. Fernando (Principal Officer); Mrs. C.M. Subasinghe, Mrs. M. K. S. C. Alwis, Mrs. D.V.O. Weerakoon (Deputy Principal Officers); Miss. R.M.D.K. Priyadarshani (Assistant Principal Officer); Miss C.I.T. Sarathchandra (Parliamentary Officer)

**LIBRARIAN** - Mr. S.L. Siyath Ahemed

**DEPUTY LIBRARIAN -** Miss. K.D.S. Wijenayake

**ASSISTANT LIBRARIAN** - Mr. G. Ratnayake

**JUNIOR ASSISTANT LIBRARIAN GRADE I -** Mr. W.A. Gunarathna

**JUNIOR ASSISTANT LIBRARIAN** - Mr. H.A.S.S. Perera

**CHIEF RESEARCH OFFICER** - Mr. G. Kumanayake

**SENIOR RESEARCH OFFICER -** Mr. M. Ajiwadeen, Mrs. G.R.A. Godagama, Mrs. P.L.T. Erandathi

**RESEARCH OFFICERS** - Mrs. R.N.H. Wijayathilaka, Mrs. H.P.A.S. Abeykoon, Mr. V. Muralithas

**CHIEF PARLIAMENTARY INTERPRETER** - Mr. W.M.U. Bandara

**DEPUTY CHIEF PARLIAMENTARY INTERPRETERS** - Mr. I.L. Abdul Jabbar, Mr. J.A.S.P. Perera, Mr. C.J. Karunaratne

**SENIOR PARLIAMENTARY INTERPRETERS** - Mr. K.D.R. Padmasiri, Mr. A. Saravanabavanandan, Mr. A.G. Mohamed Fiqrhi, Mr. S.R.M. Nisam, Mr. G.F.B. Sureshwaran, Mrs. N.B.C.J. Nissanga, Mrs. H.V.S. Heendeniya, Mr. P.L.P.L. Kumarasiri, Mr. P. Shanthakumar, Mr. S. Rameshkumar, Mrs. R. Vasanthi Perera, Mr. M. Ajithkumar, Mr. M.H.M. Ramis

**PARLIAMENTARY INTERPRETERS -** Mr. D.D.V.N. Dhammage, Mr. E.A. Amarasena, Mr. E.M.N.S.M. Ekanayake, Mrs. A.L.A.D. Thiumini, Mr. M.Z.M. Azka, Mrs. A.R.Thirukumar, Mr. M.I.M. Fazi, Mr. N.J. Wickramage, Mr. P.M.A. Hussain, Mr. B.M. Razeel

# DEPARTMENT OF INFORMATION SYSTEMS AND MANAGEMENT

**DIRECTOR (INFORMATION SYSTEMS AND MANAGEMENT)** - Mr. H.M.C. Perera

**SYSTEMS ENGINEER** - Mr. N.B.U. Nawagamuwa

**SYSTEMS ANALYST** - Mr. C.J. Willoraarachchi

**COMMUNICATION / SECURITY ENGINEER** - Mr. G.N. Lakmahal

**SYSTEMS DESIGNER** - Mr. M.N.C. Wickramasinghe

**SYSTEMS ADMINISTRATOR -** Mr. A.S.D.M. Wickramaratne

**WEB AND NETWORK ADMINISTRATOR -** Mr. N.G.L.S. Karunathilaka

**DATA BASE ADMINISTRATOR-** Mr. N.M.P.U. Premachandra

**SENIOR COMPUTER PROGRAMMERS**- Mr. D. Panditha, Miss P.M.M. Chandima

**COMPUTER PROGRAMMER -** Mrs. S.A.A.B. Athukorala

**SENIOR WEB EDITOR (SINHALA/ ENGLISH) -** Mr. U.L. Geeganage

**SENIOR WEB EDITOR (ENGLISH/ TAMIL) -** Mr. M.N.M. Shifaq

**SENIOR ASSISTANT COMPUTER PROGRAMMER -** Mrs. P.L.I.G. Cooray

**SENIOR HELP DESK CO-ORDINATOR** - Mrs. B.N.H. Thissera

**PARLIAMENTARY OFFICER –** Mr. W.V.R. Wickramaratne

**SENIOR COMPUTER OPERATORS** - Mrs. P. Jehanya, Mr. J.S. Colombage, Mrs. K.G.S. Sewwandhi, Mr. W.H.U.D. Piyatunga, Mr. N.D.D.P. Premasiri, Mr. K.P.P.S. Romawardana, Mrs. W.D.A. Jayarukshi, Mr. L.G. Ashiq Ali, Mr. A.R.M. Rikaz Ali, Mr. A.M. Fowsul Ameen

**SENIOR COMPUTER TECHNICIANS -** Mr. G.M.T. Perera, Mr. H.S. Sathyajith

**SENIOR TECHNICAL ASSISTANTS -** Mr. V.R.S.J. Somaratne, Mr. W.S. Suranga

# DEPARTMENT OF COMMUNICATION

**PUBLIC OUTREACH OFFICER -** Mrs. Y.L.R. Nootan

**MEDIA OFFICER (STILL AND VIDEO PHOTOGRAPHY) -** Mr. U.G.N. Duminda

**PUBLIC OUTREACH OFFICE COORDINATOR (SINHALA) -**

**PUBLIC OUTREACH OFFICE COORDINATOR (TAMIL) -** Mr. S. Jeyaprakash

**MEDIA OFFICE COORDINATOR (SINHALA) -** Mr. S.A.S.K. Silva

# පාර්ලිමේන්තු විවාද

නිල වාර්තාව

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**නව වන පාර්ලිමේන්තුව - පළමුවන සභා වාරය**

# பாராளுமன்ற விவாதங்கள்

அதிகார அறிக்கை

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின்

**ஒன்பதாவது பாராளுமன்றம் - முதலாவது கூட்டத் தொடர்**

# PARLIAMENTARY DEBATES

OFFICIAL REPORT

**THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**NINTH PARLIAMENT - FIRST SESSION**

**284** වන කාණ්ඩය | **தொகுதி 284** | **VOLUME 284**

## පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2021 අගෝස්තු 03වන අඟහරුවාදා***

*2021 ஓகஸ்ட் 03 , செவ்வாய்க்கிழமை*

*Tuesday, 03rd August, 2021*

**පූ.භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත දැක්වෙන සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

**ශ්‍රී ලංකා ජනාධිපති**
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2021 ජූලි මස 19 වන දින

ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

ගෝඨාභය රාජපක්ෂ

# නිවේදන
# அறிவிப்புக்கள்
# ANNOUNCEMENTS

## මුදල් පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
## நிதி சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
## FINANCE BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, මුදල් නැමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් 7ක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
# சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
# PAPERS PRESENTED

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව තාක්ෂණික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2020 වර්ෂය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව. -[අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2020 වර්ෂය සඳහා විදේශ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.-[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මහාමාර්ග අමාත්‍යාංශයේ මාර්ග සංවර්ධන අධිකාරිය සම්බන්ධව සඳහන් කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 (4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - கல்வி அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of Education)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2019 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2019 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iii) 2019 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2019 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් වාර්තාව.

මෙම වාර්තා අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නිවේදනය, නියම සහ නියෝග ඉදිරිපත් කරමි.

(i) (52 අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 8 සහ 30 වගන්ති සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 25 දිනැති අංක 2216/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය;

(අංක 07/2021 දරන සුරාබදු නිවේදනය)

(ii) සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3ඇ වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 අප්‍රේල් 05 දිනැති අංක 2222/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 අප්‍රේල් 05 දිනැති අංක 2222/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 අප්‍රේල් 22 දිනැති අංක 2224/24 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 22 දිනැති අංක 2216/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(vi) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මාර්තු 09 දිනැති අංක 2218/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(vii) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මාර්තු 19 දිනැති අංක 2219/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(viii) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 19 දිනැති අංක 2224/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය; සහ

(ix) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජූනි 11 දිනැති අංක 2231/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය.

මෙම නිවේදනය, නියම සහ නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2020 වර්ෂය සඳහා පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, ජලසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2018 වර්ෂය සඳහා ජල සම්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු උදය ගම්මන්පිල මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு உதய கம்மன்பில - வலுசக்தி அமைச்சர்)
(The Hon. Udaya Gammanpila - Minister of Energy)

ගරු කථානායකතුමනි, 2019 වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Rohitha Abegunawardhana - Minister of Ports and Shipping)

ගරු කථානායකතුමනි, 2017/2018 වර්ෂය සඳහා සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව වරාය හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත් කෙටුම්පත;

(ii) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියම;

(iii) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ නියෝගය;

(iv) 2021 අංක 02 දරන පරිපූරක ඇස්තමේන්තුව;

(v) වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2021; සහ

(vi) 2018 සහ 2019 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(iii) 2018 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(iv) 2014 වර්ෂය සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(v) 2015 වර්ෂය සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(vi) 2016 වර්ෂය සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(vii) 2017 වර්ෂය සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(viii) 2018 වර්ෂය සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු කංචන විජේසේකර මහතා (විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - அலங்கார மீன்கள், நன்னீர் மீன்கள், இறால்களை வளர்த்தல், கடற்றொழில் துறைமுகங்கள் அபிவிருத்தி, பலநாள் கடற்றொழில் அலுவல்கள் மற்றும் மீன் ஏற்றுமதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - State Minister of Ornamental Fish, Inland Fish and Prawn Farming, Fishery Harbour Development, Multiday Fishing Activities and Fish Exports)

ගරු කථානායකතුමනි, ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා ලංකා ධීවර සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, මහජන පෙත්සම් පිළිගැන්වීම.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, ඊට පෙර, පාර්ලිමේන්තුවේ බලතල සහ වරප්‍රසාද ගැන එක කාරණයක් ඉදිරිපත් කරන්න මම ඔබතුමාගෙන් අවසර ඉල්ලනවා. මේ අවස්ථාවේ ගරු සෞඛ්‍ය ඇමතිතුමියත් සභාවේ සිටින නිසා විශේෂයෙන්ම මම ගරු සභානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පාර්ලිමේන්තු බලතලවලට අනුව එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුවේ අලුත් ක්‍රමවේදයක් ඇති කරලා, සෞඛ්‍ය ඇමතිතුමා, එහෙම නැත්නම් අග්‍රාමාත්‍යතුමා හැම පාර්ලිමේන්තු සතියේම කොවිඩ්-19 පිළිබඳව ප්‍රකාශයක් ඉදිරිපත් කරනවා. මම සෞඛ්‍ය ඇමතිතුමියගෙන් ඉල්ලා සිටින්නේ, හැම සතියේම මෙම ගරු සභාවේදීත් එවැනි ප්‍රකාශයක් කරන්න කියලායි. එහෙම කරන එක හොඳයි. මොකද, එක එක අය එක එක විධියට කරුණු කියනවා. සමහර අය කියනවා, "අපි කෝටි 3ක්, නැත්නම් කෝටි 4ක් එන්නත් ගේන්න යනවා" කියලා. සාමාන්‍යයෙන් කැබිනට් මණ්ඩලය සඳුදා දිනයේ රැස්වන නිසා අඟහරුවාදාට පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒවා දැනුම් දෙන්න, අපි ඔබතුමියගෙන් අහන්නම්.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (සෞඛ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - சுகாதார அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Health)

ගරු කථානායකතුමනි, ඒක හොඳයි කියා මමත් හිතනවා. ප්‍රශ්න උත්තර හැටියට නොවෙයි, රටේ තත්ත්වය පිළිබඳ වාර්තාවක් හැම අඟහරුවාදාම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නම්.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ලසන්ත අලගියවන්න මහතා (සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - கூட்டுறவுச் சேவைகள், சந்தைப்படுத்தல் அபிவிருத்தி மற்றும் நுகர்வோர் பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - State Minister of Co-operative Services, Marketing Development and Consumer Protection)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මුදුන්ගොඩ, මාහරගම, සියනෑ විලේජ්, අංක 161/59/117 දරන ස්ථානයෙහි පදිංචි ඊ.ඒ.ජී.කේ.ජී. ද අල්විස් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) නිට්ටඹුව, නුවර පාර, අංක 14/1 දරන ස්ථානයෙහි පදිංචි ජී.එස්.ඒ.ඒ. සහබන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු කපිල අතුකෝරල මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ජගත් කුමාර මහතා**
(மாண்புமிகு ஜகத் குமார)
(The Hon. Jagath Kumara)

ගරු කථානායකතුමනි, හෝමාගම, කටුවාන, දේවාල පාර, අංක 333/5බී දරන ස්ථානයෙහි පදිංචි එන්.ඒ.එස්. මල්කාන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු එච්. නන්දසේන මහතා**
(மாண்புமிகு எச். நந்தசேன)
(The Hon. H. Nandasena)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කැබිතිගොල්ලෑව, වාහල්කඩ, ඩී 04 දරන ස්ථානයෙහි පදිංචි ජී.ඒ.අයි. ප්‍රියංගනී වීරසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පදවි පරාක්‍රමපුර, 80 කොළණිය, කන්දෙගෙදර යන ලිපිනයෙහි පදිංචි අයි.පී. චන්දන ප්‍රේමතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -71/2020- (1), ගරු හේෂා විතානගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## 2015-2019 දක්වා රෙදිපිළි සහ ඇඳුම් ආනයනය: විස්තර
### 2015-2019 வரையிலான துணி வகைகள் மற்றும் ஆடைகள் இறக்குமதி : விபரம்
### IMPORT OF TEXTILES AND CLOTHES FROM 2015-2019: DETAILS

**2. ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)

මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -(1):

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ -

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ රෙදිපිළි සහ ඇඳුම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම රෙදිපිළි සහ ඇඳුම් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම රෙදිපිළි සහ ඇඳුම් ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට රෙදිපිළි සහ ඇඳුම් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரையிலான ஒவ்வொரு வருடத்திலும் -

(i) இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட துணி வகைகள் மற்றும் ஆடைகளின் அளவு யாதென்பதையும்;

(ii) அதற்காகச் செலவிடப்பட்ட பணத்தொகை வெவ்வேறாக யாதென்பதையும்;

(iii) மேற்படி துணி வகைகள் மற்றும் ஆடைகள் எந்தெந்த நாடுகளிலிருந்து இறக்குமதி செய்யப் பட்டன என்பதையும்;

(iv) மேற்படி துணி வகைகள் மற்றும் ஆடைகளை இறக்குமதி செய்த கம்பெனிகள் யாவை யென்பதையும்;

தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி காலப்பகுதியில் இலங்கைக்குத் துணி வகைகள் மற்றும் ஆடைகளை இறக்குமதி செய்வதற் காகச் செலவாகிய மொத்தத் தொகை எவ்வள வென்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House separately, pertaining to each year during the period from 2015 to 2019 -

(i) the quantity of textiles and clothes imported into Sri Lanka;

[ගරු මොහමඩ් මුසම්මිල් මහතා]

(ii) the money that has been incurred on that;

(iii) the countries from which those textiles and clothes were imported; and

(iv) the companies which imported those textiles and clothes?

(b) Will he also inform this House of the total expenditure on importing textiles and clothes into Sri Lanka during the period concerned?

(c) If not, why?

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා (මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால் - நிதி, மூலதனச் சந்தை மற்றும் அரச தொழில்முயற்சி மறுசீரமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Nivard Cabraal - State Minister of Money and Capital Market and State Enterprise Reforms)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කළ එක් එක් රෙදිපිළි සහ ඇඳුම් ප්‍රමාණය ඇමුණුම 01හි දක්වා ඇත.

(ii) ශ්‍රී ලංකාවට ආනයනය කළ රෙදිපිළි සහ ඇඳුම් සඳහා වැය වූ මුදල වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02හි දක්වා ඇත.

(iii) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකාවට රෙදිපිළි සහ ඇඳුම් ආනයනය කළ රටවල නාම ලේඛනය ඇමුණුම 03හි දක්වා ඇත.

(iv) රෙදිපිළි සහ ඇඳුම් ආනයනය කළ සමාගම්වල නාමලේඛනය ඇමුණුම 04හි දක්වා ඇත.

(ආ) රුපියල් 1,630,301,404,320 (රුපියල් බිලියන 1,630)

(ඇ) පැන නොනඟී.

දීර්ඝ විස්තරයක් තිබෙන නිසා ඇමුණුම් 01, 02, 03, සහ 04 **සභාගත*** කරමි.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඇඟලුම් කර්මාන්තය තමයි අපේ රටට දෙවැනියට විශාලම ආදායම් ප්‍රමාණයක් ගෙන එන කර්මාන්තය. මේ කර්මාන්තයේ විශාල පිරිසක් නියැලී සිටිනවා. විශේෂයෙන්ම ලෝකයේ ඉතාම තරගකාරී තත්ත්වයක තමයි මේ කර්මාන්තය තිබෙන්නේ. චීනය, වියට්නාමය, බංග්ලාදේශය වැනි රටවල් අපට තරගකාරී විධියට ඇවිල්ලා තිබෙනවා. මෙතැනදී පෞද්ගලික අංශයේ මැදිහත්වීමෙන් යම් ප්‍රමාණයකින් වෙළෙඳ පොළ ප්‍රසාරණය කර ගනිමින් ඒ තරගකාරිත්වයට මුහුණ දෙන්න කටයුතු කරනවා. මේ සඳහා රාජ්‍ය අංශය විධියට විවිධ ප්‍රතිපත්ති අරගෙන, වෙළෙඳ පොළ ප්‍රසාරණය කිරීම සඳහා යම්කිසි උපාය මාර්ගයක් සකස් කරලා තිබෙනවා ද? ඒ වාගේම, ව්‍යාපාරිකයන්ට ලබා ගැනීමට නොහැකි වෙච්ච ආනයනය කරපු රෙදි විශාල ප්‍රමාණයක් දැන් Sri Lanka Customsවල තිබෙනවා කියලා මට ආරංචි වුණා. ඒවාටත් යම්කිසි ක්‍රමවේදයක් ඔබතුමා සකස් කරනවා ද?

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)

ගරු කථානායකතුමනි, ඇඟලුම් ක්ෂේත්‍රය කියන්නේ සම්පූර්ණයෙන්ම වාගේ පෞද්ගලික අංශයෙන් ක්‍රියාත්මක වන ක්ෂේත්‍රයක්. රජය, ඒ ක්ෂේත්‍රයට මැදිහත්වීමකුත් කරනවා. ඒ වාගේම ඒ ක්ෂේත්‍රයේ සියලු කටයුතු කිරීමට අපි උපකාර වනවා. අපි ඒ අයගේ කටයුතු කිරීමට උදවු කරනවා, mainly, as a facilitator. ඒ වාගේම ඒ අයට අවශ්‍ය සියලු පහසුකම් අපි ලබා දෙනවා.

ඒත් එක්කම, රේගුව තුළින් කෙරෙන කාර්ය භාරය තවදුරටත් කාර්යක්ෂම කරලා ඒ හරහාත් ඇඟලුම් ක්ෂේත්‍රයේ කටයුතු කරන අයට අපි සහාය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ඉදිරියේදී මේ සම්බන්ධයෙන් තවත් දේවල් කරන්නත් තිබෙනවා. මේ වනකොට මැදිහත්කරුවකු හැටියටත්, පහසුකම් සලස්වන්නකු හැටියටත් රජය මේ ක්ෂේත්‍රයට දැවැන්ත ලෙස උපකාර වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කොවිඩ් වසංගතය තිබෙන කාලයේදීත් අපි ඒ අයගේ වැඩ කටයුතු කිසිම බාධාවකින් තොරව නිරන්තරයෙන් කර ගෙන යන්නට අවශ්‍ය සහාය ලබා දී තිබෙන බවත් මා මේ අවස්ථාවේදී කියන්න අවශ්‍යයි.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු ප්‍රේම්නාත් දොලවත්ත මන්ත්‍රීතුමා අසනවා.

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)

ගරු කථානායකතුමනි, මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මම මේ ප්‍රශ්නය අහනවා. අපි දන්නවා, දැන් තිබෙන අර්බුදය අපට හට ගන්නේ ඩොලර්වල තිබෙන මදිපාඩුකම මත බව. ඒ අනුව අපට මේ වනකොට ඩොලර් අවශ්‍යතාවක් තිබෙනවා. රජයක් හැටියට අපි මේ සම්බන්ධයෙන් සාධනීය පියවර ගණනාවක් අරගෙන තිබෙනවා. අනවශ්‍ය භාණ්ඩ රටට ගෙනෙන එක අපි නතර කර තිබෙනවා. ඒ කාරණා එක්ක බැලුවාම පෙනෙනවා, මේ ආණ්ඩුවේ තිබෙන්නේ උඩුගම් බලා යන ස්වරූපයක් බව. එහි එක් පියවරක් හැටියට අපි මෝටර් රථ ආනයනයේ යම් ආකාරයක සීමාවක් පනවා තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම මේ කාරණය යෝජනාවක් හැටියට වාගේම ප්‍රශ්නයක් හැටියට ඔබතුමාට යොමු කරනවා. රථ වාහන සහ අමතර කොටස් අපේ රටට නොගෙන්වීම තුළ අද රටේ රථ වාහනවල මිල අස්වාභාවික ලෙස ඉහළ ගිහිල්ලා තිබෙන බව අපි දන්නවා. දැන් අපි රථ වාහන ගෙන්වන්නේ නැහැ. ඒ නිසා අපට කෝටි ගණනක මුදලක් ඉතුරුවෙලා තිබෙනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, අපේ රටට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ගෙනෙන රට විරුවන් පිරිසක් ඉන්න බව අපි දන්නවා. ඒ අයට මේ රටට මෝටර් රථයක් ගෙනෙන්න -මම මේ අහන ප්‍රශ්නයට මූලික පිළිතුර දෙන්න පුළුවන් ඔබතුමන්ලාටයි.- අපි අවුරුද්දක සහන කාල සීමාවක් දෙන්න ඕනෑ. හැබැයි, එලෙස ගෙනෙන මෝටර් රථයට අදාළ බදු ගෙවිය යුත්තේ, ඒ රටවල සේවය කරන අය විසින් ඩොලර්වලින්. ඒ තුළින් රථ වාහනත්

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

මේ රටට එනවා; ඒ අයට යම් සහනයක් ලබා දීමකුත් වනවා. ඒ එක්කම අපට නොදැනීම අපේ රටේ සල්ලි සත පහක්වත් එළියට යන්නේ නැහැ. හැබැයි, විදේශ රටවල සේවය කරන ලාංකිකයෝ ඒ අයට මේ ලැබෙන අවස්ථාව උපයෝගි කරගෙන ඩොලර් විශාල ප්‍රමාණයක් ලංකාවට එවන්න හුරු වෙනවා. ඒ තුළින් අපට ඩොලර් සංචිතයක් ඇති වනවා. මෙකේ තිබෙන මූලික කාරණාත් අපි දන්නවා. සමහර විට අපේ රටින් ආපසු සල්ලි යවන්න පුළුවන්. ඒ උණ්ඩියල් ක්‍රම අපට නවත්වන්න වනවා. අපි දැන් මෝටර් රථ ගෙන්වන්නේ නැතිව රටින් ඩොලර් පිටතට යෑම නවත්වා තිබෙනවා වාගේම, අපේ රටට දීර්ඝ කාලයක් තිස්සේ ඩොලර් එවන ඒ අයට යම් සහනයක් හැටියට අවුරුද්දක කාල සීමාවක් මෝටර් රථ ගෙන්වීමට අවස්ථාව දුන්නොත්, ඒ රථ වාහන ගෙන්වීමත් එක්කම විශාල මුදල් ප්‍රමාණයක් අපේ රටේ වෙනම ගිණුමක මේ වෙලාවේ තැන්පත් කර ගන්න පුළුවන් වෙයි නේද කියන කාරණය මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)

ගරු කථානායකතුමනි, එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව මම අපේ ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා. අපි දැන් මුහුණ දීලා සිටින්නේ අස්වාභාවික තත්ත්වයකට. අද ලෝකයේ සියලු ආර්ථික කටයුතු විවිධාකාරයේ බලපෑම්වලට ලක් වෙලා තිබෙන බව අපි දන්නවා. මේ ප්‍රශ්නය නිසා, විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රය මේ වෙලාවේ අපට අවශ්‍ය විධියට හසුරුවා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ වුණත් ජනතාවට බාධාවක් නොවන විධියට අපට පුළුවන් ආකාරයෙන් මේ කටයුතු කරගෙන යන්න අපි සමත් වෙලා තිබෙනවා.

සමහර තැන්වලදී නීති රීති දමන්න සිදුවෙලා තිබෙන බව මම පිළිගන්නවා. ඒ හරහා ඒ ඒ ක්ෂේත්‍රවලට යම් පීඩනයක් ඇති වෙලාත් තිබෙනවා. ඒ වුණත් සංචාරක ක්ෂේත්‍රය තවදුරටත් වර්ධනය වෙනකොට අපට නැවත වරක් මේ ප්‍රශ්නවලට මුහුණ දීමට හැකියාවක් තිබේවි කියලායි අපි හිතන්නේ. ඔබතුමාගේ යෝජනාව interesting යෝජනාවක්. ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමනි, යම්කිසි ආකාරයකට එවැනි දෙයක් ක්‍රියාත්මක කරන්න අපට පුළුවන් නම්, අපි ඒ ගැන සලකා බලා කටයුතු කරන්න බලාපොරොත්තු වන බවත් කියන්න අවශ්‍යයි.

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව: පුරප්පාඩු
### சிறைச்சாலைகள் திணைக்களம்: வெற்றிடங்கள்
### DEPARTMENT OF PRISONS: VACANCIES

256/2020

**3. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා මේ වනවිට අනුමත බන්ධනාගාර නිලධාරීන් සංඛ්‍යාව;

(ii) එම දෙපාර්තමේන්තුවේ මේ වනවිට සේවයේ නියුතු බන්ධනාගාර නිලධාරීන් සංඛ්‍යාව;

(iii) දෙපාර්තමේන්තුවේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මේ වනවිට පවතින පුරප්පාඩු පිරවීම;

(ii) බන්ධනාගාර තුළ සිදුවන අක්‍රමිකතා වැළැක්වීම;

සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிறைச்சாலைகள் திணைக்களத்திற்குத் தற்போது அங்கீகரிக்கப்பட்டுள்ள சிறைச்சாலை அலுவலர் களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி திணைக்களத்தில் தற்போது சேவை யாற்றிவருகின்ற சிறைச்சாலை அலுவலர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) இத்திணைக்களத்தில் தற்போது நிலவுகின்ற வெற்றிடங்களின் எண்ணிக்கை யாதென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ)(i) சிறைச்சாலைகள் திணைக்களத்தில் தற்போது நிலவுகின்ற வெற்றிடங்களை நிரப்புதவதற்காக;

(ii) சிறைச்சாலைகளில் இடம்பெறுகின்ற முறை கேடுகளை ஒழிப்பதற்காக;

அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கை யாதென் பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice:

(a) Will he inform this House -

(i) the number of approved Prison Officers for the Department of Prisons at present;

(ii) the number of Prison Officers attached to that Department at present; and

(iii) the number of vacancies existing in the Department at present?

(b) Will he also inform this House of the measures to be taken by the Ministry -

(i) to fill the vacancies existing in the Department of Prisons at present; and

(ii) to eliminate the irregularities taking place in prisons?

(c) If not, why?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி - நீதி அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry - Minister of Justice)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේ යි.

(අ) (i) ඔව්.

7,872කි.

(ii) 5,567කි.

(iii) 2,305කි.

එක් එක් තනතුරුවලට අදාළ අනුමත නිලධාරීන් සංඛ්‍යාව, දැනට සේවයේ නියුතු සංඛ්‍යාව හා පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු වාර්තාව ඇමුණුම I මඟින් ඉදිරිපත් කරමි.

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

(ආ) ඔව්.

(i) එක් එක් තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව ඇමුණුම II මඟින් ඉදිරිපත් කරමි. එක් එක් කරුණු සම්බන්ධයෙන් අපි ගෙන තිබෙන පියවර මොනවාද කියන එක ඒ අනුව බලන්න පුළුවන්.

(ii) -ආරක්ෂාවට තර්ජනයක් වන රැඳවියන් බූස්ස අධිආරක්ෂිත බන්ධනාගාරයේ රැඳවීම.

-විශේෂ කාර්ය බලකායේ ආරක්ෂාව බූස්ස, අඟුණුකොළපැලැස්ස හා කොළඹ බන්ධනාගාර සංකීර්ණ වෙත යෙදවීම.

-බූස්ස, අඟුණුකොළපැලැස්ස හා කොළඹ ආදී ප්‍රධාන ආයතනවල ජංගම දුරකථන අවහිරතා ඇති කිරීම.

-නිලධාරීන් විධිමත් පරිදි පුහුණු කිරීම.

-බන්ධනාගාර බුද්ධි අංශය ප්‍රතිසංවිධානය කර, බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය පිහිටුවීම හා ඊට යුද හමුදාවෙන් ඉවත් වූ 500 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කරමින් පැවතීම.

විශේෂයෙන් බන්ධනාගාරයේ බුද්ධි අංශය ප්‍රතිසංවිධානය කරලා යම් යම් වැටලීම් කරනවා. ඒ අනුව තමයි මෑතකදී මහරැදී ඒ සැකකරුවන් අල්ලා ගැනීමට පුළුවන් වුණේ.

(ඇ) ඉහත (අ) සහ (ආ) අනුව පැන නොනගී.

ඇමුණුම් I හා II **සභාගත*** කරමි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, පුරප්පාඩු දෙදහස් ගණනක් තිබෙන බව ඔබතුමා කියනවා. ඒ නිසා වෙන්න ඇති, පසුගිය කාලයේ විභාග පවත්වා සම්මුඛ පරීක්ෂණ පැවැත්වූවේ. නමුත්, විධිමත් ක්‍රමවේදයකට අනුව ඒ බඳවා ගැනීම් සිදු වුණේ නැහැ. විධිමත් ක්‍රමවේදයට බඳවා ගත්තා නම්, ලකුණු මට්ටම සහ දක්ෂතා අනුව තමයි බඳවා ගන්න ඕනෑ. නමුත් ගරු ඇමතිතුමනි, අප දන්නා විධියට ඒ අදාළ විභාග ලියා සමත් වූ බොහෝ දෙනෙක් අපේ පළාතේත් ඉන්නවා. හැබැයි, ඔවුන්ගේ ලකුණු සංඛ්‍යාව හෝ ඔවුන් තෝරා ගෙන තිබෙනවාද නැද්ද, බඳවා ගන්නා ක්‍රමවේදය මොකක්ද ආදී කිසිම තොරතුරක් අන්තර්ජාලයේ පළ කර තිබුණේ නැහැ. හැබැයි ගරු ඇමතිතුමනි, යම්කිසි සීමිත පිරිසක් සම්මුඛ පරීක්ෂණවලින් තෝරා ගත් බව මුහුණු පොත හරහා අපි දැක්කා. ඇතැම් අය අපට පෞද්ගලිකව කථා කරලා කිව්වා, "අපට නම් කැඳවීම් ලිපි ආවේ නැහැ. නමුත්, සමහර කණ්ඩායම් යනවා" කියලා. එහෙම නම්, ක්‍රමවේද දෙකක් යටතේ බඳවා ගන්නා අලුත් ක්‍රමයක් අමාත්‍යාංශය තුළ තිබෙනවාද කියා අපි දැන ගන්න කැමැතියි. එහෙම නැත්නම්, ඒ සුවිශේෂී කණ්ඩායම් තෝරා ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදයක් තිබෙනවාද කියන්න. මොකද, ඒ දරුවෝ බොහෝදෙනෙක් ඒ ගැන දන්නේ නැහැ. එහෙම ක්‍රමවේදයක් තිබෙනවා නම් ඒක ඒ දරුවන්ටත්, රටටත් පැහැදිලි කරන්න. එතකොට ඒ දරුවන් අපට කථා කරන එකකුත් නැහැ. ඒ අයගේ ප්‍රශ්නයත් විසඳේවි. එවැනි බඳවා ගැනීමේ ක්‍රමවේදයක් නැත්නම්, එහෙම බඳවා ගැනීමක් කර නැහැ කියන කාරණය තහවුරු කරන්න ඔබතුමාට පුළුවන්ද, ගරු ඇමතිතුමනි?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු මන්ත්‍රීතුමනි, ඔය කියන දේවල් සම්බන්ධයෙන් මට ඔබතුමාට උත්තර දීමට හැකියාවක් මේ අවස්ථාවේදී නැහැ. මීට මාසයකට පමණ ඉස්සෙල්ලාත් ඔය හා සමාන ප්‍රශ්නයක් මගෙන් අහලා තිබුණා. අමාත්‍යාංශය සහ බන්ධනාගාර කොමසාරිස්තුමා විසින් එයට පිළිතුර වශයෙන් මට ඉදිරිපත් කර තිබුණේ, නිසි ක්‍රියා පටිපාටිය අනුව කටයුතු කරන බවයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් මේ කියන කරුණු බන්ධනාගාර කොමසාරිස්තුමා වෙත ඉදිරිපත් කරලා එතුමාගේ ප්‍රතිචාරය ලබා ගෙන මම ඔබතුමාව පෞද්ගලිකව දැනුවත් කරන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීමා අහනවා.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු අමාත්‍යතුමනි, මා කලින් දවසකත් ඔබතුමාගෙන් ඇහුවා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වැටුප් වැඩි වීමක් පිළිබඳ - සියයට 40 වැටුප් වැඩි වීම පිළිබඳ- ප්‍රශ්නය. ඔබතුමා එදා දවසේත් උත්තරයක් දුන්නා, "අපි ඉතාම ඉක්මනින් එය කරනවා" කියලා. අපට දැනගන්න ලැබුණු පරිදි මහා භාණ්ඩාගාරය මේ සඳහා අනුමැතිය ලබා දෙන්නේ නැහැ. එවැන්නක් තමයි අපට වාර්තා වන්නේ. ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිවරයාත්, මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිවරයාත් විටින් විට කියනවා, "රජයට කිසිදු මුදල් ප්‍රශ්නයක් නැහැ. ඕනෑ තරම් සල්ලි තිබෙනවා" කියලා. එහෙම නේ කියන්නේ. එහෙම තිබෙනවා නම්, කැබිනට් මණ්ඩලය අනුමත කරලා ගොඩක් දවස් ගත වී තිබියදීත් බන්ධනාගාර නිලධාරීන්ගේ සියයට 40 වැටුප් වැඩිවීම ලබා නොදෙන්නේ ඇයි? එම නිලධාරීන්ට මේ විධියට සලකන්නේ ඇයි? ඉහළ නිලධාරීන්ට නම් සමහර වෙලාවට යම් යම් සැලකිලි ලැබෙනවා කියා පසු ගිය දවස්වල මුහුණු පොත හරහා අපි දැක්කා. හැබැයි, ඒ පුංචි නිලධාරීන්ට සියයට 40 වැටුප් වැඩි වීම ලබා දීමට කටයුතු කරන්නේ නැහැ. එක්කෝ ඔබතුමන්ලා කියන්න, අහවල් දවස වන කොට ඒ වැටුප් වැඩිවීම ලබා දෙනවා කියා. ඒ අය නිරන්තරයෙන් පීඩනයට පත් කරන්නේ නැතිව, කවදා හෝ දවසක් කියලා, මෙදා වන කොට ඒ වැටුප් වැඩි වීම ලබා දෙනවා කියන පිළිතුර හෝ ලබා දෙන්න කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු මන්ත්‍රීතුමනි, මා මීට පෙර කියූ ආකාරයටම අපි මේ කාරණය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඊයේ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පැවැති කැබිනට් මණ්ඩල සාකච්ඡාවේදීත් මුදල් අමාත්‍යාංශය සඳහන් කළ ආකාරයට, පොදුවේ වැටුප් වැඩි කිරීම් හෝ ඊට අදාළ වෙනත් විචලනයන් පිළිබඳ ඊළඟ අය වැයේදී පූර්ණ වශයෙන් සලකා බලන්න තමයි අදහස් කරගෙන ඉන්නේ. මොකද, යම් කොට්ඨාසයකට විතරක් විශේෂයක් කරපු ගමන් තවත් කොට්ඨාසයක් ඉල්ලීම් ඉදිරිපත් කරනවා, ගරු මන්ත්‍රීතුමනි. ඊළඟට, තවත් පිරිසක් ඉල්ලීම් ඉදිරිපත් කරන්න බලනවා. එතකොට ඒ සිද්ධියම විශාල ප්‍රශ්නයක් බවට පත් වෙනවා. ඔබතුමා කියූ ආකාරයටම අප මේ මුහුණ දී තිබෙන්නේ ඉතිහාසයේ ඉතා දරුණු අර්බුදයකට. අපි ඒක පිළිගන්නට ඕනෑ. ඔබතුමා දන්නවා, මේ කාලය තුළ අපේ රටට tourismවලින් ආදායමක් ලැබෙන්නේ නැති බව. පිට රටින් යම් ප්‍රමාණයක් මුදල් එනවා; exports සිදු වෙනවා.

රජයට ප්‍රධාන වශයෙන් ආදායම් ලැබෙන ආකාර තුනයි තිබෙන්නේ. එකක් තමයි, Excise Department එකෙන් ලැබෙන ආදායම. දෙවැනි එක තමයි, රේගුවෙන් ලැබෙන ආදායම. තුන්වන එක තමයි, ආදායම් බදුවලින් ලැබෙන ප්‍රමාණය. ඒ ආදායම් මාර්ග තුනම අද කඩා වැටිලා තිබෙනවා. මේ ඔක්කෝමත් එක්ක, පසු ගිය අවුරුදු එකහමාර තිස්සේ ගෙදර සිටින විටත් මේ රටේ රජයේ නිලධාරින්ට සම්පූර්ණ පඩිය ගෙවා තිබෙනවා. ගුරුවරුන් ඇතුළු රජයේ සේවකයන් සියලුදෙනාට ශතයක් වත් අඩු කරන්නේ නැතිව පඩි ගෙවා තිබෙනවා. මේක ඉතාම අපහසු කාලයක්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් අපත් -අප සියලුදෙනා- රට ගොඩනැඟීම සඳහා එක්ව කටයුතු කරමු, මේ කරුණ අරගෙන දේශපාලනය නොකරමු කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්න අසා අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
අතුරු ප්‍රශ්නයක් නොවෙයි, ගරු කථානායකතුමනි.

රටේ පවතින තත්ත්වය අපිත් දන්නවා. ඇත්තටම මම ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, එය පිළිගැනීම පිළිබඳව. එතුමා කියන ආකාරයට අපිත් කැමැතියි සහයෝගය දෙන්න. රටේ ආර්ථික ප්‍රශ්නය විසඳා ගන්න අපි හැමෝම එකට එකතු වෙලා අත් වැල් බැඳ ගන්න ඕනෑ කියන තැන අපි ඉන්නවා. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ඇමති මණ්ඩලයම තමයි එළියට ගිහින් කියන්නේ, "අපිට සල්ලිවල කිසිම ප්‍රශ්නයක් නැහැ. අපිට ඕනෑ තරම් සල්ලි තිබෙනවා. අපිට එහෙන්-මෙහෙන් ඉල්ලන්න ඕනෑ නැහැ" කියලා. ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා ඉස්පිරිතාලවලට උපකරණ පරිත්‍යාග කරන කොට එතුමන්ලා කිව්වේ, "අපිට එහෙම එක එක්කෙනාගෙන් ගන්න ඕනෑ නැහැ. අපිට ඕනෑ තරම් සල්ලි තිබෙනවා" කියලායි. මම මේ කියන්නේ, අන්න ඒ උද්ධච්චකම පැත්තක තියලා මේ රට ගොඩ නඟන්න අපි එකතු වෙලා වැඩ කරමු කියලායි.

## විදේශ පුහුණුවීම් ලද ඊටීඑෆ් සේවකයන්: දැනුම ප්‍රයෝජනයට ගැනීම
## வெளிநாட்டுப் பயிற்சிபெற்ற ஊ.ந.பொ. ஊழியர்கள்: அறிவினைப் பயன்படுத்திக்கொள்ளல்
## ETF EMPLOYEES TRAINED ABROAD: UTILIZATION OF KNOWLEDGE

271/2020

4. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015.01.23 සිට 2018.10.31 දක්වා කාලය තුළ විදේශ පුහුණුවීම් සඳහා සහභාගි වූ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුහුණුවීම් සඳහා ආයතනය විසින් දරන ලද මුදල එක් එක් සේවකයා අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විදේශයන්හි පුහුණුව ලැබූ සේවකයන්ගේ දැනුම, ශ්‍රී ලංකාවට උචිත පරිදි යොදා ගැනීම සඳහා නිසි වැඩ පිළිවෙළක් ආයතනය තුළ ක්‍රියාත්මක වන්නේද;

(iv) එසේ නම්, එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

( அ) (i) 2015.01.23 தொடக்கம் 2018.10.31 வரையிலான காலப்பகுதியில் வெளிநாட்டுப் பயிற்சிகளில் பங்கேற்ற ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதியத்தைச் சேர்ந்த ஊழியர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி பயிற்சிகளுக்காக நிறுவனத்தினால் உறப்பட்ட செலவினம் ஒவ்வொரு ஊழியருக் கமைவாக வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(iii) வெளிநாடுகளில் பயிற்சிபெற்ற ஊழியர்களின் அறிவினை இலங்கைக்குப் பொருந்தும் வகை யில் பயன்படுத்திக்கொள்வதற்கான முறையான வேலைத்திட்டமொன்று நிறுவனத்தில் நடை முறையிலுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி வேலைத்திட்டம் எவ்வாறு நடைமுறைப்படுத்தப்படுகின்றது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he state -

(i) the number of employees of the Employees' Trust Fund who participated in foreign trainings during the period from 23.01.2015 up to 31.10.2018;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) the expenditure that was borne by the institution for the said trainings, separately for each employee;

(iii) whether a proper programme is implemented within the institution to utilize the knowledge of the employees who were trained abroad, as appropriate for Sri Lanka; and

(iv) if so, the manner in which that programme is implemented?

(b) If not, why?

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 50දෙනෙකු සහභාගි වී ඇත.

(ii) වැය වූ මුදල් ඒ ඒ විදේශ විනිමය ඒකකවලින් ඇමුණුමෙහි සඳහන් කොට ඇත.

ඇමුණුම සභාගත* කරමි.

(iii) නිසි වැඩ පිළිවෙළක් ආයතනය තුළ ක්‍රියාත්මක වේ.

(iv) 1. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම මත මණ්ඩලයේ නිලධාරින් මෙම පුහුණු වැඩසටහන් සඳහා සහභාගි කරවීමෙන් පසුව පුහුණුව ලබා නැවත පැමිණෙන නිලධාරින් විසින් ඔවුන් ලබා ගන්නා ලද පුහුණුව පිළිබඳව මණ්ඩලයේ ඉහළ කළමනාකාරිත්වය ඇතුළු සියලු නිලධාරින් දැනුවත් කිරීම සිදු කෙරේ.

2. එම සෑම පුහුණු වැඩසටහනකටම අදාළව විදේශ පුහුණුවේ දී අධ්‍යයනය කරන ලද විෂයයන් සහ ලබා ගත් නව දැනුම ආශ්‍රිතව ව්‍යාපෘති වාර්තා සකස් කෙරේ.

3. මණ්ඩලයට අදාළ වන එම ක්‍රියාත්මක කිරීම තුළින් නව අත්දැකීම් සියලු කාර්යය මණ්ඩලය සමඟ බෙදා ගනිමින් ආයතනයේ ඵලදායිතාව ඉහළ නංවා ගැනීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් පැවැත්වීම සිදු කෙරේ.

4. මෙහිදී මූලික වශයෙන් මණ්ඩලයේ ප්‍රධාන විෂයය පථය වන සමාජ ආරක්ෂණය පිළිබඳ කටයුතු සමස්ත ශ්‍රී ලාංකික වැඩ කරන කම්කරු ජනතාවට මෙන්ම හාම්පුතුන්ටද සමස්ත ප්‍රජාවටම සහන සැලසෙන ආකාරයට දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයින පුරා ව්‍යාප්තව ඇති මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල හරහා ක්‍රියාත්මක කරනු ඇත.

5. දැනට මණ්ඩලය මඟින් සමාජ ආරක්ෂණ ක්‍රමවේද හඳුන්වා දී ඇත්තේ මණ්ඩලයට දායකත්වය සපයන කම්කරු ජනතාවට පමණකි. ඒ අතර අනෙකුත් ආසියාතික රටවල් වන චීනය, මැලේසියාව, ජපානය ආදී රටවල පවතින සමාජ ආරක්ෂණ ක්‍රම අධ්‍යයනය කර සමස්ත ජනතාවම ආවරණය වන පරිදි ජාතික සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කෙරේ.

(ආ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට මේ කාරණය මා අහන්න කැමැතියි.

අපේ රටේ පෞද්ගලික අංශයේත්, ඒ වාගේම අර්ධ රාජ්‍ය අංශයේත් සේවකයෝ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සහ සේවක අර්ථසාධක අරමුදලට දායක වෙනවා. අපි දන්නවා, සේවක අර්ථසාධක අරමුදලට සේවකයා සියයට 8කින් දායක වෙද්දී, ආයතනයේ අයිතිකරුවා සියයට 12කින් දායකවන බව. සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට සේවකයා සියයට 3කින් දායක වෙනවා. ඒ එකතු වෙන මුදල මත සියයට 14ක හෝ එහෙම නැත්නම් කවර හෝ බද්දක් අය කර ගන්න ආණ්ඩුව බලාපොරොත්තුවක් තිබෙනවාද, එහෙම සැලැස්මක් තිබෙනවාද? ඒ ගණන සියයට 14ම නොවෙන්න පුළුවන්. ඒ එකතු වෙන මුදල මත යම්කිසි බද්දක් අය කර යම් මුදලක් එකතු කරගන්න ඔබතුමන්ලා ක්‍රියාත්මක වෙනවාද? ඒ ගැන පැහැදිලි ප්‍රකාශයක් කරන්න. ඒ සේවකයා යළි එම මුදල් ලබා ගන්නා අවස්ථාවේදී එහෙම බද්දක් අය කරනවාද? ඒ බව මේ සභාවේ වාර්තාගත වෙන්න - සභාගත වෙන්න - ඔබතුමා ලබා දෙන සහතිකය මොකක්ද? එහෙම නැත්නම් "නැහැ" කියන්න. ඔව් නම්, "ඔව්" කියන්න. එහෙම වැඩ පිළිවෙළක් තිබෙනවා නම් ඒ ප්‍රතිශතය කොච්චරද?

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)

නැහැ. එහෙම කරන්න අපේ බලාපොරොත්තුවක් නැහැ. ඔබතුමන්ලාගේ පසුගිය රජය කාලයේ එවැනි සාකච්ඡාවක් තිබුණා. ඒ කාලයේ සමහර ඇමතිවරු EPF එකට tax කිරීමට බොහොම උනන්දුවෙන් සිටියා. ඒක නොකෙරුණු එක ගැන අපට සන්තෝෂයි. අපි එහෙම කරන්න බලාපොරොත්තුවක් නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් පුවත් පත් වාර්තා පළ වුණා. ඔබතුමා කියනවා, අපේ ආණ්ඩුව කාලයේ එහෙම සාකච්ඡාවක් තිබුණාය කියලා. ඔබතුමා කියනවා, "සමහර ඇමතිවරුන්" කියලා. ඒ ඇමතිවරු කවුද කියන එක මේ සභාවේදී කිව්වා නම් හොඳයි. එතකොට කාටත් ඒ ගැන දැනගන්න පුළුවන්. මේ සම්බන්ධව මාධ්‍ය වාර්තා පළ වුණා. එම මාධ්‍ය වාර්තා නිවැරදි කරනවාද? ඒ වාගේම විශේෂයෙන්ම ඔබතුමන්ලා මේ මුදල් වෙනත් මූල්‍ය ආයතනවල යළි ආයෝජනය කරන ක්‍රමවේදය මොකක්ද?

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)

ගරු මන්ත්‍රීතුමනි, එවැනි කටයුත්තක් සිද්ධ වෙන්නේ නැහැ කියලා ඉතාම පැහැදිලිව කියා තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමාත්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ ගැන කියා තිබෙනවා. ඒක පුවත් පත්වල පළ වුණා. ඒත් එක්කම මමත් සම්මුඛ සාකච්ඡා කිහිපයකදීම මේ ප්‍රශ්නයට උත්තර දුන්නා. ඒවා පුවත් පත්වලත් පළ වුණා. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමා කිසිම ගැටලුවක් තබා ගන්න එපා.

ඒත් එක්කම මා කියන්නට අවශ්‍යයි, EPF එකෙන් කරන ආයෝජන පිළිබඳව ඒ අය ඉතා පැහැදිලිව Investment Policy Statement එකක් ඒ අයගේ website එකේ දමා තිබෙන බව. ඒක කියෙව්වා නම්, මේ ආයෝජන සම්බන්ධව ඒ අයගේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා තේරෙනවා. එම ආයෝජන ප්‍රතිපත්තිය සේවක අර්ථසාධක අරමුදලේ website එකේ දිගටම පළ කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -618/2020- (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 -833/2020- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය: ගුරු පුරප්පාඩු
## திருகோணமலை மாவட்டம்: ஆசிரியர் வெற்றிடங்கள்
## TRINCOMALEE DISTRICT: TEACHER VACANCIES

872/2020

**7. ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රජයේ පාසල් සඳහා අනුමත ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රජයේ පාසල්වල මේ වනවිට සේවයේ නියුතු ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල මේ වනවිට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව, එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை மாவட்டத்திலுள்ள அரசாங்கப் பாடசாலைகளுக்கென அங்கீகரிக்கப்பட்ட ஆசிரியர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அந்த எண்ணிக்கையானது ஒவ்வொரு பாடத்தின் அடிப்படையில் வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iii) மாவட்டத்திலுள்ள அரசாங்கப் பாடசாலைகளில் தற்போது பணியாற்றும் ஆசிரியர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) அப்பாடசாலைகளில் தற்போது நிலவும் ஆசிரியர் வெற்றிடங்களின் எண்ணிக்கை, ஒவ் வொரு பாடத்தின் அடிப்படையில் வெவ்வேறாக எத்தனை என்பதையும்;

(v) மேற்படி ஆசிரியர் வெற்றிடங்களை நிரப்பு வதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக் கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the approved cadre of teachers for government schools located in the Trincomalee District;

(ii) the breakdown of the aforesaid number on per subject basis;

(iii) the number of teachers currently working at the government schools located in the aforesaid district;

(iv) the number of teacher vacancies that are existing in those schools at present, separately on per subject basis; and

(v) the steps that will be taken by the Ministry to fill the aforesaid teacher vacancies?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රජයේ පාසල් සඳහා අනුමත ගුරුවරුන් සංඛ්‍යාව පහත පරිදි වේ.

ජාතික පාසල් සඳහා අනුමත ගුරුවරුන් සංඛ්‍යාව 982කි.

පළාත් පාසල් සඳහා අනුමත ගුරුවරුන් සංඛ්‍යාව 5,410කි.

[ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා]

(ii) එම සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 01 යටතේ දක්වා ඇත. ඇමුණුම 01 බලන්න.

(iii) ඔව්.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ජාතික පාසල්වල මේ වන විට සේවයේ නියුතු ගුරුවරුන් සංඛ්‍යාව 943කි.

එම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පළාත් පාසල්වල මේ වන විට සේවයේ නියුතු ගුරුවරුන් සංඛ්‍යාව 4,783කි.

(iv) එම පාසල්වල මේ වන විට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව, එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02 යටතේ දක්වා ඇත. ඇමුණුම 02 බලන්න.

(v) සියලු පළාත්හි ආණ්ඩුකාරවරුන්, පළාත් අධ්‍යාපන ලේකම්වරුන්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින්ගේ සහභාගිත්වයෙන් හා අධ්‍යාපන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2020.11.24 දින Zoom තාක්ෂණය ඔස්සේ පළාත් ගුරු පුරප්පාඩු හා ගුරු තුලනය පිළිබඳව සාකච්ඡාවක් පවත්වන ලදී. එහිදී ජාතික පාසල් හා පළාත් පාසල් අතර ගුරු තුලනයක් සිදු කිරීම පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර, නැඟෙනහිර පළාත් ආණ්ඩුකාරතුමා ඇතුළු සියලු පළාත් ආණ්ඩුකාරවරුන් ඒ සඳහා තම එකඟතාව පළ කරන ලදී. ඒ අනුව ගුරු ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් සකස් කිරීමටත්, පළාත් පාසල් අතර ද, පළාත් පාසල් හා ජාතික පාසල් අතර ද, පළාත් තුළ හා පළාත් අතර ද ගුරු තුලනයක් සිදු කිරීමටත් එකඟතාව පළ විය.

තවද, ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරින්ට ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (ආ) ශ්‍රේණියේ ගුරු පත්වීම් ලබාදීම-2020 වැඩසටහන යටතේ 2016-2018 අධ්‍යයන වර්ෂයේ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවල තුන් අවුරුදු පූර්ව සේවා ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සාර්ථකව හදාරා නිම කළ, ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරින් 3,730ක් සඳහා 2021.01.18 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික හා පළාත් පාසල් සඳහා ගුරු පත්වීම් ලබාදෙන ලදී. එහිදී නැඟෙනහිර පාළාතේ ජාතික පාසල් සඳහා ගුරුවරුන් 133ක් හා පළාත් පාසල් සඳහා ගුරුවරුන් 412ක් යොමු කරන ලදී.

ඉහත පරිදි පුරප්පාඩු පිරවීමෙන් පසු තවදුරටත් ඉතිරි වන පුරප්පාඩු උපාධිධාරි අභ්‍යාසලාභීන් ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ වැඩසටහන යටතේ පිරවීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම 01 සහ 02 **සභාගත*** කරමි.

---

*** පුස්තකාලයේ තබා ඇත.**

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. නැඟෙනහිර පළාතේ ත්‍රිකුණාමලය, Batticaloa සහ අම්පාර යන දිස්ත්‍රික්කවල සමහර කලාපවල ගුරුවරු වැඩියෙන් ඉන්නවා. ගරු ඇමතිතුමනි, එතකොට එසේ වැඩියෙන් සිටින කලාපවල ගුරුවරු අනෙක් කලාපවලට යොමු කරලා balance කරන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවාද?

ඒ වාගේම ගරු ඇමතිතුමනි, ත්‍රිකුණාමලය වාගේ දිස්ත්‍රික්කවල ප්‍රශ්නයක් තිබෙනවා. එම දිස්ත්‍රික්කවල ISA, DO, Principal වාගේ ධුර සඳහා තවමත් හරියට පත්වීම් ලබා දීලා නැහැ. ඒ සඳහා කුමක් හෝ වැඩ පිළිවෙළක් අරගෙන යනවාද? මේ වෙනකොට බොහෝ කාලයක් තිස්සේ සුදුසුකම් නොමැති බොහෝ පිරිසක් Performing Principalsලා විධියට ඉන්නවා. ඒ සඳහා මොනවා හෝ විකල්ප වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

එවැනි අසමතුලිතතාවක් තිබෙනවා. සමහර තැන්වල ගුරුවරුන්ගේ අතිරික්තයක් තිබෙනවා, සමහර තැන්වල ගුරුවරුන්ගේ හිඟයක් තිබෙනවා. ඒ සඳහා අපි වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. විදුහල්පතිවරුන්ගේ සහ වැඩ බලන විදුහල්පතිවරුන්ගේ පත්වීම් පිළිබඳවත් අපි වැඩ කටයුතු කරගෙන යනවා. දැන් පවතින ගුරු හිඟය සඳහා ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවල සිටින ඩිප්ලෝමාධාරින් පත් කිරීම තමයි ප්‍රායෝගික ක්‍රමවේදය හැටියට අපි දකින්නේ. අපි ඒ වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. මා සඳහන් කළ පරිදි ජාතික පාසල් සඳහා ගුරුවරු 133දෙනෙක් සහ පළාත් පාසල් සඳහා ගුරුවරු 412දෙනෙක් දැනටමත් යොමු කර තිබෙනවා. එම වැඩ පිළිවෙළ පියවරින් පියවර ක්‍රියාත්ම කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා අහනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමනි, විද්‍යා පීඨවලින් ලබාදෙන ජාතික ශික්ෂණවිද්‍යා ඩිප්ලෝමාව අධ්‍යාපනවේදී උපාධියක් බවට පරිවර්තනය කරන්න බැරිද? දැනට මෙය විද්‍යා පීඨ තුළ සිදු වන්නේ ද අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාව සහ පාසල් පදනම් කර ගත් අවුරුද්දක පුහුණුවක් හැටියටයි. මේක පටන් ගත් කාලයට වඩා මේ වන විට සෑහෙන්න ඉදිරියට ගිහින් තිබෙනවා. එම ඩිප්ලෝමාවෙන් පස්සේ ඒ අය ලංකාවේ විශ්වවිද්‍යාලයකට ගිහිල්ලා හෝ එහෙම නැත්නම් ජාතික අධ්‍යාපන ආයතනයෙන් අධ්‍යාපනවේදී උපාධියක් ලබා ගන්න ඕනෑ. එහෙම නොකර ජාතික ශික්ෂණවිද්‍යා ඩිප්ලෝමාව අධ්‍යාපනවේදී උපාධියක් බවට පරිවර්තනය කරන්න අපට බැරි ඇයි? ඒ වාගේම, පසුගිය කාලයේ බොහෝ පළාත්වල පාසල්වලට සම්බන්ධ කරලා සිටි උපාධිධාරින් නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන්න කියලා මේ මොහොත වන විට දැනුම් දී තිබෙනවා. මේ කාරණය නිසා අධ්‍යාපන පද්ධතියට බරපතළ හානියක් සිදු වෙනවා. එම නිසා මේ කාරණා දෙකට අමාත්‍යාංශය මැදිහත් වෙන්නේ කොයි විධියටද කියලා මම වෙන වෙනම දැනගන්න කැමැතියි.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

එම ඩිප්ලෝමා පාඨමාලාව උපාධියක් දක්වා උසස් කිරීමේ වැඩ පිළිවෙළ පිළිබඳව අපි අවධානය යොමු කරමින් සිටිනවා. සමස්ත ව්‍යුහය ගැනම හිතලා බොහොම ඉක්මනට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාශියක වැඩ සම්පූර්ණ කරලා, එම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළේ වටිනා යෝජනාවක්. ඒකත් සැලකිල්ලට භාජන කරලා, අපි සියලුදෙනාටම එකතු වෙලා සමස්ත වැඩ පිළිවෙළ පිළිබඳ සාකච්ඡා කරන්න පුළුවන්. රටේ අධ්‍යාපනය අපේ දූ දරුවන්ගේ අනාගතයට බලපාන කාරණයක්. එම නිසා රටට ඉතා හොඳින් ගැළපෙන අධ්‍යාපන ක්‍රමය අපි සකස් කරමු. ඒ පිළිබඳ විස්තර සහිත යෝජනා නුදුරු අනාගතයේ ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමනි, මගේ ප්‍රශ්නය තුළ මම ඔබතුමාගෙන් තවත් කාරණයක් ඇහුවා. ඒක තමයි, පාසල්වල හිටපු උපාධිධාරීන්ට දැන් නැවත වරක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට යන්න කියලා තිබෙනවා. විශේෂයෙන්ම උතුරුමැද පළාතේ සහ තවත් පළාත් කිහිපයක මේ ප්‍රශ්නය තදින්ම මතු වෙලා තිබෙනවා. ඒ අයත් මෑතකදී අවස්ථා තුනකදී බඳවා ගත් උපාධිධාරීන්ගෙන් කොටසක්. මේ උපාධිධාරීන් සඳහා විභාගයක් පවත්වලා, ඔවුන් ගුරු සේවයට බඳවා ගන්නවා කියාත් පසුගිය කාලයේ කතිකාවක් සිදුවුණා. දකුණු පළාතේ සෘජුවම එම පත්වීම් පවා දුන්නා. දකුණු පළාත් ආණ්ඩුකාරතුමාම ඒ අයට පත්වීම් ලිපි ලබා දුන්නා. එම ඡායාරූප පවා තිබෙනවා. එකම විධියට බඳවාගත් උපාධිධාරීන්ට මෙහෙම දෙවිධියකට සලකන්නේ ඇයි, ගරු ඇමතිතුමනි?

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු මන්ත්‍රීතුමනි, එහෙම දෙයක් සිදු වෙලා තිබෙනවා නම් මා ඒ ගැන සොයා බලන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 -907/2020- (1), ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබාදීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් මට පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න ඕනෑ. ඒකට පොඩි වෙලාවක් දෙන්න.

ගරු ඇමතිතුමනි, ඊයේ වෙනකොට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා ගුරුවරුන්ට පාසල්වලට වාර්තා කරන්න කියලා. පාසල් සියල්ල වසා දමා තිබෙන මේ වකවානුවේ ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව ඉවත් කරන්න කියා ඒ අය පාරට බැහැලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඇත්තටම ගුරුවරුන්ට සේවයට වාර්තා කරන්න කියලා තිබෙන්නේ ඒ අයගේ වැටුප් විෂමතා පිළිබඳ ඉල්ලීම සම්බන්ධයෙන් පැවැත්වෙන උද්ඝෝෂණ සහ විරෝධතාවලට බය නිසාද, නැත්නම් ඒවා කඩාකප්පල් කරන්නද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

නැහැ, නැහැ. එහෙම කිසි බයක් නිසා නොවෙයි, ගරු මන්ත්‍රීතුමියනි. කැබිනට් මණ්ඩලය ඊයේ හවස රැස් වෙලා මේ ප්‍රශ්නය පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. අපි පිළිගන්නවා අද ගුරුවරයා ඉන්නේ ගුරුවරයා සිටිය යුතු තැන නොවෙයි කියන එක. ඔවුන්ට සහනයක් අවශ්‍යයි. ගුරුවරුන්ට වැටුප් වැඩිවීමක් අවශ්‍ය බව ප්‍රතිපත්තියක් හැටියට අපි පිළිගන්නවා. හැබැයි මේක අද ඊයේ ඇති වුණු ප්‍රශ්නයක් නොවෙයි. මෙය බී.සී. පෙරේරා වැටුප් කොමිසම හරහා ඇති වුණු, අවුරුදු 24ක් විතර පරණ ප්‍රශ්නයක්. මෙහිදී රජයේ ස්ථාවරය තමයි, අපි මේ පිළිබඳ විසඳුමකට පැමිණීමේදී අනිකුත් සමාන්තර සේවා ගැනත් හිතන්න ඕනෑය කියන කාරණය. එහෙම නැත්නම් තව ව්‍යාකූලතා ඇති වෙනවා. ඒ සඳහා අත්‍යවශ්‍ය පියවරක් විධියට වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව එක්කත් සාකච්ඡා කරන්න වෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, අය වැය ලේඛනය ඉදිරිපත් කරන විට සමස්ත රාජ්‍ය සේවය ගැන හිතලා සුදුසු පියවර ගැනීමට. ක්ෂණිකව ඒ පියවර ගන්න අපට පුළුවන්කමක් නැහැ. හැබැයි, මේ ප්‍රශ්නය විසඳීමට රජයට අවංක උනන්දුවක් තිබෙනවා. ගුරුවරු පිළිබඳව අපේ ලොකු ගෞරවයක් තිබෙනවා. එම නිසා මේක කරන්න සුදුසුම වෙලාව අය වැය ලේඛනය ඉදිරිපත් කරන වෙලාවයි, සියලු සේවා සහ ක්ෂේත්‍ර ගැන හිතලා.

අපි අවංකව කියන්න ඕනෑ අනෙක් කාරණය තමයි, කොවිඩ්-19 වසංගතය නිසා රටේ ආර්ථික ප්‍රශ්නයක් තිබෙන බව. මේ වසංගතය නිසා රජයේ ආදායම් පහළ වැටිලා තිබෙනවා. එම නිසා මේ ප්‍රශ්නයට අද හෙටම ක්ෂණික විසඳුමක් දෙන්න පුළුවන්කමක් නැහැ. නොවැම්බර් මාසයේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන විට මේ සියලු සාධක සැලකිල්ලට භාජන කරලා සමස්ත රාජ්‍ය සේවය සම්බන්ධයෙන්ම ප්‍රායෝගික විසඳුම් ඉදිරිපත් කිරීමට රජය බලාපොරොත්තු වෙනවා, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමියට දැන් අවස්ථාවක් දුන්නා නේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මම විවාදයක් කරනවා නොවෙයි, ගරු කථානායකතුමනි. එතුමා ප්‍රකාශ කළා,-[බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දැන් ඔබතුමියගේ කථාව නවත්වන්න කෝ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
පොඩ්ඩක් ඉන්න. ඔබතුමන්ලාගේත් ගුරුවරු ඉන්නවා නේ. [බාධා කිරීමක්]- පොඩ්ඩක් ඉන්න. මට කථා කරන්න අවස්ථාව දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, එහෙම නම් ඉක්මනට කියන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ප්‍රශ්නය වැරදි තැනකින් අල්ලාගෙන ඉන්න බව මම කියන්න ඕනෑ. ගුරුවරුන්ට කියලා කිසිම දවසක විශේෂයෙන් වැටුප් වැඩිවීමක් වෙලා නැහැ. ඔබතුමා කිව්වා වාගේ 1997දී ගුරුවරුන් පහළට දාලා රජයේ අනෙක් නිලධාරීන් ඉහළට ගෙනිච්ච නිසා තමයි ගුරුවරුන්ට වැටුප් විෂමතාවක් ඇති වුණේ. ගිය අය වැයේදී ඔබතුමා කිව්වා, ඒ අය වැයෙන් ක්ෂණික අතුරු දීමනාවක් දෙනවා කියලා. දැන් ආපහු ඉදිරි අය වැය ගැන කථා කරනවා. අපි දන්නවා, රටේ මුදල් ප්‍රශ්නයක් තිබෙන බව. ගුරුවරු කියන්නේ නැහැ අපට දැන්මම ඒ වැටුප දෙන්න කියලා. ගරු ඇමතිතුමනි, ගුරුවරු මේ වෙලාවේ අහන්නේ අපේ වැටුප් විෂමතාව ඉවත් කරනවා ද, සංවෘත සේවාවක් හැටියට අප නම් කරනවා ද කියලායි. ගුරු සේවය සංවෘත සේවාවක් හැටියට නම් කරනවා නම් අනෙක් අයත් එක්ක ගැටුමක්, හැප්පිල්ලක් එන්නේත් නැහැ, ගරු ඇමතිතුමනි. අද ගුරුවරු කියන්නේ, "මේ ඉල්ලීම් දෙන දවසක් කියන්න, අපි අයින් වෙනවා." කියලායි. අපේ වැටුප් විෂමතාව අයින් කරනවා ද කියලායි ඔවුන් අහන්නේ. ගුරුවරු කියන්නේ බුද්ධිමත් පිරිසක්. ඒ අය දන්නවා, මේ වෙලාවේ ආණ්ඩුවට සල්ලි නැහැ කියලා. කොවිඩ්-19 වසංගතය හමුවේ යම්කිසි ගැටලුවක් අපේ රටේ තිබෙනවා කියලාත් ඒ අය දන්නවා. මේ ගුරුවරු මරණ සහතිකය අතට අරගෙනයි අද එළියට බැහැලා තිබෙන්නේ. ඒ නිසා ඒ ජීවිතවලට වග කියන්න ඕනෑ. ඇමතිතුමා වචනයක් දෙන්න, වැටුප් විෂමතාව අයින් කරනවා ද, එහෙම නම් ඒ කවදා ද කියලා. එහෙම කිව්වොත් ගුරුවරු මේ විරෝධතා නවත්වනවා.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
මම කිව්වා නේ, ඉදිරි අය වැය ලේඛනයේදී අපි ඒ පිළිබඳ පියවර ගන්නවා කියලා. ගරු මන්ත්‍රීතුමියනි, මීට ඉස්සෙල්ලා තිබුණේ ඔබතුමිය නියෝජනය කළ ආණ්ඩුව. ඒ කාලයේත්, ඊට ඉස්සෙල්ලාත් මේ ප්‍රශ්නය තිබුණා නේ. නමුත්, ඒ කිසිම ආණ්ඩුවක් මේ ප්‍රශ්නයට විසඳුමක් ඉදිරිපත් කළේ නැහැ. මම මේ කවුරුවත් විවේචනය කරනවා නොවෙයි. අවුරුදු 25ක් තිස්සේ මේ ප්‍රශ්නය තිබුණා. ළමයින්ට උගන්වන්නේ නැහැයි කියලා ක්ෂණිකව තීරණය කිරීම එතරම් සාධාරණයි කියලා මම හිතන්නේ නැහැ. මෙහිදී අපි දෙපැත්ත ගැනම බලන්න ඕනෑ. මම ඊයේත් කිව්වා, මේකෙන් අතිශයින්ම පීඩනයට පත්වෙලා තිබෙන්නේ අපේ රටේ සිටින වරප්‍රසාද නැති ළමයි බව. අපේ රටේ වරප්‍රසාද තිබෙන ළමයින්ට මේකෙන් කිසිම ප්‍රශ්නයක් නැහැ. ඉස්සරටත් වඩා හොඳින් ඒ අයගේ අධ්‍යාපන කටයුතු දැන් කෙරීගෙන යනවා. ඒ ගැනත් අපි හිතන්න ඕනෑ. මෙහිදී ගුරුවරුන්ටත් සාධාරණයක් ඉෂ්ට වන්න ඕනෑ. හැබැයි, මේ විධියට අහිංසක ළමයි දැඩි පීඩනයකට පත් කිරීම සාධාරණ වන්නේ නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛයෙන් කිව්වේ මොකක්ද? එන්නතේ දෙවැනි මාත්‍රාව ගුරුවරුන්ට දීමෙන් පසු පාසල් විවෘත කරන්න ඕනෑ කියලායි. අද උදේ වනකොට මේ රටේ ගුරුවරුන්ගෙන් සියයට 84ක් එන්නතේ පළමුවෙනි මාත්‍රාව ලබා ගෙන තිබෙන බව ඔබතුමිය දන්නවාද කියලා මම දන්නේ නැහැ. සයිනොෆාම් එන්නතේ දෙවැනි මාත්‍රාවත් අපට සති 4ක් ඇතුළත ගුරුවරුන්ට දෙන්න පුළුවන්. ඒක ලබා දුන්නාට පසු අපි පාසල් විවෘත කරනවා. ඒ සඳහා පෙර සූදානමක් ලෙස විදුහල්පතිවරුන්ට සහ ගුරුවරුන්ට පාසල්වලට පැමිණෙන්න කියන ආයාචනය තමයි අපි කළේ.

**ගරු ගාමිණී ලොකුගේ මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Transport)
ගරු කථානායකතුමනි, ගුරුවරුන්ගේ ප්‍රශ්නය ගැන අද රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය කථා කරනවා. නමුත්, මේ ප්‍රශ්නය ඇතිවෙලා දැන් අවුරුදු හත-අටක් වනවා. යහ පාලන ආණ්ඩුව පැවැති පසුගිය කාලයේ මේ අය කවුරුවත් එක දවසක්වත් මේ පිළිබඳව කථා කළේ නැහැ. මේ ප්‍රශ්නය මේ ආණ්ඩුව ඇති කරපු එකක් නොවෙයි. මේක පසුගිය කාලයේ සිට තිබුණු ප්‍රශ්නයක්. [බාධා කිරීමක්] ඔබතුමිය පොඩ්ඩක් ඉන්න. මේ ප්‍රශ්නය ගැන අපි හුඟක් සාකච්ඡා කර තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම කියන්නේ අපේ ආණ්ඩුවක් ගැන නොවෙයි. මේක ආණ්ඩු පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි, ගරු ඇමතිතුමනි. ඒක හොඳට මතක තබාගන්න.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ඔබතුමිය නියෝජනය කළ ආණ්ඩුව පැවැති කාලයේත් මේ ප්‍රශ්නය තිබුණා.ඒ කාලයේදී ඔබතුමියලාගේ අධ්‍යාපන ඇමතිතුමා, ඔබතුමියලාගේ අගමැතිතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඔබතුමියලා අද රාජ්‍ය නොවන සංවිධාන එකතු කර ගෙන රජය අසීරුතාවට පත් කරන්න හදනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order. Please!

ගරු කථානායකතුමනි, අපේ රජය පැවැති කාලයේ මේ ගැන අවධානය යොමු කළා. අපේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, ඒ කරුණ ගැන පස්සේ විවාදයක් කරමු.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේක රීති ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, කියන්න. ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩුව පැවැති කාලයේ අපි ගුරුවරුන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කළා. ඔබතුමන්ලාට මතකයි නේද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි.

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමනි, 9වන ප්‍රශ්නය අහන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමියට වුවමනා තරම් අවස්ථාව ලබා දීලා තිබෙනවා. ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)
ගරු කථානායකතුමනි, මම 9 වන ප්‍රශ්නය අහනවා. පිළිතුර ලැබෙන්න පෙර ගරු කථානායකතුමාගේ කාරුණික සැලකිල්ලට ගෞරවයෙන් යුතුව මේ කාරණය යොමු කරනවා. මම මේ ප්‍රශ්නය අහලා මාස ගණනාවක් ගත වුණා. ප්‍රශ්නයට පිළිතුරු ලැබෙන අවස්ථාව වනකොට එය කල් ඉකුත් වෙච්ච තත්ත්වයකට පත්වනවා. අපේ රටේ පුරවැසියන්ට ලබා දිය යුතු සහනය කඩිනම් කිරීමයි මම මේ ප්‍රශ්නය ඇසීම තුළින් අපේක්ෂා කළේ. ඒ නිසා මේ පවතින ක්‍රමවේදයේ යම්කිසි වරදක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙහෙම ප්‍රමාදවෙලා ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙන්න සලස්වන්නේ නැතිව, එය කඩිනම් කිරීම සඳහා පාර්ලිමේන්තුවේත්, කථානායකතුමාගේ කාර්ය මණ්ඩලයේත් අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

## "CONTACT SRI LANKA" වෙබ් අඩවියේ ලියාපදිංචි වූ ශ්‍රී ලාංකිකයන්: නැවත ගෙන්වා ගැනීම
## "CONTACT SRI LANKA" இணையத்தளத்தில் பதிவுசெய்துள்ள இலங்கைப் பிரஜைகள்: மீள அழைத்துவரல்
## SRI LANKANS REGISTERED WITH "CONTACT SRI LANKA" WEBSITE: REPATRIATION

930/2020

**9. ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)
විදේශ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) විදේශ අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන "Contact Sri Lanka" වෙබ් අඩවියේ ලියාපදිංචි වී ශ්‍රී ලංකාවට නැවත පැමිණීමට ඉල්ලුම් කර ඇති විදේශගත ශ්‍රී ලාංකික පුරවැසියන්;

(ii) ඉහත පුරවැසියන් අතරින් මේ වනවිට ශ්‍රී ලංකාවට ගෙන්වාගෙන ඇති පුරවැසියන්;

සංඛ්‍යාව එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවට නැවත පැමිණීමට ඉල්ලුම් කර ඇති විදේශගත ශ්‍රී ලාංකිකයන් ගෙන්වා ගැනීම සඳහා සැලසුම් කර ඇති වැඩ පිළිවෙළ කවරේද;

(ii) මාසිකව ගෙන්වා ගැනීමට සැලසුම් කර ඇති සංඛ්‍යාව දළ වශයෙන් කොපමණද;

(iii) සියලු දෙනා නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට නියමිත කාල වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) මෙම ශ්‍රී ලාංකිකයන් අතර සිටින රෝගීන්, වැඩිහිටියන්, ගැබිනි මව්වරුන්, දරුවන් සහ රැකියා අහිමිවූවන් ආදී විශේෂ කණ්ඩායම්වල සුබසාධනය සම්බන්ධයෙන් එම එක් එක් රටවල පිහිටි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வெளிநாட்டலுவல்கள் அமைச்சினால் பேணப் பட்டு வருகின்ற "Contact Sri Lanka" இணையத்தளத்தில் பதிவு செய்து இலங்கைக்கு மீள வருவதற்கு விண்ணப்பித்துள்ள வெளிநாடு வாழ் இலங்கைப் பிரஜைகளின் எண்ணிக்கை;

(ii) மேற்படி பிரஜைகளில் இன்றளவில் இலங்கை க்கு அழைத்து வரப்பட்டுள்ள பிரஜைகளின் எண்ணிக்கை;

ஒவ்வொரு நாட்டின் பிரகாரம் தனித்தனியாக எத்தனை யென்பதை அவர் இச்சபைக்கு அறிவிப் பாரா?

(ஆ) (i) இலங்கைக்கு மீள வருவதற்கு விண்ணப் பித்துள்ள வெளிநாடு வாழ் இலங்கையர்களை அழைத்து வருவதற்கு வகுக்கப்பட்டுள்ள வேலைத்திட்டம் யாதென்பதையும்;

(ii) மாதாந்தம் அழைத்து வருவதற்குத் திட்டமிடப் பட்டுள்ள எண்ணிக்கை அண்ணளவாக எத்தனையென்பதையும்;

(iii) சகலரையும் மீள இலங்கைக்கு அழைத்து வருவதற்கு உத்தேசிக்கப்பட்டுள்ள காலப்பகுதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) மேற்படி இலங்கையர்கள் மத்தியில் உள்ள நோயா ளர்கள், முதியோர்கள், கர்ப்பிணித் தாய்மார்கள், சிறுவர்கள் மற்றும் தொழில் இழந்தவர்கள் போன்ற விசேட குழுக்களின் நலனோம்புகை தொடர்பாக மேற்படி ஒவ்வொரு நாட்டிலும் அமைந்துள்ள இலங்கைத் தூதுவராலயங்களினால் மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கைகள் வெவ்வேறாக யாவை என்பதையும் அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා]

asked the Minister of Foreign:

(a) Will he inform this House -

(i) the number of expatriate Sri Lankan citizens who have applied to return to Sri Lanka by registering with the "Contact Sri Lanka" website which is maintained by the Foreign Ministry; and

(ii) out of the above citizens, the number of citizens who have been brought to Sri Lanka by now in relation to each country, separately?

(b) Will he also inform this House -

(i) the arrangement that has been planned to bring back the Sri Lankans who have applied to return to Sri Lanka;

(ii) approximately, the number that has been planned to bring back monthly; and

(iii) the time frame within which all the expatriate Sri Lankans will be brought back?

(c) Will he also inform this House of the measures taken by the Sri Lankan Foreign Missions in each country in regard to the welfare of the special groups of persons such as patients, elderly persons, pregnant mothers, children and those who have lost their employment among these Sri Lankans, separately?

(d) If not, why?

**ගරු තාරක බාලසූරිය මහතා (කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தாரக பாலசூரிய - பிராந்திய உறவு நடவடிக்கைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Tharaka Balasuriya - State Minister of Regional Co-operation)

Sir, on behalf of the Minister of Foreign, I answer the Question.

(a) (i) The number of expatriate Sri Lankan citizens who have applied to return to Sri Lanka by registering with the "Contact Sri Lanka" website, which is maintained by the Foreign Ministry, from 26.03.2020 to 21.07.2021 is 61,603. This includes:

| | |
|---|---|
| Gone abroad for short visits | 5,902 |
| Students | 3,352 |
| Workers abroad and dependents | 52,348 |
| Total | 61,603 |

The figures of regional breakdown are:

| | | |
|---|---|---|
| 01 | Middle East Region | 32,053 |
| 02 | East Asia and Pacific Region | 7,879 |
| 03 | South Asia Region | 3,155 |
| 04 | Southeast Asia Region | 3,317 |
| 05 | Europe, Central Asia and European Union | 13,216 |
| 06 | North America Region | 1,442 |
| 07 | Africa Region | 479 |
| 08 | Latin America and Caribbean Region | 62 |
| | Total | 61,603 |

(ii) The number of Sri Lankans who have been repatriated as at 21.07.2021 is as follows:

Returnees registered at Sri Lankan Missions/ Posts abroad as at 21.07.2021

| Category | Total Returees Registered |
|---|---|
| Short-term visitors | 5,902 |
| Students | 3,353 |
| Migrant workers and Dependents | 52,348 |
| **Grand Total** | **61,603** |

Regional breakdown of returnees registered at Sri Lanka Missions

| Region | Total Returees Registered |
|---|---|
| Africa | 479 |
| East Asia | 7,879 |
| Europe, Central Asia and EU | 13,216 |
| Latin America and Caribbean | 62 |
| Middle East | 32,053 |
| North America | 1,442 |
| South Asia | 3,155 |
| Southeast Asia | 3,317 |
| **Grand Total** | **61,603** |

The opportunity to come to this country has been provided from 06.04.2021 for the Sri Lankan citizens abroad, dual citizens with Sri Lankan passports, spouses with foreign citizenship of Sri Lankan citizens, children with foreign citizenship of Sri Lankan parents and Sri Lankan sailors arriving in Sri Lanka by air, subject to the guidelines issued by the Ministry of Health from time to time and without the prior permission of the Foreign Ministry and to carry a maximum of 75 passengers per aircraft.

(b) (i) As mentioned above, Sri Lankans living abroad are provided with the facility to contact the relevant airlines and return to the Island on the basis of the guidelines issued by the Ministry of Health from time to time.

Further, the Foreign Ministry, in coordination with the Ministry of Health and the Civil Aviation Authority, will continue to facilitate the Sri Lankan citizens requesting to return to Sri Lanka from India, South African and South American countries which are subject to restricted entry to Sri Lanka as per the guidelines currently in force dated 15th July, 2021 issued by the Ministry of Health.

Accordingly, the Foreign Ministry, in coordination with the Sri Lankan Embassy in India and SriLankan Airlines, facilitated the return of 280 Sri Lankans who were unable to return to Sri Lanka from India.

Further, action has been taken to repatriate the migrant Sri Lankans, who wish to pay for their quarantine, transportation and other facilities, by charter and cargo aircraft coordinated by the relevant embassy.

Please note, however, that the number of daily repatriations depends on the amount of space available in the quarantine centres, the number of COVID patients reported in the Island, the heath guidelines issued from time to time by the Ministry of Health as well as the government policies issued by the relevant governments of the countries where Sri Lankans are staying.

(ii) The number of people repatriated to Sri Lanka per month is determined by the Presidential Task Force on the basis of periodic surveys and data obtained from the Sri Lanka Army and other relevant service providers in charge of government quarantine centres involved in the repatriation programme and also based on the observations of the Ministry of Health issuing the health guidelines.

(iii) No such time frame can be given for this.

It varies based on the guidelines of the Ministry of Health and the local COVID situation. However, as mentioned earlier, Sri Lankans are now allowed to enter the Island connecting with the relevant airlines as the prior permission of the Foreign Ministry and the Civil Aviation Authority, which had previously been required for Sri Lankans to visit Sri Lanka, has been revoked. (The maximum number of daily arrivals per flight entering the Island, which is currently at 75 passengers per flight, has been imposed by the Civil Aviation Authority on the advice of the health sector.)

(c) The Foreign Ministry has airlifted more than 10,000 dry rations and indigenous medicine packets to Dubai and Doha Qatar as immediate relief while nearly Rs. 130 million - Rs. 100 million from the Foreign Ministry and Rs. 30 million from the Sri Lanka Bureau of Foreign Employment - has been allocated by the Government for the welfare of migrant workers.

From the outset, the Government has been working to repatriate Sri Lankans who have requested to return to Sri Lanka, giving priority to special groups such as patients, the elderly, pregnant mothers, children and the unemployed.

Further, the Government of Sri Lanka is continuing to take necessary action to negotiate with foreign countries to facilitate visa extensions for them without penalty at the expiration of the visa, to negotiate with employers who have failed to pay their salaries properly and get their salaries paid and also for necessary legal intervention in cases of disagreement. Further, the embassies have been instructed to provide prompt solutions to their problems. Furthermore, the Labour Welfare Divisions of the embassies have introduced special telephone numbers to enable Sri Lankans who fall into the above categories in those countries to report their problems directly to the embassies, thereby enabling them to take necessary remedial action. Also, food, shelter and medical assistance were provided through the embassies to the Sri Lankans who have lost their jobs.

(d) Does not arise.

## අග්නිදිග විශ්වවිද්‍යාලය: පීඨ
## தென்கிழக்குப் பல்கலைக்கழகம்: பீடங்கள்
## SOUTH EASTERN UNIVERSITY: FACULTIES

973/2020

**10. ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා**
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතරින් වෛද්‍ය, ඉංජිනේරු, සත්කාරක සේවා සංචාරක ව්‍යාපාර හා සිද්ධි පිළිබඳ කළමනාකරණය පාඨමාලා පවත්වනු ලබන විශ්වවිද්‍යාලවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ පීඨ සහ මණ්ඩපවල නම් කවරේද;

(iii) වර්ෂ 2015 සිට 2019 දක්වා ඉහත විශ්වවිද්‍යාලයේ ස්ථාපනය කරන ලද මණ්ඩපවල නම් කවරේද;

(iv) එම මණ්ඩප සඳහා බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ සත්කාරක සේවා සංචාරක ව්‍යාපාර හා සිද්ධි පිළිබඳ කළමනාකරණය මණ්ඩපයක් ආරම්භ කරන්නේද;

(ii) ඒ සඳහා සංචාරක කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන අරුගම්බේ පිහිටි පොතුවිල් ප්‍රදේශය තෝරා ගන්නේද;

(iii) එසේ නම්, පොතුවිල් ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් උක්ත මණ්ඩපය ආරම්භ කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைப் பல்கலைக்கழகங்களுள், மருத்துவம், பொறியியல், விருந்தோம்பல், சுற்றுலா மற்றும் நிகழ்ச்சிகள் முகாமைத்துவம் ஆகிய பாட நெறிகள் நடாத்தப்படுகின்ற பல்கலைக்கழகங் களின் பெயர்கள் வெவ்வேறாக யாவை;

(ii) இலங்கைத் தென்கிழக்குப் பல்கலைக்கழகத் திலுள்ள பீடங்களினதும் அதன் வளாகங்களி னதும் பெயர்கள் யாவை;

(iii) 2015 முதல் 2019ஆம் ஆண்டு வரையில் மேற்குறிப்பிட்ட பல்கலைக்கழகத்திற்குரியதாகத் தாபிக்கப்பட்டுள்ள வளாகங்களின் பெயர்கள் யாவை;

(iv) மேற்குறிப்பிட்ட வளாகங்களுக்குச் சேர்க்கப் பட்டுள்ள மாணவர்களின் எண்ணிக்கை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கைத் தென்கிழக்குப் பல்கலைக்கழத்தில் விருந்தோம்பல், சுற்றுலா மற்றும் நிகழ்ச்சிகள் முகாமைத்துவத்திற்கான வளாகமொன்றை ஆரம்பிப்பாரா;

[ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා]

(ii) இதற்காகச் சுற்றுலாக் கைத்தொழிலுக்குப் புகழ் பெற்ற அருகம்பே அமைந்துள்ள பொத்துவில் பிரதேசம் தெரிவுசெய்யப்படுமா;

(iii) ஆமெனில், பொத்துவில் பிரதேசத்தை மையமாக வைத்து குறிப்பிட்ட வளாகத்தை ஆரம்பிப் பதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the names of the universities that offer courses on medicine, engineering, hospitality services, tourism and event management among the universities in Sri Lanka;

(ii) the names of the faculties and campuses of the South Eastern University of Sri Lanka;

(iii) the names of the campuses of the above University that were established from 2015 to 2019; and

(iv) the number of students enrolled to those campuses?

(b) Will he also inform this House -

(i) whether a campus of hospitality service, tourism and event management would be established in the South Eastern University of Sri Lanka;

(ii) whether Pottuvil area, where Arugam Bay is situated and which is well known for the tourism industry, would be selected for that; and

(iii) if so, the measures that would be taken to establish the above campus in the Pottuvil area?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතරින් වෛද්‍ය, ඉංජිනේරු, සත්කාරක සේවා සංචාරක ව්‍යාපාර හා සිද්ධි පිළිබඳ කළමනාකරණය පාඨමාලා පවත්වනු ලබන විශ්වවිද්‍යාලවල නම් වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.

**වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන පාඨමාලාව පිරිනමන විශ්වවිද්‍යාල**

1. කොළඹ විශ්වවිද්‍යාලය
2. පේරාදෙණිය විශ්වවිද්‍යාලය
3. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
4. කැලණිය විශ්වවිද්‍යාලය
5. යාපනය විශ්වවිද්‍යාලය
6. රුහුණ විශ්වවිද්‍යාලය
7. නැගෙනහිර විශ්වවිද්‍යාලය
8. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
9. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
10. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
11. මොරටුව විශ්වවිද්‍යාලය

**ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන පාඨමාලාව පිරිනමන විශ්වවිද්‍යාල**

1. පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2. යාපනය විශ්වවිද්‍යාලය
3. රුහුණ විශ්වවිද්‍යාලය
4. මොරටුව විශ්වවිද්‍යාලය
5. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
6. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර හා සිද්ධි පිළිබඳ කළමනාකරණය පිළිබඳ අධ්‍යයන පාඨමාලා පිරිනමන විශ්වවිද්‍යාල**

**ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර හා සිද්ධි පිළිබඳ කළමනාකරණය පිළිබඳ අධ්‍යයන පාඨමාලාව**

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

**සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය**

1. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
2. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
3. යාපනය විශ්වවිද්‍යාලය

**ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණය**

කොළඹ විශ්වවිද්‍යාලය

(ii) ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය යටතේ මණ්ඩප කිසිවක් පිහිටුවා නොමැති අතර පීඨවල නම් පහත පරිදි වේ.

- කලා හා සංස්කෘතික පීඨය
- කළමනාකරණ හා වාණිජ්‍යය පීඨය
- ව්‍යවහාරික විද්‍යා පීඨය
- ඉස්ලාමීය අධ්‍යයන හා අරාබි භාෂා පීඨය
- ඉංජිනේරු පීඨය
- තාක්ෂණ පීඨය

(iii) ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය යටතේ මණ්ඩප කිසිවක් ස්ථාපනය කර නොමැත.

(iv) ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය යටතේ කිසිදු මණ්ඩපයක් පිහිටුවා නොමැති බැවින් සිසුන් බඳවා ගැනීමක් සිදු කර නැත.

(ආ) (i) මේ වනතෙක් එවැනි තීරණයක් ගෙන නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා**
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)

Hon. Minister, is there any plan to start a Medical Faculty or a Law Faculty in the South Eastern University?

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

At the moment, there is no formal proposal which has been submitted to us. If a proposal is made, we will certainly give it due consideration. But, your Question stresses the establishment of campuses. I do not think that is where we should begin, not with the establishment of a campus. but, if a particular course of study is appropriate, we can certainly consider that if a recommendation to that effect is made by the Senate of the University and endorsed by the Council of the University.

**ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා**
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)

I heard that there is a process going on to start a Medical Faculty and a Law Faculty there. Since Arugam Bay is a famous place for tourism, there is a request to start a degree course in tourism as well. I heard about that. That is why I asked you whether there is any plan to start those kinds of degree courses.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු මන්ත්‍රීතුමනි, ආරුගම්බේ, පොතුවිල් ප්‍රදේශය සංචාරක කර්මාන්තයට බොහොම සුදුසු, සංචාරක ආකර්ෂණය වැඩි ප්‍රදේශයක් බව මම පිළිගන්නවා. එම නිසා මගේ යෝජනාව අපි the course of study පටන් ගනිමු කියන එකයි. ඊට පස්සේ මණ්ඩපයක් ගැන කල්පනා කරන්න පුළුවන්. හැබැයි, අපි ආරම්භයක් හැටියට ඒ විෂයය ඉගැන්වීම පටන් ගනිමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## දේශීය කිරිපිටි කර්මාන්තශාලා: විස්තර
### உள்நாட்டுப் பால்மா தொழிற்சாலைகள்: விபரம்
### LOCAL MILK POWDER FACTORIES: DETAILS

71/2020

**1.** **ගරු බුද්ධික පතිරණ මහතා (ගරු හේෂා විතානගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு ஹேசா விதானகே சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Hesha Withanage)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති දේශීය කිරිපිටි කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්ත ශාලාවල නම් හා ලිපිනයන් කවරේද;

(iii) වර්ෂ 2015 සිට මේ වනතෙක් එම කර්මාන්තශාලාවල නිෂ්පාදන ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්තමානයේදී දේශීය කිරිපිටි කර්මාන්තශාලා මුහුණ දී ඇති ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் அமைக்கப்பட்டுள்ள உள்நாட்டுப் பால்மா உற்பத்தித் தொழிற்சாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) அந்தத் தொழிற்சாலைகளின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்;

(iii) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரையில் மேற்படி தொழிற்சாலைகளில் உற்பத்தி செய்யப் பட்ட அளவுகள் ஒவ்வொரு வருட அடிப் படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) தற்போது உள்நாட்டுப் பால்மா உற்பத்தித் தொழிற்சாலைகள் முகங்கொடுத்துள்ள பிரச் சினைகளைத் தீர்ப்பதற்கு அமைச்சு மேற் கொள்ளும் நடவடிக்கைகள் யாவை என்ப தையும்;

அவர் இச்சபைக்கு அறிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House -

(i) the number of local milk powder factories situated in Sri Lanka;

(ii) the names and the addresses of the aforesaid factories;

(iii) the quantity of production in the aforesaid factories in each year during the period from the year 2015 up to now, separately; and

(iv) the steps taken by the Ministry to solve the problems encountered by the local milk powder factories at present?

(b) If not, why?

**ගරු ඩී. බී. හේරත් මහතා (පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.பி. ஹேரத் - கால்நடை வளங்கள், பண்ணைகள் மேம்பாடு, பால் மற்றும் முட்டை சார்ந்த கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. D.B. Herath - State Minister of Livestock, Farm Promotion and Dairy and Egg Related Industries)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) තුනකි.

(ii) 01) නම - සී/ස මිල්කො (පුද්ගලික) සමාගම

ලිපිනය - විසිරි වියලන කිරි කර්මාන්ත ශාලාව, අඹේවෙල

[ගරු ඩී. බී. හේරත් මහතා]

02) නම - සී/ස පැල්වත්ත ඩේරි ඉන්ඩස්ට්‍රීස් සමාගම

ලිපිනය - පැලවත්ත, බුත්තල

03) නම - කුරුණෑගල කිරි කර්මාන්ත ශාලාව, නෙස්ලේ ලංකා සමාගම

ලිපිනය - මාකඳුර, ගෝනවිල (වයඹ පළාත)

(iii) කිරි පිටි නිෂ්පාදන ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| මිල්කො (පුද්ගලික) සමාගම | 4,281.53 | 4,624.74 | 7,252.71 | 6,604.25 | 3,252.91 | 4,264.01 |
| පැල්වත්ත ඩේරි ඉන්ඩස්ට්‍රීස් සමාගම | 2,456.10 | 2,876.30 | 4,256.54 | 2,829.42 | 2,425.52 | 3,596.91 |
| නෙස්ලේ ලංකා සමාගම | - | - | 2,544.00 | 2,928.00 | 1,199.00 | 506.00 |

(iv) වර්තමාන රජයේ ප්‍රතිපත්තිය වනුයේ කිරි පිටි වෙනුවට දේශීය දියර කිරි භාවිතය ප්‍රචලිත කිරීම වේ.

කෙසේ වෙතත් සාධාරණ මිලක් යටතේ කිරි මිලදී ගැනීමට සියලුම කිරි සැකසුම්කරුවන් හා සාකච්ඡා කර වැඩ පිළිවෙළක් සැකසීමට කටයුතු සිදු වෙමින් පවතී.

කිරි කර්මාන්තශාලා මුහුණදී ඇති ප්‍රධාන ප්‍රශ්නය වනුයේ අවශ්‍ය තරම් දියර කිරි නිෂ්පාදනය නොවීම වන බැවින් දෛනික කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීම සඳහා,

කිරි ගොවිපොළ වැඩිදියුණු කිරීම

සතුන්ගේ අභිජනන හැකියාව වැඩිදියුණු කිරීම

සත්ව ආහාර සුලභ කිරීම ආදී කටයුතු ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කර ඇත.

(ආ) පැන නොනඟී.

## රාජ්‍ය විශ්වවිද්‍යාලවල බාහිර උපාධි පාඨමාලා: ලියාපදිංචිය නවතාලීම
## அரச பல்கலைக்கழகங்களில் வெளிவாரிப் பட்டப்படிப்புக் கற்கைநெறிகள்: பதிவுகளை நிறுத்துதல்
## EXTERNAL DEGREE COURSES IN STATE UNIVERSITIES: TERMINATION OF REGISTRATION

618/2020

**5. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு துஷார இந்துனில் அமரசேன சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Thushara Indunil Amarasena)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය විශ්වවිද්‍යාලවල බාහිර උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටින සිසුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) බාහිර උපාධි පාඨමාලා හැදෑරීම සඳහා සිසුන් ලියාපදිංචි කිරීම නැවැත්වීම සඳහා මේ වනවිට තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එවැනි තීරණයක් ගැනීමට බලපාන ලද හේතු කවරේද;

(iii) ඒ හේතුවෙන් මේ වනවිට බාහිර උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටින සිසුන් දැඩි දුෂ්කරතාවකට පත්වන බව දන්නේද;

(iv) එසේ නම්, බාහිර උපාධි පාඨමාලා නැවත කඩිනමින් ආරම්භ කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2015ஆம் ஆண்டு முதல் இற்றைவரை அரச பல்கலைக் கழகங்களில் வெளிவாரிப் பட்டப்படிப்புக் கற்கை நெறிகளைப் பயில்வதற்காகப் பதிவுசெய்து கொண்டுள்ள மாணவர்களின் எண்ணிக்கை யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வெளிவாரிப் பட்டப்படிப்புக் கற்கைநெறிகளைப் பயில்வதற்காக மாணவர்களைப் பதிவுசெய்யும் நடவடிக்கைகளை நிறுத்துவதற்கு இன்றளவில் தீர்மானமொன்று மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வாறானதொரு தீர்மானத்தை மேற்கொள்வதற்கு வழிவகுத்த காரணங்கள் யாவை என்பதையும்;

(iii) இதன் காரணமாகத் தற்போது வெளிவாரிப் பட்டப்படிப்பினை மேற்கொள்வதற்குப் பதிவுசெய்துகொண்டுள்ள மாணவர்கள் பாரிய அசௌகரியத்திற்கு முகங்கொடுப்பார்கள் என்பதை அறிவாரா என்பதையும்;

(iv) ஆமெனில், வெளிவாரிப் பட்டப்படிப்புக் கற்கை நெறிகளை மீண்டும் துரிதமாக ஆரம்பிப்பதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House of the number of students registered with the State universities in order to follow external degree courses since 2015 to date?

(b) Will he also inform this House -

(i) whether a decision has been taken to stop the registration of the students for external degree courses by now;

(ii) if so, the reasons for arriving at such a decision;

(iii) whether he is aware that the students who have already registered for external degree courses are severely inconvenienced due to aforesaid measures; and

(iv) if so, the measures that have been taken to restart external degree courses immediately?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

**ඇමුණුම 01*** යටතේ දක්වා ඇත.

(ආ) (i) මෙවන් තීරණයක් ගෙන නැත.

1037 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා තීරණයට අනුව ශාස්ත්‍රවේදී උපාධි පමණක් ප්‍රතිව්‍යුහගත කිරීමකට ලක්කොට නැවත හඳුන්වා දීම සඳහා 2020 අගෝස්තු 28 වන දින නව ලියාපදිංචි කිරීම් තාවකාලිකව නවතන ලදී.

කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1/2021 චක්‍රලේඛනය යටතේ මෙම ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු මේ වන විට තත්ත්ව පාලන කවුන්සලය මඟින් ක්‍රියාත්මක වෙමින් පවතී. අදාළ චක්‍රලේඛය හා කමිටු නිර්දේශ මේ සමඟ අමුණා ඇත.

(ii) ශාස්ත්‍රවේදී බාහිර උපාධි පාඨමාලාව වර්තමාන රැකියා වෙළඳපළට ගැළපෙන ලෙස ප්‍රතිව්‍යුහගත කර ආරම්භ කිරීම සඳහා,

සටහන: වර්තමාන රැකියා වෙළඳපොළේ ප්‍රමුඛ අවශ්‍යතාවන් වන තොරතුරු තාක්ෂණය, භාෂා ප්‍රවීණතාව, ප්‍රායෝගික වැඩ පුහුණුව යන ක්ෂේත්‍ර සැලකිල්ලට ගෙන මෙම චක්‍රලේඛය මඟින් ශාස්ත්‍රවේදී බාහිර උපාධි පාඨමාලාව ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කර ඇත.

ඒ අනුව, වර්තමානයේ ශාස්ත්‍රවේදී බාහිර උපාධිධාරීන් මුහුණ පා සිටින රැකියා වියුක්තියට විසඳුමක් මෙමඟින් ලබාදීමට හැකි වේ.

(iii) එම පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වූ සිසුන් දැඩි දුෂ්කරතාවකට පත් නොවීමට කටයුතු කිරීම සඳහා දැනටමත් පියවර ගෙන ඇත.

(iv) 01/2021 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය යටතේ ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යය 2021 අගෝස්තු මස අග වන විට අවසන් කර බාහිර උපාධි පාඨමාලා නැවත 2021 සැප්තැම්බර් මස 15 සිට ආරම්භ කිරීම සඳහා අදාළ විශ්වවිද්‍යාලවලට උපදෙස් දීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
Sir, I rise to a point of Order. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, මම මේ කියන්න යන කාරණය අධ්‍යාපනයට අදාළ කාරණයක් නොවෙයි. ඒ වාගේම ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමාට අදාළ කාරණයකුත් නොවෙයි. මා මෙය ඉදිරිපත් කරන්නේ ස්ථාවර නියෝග 82(1) යටතේ .

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 82(1) යටතේ ද ඔබතුමිය කියන්නේ?

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ කාන්තා මන්ත්‍රීවරියන් දොළොස් දෙනායි ඉන්නේ. පසුගිය දිනක ගරු උදය ගම්මන්පිල ඇමතිතුමා සම්බන්ධයෙන් පැවති විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදය අවස්ථාවේ තලතා අතුකෝරල මැතිනිය සම්බන්ධ කර ගනිමින් මේ සභාවේ ඇතැම් ඇමතිවරු සහ මන්ත්‍රීවරු හැසිරුණු ආකාරය ගැන මා කනගාටු වෙනවා. මා විශේෂයෙන් කියන්න ඕනෑ, මේ සභාව තිබෙන්නේ හුදෙක්ම කාන්තාවන් ගැන විවේචනය කරන්නවත්, මෙහි ඉන්න මන්ත්‍රීවරුන්ගේ බිරින්දෑවරු හෝ වෙනත් සම්බන්ධතා ගැන කථා කරන්නවත් නොවෙයි කියන එක. මේ සභාව තිබෙන්නේ, ජනතාවගේ ප්‍රශ්න ගැන තීන්දු තීරණ ගන්නයි. එදා ඔය ආසනයේ හිටියේ ඔබතුමායි. ඔබතුමාටත් බිරිඳක්, ඒ වාගේම දියණියක් ඉන්නවා. තලතා අතුකෝරල මැතිනියට වාචික ලිංගික හිංසනයක් සිද්ධ කරන වෙලාවේ ඔබතුමාත් හිනා වෙවී ඔතැන නිහඬව සිටීම පිළිබඳව මන්ත්‍රීවරියක් හැටියට මගේ කනගාටුව වාගේම අප්‍රසාදය මේ වෙලාවේ ප්‍රකාශ කරනවා. ඒ තුළ මන්ත්‍රීවරියන්ගේ වරප්‍රසාදයකට හානි වෙලා තිබෙනවා කියන එක මම මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ගැන සොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමියනි.

මීළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු විපක්ෂ නායකතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### කොවිඩ්-19 රෝග ව්‍යාප්තියේ වර්ධනය
### கொவிட்-19 பரவலின் அதிகரிப்பு
### INCREASED SPREAD OF COVID-19 PANDEMIC

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මෙම ප්‍රශ්නය මතු කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පසුගිය සති කිහිපය තුළ හදිසියේ නැවතත් කොවිඩ්-19 රෝග ව්‍යාප්තිය වැඩි වෙලා, අසාධ්‍ය රෝගීන් සහ මරණ ද වැඩි වී ඇති බව වාර්තා වෙනවා. මෙය ජාතික වැදගත්කමකින් යුත් හදිසි ගැටලුවක් වන බැවින්, පහත ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙනවා.

1. පසුගිය සතිය තුළ ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බව වාර්තා වූ කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව, අසාධ්‍ය රෝගීන් සහ මරණ පිළිබඳ සැලකීමේ දී තවත් කොවිඩ් රැල්ලක් මෙරට නිර්මාණය වෙමින් පවතින බව රජය පිළිගන්නේ ද?

2. පසුගිය දින 10 තුළ වාර්තා වූ කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව, කොවිඩ් මරණ සංඛ්‍යාව, PCR පරීක්ෂණ සංඛ්‍යාව සහ හදිසි ප්‍රතිකාර ඒකක තුළ ප්‍රතිකාර ලබන

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

රෝගීන් සහ රෝහල්වල සාමාන්‍ය වාට්ටුවල ප්‍රතිකාර ලබන කොවිඩ් රෝගීන් සංඛ්‍යාව මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

3. මේ වන විට ලෝකය පුරා හඳුනා ගෙන ඇති කොවිඩ් ප්‍රභේද මොනවාද? ඒවායින් මෙරට තුළ වාර්තා වී ඇති ප්‍රභේද මොනවාද?

4. දැනට මෙරට ලබා දෙන එන්නත් වර්ග වන ඉන්දියාවේ නිෂ්පාදිත Covishield AstraZeneca එන්නත, චීනයේ නිෂ්පාදිත Sinopharm එන්නත, රුසියාවේ නිෂ්පාදිත Sputnik V, ඇමෙරිකාවේ නිෂ්පාදිත Pfizer-BioNTech සහ Moderna යන එන්නත් වර්ග පහ අතුරින් ඒ එක් එක් ප්‍රභේද සඳහා සාර්ථකත්වය කොපමණ ද?

5. තවත් කොවිඩ් රැල්ලක් නිර්මාණය වෙමින් පවතින වාතාවරණය තුළ කොවිඩ් පැතිරීම වැළැක්වීම සඳහා පනවා තිබූ රෙගුලාසි ලිහිල් කිරීම සුදුසු වන්නේ ද?

ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමියගෙන් පුංචි පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙනවා. ඊයේ රෑ ප්‍රවෘත්ති විකාශයේ දී විශේෂඥ වෛද්‍ය හේමන්ත හේරත් මැතිතුමා ප්‍රකාශ කළා, ප්‍රවාහන ක්ෂේත්‍රයේ සිදුවන ක්‍රියාදාම පිළිබඳ එතුමාට වග කියන්න බැහැයි කියලා. ඒ කියන්නේ, දුම්රිය තුළ ඒ දුරස්ථභාවය තිබෙනවා ද නැද්ද, එහෙමත් නැත්නම් බස් රථ තුළ ඒ නියාමනය සිදු වෙනවා ද, නැද්ද කියන එක පිළිබඳ එතුමාට වගකියන්න බැහැ කියන එක. මම ඔබතුමියගෙන් අහන්න කැමැතියි, මෙවැනි තත්ත්වයක් තුළ එවැනි ප්‍රකාශයක් කිරීම සුදුසු ද, නුසුදුසු ද කියලා.

ඒ වාගේම මම ඔබතුමියට තවත් කාරණයක් මතක් කරන්න කැමැතියි. මහාචාර්ය මලික් පීරිස් මහත්මයා මේ ප්‍රශ්නය පිළිබඳ හොඳ දැනුමක් තිබෙන ප්‍රවීණ වෛද්‍යවරයෙක්. ඉදිරි සති කිහිපය තුළ නිර්මාණය වන මහා භයංකාර කොවිඩ් රැල්ලක් පිළිබඳ එතුමා අනාවැකියක් පළ කර තිබෙනවා. ඒ පිළිබඳ රජය ගන්නා ක්‍රියා මාර්ග මොනවාද?

6. සියලු රජයේ නිලධාරින්ට මෙම සතියේ සිට අඛණ්ඩව රාජකාරියට වාර්තා කිරීමට නියම කිරීම තුළ කොවිඩ් රෝගය සම්බන්ධයෙන් අවදානම් කාණ්ඩ ලෙස සැලකෙන නිධන්ගත රෝගවලින් පෙළෙන පිරිස්, ගර්භිණී සහ කුඩා දරුවන් සිටින නිලධාරිනියන්ගේ ජීවිත අවදානමකට ඇද දැමීමක් සිදු නොවන්නේ ද?

ගරු සෞඛ්‍ය ඇමතිතුමියනි, මම ඔබතුමියගෙන් බොහොම සානුකම්පිතව ඉල්ලීමක් කරන්න කැමැතියි. විශේෂයෙන්ම ගර්භිණී මව්වරු, කිරි දෙන මව්වරු, කුඩා දරුවන් ඉන්න මව්වරු යනාදී රාජ්‍ය සේවකයන් අනිවාර්ය රාජ්‍ය සේවයට කැඳවීම පිළිබඳ කරුණාකර අදම තීන්දුවක් ගන්න. විශේෂයෙන් මේ පවතින භයංකාර රැල්ල තුළ එය සලකා බලා ඒ පිළිබඳ විශේෂ තීන්දුවක් ගෙන කටයුතු කරන්න.

7. සෞඛ්‍ය අංශ සතුව පවතින ICU beds, ඔක්සිජන් සැපයුම, පරීක්ෂණ ධාරිතාව සහ සෞඛ්‍ය නිලධාරින්ගේ ප්‍රමාණය පිළිබඳ රජය සෑහීමකට පත්වන්නේ ද? එම ප්‍රමාණය ඉදිරියේ දී ඇති විය හැකි තත්ත්වය පාලනය කිරීමට ප්‍රමාණවත් ද? ඒ පිළිබඳ විශේෂඥයන්ගේ පුරෝකථන පිළිබඳ රජය සැලකිලිමත් වන්නේ ද? පසුගිය අවස්ථා කිහිපයේදීම අප අවධාරණය කළ පරිදි, රජය විසින් අලුතින් ඇති කරන ලද ICU beds, ඔක්සිජන් සැපයුම් සහ ප්‍රතිකාර ධාරිතාවන් කොපමණ ද?

මම මේ වෙලාවේ මේ කාරණා ගරු ඇමතිතුමියගේ අවධානයට යොමු කරන්න කැමැතියි. මා ළඟ තිබෙන මේ ඡායාරූප ටික ඕනෑ නම් ඔබතුමියට එවන්නම්. මේ ඡායාරූපවලින් පෙන්නුම් කරන්නේ කොළඹ රෝහල් පද්ධතියේ අද තිබෙන තත්ත්වය. අද කොවිඩ් රෝගීන් ඉන්නේ රෝහල්වල කොරිඩෝවල පැදුරු දමාගෙනයි. ඒ අයට ඇඳන් නැහැ; ප්‍රමාණවත් ICU beds නැහැ. ගරු කථානායකතුමනි, මම මේ ඡායාරූප සියල්ල **සභාගත*** කරනවා.

ගරු ඇමතිතුමියනි, මම ඔබතුමියට මේවා එවන්නම්. කරුණාකර ඔබතුමිය සොයා බලන්න රාගම රෝහල, කළුබෝවිල රෝහල සහ ජාතික රෝහලේ අද තිබෙන තත්ත්වය. ඒ වාගේම අද දවස වන විට රිජ්වේ ආර්යා ළමා රෝහලේ අධ්‍යක්ෂතුමාත් කියනවා, රෝහල තුළ ලෙඩ්ඩු පිරී ඉතිරී ගිහින් කියලා. මේ වාගේ බරපතළ ප්‍රශ්නයක් ඇති වී තිබෙනවා. මේ ඇති වී තිබෙන "ඩෙල්ටා" රෝගයේ රැල්ල තුළ අපේ සෞඛ්‍ය පද්ධතියට මේක දරා ගන්න පුළුවන්ද?

ඒ වාගේම රෙගුලාසි අඩු කිරීම තුළින් ඇත්ත වශයෙන්ම බරපතළ තත්ත්වයක් නිර්මාණය වනවා නේද කියන ප්‍රශ්නය මම ඔබතුමියගෙන් මේ අවස්ථාවේ අහන්න කැමැතියි, ගරු ඇමතිතුමියනි. මම මේ ඡායාරූප ටික ඔබතුමියට දෙන්නම්. අද ලෙඩ්ඩු ඉන්නේ ඇඳන්වල නොවෙයි. ඔවුන් වාඩි වෙලා ඉන්නේ බිම. ඒකයි අද තත්ත්වය.

8. මේ වන විට කොවිඩ් - 19 ආසාදිත දරුවන් සංඛ්‍යාව ද සැලකිය යුතු ලෙස ඉහළ යමින් තිබෙනවා. එමෙන්ම දරුවන් කොවිඩ් වැලඳී මිය ගොස් ඇති බව ද වාර්තා වෙනවා. ඒ පිළිබඳ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්නේද? දරුවන් මෙතෙක් එන්නත්කරණයට ලක් කර නොමැති බැවින්, මෙම තත්ත්වය පාලනයට රජය ගන්නා ක්‍රියා මාර්ග මොනවාද?

ගරු ඇමතිතුමියනි, විශේෂයෙන්ම රටවල් ගණනාවක් වයස අවුරුදු 12ට වැඩි දූ දරුවන් එන්නත් කිරීමේ පියවර ගෙන තිබෙනවා. අපේ රටේ එන්නත්කරණ ප්‍රතිපත්තියට වයස අවුරුදු 12ට වැඩි දූ දරුවන් ඇතුළත් කරලා ඔවුන්ට ද එන්නත් ලබා දෙනවා ද? වයස අවුරුදු 12ට වැඩි, විශේෂයෙන්ම අපොස (උසස් පෙළ) විභාගයට මුහුණ දෙන දූ දරුවන් ද ඇතුළුව විභාගවලට මුහුණ දෙන දූ දරුවන්ට එන්නත් ලබා දීමට කටයුතු කරනවාද?

ගරු ඇමතිතුමියනි, මම විශේෂ කාරණයක් කෙරෙහි ඔබතුමියගේ අවධානය යොමු කරවන්න කැමැතියි. කොවිඩ් - 19 වයිරසයේ අලුත් ප්‍රභේද ඇති වීමේ තත්ත්වය තුළ එන්නත්වල ශක්තිය පිළිබඳව අද විවිධ අදහස් පළ වනවා. මා මේ කාරණය කියන්නේ අර්බුදයක් ඇති කරන්න නොවෙයි. මමත් රටේ ජනතාවට කියනවා, සියලුදෙනා එන්නත්කරණ ක්‍රියාවලියට සහභාගි වෙන්න කියා. එහෙම කියන අතරතුර මම කියනවා, වයස අවුරුදු 60ට වැඩි පුරවැසියන්ට තුන්වැනි එන්නතකුත් ලබා දෙන්න ඊශ්‍රායලය තීන්දුවක් ගෙන තිබෙන බව. ගරු සෞඛ්‍ය ඇමතිතුමියගෙන් මම අහනවා, තුන්වැනි එන්නත පිළිබඳ අපේ රටේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා? ගරු ඇමතිතුමියනි, මා විශේෂයෙන්ම මේ ප්‍රශ්නය අහන්න හේතුවක් තිබෙනවා. පිට රටවල තවත් ප්‍රභේදයක් තිබෙනවා ලු, Delta Plus කියලා. අද ඒ වාගේ ප්‍රභේද ගණනාවක් තිබෙනවා. මේ ඉදිරිපත් කරපු ප්‍රශ්නවලට මම ඔබතුමියගෙන් පැහැදිලි පිළිතුරක් බොහොම කාරුණිකව බලාපොරොත්තු වෙනවා. සෞඛ්‍ය පහසුකම් නැති රෝගීන් වෙනුවෙන් ඔබතුමිය ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද?

බොහොම ස්තුතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු විපක්ෂ නායකතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුර සැපයීම සඳහා මම මේ මස 05 වන දා දක්වා කල් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේදී ස්ථාවර නියෝග 27 (2) යටතේ සහ වෙනත් අවස්ථාවලදී කොවිඩ්-19 සම්බන්ධයෙන් ගරු විපක්ෂ නායකතුමා එකොළොස් වතාවක් අසා තිබෙනවා. ඒ එකොළොස් වතාවේදීම මම අවශ්‍ය තොරතුරු සහ පිළිතුරු සපයා තිබෙනවා. කොවිඩ් වසංගතය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේදී විවිධ මැති ඇමතිවරු පහළොස් වතාවක් ප්‍රශ්න කර තිබෙනවා. මම ඒ සියල්ලට පිළිතුරු ලබා දී තිබෙනවා. මේ සම්බන්ධයෙන් ද දීර්ඝ පිළිතුරක් ලබා දීමට අවශ්‍ය නිසා මම අනිද්දා වන තෙක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම ඇත්තටම ස්තුතිවන්ත වෙනවා, අපේ සෞඛ්‍ය ඇමතිතුමියට. එතුමිය එකොළොස් වතාවක් සහ පහළොස් වතාවක් කොවිඩ්-19 සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් කළ බව කිව්වා. හොඳයි, අද අහපු ප්‍රශ්නයට ඔබතුමිය 05වන දා පිළිතුර සපයන්න. එහි කිසිම ගැටලුවක් නැහැ. හැබැයි, එක ගැටලුවක් තිබෙනවා. ඒ ගැටලුව මේකයි. මේ ප්‍රශ්නයට පිළිතුර ලබා දීමේ ප්‍රමාදය තුළ යම් සැකයක් ඇති වෙනවා, මේ සිදු වන ක්‍රියාදාමය පිළිබඳව මේ රජය පවා updated ද කියා. "ඩෙල්ටා" ඇතුළු අලුත් ප්‍රභේද ඇති වීමේ ප්‍රශ්නය එක්ක මතු වන මහා රැල්ල හමුවේ රජයේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය විධිමත්ව ක්‍රියාත්මක වනවා කියන විශ්වාසය රටේ ජනතාව තුළ ඇති කරන්න ඕනෑ. රටේ ජනතාව තුළ එම විශ්වාසය ඇති කිරීම සඳහා ඔබතුමිය පැය විසිහතරක් තුළ විධිමත්ව උත්තර දෙන්න සූදානම් වෙලා ඉන්න ඕනෑ. එහෙම කළොත්, රටේ ජනතාවට ලොකු විශ්වාසයක් ඇති වෙනවා, මේ රජය බොහොම කාර්යක්ෂමයි, මේ ප්‍රශ්නවලට විධිමත් විසඳුම් ලබා දෙන්න හැකියාවක්, කල් ඉල්ලන්නේ නැතිව ඊළඟ දවසේම උත්තර දෙන්න හැකියාවක් මේ රජයට තිබෙනවා කියා. එවිට ඒ මතය ජනතාව තුළ ඇති වෙනවා. එච්චරයි මා කියන්නේ. ඉදිරියේදී එම විශ්වාසය රටේ ජනතාව තුළ ඇති කරන්න කියා මම ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නවලට පිළිතුර ලබා දීමට පැය 24ක කාලයක් පමණයි ලබා දෙන්නේ. නමුත්, නියමිත ප්‍රශ්නය අසන අතර මැදදීත් එතුමා කරුණු ඉදිරිපත් කරනවා. ස්ථාවර නියෝග 27(2) යටතේ කොවිඩ් වසංගත තත්ත්වය ගැන අසන ලද ප්‍රශ්නවලට මම එතුමාටම හත් වතාවක් උත්තර දී තිබෙනවා. ඊට අමතරව, කොවිඩ් වසංගතය පිළිබඳව එතුමා විසින් අසන ලද ස්ථාවර නියෝග 27(2) යටතේ නොවන ප්‍රශ්නවලට තවත් හතර වතාවකදී උත්තර දී තිබෙනවා. ඒ වාගේම, සභාව කල් තබන අවස්ථාවේ අසනු ලබන ප්‍රශ්න ද ඇතුළුව සමස්තයක් වශයෙන් පහළොස් වතාවකදී උත්තර දී තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ දින දෙකක විවාදයක් ද පැවැත්වුණා, කොවිඩ් වසංගත තත්ත්වය සම්බන්ධයෙන්.

ගරු විපක්ෂ නායකතුමනි, පිළිතුර ලබා දීමට පැය 24ක් කල් ඉල්ලීමෙන් පෙන්නුම් කරන්නේ ආණ්ඩුවේ තත්ත්වය වත්, ආණ්ඩුවේ ස්ථාවරය වත්, ආණ්ඩුවේ updated නැති බව වත් නොවෙයි. මේ උත්තරීතර පාර්ලිමේන්තුවට පිළිතුරු ලබා දීමේදී මා සූදානමක් ඇතිව පිළිතුරු ලබා දිය යුතුයි. මේ දක්වා කෙටි දැනුම් දීමකදී පවා මම පිළිතුරු ලබා දුන්නා. මේ ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්න මා ඉල්ලන්නේ පැය 24ක කාලයක් පමණයි.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඊළඟට, මහජන ආරක්ෂක අමාත්‍ය ගරු සරත් වීරසේකර මැතිතුමාගේ ප්‍රකාශය.

## මහජන ආරක්ෂක අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## பொதுமக்கள் பாதுகாப்பு அமைச்சரினது கூற்று
## STATEMENT BY MINISTER OF PUBLIC SECURITY

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekera - Minister of Public Security)

ගරු කථානායකතුමනි, පසුගිය පාර්ලිමේන්තු රැස්වීම් සතියේ ගරු මනූෂ නානායක්කාර මන්ත්‍රීතුමා දැනුවත්ව හෝ නොදැනුවත්ව ඉතා බරපතළ චෝදනාවක් කළා, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ක්‍රියා දාමයක් පිළිබඳව. ඒ වෙලාවේ මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටියා එයට පිළිතුරු දීමට ඉතා ළඟදීම අවස්ථාවක් දෙන්න කියා. ඒ අවස්ථාව මට ලබා දීම ගැන ඔබතුමාට මගේ ස්තුතිය පිරිනමනවා, ගරු කථානායකතුමනි.

ගරු මනූෂ නානායක්කාර මන්ත්‍රීවරයා විසින් කරන ලද ප්‍රකාශය මම හොඳින් ශ්‍රවණය කළා. එතුමා නඟන ලද එක් එක් චෝදනාවලට, කරන ලද එක් එක් සාවද්‍ය ප්‍රකාශවලට මා මෙසේ පිළිතුරු දෙනවා.

එතුමාගේ ප්‍රධාන චෝදනාව, පොලීසියේ රථවාහන පාලනය නවීකරණය කරන මුවාවෙන් අමාත්‍යාංශයේ විශාල වංචාවක් සිදු කරන්න යන බවයි. එහිදී එතුමා කියනවා, මා මේ සම්බන්ධයෙන් කීප දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර ඒ හරහා වාර්තාවක් කැඳවා තිබෙනවා කියා. ඒක වැරැදියි. මා කිසිදු වාර්තාවක් කැඳවා නැහැ. ඒ කමිටුවේ රාජකාරිය, රථවාහන පාලනය ඇතුළුව පොලීසිය නවීකරණය කිරීම සඳහා සංකල්ප ගොඩනඟා නියම අවශ්‍යතා හඳුනාගෙන, අවශ්‍ය කරන ඉලක්ක කරා යෑමට ව්‍යාපෘති යෝජනාවක්, එසේ නැත්නම් project report එකක්, නැත්නම් Terms of Reference කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමයි. මේ කර්තව්‍යය ඉතා පිරිසිදුව සහ විනිවිදභාවයෙන් කරන්න ඕනෑ නිසා මමයි ඒ කමිටුව යෝජනා කරලා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ගත්තේ. එම ක්ෂේත්‍රය පිළිබඳ රටේ සිටින ප්‍රවීණයන් ඒ කමිටුවට පත් කරන්න තීරණය කළේ මමයි. කැබිනට් මණ්ඩලය අනුමත කළ ඒ කමිටුවේ සාමාජිකයන් වන්නේ, අතිරේක ලේකම් - මහජන ආරක්ෂක අමාත්‍යාංශය; ප්‍රධාන විධායක නිලධාරි - තොරතුරු, සන්නිවේදන හා තාක්ෂණ ආයතනය; ප්‍රධාන තාක්ෂණ නිලධාරි - තොරතුරු, සන්නිවේදන හා තාක්ෂණ ආයතනය; ප්‍රධාන විධායක නිලධාරි - ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය; අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් - ජාතික ක්‍රමසම්පාදන හා සැලසුම් සහ මූල්‍ය; ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි - අධ්‍යක්ෂ, නීති කොට්ඨාසය; ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - පොලිස් ප්‍රවර්ධන දිසාව; ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි - අධ්‍යක්ෂ, රථවාහන පාලන හා මාර්ග ආරක්ෂාව; සහකාර පොලිස් අධිකාරි - අධ්‍යක්ෂ, තොරතුරු සන්නිවේදන කොට්ඨාසය; සහකාර පොලිස් අධිකාරි -තොරතුරු තාක්ෂණ කොට්ඨාසය සහ මා විසින් පත් කරන ලද උපදේශකවරයෙක්.

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

ගරු කථානායකතුමනි, කාටත් තේරෙනවා මෙතැනදී එක්කෙනෙකු පමණක් නොවෙයි, මේ ක්ෂේත්‍රයේ ඉන්න ඉහත සඳහන් ප්‍රවීණයන් සියලුදෙනා එක් වී තමයි තීරණය ගන්නේ කියලා. වංචාවක් කරනවා නම් ඒ සියලු දෙනා එක් වෙලා තමයි වංචාව සිදු කරන්න ඕනෑ. ඒ සියලු දෙනා අත්සන් කරලා තමයි ඕනෑම වාර්තාවක් ඉදිරිපත් කරන්නත් ඕනෑ. ඊළඟට එතුමා කිව්වා, මේ කමිටුව පොලීසියට ඉදිරිපත් කරපු ව්‍යාපෘති වාර්තාව - project proposal - සභාගත කරනවා කියලා. ඒකත් සම්පූර්ණයෙන් අසත්‍යයක්. මේ කමිටුව තවමත් කිසිම project proposal එකක් හෝ කිසිම වාර්තාවක් ඉදිරිපත් කර නැහැ.

ඊළඟට එතුමා කියනවා, ඒ ව්‍යාපෘති වාර්තාවේ තිබෙන උපකරණ ගෙන්වන්නේ, සෙකියුරාටෙක් ආයතනයයි කියලා. මේ ආයතනයෙන් කිසිම උපකරණයක් ගෙන්වන්න කිසිදු තීරණයක් ගෙන නැහැ. එහෙම ගෙන්වලාත් නැහැ; ඔවුන්ට ගෙන්වන්නත් බැහැ. ඒකත් අසත්‍යයක්. එය සෙකියුරාටෙක් ආයතනය විසින් කරන ලද ඉදිරිපත් කිරීමක් පමණයි; presentation එකක් පමණයි. මේ වාගේ ඉදිරිපත් කිරීම් වෙනත් සමාගම්වලින් ද කර තිබෙනවා. විශ්වවිද්‍යාල සිසුන් පවා එහෙම ඉදිරිපත් කිරීම් කර තිබෙනවා.

ඊළඟට, එතුමා චෝදනා කරනවා, Securatec Lanka (Pvt.) Limitedහි අධ්‍යක්ෂ ධුරයක් දරන ICTA එකේ උපදේශක කෙවින් අරවින්ද මහතා මේ කමිටුවේ ඉන්නවා කියලා. ඒකත් සම්පූර්ණයෙන් අසත්‍යයක්. එහෙම කිසි කෙනෙක් මේ කමිටුවේ නැහැ. එතුමා කරන ඊළඟ චෝදනාව, මා විසින් පත් කරන ලද උපදේශකවරයෙකු වශයෙන් සිටින අරුණ අමරසේකර මහතා මේ සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ක්‍රියා කොට තිබෙනවා කියන එක. මනූෂ නානායක්කාර මන්ත්‍රීවරයා පෙන්වන ලද උපකරණ ගෙන්වන්නේ Securatec Lanka (Pvt.) Limited කියන සමාගම. අමරසේකර මහතා ඒ සමාගමේ කවරදාක වත් සේවය කර නැහැ. නමුත් ඔහු Securatec Solutions කියන සමාගමේ සේවය කර, ව්‍යාපෘතියකින් පසුව අස් වී තිබෙනවා. සෙකියුරාටෙක් සමාගමට යම් ඉදිරිපත් කිරීමක් කරන්න ඒක කිසිම බාධාවක් වෙන්න පුළුවන්කමක් නැහැ. ඔහු TRC එකේ හිටපු අධ්‍යක්ෂ ජෙනරාල් මෙන්ම විදුලි සංදේශ තාක්ෂණය ගැන වසර 25ක අත් දැකීම් බහුල කෙනෙක්. ඒ නිසායි මා ඔහු පත් කළේ.

ඊළඟට එතුමා කියනවා, දඩ මුදල් සම්බන්ධව. දඩ මුදල්වලින් අපට මාසයකට රුපියල් මිලියන 8.3ක් පමණ ගත හැකියි කියනවා. එතුමා ළඟ හඬ පටයක් ද තිබෙනවා ලු.

මේකත් ජනතාව නොමඟ යැවීමක්. මේක පටිගත කරලා තිබෙන්නේ, සෙකියුරාටෙක් සමාගම විසින් කරන ලද විවෘත ඉදිරිපත් කිරීමකදී. එය, මා ඇමති ධුරයට පත්වන්නත් පළමු ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව, පොලිස්පතිතුමාගේ අනුමැතියෙන් ෂැන්ග්‍රි-ලා හෝටලයේදී පොලිස් නිලධාරින්ට කරන ලද presentation එකකදී අහපු ප්‍රශ්න - උත්තර සාකච්ඡාවක්. ඒක හොරෙන් කරපු එකක් නොවෙයි. ඊට පස්සේ පොලිස්පතිතුමාගේ නියෝගය පරිදි පොලිස් කාර්යාලයේදී නැවතත් සාකච්ඡාවක් තිබිලා තිබෙනවා. ඒ, මා එන්නට පළමුව. ඒ නිල සාකච්ඡාවල කරපු කථා තමයි පටිගත කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, එක්තරා පුද්ගලයෙකු කාගේදෝ කොන්ත්‍රාත්තුවකට -බොහෝ විට සෙකියුරාටෙක් සමාගම සමඟ තරගයක් තිබෙන සමාගමක කීමට- ඒ සාවද්‍ය තොරතුරු සමඟ පෙත්සමක් ලියාගෙන මාධ්‍ය සාකච්ඡාවක් කරන්න සූදානම් වුණා. ඊට පස්සේ ඒවා අසත්‍ය තොරතුරු කියලා දැන ගත්තාම ඒ පුද්ගලයා මාධ්‍ය සාකච්ඡාව අවලංගු කරලා පෙත්සම හකුළා ගත්තා. ඒ හකුළා ගත් පෙත්සම තමයි මනූෂ නානායක්කාර මන්ත්‍රීවරයා මේ පාර්ලිමේන්තුවේදී කිසිම සෙවිල්ලක්, බැලිල්ලක් නැතුව එදා දිග හැරියේ. ගරු කථානායකතුමනි, කැබිනට් අනුමත කොමිටියෙන් කරන්නේ, ශක්‍යතා අධ්‍යයනයක් කරලා පොලීසියේ නියම අවශ්‍යතාව හඳුනාගෙන සංකල්පීය වශයෙන් ඒ යෝජනාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන එක පමණයි. ඒ ශක්‍යතා අධ්‍යයනය කරන්න පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් රුපියල් මිලියන 22ක් ඉල්ලලා තිබෙනවා. නමුත් අමරසේකර මහතා ඇතුළු ඒ කොමිටිය කිසිදු මුදලක් වැය නොකොට ඒ අධ්‍යයනය දැන් සියයට 95ක් සිදු කර අවසන්. තවම කිසිම ව්‍යාපෘති යෝජනාවක් ඔවුන් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර නැහැ. එහෙම ඉදිරිපත් කළාට පසුව ඒවායේ පිරිවිතර, ඒ කියන්නේ specifications හදලා, ටෙන්ඩර් කැඳවලා, තාක්ෂණික ඇගයීම් කරලා මිලදී ගන්නේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ කැබිනට් අනුමත උපකොමිටියක් මඟින්. මේ කොමිටිය හෝ මගේ උපදේශකවරයා හෝ ඒ කිසිම දේකට සම්බන්ධ වෙන්නේ නැහැ. ඕනෑම සමාගමකින් අයථා ලෙස උපකරණ ගෙන්වනවා නම් ඒ වංචාවට මගේ ලේකම්වරයා, පොලිස්පතිතුමා සහ කැබිනට් අනුමත උපකමිටුව ඇතුළු සියලුදෙනාම ඒ වංචාවට සහභාගි වෙන්න ඕනෑ. ඒක එහෙම වෙන්න බැරි බව ඔබ සියලුදෙනාම දන්නවා. මනූෂ නානායක්කාර මන්ත්‍රීවරයා එදා පාර්ලිමේන්තුවේදී වාද කරන විෂය පථයට පරිබාහිරව කරන ලද ඒ බරපතළ චෝදනාව ඉතාම සාවද්‍ය, ජනතාව නොමඟ යවනසුළු ප්‍රකාශයක් බව මා මෙහිදී කියා සිටිනවා.

ගරු කථානායකතුමනි, මාර්ග අනතුරුවලින් රටේ බොහෝ අය මිය යනවා. පසුගිය වසර දහයේ පමණක් 27,000ක් දෙනා ජීවිතක්ෂයට පත් වුණා. මේ වසරේ අද වෙන තුරු 1,500කට වඩා මහාමාර්ගය මත රිය අනතුරුවලින් මැරිලා තිබෙනවා. ඒ වාගේම ජනතාවට දඩ මුදල් ගෙවන්න, නැවත රියැදුරු බලපත්‍රය ගන්න සෑහෙන දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිදු වෙනවා. ඒක නිසා, තමාගේ credit card එකකින් හෝ වෙනත් යම් විධියකින් එවෙලේම දඩ මුදල් ගෙවා ඒ බව රථවාහන පොලිස් නිලධාරියාගේ ජංගම දුරකථනයට දැන්විය හැකි ක්‍රමයක් අපි සකස් කළ යුතුයි. එවැනි මාර්ග වැරදි යම් කිසි ප්‍රමාණයක් සිදු කළ පසුව පසුව රියැදුරු බලපත්‍රය අවලංගු කරන්නත් කටයුතු කරන්න පුළුවන්. එතකොට මාර්ග නීති කඩ කරන්න මිනිස්සු බය වෙනවා. ඒක අනතුරු අඩු කරන එක ක්‍රමයක්. එහෙම නම් මේ කොමිටියේ එක් කාර්යභාරයක් තමයි ඒ වාගේ අවශ්‍යතා හඳුනා ගන්නා එක. ඒකට විවිධ සමාගම්, පුද්ගලයන් ඉදිරිපත් කිරීම් කර තිබෙනවා. Specifications හදලා, විවෘත ටෙන්ඩර් කැඳවලා, උපකරණ මිලදී ගන්න ඔවුන් කිසිසේත්ම සහභාගි වෙන්නේ නැහැ. මේ අභූත චෝදනාව කළ වහාම ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා පොලිස්පතිතුමාට මම නියෝග කළා. ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එය පැවරුවා. ඔවුන්ගේ වාර්තාව දැන් මගේ අතේ තිබෙනවා. ඔවුන්ද මේ චෝදනාව සාවද්‍යයි කියා තිබෙන අතර අවසානයේ CID එක කියා තිබෙනවා, "ඉහත කරුණු අනුව මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා පොලීසිය නවීකරණය සඳහා අදාළ අංශවලින් විස්තර ලබාගෙන, ඒවා මෙම කමිටුව හරහා සාකච්ඡා කිරීමෙන් අදාළ නිර්දේශ ලබා දීමේ කටයුතු මේ වන විටත් සාකච්ඡා මට්ටමේ පවතින බැවින් මේ තුළින් කිසිදු භාණ්ඩයක් සඳහා මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැති අතර, රථ වාහන දඩ මුදල් වංචා කිරීමක් සම්බන්ධයෙන් කරුණු අනාවරණ වී නැත" කියලා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්නට ඕනෑ. මම වසර 35ක් නාවික හමුදාවේ සේවය කර තිබෙනවා. කිසිම දූෂිත චෝදනාවක් නැහැ. මම වසර හතරක් සිවිල් ආරක්ෂක බලකායේ සේවය කර තිබෙනවා. කිසිම දූෂිත චෝදනාවක් නැහැ. මම වසර පහක් නියෝජ්‍ය අමාත්‍යවරයෙකු වශයෙන් ක්‍රියා කර තිබෙනවා. කිසිම දූෂිත චෝදනාවක් නැහැ.

මගේ පසුබිම ඒකයි. ඒ අවංකභාවය මා උපයා ගත් එකක්. මම අයථා ලෙස මුදල් උපයා ගන්නේත් නැහැ; මගේ යටතේ වෙන කාටවත් එහෙම කරන්න ඉඩ දෙන්නේත් නැහැ. ඒක, මගේ විදුහලෙන් සහ දෙමව්පියන්ගෙන් ලැබූ ආභාසය. ඒ ප්‍රතිපත්තියේ මා දිගටම ඉන්නවා.

ස්තුතියි.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේක ඒ ගැන විවාදයක් කරන වෙලාවක් නොවෙයි. ඒක වෙන වෙලාවක ගන්න.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
එතුමා හත් වතාවක් මගේ නම සඳහන් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට මොකක්ද කියන්න තිබෙන්නේ?

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු කථානායකතුමනි, මට සාධාරණ වේලාවක් දෙන්න.

ගරු ඇමතිතුමාගේ කථාවේදී මගේ නම හත් වතාවක් සඳහන් කරලා එතුමා නිර්දෝෂී වෙන්න උත්සාහ කළා. මම කියන්නේ නැහැ, මේක ඇමතිවරයා - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ සම්බන්ධව වෙනම විවාදයක් ඉල්ලා ගන්න. [බාධා කිරීම්] මෙතැන පැහැදිලි කිරීම් කරන්න බැහැ. [බාධා කිරීම්] ඇමතිවරයාගේ ප්‍රකාශයට පැහැදිලි කිරීම් කරන්න බැහැ. [බාධා කිරීමක්]

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
එතුමා මගේ නම කිව්වා. මගේ නම කියපු නිසා මට කථා කරන්න ඉඩ දෙන්න, ගරු කථානායකතුමනි. [බාධා කිරීම්] මගේ නම කිව්වා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேக்கர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
ගරු කථානායකතුමනි, එතුමා කළ චෝදනාවට තමයි මම පිළිතුරු දුන්නේ. ඒ නිසා තමයි නම කිව්වේ. [බාධා කිරීම්] ඒකට උත්තර දුන්නා. ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා වාඩිවෙන්න. [බාධා කිරීම්]

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ඒ ගැන තමයි මම කියන්න හදන්නේ. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ අවස්ථාවේ විවාදයකට යන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. ඒ සම්බන්ධයෙන් වෙනම විවාදයක් ඉල්ලන්න. [බාධා කිරීමක්] ඇමතිතුමාගේ ප්‍රකාශයට වෙනම විවාදයක් ඉල්ලන්න. ඒක දෙන්නම්. [බාධා කිරීමක්]

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු කථානායකතුමනි, මේක වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයක්. කරුණාකර ඔබතුමා මට ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද වරප්‍රසාද ප්‍රශ්නය?

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
වරප්‍රසාද ප්‍රශ්නය මේකයි, ගරු කථානායකතුමනි. මම එදා මේ පාර්ලිමේන්තුවේ කථාව කරලා අවසන් වෙනකොටම ගාල්ලේ හබරාදුව සහ අහංගම පොලිස් ස්ථාන දෙකට කථා කරලා මගේ නමට තිබෙන වැරැදි මොනවාද කියලා හොයන්න පටන් ගත්තා. [බාධා කිරීමක්] එන්න, මුහුණට කථා කරන්න. මේ අහන්න. දැන් කිව්වා, අරුණ අමරසේකර කියන පුද්ගලයා මේ company එකේ සාමාජිකයෙක් නොවෙයි කියලා. මේ search එක කළේ ජූලි මාසයේ 13වැනි දා. එම search එක අනුව අරුණ අමරසේකර මේ company එකේ, - [බාධා කිරීමක්] Companies කිහිපයක් තිබෙනවා. "Securatec" සමාගම විතරක් නොවෙයි, "Securatec Lanka", "Securatec Solutions" - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔය පැහැදිලි කිරීම විවාදයකදී කරන්න. [බාධා කිරීම්]

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු කථානායකතුමනි, මට පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන පැහැදිලි කිරීමක් නැහැ. [බාධා කිරීමක්] ඒකට වෙනම විවාදයක් ඉල්ලන්න, අපි දෙන්නම්. [බාධා කිරීම්]

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
මේක පාර්ලිමේන්තුව. ඇත්ත හෙළි කරනවාට බයද? [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම, ගරු සභානායකතුමා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
### பாராளுமன்ற அமர்வு
### SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (විදේශ අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - வெளிநாட்டு அலுவல்கள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Foreign and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
### தனி உறுப்பினர் சட்டமூலங்கள்
### PRIVATE MEMBERS' BILLS

## අරුන්දික ප්‍රනාන්දු සහන සේවා සහ ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු අනුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### அருந்திக பர்னாந்து நிவாரண சேவைகள் மற்றும் கொட்பிறி பர்னாந்து ஞாபகார்த்த மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### ARUNDIKA FERNANDO RELIEF SERVICES AND GODFREY FERNANDO MEMORIAL FOUNDATION (INCORPORATION) BILL

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

> "අරුන්දික ප්‍රනාන්දු සහන සේවා සහ ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු අනුස්මරණ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

**ගරු සම්පත් අතුකෝරල මහතා**
(மாண்புமிகு சம்பத் அதுகோரல)
(The Hon. Sampath Athukorala)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සෞඛ්‍ය අමාත්‍යතුමිය වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி சுகாதார அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Health for report.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම හත් වතාවක් කිව්වා. එතුමාට පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාවක් දෙන්න. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම පැහැදිලි කිරීම සම්බන්ධව පිළිතුරු දුන්නා. ඒකට වෙනම විවාදයක් ඉල්ලන්න. [බාධා කිරීම්]

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු කථානායකතුමනි, මට විනාඩි පහක් දෙන්න. මම කියන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, එහෙම වේලාවක් නැහැ. [බාධා කිරීම්]

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ඇයි, මේ? [බාධා කිරීම්] බය නැත්නම් කියන්න - [බාධා කිරීම්] ඒක නිසා තමයි මගේ කට වහන්න හදන්නේ; පොලීසිය මඟින් මගේ කට වහන්න හදන්නේ. [බාධා කිරීම්] ඇයි බය? [බාධා කිරීම්] මම කියන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේගේ තනතුරු දෙකක් දැන් ගලවා ඉවරයි. [බාධා කිරීම්] ඔය තිබෙන ටිකත් රැකගන්න ඕනෑ නම්, - [බාධා කිරීම්] මට කියන්න දෙන්න. [බාධා කිරීම්] ඇත්ත කියන්න දෙන්න. ඇයි, බය? [බාධා කිරීම්] නිවැරදි නම්, බය නැත්නම් ඉඩ දෙන්න. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනා අංක 3, ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

## මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### மனித உரிமைகள் அமைப்பு (கூட்டிணைத்தல்) சட்டமூலம்
### HUMAN RIGHTS ORGANIZATION (INCORPORATION) BILL

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"මානව හිමිකම් සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධිකරණ අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி நீதி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Justice for report.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. මනුෂ නානායක්කාර මැතිතුමාගේ නම කිහිප වතාවක් සඳහන් වුණු නිසා, එතුමාට විනාඩියක කාලයක් ලබා දෙන්න. විනාඩියක් දෙන්න, එතුමාට කථා කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට එම පැහැදිලි කිරීම සඳහා අවස්ථාව ලබා දුන්නා. එතැනින් එහාට ඒ ගැන කථා කරන්න අවශ්‍ය නැහැ, ගරු විපක්ෂ නායකතුමනි.

යෝජනා අංක 4, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ඔබතුමාට ඕනෑ මේ වගේ අය රකින්නද? [බාධා කිරීමක්] හොරු රකින්නද? පාර්ලිමේන්තුව තිබෙන්නේ හොරු රකින්නද? [බාධා කිරීමක්] බය නැත්නම්, නිවැරදි නම්, මේ කරුණු ටික සභාගත කරන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මගේ යෝජනා තුනක් තිබෙනවා.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ බය නැත්නම්, ලජ්ජාවක් තිබෙනවා නම්, [බාධා කිරීමක්] තමුන්නාන්සේට පුළුවන්කමක් තිබෙනවා නම්, මේ කියන කරුණුවලට [බාධා කිරීමක්] ඉදිරිපත් කරන්න. ඇයි, කට වහගෙන ඉන්නේ? [බාධා කිරීමක්] ඇයි, කටවල් වහන්න උත්සාහ කරන්නේ? තමුන්නාන්සේලා නිරෝධායන නීති දමලා උද්ඝෝෂණ නවත්වන්න හැදුවාට, නීති දමලා කටවල් වහන්න හැදුවාට, පොලිසි ගණනේ ගිහිල්ලා අපිව නවත්වන්න හැදුවාට, තමුන්නාන්සේලා - [බාධා කිරීමක්] මතක තබා ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්නේ නැද්ද? [බාධා කිරීම්]

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
යෝජනාව ඉදිරිපත් කරන්න ඉස්සෙල්ලා - [බාධා කිරීම්] ඇයි, බයද? ඇයි, ලජ්ජාද? [බාධා කිරීම්] මෙතුමා කියපු අසත්‍ය කාරණා ටිකට මට උත්තර දෙන්න ඕනෑ. - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්නේ නැත්නම් ඊළඟ අවස්ථාවට යන්න වෙනවා. [බාධා කිරීම්]

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
මේ කියපු කරුණුවලට [බාධා කිරීම්] ඇත්ත කථා කරන්න - [බාධා කිරීම්] ඇයි, බයද? [බාධා කිරීම්] බය නැත්නම් ඉඩ දෙන්නේ නැත්තේ ඇයි? [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මැතිතුමා, ඔබතුමා යෝජනා ඉදිරිපත් කරන්නේ නැද්ද? [බාධා කිරීම්] යෝජනා ඉදිරිපත් කරන්නේ නැද්ද? [බාධා කිරීම්]

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ඔබතුමා මේ සභාව සන්සුන් කරන්න කෝ, මට කථා කරන්න.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
බය නැත්නම් ඇයි කියන්න ඉඩ දෙන්නේ නැත්තේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සාරතී දුෂ්මන්ත මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්න. [බාධා කිරීම්]

## බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### பலாங்கொடை ஆனந்த மைத்திரிய மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### BALANGODA ANANDA MAITREYA FOUNDATION (INCORPORATION) BILL

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

> " බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Buddhasasana, Religious and Cultural Affairs for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දිනට නියමිත කටයුතු. ගරු සභානායකතුමා. [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேக்கர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමනි, වරප්‍රසාදවලට මුවා වෙලා ඔහොම කථා කරන්න එපා. තමුන්නාන්සේ එළියට ඇවිල්ලා කියන්න. [බාධා කිරීම්]

## කල්තැබීම
### ஒத்திவைப்பு
### ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා. [බාධා කිරීම්]

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, ඔබතුමා මේ සභාව පොඩ්ඩක් පාලනය කරලා දෙනවා නම් හොඳයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
තමුන්නාන්සේලා බයයි, ඇත්ත කියනවාට බයයි. [බාධා කිරීම්] නැත්නම් කට අරින්න ඉඩ දෙන්න. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර ඉඳ ගන්න. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව - 2020
## இலங்கை மத்திய வங்கியின் வருடாந்த அறிக்கை - 2020
ANNUAL REPORT OF CENTRAL BANK OF SRI LANKA - 2020

[පූ.භා. 11.32]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන වාර්ෂික වාර්තාව හුදු මුදල් නීති පනතේ අවශ්‍යතාවක් මත ඉදිරිපත් කරන්නක් පමණක් නොව, මේ මොහොතේ රටේ ආර්ථිකයේ පවතින තත්ත්වය පිළිබඳව මහ ජනතාවගේ අවබෝධය සඳහා වන පිළිබිඹුවක්ද වේ.
>
> ඒ අර්ථයෙන් 2020 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව විසින් හෙළිදරව් කරනු ලබන සමාජ ආර්ථික දත්ත පිළිබඳව ගැඹුරින් සලකා බැලිය යුතුව තිබේ. රට දැවැන්ත ආර්ථික අර්බුදයක් කරා යමින් ඇති බවත්, රටේ අනාගතය සම්බන්ධයෙන් ඇත්තේ අවදානම් සහගත පුරෝකථනයක් බවත් එයින් පෙනී යයි. විශේෂයෙන් රාජ්‍යයේ ණය බර වේගයෙන් ඉහළ යමින් ඇති බවද, උද්ධමනය ඉහළ නඟිමින් ඇති බවද, රාජ්‍ය ආදායම් පහළ යමින් ඇති බවද, ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය පහළ ගොස් ඇති බවද, විදේශ සංචිත පහළ වැටෙමින් ඇති බවද, ජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව හැකිළෙමින් ඇති බවද, ආහාර සුරක්ෂිතතාව බිඳ වැටෙමින් ඇති බවද එය විසින් පෙන්වා දෙනු ලබයි.
>
> මෙම තත්ත්වය තුළ එම දත්ත විසින් පෙන්වා දෙනු ලබන ආර්ථිකයේ අවදානම් සහගත නැඹුරුව බරපතළ ලෙස සැලකිල්ලට ගත යුතු බවත්, ඒ පිළිබඳව ගැඹුරු සාකච්ඡාවක් සිදු විය යුතුව ඇති බවත් මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු කථානායකතුමනි, මහ බැංකු වාර්තාව හරහා රටේ ආර්ථිකයේ ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳ දත්ත -තොරතුරු- ඉදිරිපත් කරනවා. ඒ වාගේම ආණ්ඩුව සමහර දත්ත -තොරතුරු- විකෘතියට භාජන කරලා තිබෙනවා. කවුරු හරි නැඟිටලා කිව්වොත්, විකෘතියට භාජන කරපු තැනක් පෙන්වන්න කියලා, මා එවැනි බොහෝ තැන් පෙන්වන්න ලැහැස්තියි. නමුත් දැන් මා ඒකට මාගේ කාලය වැය කරන්නේ නැහැ. මහ බැංකු වාර්තාව හරහා ලබාදෙන දත්ත -තොරතුරු- තිබෙනවා. රජය විකෘති කරන ලද සහ සඟවන තොරතුරු තිබෙනවා. ඊළඟට, මේ හරහා මහ ජනයාගේ එදිනෙදා ජීවිත හරහා මේ ආර්ථිකයේ ඇති වී තිබෙන තත්ත්වය පෙන්නුම් කරමින් තිබෙනවා. ඒ සියලු සාධකවලින් පෙන්නුම් කරන්නේ, මෑත කාලයේ -දශක ගණනාවකට පසුව- අපේ රට ගැඹුරු ආර්ථික අවදානමක් කරා ගමන් කරමින් තිබෙන බවයි. මුදල් ඇති පදම් තිබෙන බවත්, ඕනෑ තරම් වියදම් කළ හැකි බවත් කියමින් සමහර අමාත්‍යවරු පුරාජේරු දෙඩෙව්වාට, සැබැවින්ම අපේ රටේ ආර්ථිකයේ පතුල වේගයෙන් කඩා වැටෙමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ක්ෂේත්‍ර හතරක් ඔස්සේ මේ ආර්ථික අර්බුදය ප්‍රකාශයට පත් වෙමින් තිබෙනවා. එකක්, රාජ්‍ය ආදායම වේගයෙන් හීන වෙමින් තිබෙනවා. අනෙක් එක, නිෂ්පාදනය වේගයෙන් කඩා වැටෙමින් තිබෙනවා. අනෙක් එක, ආනයන අපනයන අතර තිබෙන පරතරය -වෙළෙඳ හිඟය වේගයෙන් වර්ධනය වෙමින් තිබෙනවා. අනෙක් එක, අපේ රට විශාල ණය අර්බුදයක ගිලී තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ කරුණු හතර වෙන් වෙන්ව කිව්වත්, මේවා එකිනෙකාට බලපෑම් කරමින්, එකිනෙකා සමඟ, -එකිනෙක කරුණු සමඟ- වෙළෙමින් තිබීම නිසා අපේ රට ගැඹුරු ආර්ථික චණ්ඩ මාරුතයකට මුහුණ දී තිබෙනවා. දැන් ආණ්ඩුව මේ පිළිබඳව සැබෑ චිත්‍රය රටට ඉදිරිපත් කරමින්, ඒ සඳහා රාජ්‍ය කාර්යභාරය, පෞද්ගලික අංශයේ කාර්යභාරය, පුරවැසියාගේ කාර්යභාරය නිසි පරිදි ඉදිරිපත් කරමින් ජාතික සැලැස්මක් හැදුවේ නැත්නම් මේ අර්බුදය ඉතාම අවදානම් සහගත තත්ත්වයට පත්වීම වළක්වන්න බැහැ.

මා කරුණු කිහිපයක් කියන්නම්, තිබෙන වෙලාව අනුව. අපි දන්නවා තමුන්නාන්සේලා රාජ්‍ය ආදායම විධියට 2021 වසරේදී රුපියල් බිලියන 1,961ක් උපයන්න ඇස්තමේන්තු කරලා තිබෙන බව. හැබැයි ගරු කථානායකතුමනි, පසුගිය මාස හතරේ -අප්‍රේල් 30 දක්වා- උපයා තිබෙන්නේ, රුපියල් බිලියන 482යි.

ඒ කියන්නේ, ආණ්ඩුව මේ වර්ෂයේ රුපියල් බිලියන 1,961ක් ආදායම හැටියට අපේක්ෂා කළත්, රුපියල් බිලියන 482යි වසරේ තුනෙන් එකක කාලයක් ගතවෙනකොට උපයලා තිබෙන්නේ. රාජ්‍ය ආදායම රුපියල් බිලියන 1,500 සීමාවේ පවතින බව තමයි එයින් පෙන්නුම් කරන්නේ. ඒ කියන්නේ මොකක්ද? රුපියල් බිලියන 1,961ක් අපේක්ෂා කළත්, මේ වසරේ ආදායම රුපියල් බිලියන 1,500 සීමාවේ පවතිනවා. මා තවත් පැහැදිලි කළොත් ගරු කථානායකතුමනි, රාජ්‍ය ආදායම අප්‍රේල් මාසයේ 30 දක්වා රුපියල් බිලියන 482ක් වෙනකොට, ණය පොලී වාරිකය හැටියට රුපියල් බිලියන 366ක් ගෙවන්න සිද්ධ වුණා, ණය වාරිකය හැටියට රුපියල් බිලියන 310ක් ගෙවන්න සිද්ධ වුණා. ගරු කථානායකතුමනි, මහා භාණ්ඩාගාරයට රපියල් බිලියන 482ක ආදායමක් එනකොට ණය සහ පොලී වාරික හැටියට රුපියල් බිලියන 676ක් ගෙවන්න සිදු වී තිබෙනවා. එයින් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවෙයි, රුපියල් බිලියන 194ක්, ඒ කියන්නේ රුපියල් කෝටි 19,400ක් ණය පොලී වාරික ගෙවීම වෙනුවෙනුත් ණය ලබා ගත යුතු බවයි. මහා භාණ්ඩාගාරයට මාස 4ක් තුළ ලැබෙන මුළු ධනය ණය පොලී වාරික වෙනුවෙන් වැය කළත්, එම ණය පොලී වාරික වෙනුවෙන් තවත් රුපියල් කෝටි 19,400ක මුදලක් උපයා ගත යුතුව තිබෙනවා. ඒ කියන්නේ ආණ්ඩුවේ ආදායම ණය පොලී වාරිකය ගෙවීමටවත් ප්‍රමාණවත් නැති තැනකට පත් වී තිබෙනවා කියන එකයි. ගරු කථානායකතුමනි, මා මෙය තවත් පැහැදිලි කරන්නම්.

ආසන්න වශයෙන් ගත්තොත්, ආණ්ඩුවේ ආදායම රුපියල් බිලියන 482ක් වෙනකොට ආණ්ඩුවේ මුළු වියදම රුපියල් බිලියන 1,678ක් වෙනවා. ඒ කියන්නේ කුමක්ද? ආණ්ඩුවේ දවසක ආදායම රුපියල් කෝටි 400ක් වෙනකොට, ආණ්ඩුවට දවසකට රුපියල් කෝටි 565ක් ණය වශයෙන් ගෙවන්න සිදු වී තිබෙනවා. දවසක ආදායම ලෙස කෝටි 400ක් උපයාගෙන, දවසකට කෝටි 565ක ණයක් ගෙවන්න සිදුවෙලා තිබෙනවා. බිලියන 482ක් උපයලා බිලියන 1,600 ගණනක් වියදම් කරන්න ආණ්ඩුවට සිදු වී තිබෙනවා. විශේෂයෙන්ම තමුන්නාන්සේලා පසුගිය අවුරුද්දේ ක්‍රියාත්මක කළ බදු ප්‍රතිසංස්කරණය රටේ ආර්ථිකය නැංවීමට හෝ ජනතාවගේ ජීවන බර සැහැල්ලු කිරීමට කිසිසේත්ම හේතුවෙලා නැහැ. එම බදු සහන ඉතා කුඩා වෞර වළල්ලක් අතට ගලාගෙන ගියා. ආණ්ඩුවට ලැබිය යුතු රුපියල් බිලියන 600කට ආසන්න මුදල් ප්‍රමාණයක් තමුන්නාන්සේලාගේ බදු ප්‍රතිසංස්කරණය හේතු කොටගෙන රජයට අහිමි වී තිබෙනවා. එම නිසා මේ රාජ්‍ය ආදායම තවත් වේගයෙන් කඩා වැටෙන තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, ආනයන සහ අපනයන අතර ඇති වී තිබෙන ප්‍රශ්නය. විශේෂයෙන්ම ගිය අවුරුද්දේ විවිධ ආනයන සීමා දාලා අපේ ආනයන අපනයන අතර පරතරය ඩොලර් බිලියන 6ට සීමා කරගන්න සමත් වුණා. එය ඊට පෙර වසර හා සංසන්දනය කර බලනකොට වෙළෙඳ ශේෂ හිඟයේ ඩොලර් බිලියන 2ක අඩුවක්

[ගරු අනුර දිසානායක මහතා]

විධියට වාර්තා වුණා. වාහන ආනයනය මුළුමනින්ම නතර කරමින්, කහ ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ විශාල ප්‍රමාණයක ආනයන නතර කරමින්, මෝටර් රථ අමතර කොටස් ආනයනය නතර කරමින්, විවිධ ආනයන බාධා ඇති කරමින් තමුන්නාන්සේලා ආනයන සීමා ඇති කරන්න හැදුවත්, පසුගිය මාස හතරේ ප්‍රතිඵලය කුමක්ද? ගරු කථානායකතුමනි, භාණ්ඩ ආනයනය කිරීම වෙනුවෙන් පසුගිය මාස හතර තුළ ඩොලර් මිලියන 6,448ක් වැය වී තිබෙනවා. අපනයන ආදායම විධියට ලැබී තිබෙන්නේ ඩොලර් මිලියන 3,800යි. ඒ කියන්නේ, ඩොලර් මිලියන 2,948ක හිඟයක් තිබෙනවා. ආසන්න වශයෙන් ගත්තොත් පසුගිය මාස 4 ඇතුළත ඩොලර් බිලියන 3ක වෙළෙඳ හිඟයක් නිර්මාණය කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අවුරුද්දෙන් තුනෙන් එකක වෙළෙඳ ශේෂය ඩොලර් බිලියන 3ක් වෙනකොට, එය අවුරුද්දකට ගළපලා බලනකොට මේ අවුරුද්ද තුළ ආසන්න වශයෙන් ඩොලර් බිලියන 8ත්, 9ත් අතර වෙළෙඳ ශේෂ හිඟයක් මතු වීමේ අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා. මම අහන්නේ, මේකට තිබෙන පිළිතුර මොකක්ද? තමුන්නාන්සේලා සියලු ආනයන තහනම් කළා. වාහන ආනයනය තහනම් කර තිබෙනවා, වාහන අමතර කොටස් ආනයනය තහනම් කර තිබෙනවා, සුවඳ විලවුන් වර්ග ආනයනය තහනම් කර තිබෙනවා, රසායනික කෘෂි යෙදවුම් ආනයනය තහනම් කර තිබෙනවා. ඒ සියල්ල තහනම් කර තිබුණත්, ඩොලර් බිලියන 3ක -ඩොලර් කෝටි 300ක- වෙළෙඳ හිඟයක් මේ වසරේ මුල් මාස 4 තුළ වාර්තා වෙනවා. ඒ කියන්නේ, මේ වසර අවසන් වෙනකොට ඩොලර් බිලියන 8ත්, 9ත් අතර වෙළෙඳ ශේෂ හිඟයක් සහිත අර්බුදයක් ඇති වීමේ ඉඩ කඩ නිර්මාණය වෙලා තිබෙන බවයි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අපනයන ආදායමින් සියයට 25ක් සම්පූර්ණ කරන්නේ කෘෂි ක්ෂේත්‍රයෙන් බව අපි දන්නවා. හැබැයි ගරු කථානායකතුමනි, සිදු වී තිබෙන දේ තමයි, ගිය අවුරුද්දේ ජුනි මාසය හා සංසන්දනය කර බලනකොට මේ අවුරුද්දේ ජුනි මාසයේ අපේ රටේ තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 1,400,000කින් අඩු වී තිබෙන එක. ගිය අවුරුද්දේ මාර්තුවලට වඩා මේ අවුරුද්දේ මාර්තුවල තේ නිෂ්පාදනය වැඩියි. ගිය අවුරුද්දේ අප්‍රේල්වලට වඩා මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ තේ නිෂ්පාදනය වැඩියි. ගිය අවුරුද්දේ මැයිවලට වඩා මේ අවුරුද්දේ මැයිවල තේ නිෂ්පාදනය වැඩියි. හැබැයි, ගිය අවුරුද්දේ ජුනිවලට වඩා මේ අවුරුද්දේ ජුනි මාසයේ තේ දලු කිලෝ ග්‍රෑම් ලක්ෂ 14ක් අඩුවෙලා තිබෙනවා. ඇයි අඩු වුණේ? මොකක්ද හේතුව? ඒකට විශේෂ ස්වාභාවික හේතුවක් නොවෙයි සිදු වුණේ, ගරු කථානායකතුමනි. වර්තමානයේ ඇති වී තිබෙන තත්ත්ව පිළිබඳව නිසි කළමනාකරණයක්, සැලැස්මක් නැතිවීම සහ පොහොර සඳහා අවශ්‍ය වන යෙදවුම් තහනම් කිරීම හේතු කොටගෙන මේ ජුනි මාසයේ සිට තේ වගාවට බලපෑම් ඇති කරමින් තිබෙනවා. තේ නිෂ්පාදනය ලබන වසරේ ජූලි, අගෝස්තු වෙනකොට විශාල කඩා වැටීමකට ලක් වෙනවා. ගරු කථානායකතුමනි, අපේ රටට තේවලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 1.3ක ආදායමක් ලැබෙන බවත්, එය ඇමෙරිකානු ඩොලර් මිලියන 650 දක්වා දෙකෙන් පංගුවකින් අඩුවීමේ අවදානමකට අපි මුහුණ දී තිබෙන බවත් විශේෂඥයන් හඳුන්වා දෙනවා. එම නිසා වෙළෙඳ ශේෂය පියවා ගැනීම සඳහා තිබෙන පිළියම කුමක්ද?

ඊළඟ ප්‍රධානම ප්‍රශ්නය බවට පත් වී තිබෙන්නේ රාජ්‍ය ණය. අපි විශාල රාජ්‍ය ණය උගුලකට හිර වෙලා තිබෙන බව අපි දන්නවා. උදාහරණයක් හැටියට ගත්තොත්, 2020 වසර අවසන් වෙනකොට අපේ රටේ ණය ප්‍රමාණය රුපියල් බිලියන 13,031යි. ආසන්න වශයෙන් ගත්තොත් රුපියල් ට්‍රිලියන 13යි. හැබැයි 2021 අප්‍රේල් මාසය වෙනකොට ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 16.3 දක්වා වැඩි වී තිබෙනවා. ඒ කියන්නේ මේ මාස 16 ඇතුළත රුපියල් ට්‍රිලියන 3.3කින් - රුපියල් කෝටි 330,000කින්- ණය ප්‍රමාණය වැඩි වී තිබෙනවා. ඒ අනුව ආසන්න වශයෙන් ගත්තොත්, එක පුරවැසියෙකුගේ ණය ප්‍රමාණය රුපියල් ලක්ෂ 1 1/2කින් වැඩි වී තිබෙනවා. මාස 16ක් ඇතුළත පුරවැසියෙකුගේ ණය ප්‍රමාණය රුපියල් ලක්ෂ 1 1/2කින් වැඩි වී තිබෙනවා. ආසන්න වශයෙන් ගත්තොත්, මෙම මාස 16 ඇතුළත රුපියල් කෝටි 330,000කින් ණය පංගුව වැඩි වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා කල්පනා කර බලන්න, 1950දී අපේ ණය ප්‍රමාණය රුපියල් කෝටි 100යි. 1950දී රුපියල් කෝටි 100ක ණය හිඟයක තිබුණු රටේ මාස 16ක් ඇතුළත ණය පංගුව විතරක් රුපියල් කෝටි 330,000කින් වැඩි වී තිබෙනවා. ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලාගේ භාණ්ඩාගාරය ඇප වෙමින් ඇපකර හරහා රාජ්‍ය ආයතන ණය ලබාගෙන තිබෙනවා. ඇපකර හරහා රාජ්‍ය ආයතනවලින් ගත් ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 1.4යි; රුපියල් කෝටි 140,000යි. ඔක්කොම ගත්තොත්, ඒවා රාජ්‍ය ණය. ආසන්න වශයෙන් ගත්තොත්, රාජ්‍ය ණය රුපියල් ට්‍රිලියන 17.7 දක්වා වර්ධනය වී තිබෙනවා. මේ රට විශාල ණය උගුලක හිර වී තිබෙනවා. ප්‍රධානම ගැටලුව දේශීය ණය නම්, තමුන්නාන්සේලාගේ බියගම මුදල් අච්චු ගහන factory එකට පින් සිද්ධ වෙන්න ඕනෑ. තමුන්නාන්සේලා උදේ හවස මල් පූජා කරන්න ඕනෑ තැනක් තිබෙනවා, උදේ හවස වන්දනා කරන්න ඕනෑ තැනක් තිබෙනවා, උදේ හවස ගිහිල්ලා හඳුන්කූරු පත්තු කරන්න ඕනෑ තැනක් තිබෙනවා. ඒ වෙන කිසි තැනක් නොවෙයි. බියගම මුදල් අච්චු ගහන factory එක. බියගම මුදල් අච්චු ගහන factory එක හරහා දේශීය ණයවලට මොනවා හෝ කරගන්න පුළුවන්.

තමුන්නාන්සේලා පසුගිය අප්‍රේල් මාසය වෙනකොට මාස 16ක් ඇතුළත රුපියල් ට්‍රිලියනයක මුදල් අච්චු ගහලා තිබෙනවා. රුපියල් කෝටි ලක්ෂයක මුදල් අච්චු ගහලා තිබෙනවා. තමුන්නාන්සේලා වඳින්න ඕනෑ කොතැනටද? බියගම මුදල් අච්චු ගහන factory එකට. ඒ විතරක් නොවෙයි, පසුගිය දා එක් දිනක් ඇතුළත රුපියල් බිලියන 221ක්, ඒ කියන්නේ රුපියල් කෝටි 22,100ක මුදල් අච්චු ගහලා තිබෙනවා. ඒකෙන් පෙන්නුම් කරන්නේ කුමක්ද? දේශීය ණය පියවා ගැනීම සඳහා ඇති තරමට මුදල් අච්චු ගහන්න පුළුවන් වේවි. හැබැයි, ලංකාවේ පළමු වතාවට අපේ මුළු ණයවලින් සියයට 47කට ආසන්න ප්‍රමාණයක් විදේශීය ණය බවට පත්වී තිබෙනවා. අපේ විදේශීය ණය පංගුව ඇමෙරිකානු ඩොලර් බිලියන 35.1ක් බව අප්‍රේල් මස 30වෙනි දාට වාර්තා වෙනවා. මේ අවුරුද්දේ අප්‍රේල් මස 30වැනි දා වෙනකොට ආණ්ඩුවක් හැටියට අපේ විදේශීය ණය පංගුව ගැනයි මා කියන්නේ. මා කියන්නේ පෞද්ගලික සමාගම් ලබාගෙන තිබෙන ණය නොවෙයි. මා කියන්නේ රාජ්‍ය ආයතනවලින් ලබාගෙන තිබෙන ණය නොවෙයි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඇමෙරිකානු ඩොලර් ණය ලබාගෙන තිබෙනවා. ලංකා විදුලිබල මණ්ඩලය ඇමෙරිකානු ඩොලර් ණය ලබාගෙන තිබෙනවා. ඒවා පසෙකින් තැබුවත්, මෙම වසරේ අප්‍රේල් මාසයේ 30වෙනි දා වෙනකොට මධ්‍යම ආණ්ඩුව විතරක් ලබාගෙන තිබෙන ඇමෙරිකානු ඩොලර් ණය ප්‍රමාණය රුපියල් බිලියන 35.1ක් වෙලා තිබෙනවා. එම නිසා ලංකාවේ පළමුවැනි වතාවට මුළු රාජ්‍ය ණය පංගුවෙන් සියයට 47ක් විදේශීය ණය බවට පත් වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, එම විදේශ ණයවලිනුත් විශාල ණය පංගුවක් ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හරහා ලබාගෙන තිබෙනවා. ආසන්න වශයෙන් ගත්තොත්, එතැන රුපියල් බිලියන 15ක් තිබෙනවා. ඒ කියන්නේ සියයට 40ක්. විදේශ ණයවලින් සියයට 40ක් ස්වෛරී බැඳුම්කර හරහා ලබාගෙන තිබෙනවා.

2007 වෙනතුරු අපි ස්වෛරී බැඳුම්කර හරහා ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළෙන් ණය ගත්තේ නැහැ; වාණිජ ණය ගත්තේ නැහැ. අපි 2007 වෙනතුරු එහෙම ණය ගත්තේ නැහැ. හැබැයි 2007 මහබැංකු අධිපතිවරයා හැටියට හිටපු වර්තමාන මුදල් රාජ්‍ය ඇමතිවරයා "අපි සල්ලි හොයාගන්න ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළට යනවා" කියලා ස්වෛරී බැඳුම්කර හරහා ණය ලබා ගත්තා. ගරු කථානායකතුමනි, ස්වෛරී බැඳුම්කර හරහා ගන්නා ලද ණය විශාල පොලී අනුපාතිකවලට ලබාගන්න අපට සිදු වුණා. ඒ ණය උගුලේ අපි අද හිර වී තිබෙනවා. මේ ජූලි මාසයේ 27වැනි දා ඇමෙරිකානු ඩොලර් බිලියනයක ස්වෛරී බැඳුම්කරයක් අපි ගෙවනු ලැබුවා. හැබැයි අපට ලබන ජනවාරි මාසයේ තව ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක් ගෙවන්න තිබෙනවා. ලබන අවුරුද්දේ ජූලි මාසයේ 18වැනි දා තව ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000ක් -ඇමෙරිකානු ඩොලර් බිලියනයක්- ගෙවන්න තිබෙනවා. ඒ කියන්නේ ලබන වසර සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500ක් අපට අවශ්‍ය වෙනවා කියන එකයි. එම නිසා මේ විදෙස් ණය උගුලේ අපි අද හිර වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අද අප සතුව තිබෙන විදෙස් සංචිත ප්‍රමාණය කොපමණද? මුදල් අමාත්‍යතුමනි, මෙම ජූලි 27වැනි දාට පසුව අද වන විට හෝ තමුන්නාන්සේට ඉදිරිපත් කළ හැකි ආසන්නම දිනයට සංඛ්‍යා දත්ත ඉදිරිපත් කරන්න. ජූලි 27වැනි දාට පසුව විදෙස් සංචිත කොපමණ තියෙනවාද කියා අපි දැනගන්න කැමැතියි. මුදල් අමාත්‍යාංශයේ ලේකම්, එස්.ආර්. ආටිගල මහත්මයාගෙන් මාධ්‍යවේදියකු මෙම ප්‍රශ්නය ඇහුවාම, ඔහු ප්‍රශ්නය මඟ හරිනවා මා දැක්කා. "විදෙස් සංචිත නිතරම උච්චාවචනය වෙනවා, නිතරම අඩු වෙනවා. වැඩි වෙනවා. එම නිසා කියන්න බැහැ" කියලා ඔහු කිව්වා. ඒක වැරදියි. මා අහන්නේ ජූලි මාසයේ 28වන දාට කොච්චරක් තිබුණා ද කියලා. ඩොලර් බිලියන 2.5ත්, ඩොලර් බිලියන 3ත් අතර මුදල් ප්‍රමාණයක් තමයි විදේශ සංචිතවල ඇත්තේ කියලා මම උපකල්පනය කරනවා. ඒක එහෙම නොවෙයි නම්, අජිත් නිවාඩ් කබ්රාල් රාජ්‍ය ඇමතිතුමනි, ඒක එහෙම නොවෙයි කියලා ඔබතුමා කියන්න. ඒ විතරක් නොවෙයි, භාණ්ඩාගාරයේ account එක බැංකු අයිරාවකින් - OD එකකින් - දුවන්නේ. බැංකු අයිරාව කොච්චර ද? භාණ්ඩාගාරයේ බැංකු අයිරාව අද වන විට රුපියල් බිලියන 620යි. ඒ කියන්නේ, භාණ්ඩාගාර account එක කෝටි 62,000ක බැංකු අයිරාවකින් දුවන තැනකට රට පත් වෙලා තිබෙනවා. මේක තමයි රටේ ආර්ථිකය.

ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, ඉදිරි මාස 4ක කාලය ඇතුළත ඩොලර් බිලියන 1.3ක් අපි ගෙවිය යුතුව තිබෙනවා. ඩොලර් බිලියන 1.3ක් අපට ඕනෑ ණය ගෙවන්න; ආසන්න වශයෙන් ඩොලර් බිලියන 3ක් අපට ඕනෑ භාණ්ඩ ගෙනෙන්න. ඒ කරුණු දෙකට පමණක් ඩොලර් බිලියන 4.3ක අවශ්‍යතාවක් තිබෙනවා. ණය ගෙවීම සහ භාණ්ඩ ගෙන්වීම සඳහා පමණක් අතිරේක වශයෙන් ඩොලර් බිලියන 4.3ක අවශ්‍ය වෙනවා. ආනයනය සහ අපනයනය අතර පරතරය අපි හඳුපුවාම අගෝස්තු සිට දෙසැම්බර් දක්වා ඩොලර් බිලියන 3ක් එන්න ඉඩ තිබෙනවා. අපට දැන් ඩොලර් බිලියන 3ක් අවශ්‍යයි; ණය ගෙවන්න ඩොලර් බිලියන 1.3.ක් අවශ්‍යයි. ඒ කියන්නේ, ඒ සෘජු ගෙවීම් දෙක සඳහා පමණක් ඩොලර් බිලියන 4.3ක් අවශ්‍ය වී තිබෙනවා. මා දැනගන්න කැමැතියි, මේ මුදල කොහෙන්ද හොයා ගන්නේ කියලා. මා දැක්කා, ගරු මුදල් අමාත්‍යවරයා පසුගිය දා එතුමාගේ ට්විටර් ගිණුම හරහා ප්‍රකාශයක් කරලා තිබුණු බව. එහිදී එතුමා කියනවා, බංග්ලාදේශයෙන් ඩොලර් මිලියන 250ක් හුවමාරු ණය මුදල ලෙස ලබා ගත හැකිවෙයි කියා උපකල්පනය කරනවා කියලා. මා දන්නේ නැහැ බංග්ලාදේශය දැනට ඒ පිළිබඳව කවර ස්ථාවරයක ද ඉන්නේ කියලා. ඒ පිළිබඳවත් නිශ්චිත පිළිතුරක් පාර්ලිමේන්තුවට දෙන්න ඕනෑ. ඊළඟට කියනවා, ඉන්දියාව තවත් ඩොලර් මිලියන 400ක හුවමාරු ණය මුදලක් ලබා දෙයි කියලා. ඉන්දියාව සාමාන්‍යයෙන් ඒ මුදල ලබා දෙනවා. අපේ තිබෙන බැඳීම අනුව අපට එ්ක ලබා දෙනවා. හැබැයි, ඒක මාස 6ක හුවමාරුවක්. අගෝස්තු මාසයේ ඒ මුදල ගත්තොත් අපි ලබන අවුරුද්දේ පෙබරවාරි මාසයේ ඒක ගෙවන්න ඕනෑ. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජික රටක් නිසා ඩොලර් මිලියන 800ක් ලැබීමේ ඉඩක් තිබෙනවා. ඊට අමතරව තමුන්නාන්සේලා චීනයෙන් ඩොලර් මිලියන 300ක් ලබා ගැනීමේ සැලැස්මක් තිබෙනවා. ඊළඟට, මුදල් අමාත්‍යවරයා එතුමාගේ පණිවුඩයේදී කියනවා, ඩොලර් මිලියන 200ක් වෙළෙඳ පොළෙන් මහ බැංකුව උපයා ගන්නා බව. මා දන්නේ නැහැ වෙළෙඳ පොළේ කොහෙන්ද ඩොලර් ගන්නේ කියලා. වෙළෙඳ පොළේ විශාල ඩොලර් හිඟයක් මතුවී තිබෙනවා. ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් නිල බැංකුවල ඩොලරයේ හුවමාරු අගය රුපියල් 202ක් වුණත්, අද කළු කඩේ ඩොලර් එක රුපියල් 235, 240 දක්වා වර්ධනය වී තිබෙන බව ඔබතුමාත් දන්නවා. එතකොට කොහෙන්ද මිලදී ගන්නේ? ඒ නිසා තමුන්නාන්සේලාට සුරංගනා ලෝකයක් හදන්න පුළුවන් වෙලා තිබෙනවා. හැබැයි, මේ දත්ත ඔක්කෝම ඇතුළේ පෙන්නුම් කරමින් තිබෙන්නේ අපි විශාල ණය උගුලක හිරවෙමින් ණය ගෙවා ගැනීමේ අර්බුදයකට ලක් වෙමින් තිබෙන රාජ්‍යයක් බවයි. දැන් මොකක්ද කරන්න තිබෙන්නේ? තමුන්නාන්සේලා නැවත නැවත කරන්නේ ආනයන සීමා කරන එකයි. හැබැයි, පසුගිය මුදල් අමාත්‍යාංශ වාර්තාවේ කියන්නේ මොකක්ද? ආනයන සීමා කිරීම නැවත අපේ ආර්ථිකයට බලපෑමක් ඇති කරමින් තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, 2020 මුල් මාස 4 ඇතුළත වාහන ආනයන හරහා උපයා ගන්නා ලද ආදායම රුපියල් බිලියන 33යි. හැබැයි, මේ අවුරුද්දේ රුපියල් බිලියන 7යි. ඒ කියන්නේ මොකක්ද?

ආනයන සීමා නැවත ආර්ථිකයට බලපෑමක් ඇති කරමින් තිබෙනවා. ඒ නිසා මේවා එකට ගැට ගැසුණු දේවල්. වෙළෙඳ ශේෂයේ හිඟය, ණය අර්බුදය, නිෂ්පාදන කඩා වැටීම, රාජ්‍ය ආදායම අහිමිවීම කියන මේ කරුණු හතර එකට වෙළෙමින්, වේගවත් චණ්ඩ මාරුතයක් හැටියට රටේ ආර්ථිකයේ බලකණු සුණු විසුණු කරමින් ගමන් කරමින් තිබෙනවා. මුදල් අමාත්‍යවරයා මේ තත්ත්වය රටට කියන්න. මුදල් අමාත්‍යවරයා මේ තත්ත්වය රටට ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. මේ තත්ත්වයට තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? ගරු කථානායකතුමනි, මෙවැනි තත්ත්වයක් තිබෙනවාය කියලා කල්පනා කරමින් රටක් පාලනය කරන බව පෙන්වන්නේ නැහැ.

මම ඔබතුමාට උදාහරණ කීපයක් කියන්නම්. රටේ රාජ්‍ය ආයතන 19ක පාඩුව මම කියන්නම්. රාජ්‍ය ආයතන දහනවයේ මුල් මාස හතරේ පාඩුව රුපියල් බිලියන 82යි. ඒ කියන්නේ, රුපියල් කෝටි 8,200යි. තමුන්නාන්සේලා කියනවා, ගුරුවරුන්ට පඩි වැඩි කරන්න රුපියල් බිලියන 56ක් අවශ්‍ය වෙනවා කියලා. හැබැයි, රාජ්‍ය ආයතන 19ක පළමුවැනි මාස හතරේ පාඩුව රුපියල් බිලියන 82ක් බවට පත්වී තිබෙනවා. ඒ කියන්නේ, මේ වසර අවසන් වෙනකොට ආසන්න වශයෙන් ගත්තොත් ඒ මුදල රුපියල් බිලියන 240 ඉක්මවනවා. ඒ කියන්නේ, රුපියල් කෝටි 240,000ක්. මතක තබා ගන්න. ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමනි, SriLankan Airlines එකේ පාඩුව කීයද කියලා ඔබතුමා දන්නවා. SriLankan Airlines එක පවරා ගත්ත දවසේ සිට අද වන විට පාඩුව රුපියල් බිලියන 370යි. ඒ කියන්නේ, කෝටි 37,000යි. අපි අහනවා, එවැනි ආයතන නඩත්තු කළ යුතු ද කියලා. පළමුවැනි මාස හතරේ SriLankan Airlines එකේ පාඩුව රුපියල් බිලියන 24යි. ඒ කියන්නේ, රුපියල් කෝටි 2,400යි. පළමුවැනි මාස හතරේ තෙල් සංස්ථාවේ පාඩුව රුපියල් බිලියන 45යි. ඒ කියන්නේ, රුපියල් කෝටි 4,500යි. මොකක්ද සිදුවී තිබෙන්නේ?

[ගරු අනුර දිසානායක මහතා]

දැන් රාජ්‍ය ආයතන මහා බරක් බවට පත් වෙච්ච ආයතන බවට පත්වී තිබෙනවා. ඒ මොකක් නිසා ද? තෙල් සංස්ථාව පාඩු වෙමින් තිබියදී ලැයිස්තුවලින් සේවකයන් බඳවා ගත්තා. CPSTL ආයතනයට දේශපාලන ලැයිස්තුවලින් 100කට ආසන්න සංඛ්‍යාවක් සේවකයෝ දැම්මා. ඒ ආයතන කඩා වැටෙනවා. හැබැයි, දේශපාලන ලැයිස්තුවලින් තව සේවකයෝ දානවා. ගරු කථානායකතුමනි, තෙල් සංස්ථාව විතරක් රාජ්‍ය බැංකු දෙකට තිබෙන ණය ප්‍රමාණය රුපියල් බිලියන 670යි. ඒ කියන්නේ, රුපියල් කෝටි 67,000යි. ලංකා බැංකුවට සහ මහජන බැංකුවට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ණයයි. මේ මුදල් කාගේද? මහජනයාගේ තැන්පතු මුදල්. මේ මුදල්වලින් මොකක්ද කරලා තිබෙන්නේ? ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලංකා බැංකුවෙන්, මහජන බැංකුවෙන් ණය අරගෙන තිබෙනවා. ඒ මුදල් කොහේ සංවර්ධනයකටද යන්නේ? ඒ මුදල් යොදවන්න යන්නේ කොහේටද? ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රුපියල් බිලියන 670ක ණයකරුවකු බවට පත්වෙලා තිබෙනවා. ඒ වාගේම SriLankan Airlines එක පවරා ගත් දවසේ සිට රුපියල් බිලියන 370ක ණයකරුවකු බවට පත්වී තිබෙනවා, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ. මෙකයි මේ රටේ තත්ත්වය. ඒ නිසා මේ ආයතනවල බරත් මේ ආර්ථිකයට මහා හෙණයක් හැටියට පහත්වෙමින් තිබෙනවා. දැන් තමුන්නාන්සේලා මොකක්ද කරන්න ඕනෑ?

මා කියන්නේ මෙයයි. පළමුකොටම මේ පිළිබඳව සැබෑ තත්ත්වය තමුන්නාන්සේලා මේ රටට ඉදිරිපත් කරන්න. ඒක තමයි, අංක එක. අංක දෙක විධියට මේ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග ගණනාවක් තිබෙනවා. පළමුකොටම රාජ්‍යය කාර්යක්ෂම කිරීම සහ මුදල් නාස්තියට, වංචාවට, දූෂණයට තිත තැබීම සඳහා වේගවත් සැලැස්මක් හදන්න ඕනෑ. රාජ්‍ය ආදායම මෙපමණ අඩුවෙමින් තිබියදී තමයි, කිලෝග්‍රෑම් එකකට රුපියල් 28ක්ව තිබුණු සීනි බද්ද ශත 25 දක්වා අඩු කළේ. ඒ කවුරු වෙනුවෙන්ද? එය කළේ මේ පාර්ලිමේන්තුවේ වාඩිවෙලා සිටින කිසිම මන්ත්‍රීවරයකු වෙනුවෙන් නොවෙයි. ඒ වාගේම මේ රටේ සීනි පරිභෝජනය කරන ජනතාව වෙනුවෙනුත් නොවෙයි. සීනි සඳහා රුපියල් 28ක බද්දක් තිබුණා. ඒක ශත 25 දක්වා අඩු කළා 'විල්මාර්' ආයතනය වෙනුවෙන් පමණක්. ඒ අනුව, භාණ්ඩාගාරයට ලැබිය යුතු ධනය රුපියල් කෝටි 1,500ක් එක සමාගමක් වෙත ගලාගෙන යන්න ඉඩ සැලැස්වුවා. තමුන්නාන්සේලා මේවා කරන්නේ කවුරු වෙනුවෙන්ද?

ඒ විතරක් නොවෙයි, මේ වනකොට රජය මහා පරිමාණ ඉදිකිරීම්වලට යමින් තිබෙනවා. මේ රටේ කොන්ක්‍රීට් වනාන්තරයක් ගොඩ නැඟුවා කියලා ජනතාවගේ කුසගින්නට උත්තරයක් ලැබෙන්නේ නැහැ. එම නිසා කොන්ක්‍රීට් වනාන්තරයක් වෙනුවට රටේ ජන ජීවිතයත් එක්ක සම්බන්ධ වුණු සංවර්ධන මාවතකට ඔබතුමන්ලා යන්න. මේ මහා පරිමාණ කොන්ක්‍රීට් වනාන්තර අද අපේ රටට බරක් වෙලා තිබෙනවා. ඒවා ණය ගෙවා ගැනීමට බැරි, ප්‍රතිලාභයක් නැති ආයතන බවට පත්වී තිබෙනවා. ඒවා ආර්ථිකයකට බරක් බව ඔබතුමන්ලා මතක තබාගන්න. නමුත්, අද බර සහිත කොන්ක්‍රීට් වනාන්තර ගොඩ නැඟෙමින් තිබෙනවා. තමුන්නාන්සේලා ඒක නතර කරන්න.

මේ අර්බුදයෙන් මිදෙන්න තමුන්නාන්සේලා තෝරාගෙන තිබෙන්නේ මාර්ග තුනයි. එකක්, ණය ගැනීම. දෙවැනි එක, විකිණීම. තුන්වැනි එක, මුදල් අච්චු ගැසීම. දැන් මොකක්ද කරලා තිබෙන්නේ? තමුන්නාන්සේලා අපේ රටේ ආයතන විකුණන්න හදනවා. මේ, විශේෂයෙන් සරත් වීරසේකර අමාත්‍යවරයා නියෝජනය කරන ආණ්ඩුව. ඒගොල්ලන් දේශ ප්‍රේමීත්වය දෝරෙ ගලා ගෙන ගිය, ඇඟට ඇඟිල්ලකින් ඇන්නත් දේශ ප්‍රේමීත්වය එළියට පනින පාලකයෝ. හැබැයි, දැන් මොකක්ද වෙමින් තිබෙන්නේ? තමුන්නාන්සේලා කෙරවලපිටිය බලාගාරයෙන් සියයට 40ක් ඇමෙරිකානු සමාගමකට පවරා දුන්නා. කෙරවලපිටිය බලාගාරයට එළන ගෑස් නළ පද්ධතියක්, ඒවා ගබඩා කිරීමේ ගබඩා සංකීර්ණයක් හදන්න විදුලිබල අමාත්‍යවරයා ටෙන්ඩර් කැඳවා තිබුණා. එසේ තිබියදී ඒ වැඩේ ඇමෙරිකානු සමාගමකට පවරා දුන්නා. ඒ, ඇයි? කෙරවලපිටිය බලාගාරයේ සියයට 40 කොටස් අයිතිය ගන්නේ මේ ඉදිකිරීම් දුන්නොත් විතරයි කියලා ඇමෙරිකානු සමාගම කිව්වා. එහෙම නම් කෝ, දේශ ප්‍රේමීත්වය?

ඒ වාගේම, අපේ රටේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඒකාධිකාරිත්වයක් තිබුණු බව තමුන්නාන්සේලාත් දන්නවා. ඛනිජ තෙල් සංස්ථා පනත අනුව තෙල් ගෙන්වීම, බෙදා හැරීම, පිරිපහදු කිරීම, මිශ්‍ර කිරීම, ගබඩා කිරීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඒකාධිකාරයක්. මේ වනකොට උදය ගම්මන්පිල අමාත්‍යවරයා කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා, එම පනත සංශෝධනය කරලා තෙල් ඒකාධිකාරිත්වය බිඳින්න; රාජ්‍ය අධිකාරිත්වය බිඳින්න. එහෙමනම්, දේශ ප්‍රේමීත්වය කොතැනද තිබෙන්නේ?

ඊළඟට තමුන්නාන්සේලා දන්නවා, සෙලෙන්දිවා ආයතනය ගොඩ නඟා කොළඹ මහ තැපැල් කාර්යාලය පිහිටි බිල්ඩිම, ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය, යෝර්ක් ගොඩනැඟිල්ල, විදේශ කටයුතු අමාත්‍යාංශය පිහිටි ගොඩනැඟිල්ල, හිල්ටන් හෝටලය ආදී ජාතික සහ පෞරාණික උරුම විකුණන්න සැලසුම් කර තිබෙන බව. කොම්පඤ්ඤවීදියේ ගුවන් හමුදා කඳවුර පිහිටි භූමිය විකුණන්නත් අද සැලසුම් කරමින් තිබෙනවා. ඒ වාගේම බේරේ වැව අසළ තිබෙන ඉඩම් විකුණන්නත් අද සැලසුම් කරමින් තිබෙනවා. තමුන්නාන්සේලා කවුද? මට දැනෙන විධියට මුදල් රාජ්‍ය අමාත්‍ය කබ්රාල් මහතා ඉතා හොඳ බ්‍රෝකර්වරයෙක්. ඇත්තටම ඊට වඩා හොඳයි, බ්‍රෝකර් සමාගමක් දැම්මා නම්. ඒවා කරන්න ආණ්ඩු හදන්න ඕනෑ නැහැ. රාජ්‍ය දේපළ විකුණන්න බ්‍රෝකර් සමාගමක් අද අපි ඉදිරිපිට තිබෙනවා. එම නිසා තමුන්නාන්සේලාගේ පිළිවෙත වෙලා තිබෙන්නේ රාජ්‍ය දේපළ විකිණීමත්, ණය ගැනීමත්, නැවත මුදල් අච්චු ගැසීමත්.

ගරු කථානායකතුමනි, අපේ රටේ මහ පොළොව, පස වස විසවලින් පිරිලා තිබීම පිළිබඳව අපට විවේචනයක් තිබෙනවා. ඒක නැවත සංරක්ෂණය කර ගැනීමේ ඕනෑකමත් අපට තිබෙනවා. අපේ රටේ පුරවැසියන් වකුගඩු රෝගයෙන්, පිළිකා රෝගයෙන් පෙළෙන තත්ත්වයකට පත්වී තිබෙනවා. අපි ඒ ජීවිත නැවත සුරක්ෂිත කරන්න ඕනෑ; සුවපත් කරන්න ඕනෑ. ඒ පිළිබඳව විවාදයක් නැහැ. හැබැයි, රසායනික යෙදවුම් නතර කිරීමට ආණ්ඩුව කඩිමුඩියේ ගත් තීන්දුව අපේ රටේ මුළු නිෂ්පාදනයටම බලපෑමක් ඇති කරමින් තිබෙනවා. ගිය අවුරුද්දේ ජූනි මාසයේ තේ නිෂ්පාදනය හා සංසන්දනය කර බලනකොට මේ අවුරුද්දේ ජූනි මාසයේදී තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් ලක්ෂ 14කින් අඩුවෙලා තිබෙනවා. ඒ වාගේම මම මේකත් කියනවා. ලබන අවුරුද්දේ ජූලි, අගෝස්තු, සැප්තැම්බර් මාස වනකොට මීට වඩා වැඩි ප්‍රමාණයකින් මේ තේ නිෂ්පාදනය කඩා වැටෙනවා. ඒ වාගේම තමුන්නාන්සේලා මේ සඳහා නිසි යෙදවුම් යොදන්න සමත් වුණේ නැත්නම් අපේ රටේ ගොවීන් ගොවිතැන අත්හැර දමනවා. අපේ රටේ භූමියෙන් සියයට 11ක් කෘෂි කාර්මික බිම්. අපේ රටේ ශ්‍රම බලකායෙන් සියයට 27ක් කෘෂි කර්මාන්තයේ යෙදෙනවා. අපේ ජාතික නිෂ්පාදනයට සියයට හතහමාරක පමණ දායකත්වයක් දෙන්නේ කෘෂි කර්මාන්තයෙන්. අපේ අපනයන ආදායමින් සියයට 25ක් ලැබෙන්නේ කෘෂි කර්මාන්තයෙන්. අපේ රටේ කාර්මික නිෂ්පාදනවලින් සියයට 25ක් කෘෂි කර්මාන්තය

පදනම් වූ නිෂ්පාදන. ඒ අනුව, කෘෂි කර්මාන්තය කියන්නේ අපේ රටේ ආර්ථිකයේ ප්‍රධාන පංගුවක්. ඒ පංගුව පිළිබඳව තීන්දුවක් ගන්න ඕනෑ කොහොමද? ඒ පංගුවක යෙදවුම් පිළිබඳව තීරණයක් ගන්න ඕනෑ. ගරු විමල් රාජපක්ෂ මැතිතුමනි, ඔබතුමා තිස්සමහාරාමයේ, යෝධ වැව යටතේ, තිසා වැව යටතේ, ලුණුගම්වෙහෙර ව්‍යාපාරය යටතේ වගා කරන ගොවියෙකු බව මම දන්නවා. මම ඔබතුමා ගැන දන්නවා. ඔබතුමා ගොවිතැනත් එක්ක සම්බන්ධවෙලා කටයුතු කරනවා. මහ කන්නයේ නිසි පරිදි යෙදවුම් ලැබුණේ නැත්නම් වගා කරන්න පුළුවන්ද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි. ඔබතුමාට මේ ගරු සභාවේදී කියන්න බැරි නම් මේ විකාරය ගැන මල්ලීට ගිහිල්ලා කියන්න. මම යෝජනා කරන්නේ ඒකයි. ඔබතුමා ජනාධිපති මල්ලීට කියන්න. එතුමා කුඹුරුවල ඇවිදලා නැතිව ඇති. නමුත්, ඔබතුමා කුඹුරුවල ඇවිදලා තිබෙනවා.

නිෂ්පාදනය කඩා වැටීම නිසා සිදු විය හැකි දේ මොකක්ද? අනිවාර්යයෙන්ම ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා මේ තීන්දුව ආපසු අකුළනවා පරණ විධියටම. එහෙම නැත්නම් අපේ රටේ ආහාර හිඟයක් ඇති වනවා. කාබනික ගොවිතැන, පස සුවපත් කිරීම ගැන විද්‍යාත්මක වැඩ පිළිවෙළක් හදලා, අපේ පක්ෂයේ සාමාජිකයන් ඒ පිළිබඳව පර්යේෂණ කරලා තිබෙනවා.

ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ගියේ බියගම කොහේටද? අපේ පක්ෂයේ බියගම සංවිධායකතුමාගේ පර්යේෂණාගාරය බලන්නයි ඔබතුමා ගියේ. ඔබතුමා ශ්‍රාවස්තිපුර කොහේටද ගියේ? අපේ පක්ෂයේ, නැඟෙනහිර නුවරගම් පළාතේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගේ කුඹුර බලන්නයි ඔබතුමා ගියේ. අපි, ඒවා ප්‍රායෝගිකව කරන මිනිස්සු. ඒ නිසා ජාතික වශයෙන් කොච්චර අස්වනු ප්‍රමාණයක් ගෙනෙන්න පුළුවන්ද, කොච්චර කාලයකින් ගෙනෙන්න පුළුවන්ද කියලා අපි දන්නවා. නමුත්, එහෙම කිසි දැක්මක්, සැලැස්මක් නැතිව අද අපේ රටේ ජාතික නිෂ්පාදනය කඩා වට්ටන සැලැස්මකට ඇවිල්ලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මා අවසන් වශයෙන් කියන්නේ මේකයි. අද විශාල ඩොලර් හිඟයක් තිබෙනවා. පසුගිය ජූලි මාසයේ 05 වැනිදා ආපු තෙල් නැව බාගන්න බැරි වුණා. ඒකට දවස් දෙකක් demurrages ගෙව්වා. ඒ තෙල් නැව අම්බානිගේ සමාගමෙන් ගෙනාවේ. අම්බානි සමාගමට තමයි අපි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් නැෆ්තා දෙන්නේ. නැෆ්තා දෙනවා කියලා තමයි අපි ඩොලර් මිලියන 10ක තෙල් නැව බා ගත්තේ. දවස් දෙකක් demurrages ගෙව්වා. තව පෙට්‍රල් නැවක් ආනයනය කරන්න සැලසුම් කළා, ජූලි මාසයේ 19වැනි දාට පෙට්‍රල් හිඟ වනවා කියලා. ඒ ටෙන්ඩරය කැඳවූවා. නමුත් ටෙන්ඩරය cancel කළා, ඩොලර් ගෙවා ගන්න බැරිව. 22වැනි දා එන්න තිබුණු පෙට්‍රල් නැව අම්බානි සමාගම එක්ක කථා කරලා, 19වැනි දාට ගෙනෙන්න කටයුතු කළා. ඒ නිසා මේක 'අඩ්ඩඩ්ඩාවෙන්' දුවන්නේ. කොයි වෙලාවේ, කොතැන මේ තත්ත්වය පුපුරයිද කියන සැකය මතු වී තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවක් හැටියට පළමු කොටම තමුන්නාන්සේලා ආදර්ශයක් ලබා දෙන්න. මේ රටේ වියදම් කපන්න ලැහැස්තියි, අරපරිස්සම් ලෙස වියදම් කරන්න ලැහැස්තියි, කළමනාකරණය කරන්න ලැහැස්තියි කියන ආදර්ශය තමුන්නාන්සේලා ලබා දෙන්න.

අවසන් වශයෙන් මා මේ කාරණයත් කියන්න කැමැතියි. ඔලිම්පික්වලට ඇමතිවරු හතර පස් දෙනෙකු යන්නේ මොකටද? මොකක්ද දෙන ආදර්ශය? ඒ අය යන්නේ දුවන්නද? ඒවාට වියදම් වෙන්නේ ඩොලර්. ඩොලර් හිඟ තිබෙන රටක මොකක්ද මේ කරන්නේ? ඒ නිසා අමාත්‍යවරු ආණ්ඩුවක් හැටියට නිසි ආදර්ශයක් ලබා දෙමින්, මේ ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව රටට පැහැදිලි කරමින්, රාජ්‍යයත්, පෞද්ගලික අංශයත්, පොදු ජනතාවත් ඒකාබද්ධ කැප කිරීමක් හා මැදිහත්වීමක් සහිත වැඩ පිළිවෙළක් හැදුවේ නැත්නම්, අපේ රටට විශාල ආර්ථික උගුලක හිර වීමේ අනතුරකට මුහුණ පාන්නට සිදු වනවා කියන කාරණය අවධානයට යොමු කරමින් මා නිහඬ වනවා.

මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු කථානායකතුමාට මා ස්තුතිවන්ත වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට යෝජනාව ස්ථිර කිරීම, ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.58]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඉතා කෙටි කාලයක් නේ මට තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

සභාව කල් තබන අවස්ථාවේ ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව මා ස්ථිර කරනවා. එතුමා කථාව අවසානයේදී කිව්වා, සමහර වෙලාවට රසායනික පොහොර ආනයනය කිරීමේ තීරණය වෙනස් කරයිද දන්නේ නැහැ කියලා.

ගරු කථානායකතුමනි, ගරු විමල් රාජපක්ෂ ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ අත්සනින් ඊයේ නිවේදනයක් නිකුත් කර තිබෙනවා, සියලු බැංකුවල ප්‍රධාන විධායක නිලධාරින්ට. ඒ නිවේදනය මා සභාගත කරන්න කැමැතියි. මේ අවස්ථාවේ ඉඳලා අලුත් ගැසට් එකක් ගහලා තිබෙනවා. ඒ ගැසට් එක පරිගණකයෙන් download කර ගන්න මම උත්සාහ කළා. නමුත්, Internet එකේ එය නැහැ. මෙතෙක් තහනම් කර තිබූ නොයෙකුත් රසායනික පොහොර ආනයනය කිරීමේ නිවේදනය අගෝස්තු 01වැනි දා ඉඳලා ඉවත් කර තිබෙනවා. ඒවා licence එකක් යටතේ ගෙනෙන්න පුළුවන් කියලා මේ නිවේදනයේ කියනවා.

ගරු කථානායකතුමනි, Imports and Exports (Control) Act එක යටතේ, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ අත්සන-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු රංජිත් සියඹලාපිටිය මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிட்டிய] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. RANJITH SIYAMBALAPITIYA] *took the Chair.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය සඳහන් වෙලා තිබෙන්නේ ඉංග්‍රීසියෙන් විතරයි. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඉංග්‍රීසියෙන් විතරයි තිබෙන්නේ. සිංහල භාෂාවෙන් නැහැ. HS Code 31.02 යටතේ තිබෙනවා, "Mineral or chemical fertilizers, nitrogenous" කියලා. ඊළඟට, 31.03 යටතේ "Mineral or chemical fertilizers, phosphatic", 31.03 යටතේ තිබෙනවා, "Mineral or chemical fertilizers, potassic" කියලා තිබෙනවා. ඒක සිංහලට පරිවර්තනය කළොත් කියන්නේ, නයිට්‍රජනීය ඛනිජමය හෝ රසායනික පොහොර; පොස්පැටික ඛනිජමය හෝ රසායනික පොහොර කියලායි. මෙහිදී ඉතාම පැහැදිලිව කියනවා, නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් යන මූල ද්‍රව්‍යයන්ගෙන් දෙවර්ගයක්, තුන්වර්ගයක් අඩංගු ඛනිජමය හෝ රසායනික පොහොර වර්ග, තහනම් කරලා තිබිච්ච ලැයිස්තුවෙන් ඉවත් කරලා කියලා. ඉතින් මම කැමැතියි, ගරු මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් ඊළඟ කථාව කරන රජයේ අමාත්‍යවරයෙකුගෙන් මේකට පිළිතුරක් ලබා ගන්න.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දිගින් දිගටම කිව්වා, "මම මේක කිසිසේත් reverse කරන්නේ නැහැ. මම රසායනික පොහොර ආනයන සීමාව දැඩිව ක්‍රියාත්මක කරනවා" කියලා. අපි කවුරුත් විශ්වාස කරනවා, ඛනිජමය පොහොර - mineral fertilizer - එහෙම නැත්නම් කාබනික පොහොර අවශ්‍ය බව. ඒ වෙනස් වීම සම්බන්ධයෙන් අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. නමුත් මෙහිදී පැන නැඟුණු ගැටලුවක් තිබෙනවා. ඒ, එම තීරණය වහාම ක්‍රියාත්මක කිරීම හරහා ගොවි මහත්වරුන්ට සහ සාමාන්‍ය පාරිභෝගිකයන්ට උද්ගත වෙලා තිබුණු ගැටලුවයි. ඉතින් මේ reverse කිරීම ගැන මම අහන්න කැමැතියි, එහෙම දෙයක් කරලා තිබෙනවාද, එහෙමත් නැත්නම් බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්ට යවා තිබෙන ලියුම ව්‍යාජ එකක්ද කියලා. ඒ කාරණය සම්බන්ධයෙන් විග්‍රහයක් කරයි කියා මම බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ලිපිය සහ රෙගුලාසි ඇතුළත් ලේඛනය හැන්සාඞ්ගත කරන්න කියා ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින් මම ඒවා **සභාගත*** කරනවා.

ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා මූලික වශයෙන් කරපු විග්‍රහයට අපි සම්පූර්ණයෙන් එකඟ වෙනවා. ඒ නිසා මේ රටේ ආර්ථික ප්‍රශ්නය පිළිබඳ කථා කරන්න මම නැවතත් බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, අපි කවුරුත් ඒ ගැන දන්නවා. මෙතැන තිබෙන ගැටලුව තමයි, අපි මොකක්ද කළ යුත්තේ, කොහොමද මෙතැනින් එළියට එන්න ඕනෑ කියන එක. ඒකට විසඳුමයි අපේ මේ විවාදය තුළින් සොයන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුව විශ්වාස කරන ක්‍රම තුනක් ගැන කිව්වා. කෙටි කාලීනව ණය ගන්න ඕනෑ කිව්වා. එහිදී බංග්ලාදේශය, ඉන්දියාව, චීනය ආදි නොයෙකුත් රටවලින් කෙටිකාලීන ණය පහසුකම්, එහෙමත් නැත්නම් swap ණය ගන්නවා කිව්වා. මේක ද්‍රවශීලතාවේ ගැටලුවක්; this is a liquidity problem. ඒ නිසා තමන්ට cash flow එකක් තිබෙනවා නම් ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් කියලා තමයි එතුමන්ලා විශ්වාස කරන්නේ. ඊළඟට එතුමන්ලා කියනවා, සෙලෙන්දිවා යනාදී ආයතන හරහා අවශ්‍ය සම්පත් විකුණා මේ අවුරුද්දේ ඉදිරි මාස හයේ පමණක් ඩොලර් මිලියන 400ක් ලබා ගන්න එතුමන්ලා බලාපොරොත්තු වන බව. ඊළඟට කිව්වා, ආනයන සීමා කරලා අපනයන ශක්තිමත් කරලා වෙළෙඳ ශේෂයේ සහ ජංගම ගිණුමේ හිඟය අඩු කර ගන්න උත්සාහ කරනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී අපට පැහැදිලි කර ගන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. ඒ තමයි එතුමන්ලා -ආණ්ඩුව - විශ්වාස කරන වැඩ පිළිවෙළ මොකක්ද කියන එක. ආනයනය තහනම් කරන්න, එහෙම නැත්නම් සීමා කරන්න, ඊට පස්සේ අපනයනය වැඩි කරගන්න පුළුවන් කියා එතුමන්ලා විශ්වාස කරනවාද? "අපි භාණ්ඩ ගේන්න දෙන්නේ නැහැ. නමුත්, අපේ රටින් පිට රටවලට ගෙන යන ඒවා සම්බන්ධයෙන් අපි දැඩිව මැදිහත් වෙලා වැඩ කරනවා" කියලා අපේ රටේ භාණ්ඩ ආනයනකරුවන්ට කියන බව ද ඒ කියන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් ලෝකයේ එහෙම වෙන්නේ නැහැ. එක්කෝ විවෘත වෙන්න ඕනෑ; එහෙම නැත්නම් සංවෘත වෙන්න ඕනෑ. ඔය දෙකම කරන්න බැහැ; රෑවුලයි කැඳයි දෙකම බේරා ගන්න අපට බැහැ. එහෙම නම්, මේ මතවාදය සම්බන්ධයෙන් අපට හිතන්න වෙනවා, කොයි ආකාරයටද මේ ප්‍රශ්නයට විසඳුම සොයන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට පෙන්වන්න කැමැතියි මා ළඟ තිබෙන මේ ලෝක සිතියම. මේ ලෝක සිතියමේ රටවල් 43ක් ලකුණු කර තිබෙනවා. මෙහි ලකුණු කර තිබෙන්නේ, අද පාවිච්චි කරන මෙන්න මේ දුරකථනය, එහෙම නැත්නම් iPhones හදන රටවල් 43. අපේ ගරු මන්ත්‍රීවරුන් 225දෙනා ළඟම මේ උපකරණය තිබෙන නිසා එය උදාහරණයට ගෙන කථා කරන්න මම බොහොම කැමැතියි. අපේ රට මේ ගෝලීය නිෂ්පාදන ජාලයේ නැහැ. අපේ රටේ නම මේ රටවල් අතරට එකතු වන්නේ නැහැ.

ඒකට හේතුවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ආණ්ඩුව විශ්වාස කරනවා, 'මේ රට ඇතුළේ කරන අපේ නිෂ්පාදනවලින් ස්වයංපෝෂිත වෙන්න අපට පුළුවන්. ඒ නිසා බදු තාප්ප ගහලා, ආනයනය අඩු කරලා, සමහර වෙලාවට ආනයනය සම්පූර්ණයෙන් නතර කරලා, එහෙමත් නැත්නම් බදු සීමා ඉහළ දාලා දේශීය ආර්ථිකය ගොඩ ගන්න අපට පුළුවන්. ඒ නිසා විදේශ රටවල් සමඟ සම්බන්ධ වෙන්න අවශ්‍යතාවක් අපට නැහැ. අපට වෙළෙඳ ගිවිසුම් සමඟ එකඟ වෙන්න අවශ්‍යතාවක් නැහැ. අපට ගෝලීය නිෂ්පාදන ජාල සමඟ එකතු වෙන්න අවශ්‍යතාවක් නැහැ. අපට ආනයන ආදේශන කර්මාන්තකරණය හරහා දියුණු වෙන්න පුළුවන්.' කියලා. නමුත් ඒ විශ්වාසය පිළිබඳ ගැටලුවක් තිබෙනවා. ආනයන ආදේශන ප්‍රතිපත්තියත්, අපනයන ප්‍රතිපත්තියත් අතර ලොකු පරස්පරයක් තිබෙනවා. අපි විශ්වාස කරන්න නරකයි අප මුහුණ දෙන මේ ගැටලුවෙන් එළියට එන්න තිබෙන විකල්පය ඔය කියන ආනයන ආදේශන වැඩ පිළිවෙළයි කියලා. මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ලෝකයේ බොහෝ රටවල් මීට කලින් උත්සාහ කර තිබෙනවා; දකුණු ඇමෙරිකාවත්, ඉන්දියාවත්, වර්ෂ 1970-1977 කාලයේදී ලංකාවත් උත්සාහ කර තිබෙනවා. නමුත් එය සාර්ථක වුණේ නැහැ. එමඟින් ජනතාව බෙහෙවින් අපහසුතාවට පත් වුණා; විරැකියාව වැඩි වුණා; මිනිසුන්ට කන්න බොන්න නැති වුණා. ඒ වාගේ කාලයක් නැවත උදා වනවාට කවුරුවත් කැමැතියි කියලා, කවුරුත් ඒකට සූදානම් කියලා මම හිතන්නේ නැහැ. කවුරුවත් ඒකට කැමැති නැහැ. ඒ නිසා මේ මතවාදය පිළිබඳ සලකා බැලිය යුතුය කියා මම හිතනවා. ඔබතුමන්ලා තමයි රජය කරගෙන යන්නේ. ඔබතුමන්ලාගේ රජය තුළ මේ සම්බන්ධයෙන් ධනාත්මක කථිකාවක් ඇති වෙන්න ඕනෑ.

සමහරුන් අද විවේචනාත්මකව ආණ්ඩුවට උපදෙස් දෙන ආකාරය මම දකිනවා. IMF එකට යන්න කියනවා; ආනයන බදු තාප්ප අයින් කරන්න කියනවා. නමුත් අපට ඒවායෙන් වැඩක් නැහැ, සියලු දේ හරියාකාරව කරන්න අපි දන්නවා කියනවා. එහෙම හිතන්න එපා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මේ කාරණයත් කියලා මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේක අපි සියලුදෙනාගේ රට. අපි හැම වෙලාවේම බලන්න ඕනෑ මොනවාද තිබෙන සාක්ෂි - what the evidence is - කියලායි. සාක්ෂි එක්ක තමයි අපි ඉස්සරහට යන්න ඕනෑ. පසුගිය, යල් පැනපු මතවාදවල රැඳිලා ඉන්න එක ඇත්ත වශයෙන්ම අපේ ආර්ථික ගමනට බාධාවක්. මම අහගෙනයි බැසිල් රාජපක්ෂ ඇමතිවරයා ගැන සමහරුන් දක්වන අදහස. ඒ අය කියා තිබෙනවා, "එතුමා යථාර්ථවාදියෙක්. ඒ නිසා මේ අදහස් පිළිබඳ යම්කිසි වෙනසක් කරගන්න එතුමා බලාපොරොත්තු වෙනවා" කියලා.

අවසාන වශයෙන් මම කියන්නේ මේකයි. 1978 වර්ෂයේදී චීනයේ ඩෙං ෂියාඕපිං ජනාධිපතිතුමාගෙන් මිනිස්සු ඇහුවා, "ඇයි මේ කොමියුනිස්ට්වාදය අත් හැරලා වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමයකට යන්නේ?" කියලා. මොකක්ද දන්නවා ද එතුමා කිව්වේ? එතුමා කිව්වා, "බළලා මීයන් අල්ලනවා නම්, ඒ බළලා සුදු ද, කළු ද කියන එක මට වැඩක් නැහැ. වැඩේ වෙනවා නම් ඒ යථාර්ථවාදී ක්‍රමයට තමයි අපි යන්න ඕනෑ" කියලා. ඒ නිසා ආණ්ඩුව යථාර්ථවාදී වෙන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු අජිත් නිවාඩ් කබ්රාල් රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.08]

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා (මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால் - நிதி, மூலதனச் சந்தை மற்றும் அரச தொழில்முயற்சி மறுசீரமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Nivard Cabraal - State Minister of Money and Capital Market and State Enterprise Reforms)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මට මේ කාලය ලබා දීම පිළිබඳව. මහ බැංකුවේ හිටපු අධිපතිවරයකු හැටියට මට මෙය ඉතාම සුවිශේෂී අවස්ථාවක්. අවුරුදු 9ක පමණ කාලයක් මහ බැංකුවේ, එනම් අපේ රටේ ආර්ථිකයේ කේන්ද්‍රස්ථානයේ අධිපතිවරයා හැටියට කටයුතු කරපු මට ශ්‍රී ලංකා මහ බැංකුවේ 2020 වාර්ෂික වාර්තාව පිළිබඳව පාර්ලිමේන්තුවේදී අද පැවැත්වෙන මේ විවාදයට එකතු වීමට භාග්‍යය ලැබීම ගැන මම සතුටු වෙනවා.

මේ විවාදයේදී මේ වන විට විපක්ෂයේ කථා දෙකක් අපි ඇහුවා. ඒ කථා අහද්දී මට මතක් වුණේ ලෙඩක් ගැන කියන පිරිසක්. ලෙඩේ ගැන කියන සමහර අය ඇවිල්ලා, ලෙඩේ මේකයි කියනවා. සමහර අය ලෙඩේ ලොකු කරලාත් කියනවා. ලෙඩේ කිව්වාට සමහර අය කිසි විටෙක ලෙඩේට බෙහෙත් සොයලා නැහැ. ඒ අයට බෙහෙත් සොයන්න තේරෙන්නේත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මහ බැංකුවේ අධිපතිවරයා හැටියට සිටින විට Monetary Policy එක පිළිබඳව හැම සති දෙකකට සැරයක් විග්‍රහයක් කළා මට මතකයි. එය කරන අය ඉතාම පැහැදිලි ලෙස ඒ ඔක්කොම විග්‍රහ කරනවා. Risks මොනවාද කියා පෙන්වා දෙනවා. ඒක සන්සුන්ව කියනවා. සමහර අය හඬ පොඩ්ඩක් වැඩි කරලා කෑ ගැහුවා කියලා එහි වෙනසක් වන්නේ නැහැ. එම නිසා අපි තේරුම් ගන්නට ඕනෑ, ලෙඩේ කියන්න පුළුවන් මිනිසුන් සිටියත් ලෙඩේට බෙහෙත් දෙන්න ඒ අයට තේරෙන්නේ නැති බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ දෙනෙකු රටේ ණය බර පිළිබඳ කථා කරන නිසා මම අද හිතුවා ඒ පිළිබඳව කථා කරන්න. ණය පිළිබඳ කථා කරමින් එතුමන්ලා කියනවා, "ආණ්ඩුවට ණය ගෙවා ගන්න බැරි වෙයි" කියලා. 2020 අවුරුද්දේ ණය ගෙවා ගන්න බැරි වෙයි කියලා බොහෝ දෙනෙක් කිව්වා. මා හිතන විධියට, ඒ ගොල්ලෝ බොහොම සන්තෝෂයෙන් සිටියා, 2020 අවුරුද්දේ ණය ගෙවා ගන්න අපට බැරි වෙයි කියලා. ඒ සතුට මැකී ගියා. ඊට පස්සේ කිව්වා, "නැහැ, නැහැ, 2020 වර්ෂයේදී නොවෙයි, 2021 වර්ෂයේදී ණය ගෙවන්න බැරි වෙනවා" කියලා. ඒ අය ඒකත් සිදු වනතුරු පුල පුලා බලා සිටියා. ඒකත් වෙන්නේ නැති බව දැන් තේරුණා. දැන් ආයෙත් කියනවා, "නැහැ, නැහැ, 2022 වර්ෂයේදී හරි 2023 වර්ෂයේදී හරි එහෙම වෙයි" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සිහිනයත් බොඳ කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

මෙහිදී අප තේරුම් ගත යුතු දෙයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 2005 වර්ෂයේ, එනම් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා රට භාර ගත් අවස්ථාවේ අපේ රටේ ණය බර දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට 91ක් ලෙසයි තිබුණේ. අපි ක්‍රමක්‍රමයෙන් එය අඩු කර ගත්තා, සියයට 71 දක්වා. සමහර අයට -ලෙඩේ කියන අයට- ඒක තේරෙන්නේ නැහැ. ඒ අය ඒක ගණන් ගන්නේත් නැහැ. සමහර විට ඒ ගැන දැනගෙන කට වහගෙන ඉන්නවාත් ඇති. එදා රටේ ණය බර අඩු වුණා. එය එසේ සිදු වනවාත් එක්කම සිදු වුණු දේවල් කීපයක් තිබෙනවා. ඒවා මොනවාද? එක කාලයක -2004 වර්ෂයේදී- රටේ විදේශ ණය බර දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට 48ක් පමණ වුණා. ඉන් පසුව සියයට 30 දක්වා විදේශ ණය අඩු වුණා. ඒත් එක්කම, රටේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ණය බර සියයට 71 දක්වා අඩු වුණා.

ස්වෛරීය බැඳුම්කර ගැන කථා කරපු නිසා මා ඒ ගැනත් කියන්නට අවශ්‍යයි. ස්වෛරීය බැඳුම්කර ප්‍රමාණය ඒ කාලයේ ඇමෙරිකානු ඩොලර් බිලියන 5යි. දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් බිලියන 80ක් වුණාම එහි ප්‍රතිශතයක් හැටියට ස්වෛරීය බැඳුම්කරවලට අදාළ ඩොලර් බිලියන 5 යනු සියයට 6.25 යි. එය, සියයට 6.25ක risk එකක්. එය, ඒ කාලයේ අපේ රටේ ආර්ථිකයට උහුලන්න පුළුවන් risk එකක්. එම නිසා තමයි ඒ කාලයේ ඒ විධියට සිදු වුණේ. එදා අනෙකුත් සියලු අංශවලින් ගත් ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 19යි; ස්වෛරීය බැඳුම්කරවලින් ඩොලර් බිලියන 5යි. ඒ කාලය වන කොට ඒ සම්පූර්ණ ප්‍රමාණය ඩොලර් බිලියන 24යි. අපි ආර්ථිකය වර්ධනය කළා. අපි ආර්ථිකය ඇමෙරිකානු ඩොලර් බිලියන 80 දක්වා වර්ධනය කළා; රුපියල ස්ථාවර කළා. ඒත් එක්කම, පොලී අනුපාතය - interest rate එක - ක්‍රමක්‍රමයෙන් අඩු කර ගැනීමටත් අපට පුළුවන් වුණා. ඒ නිසා තමයි ඒ කාලයේ අපේ රටේ ආර්ථිකයේ ස්ථාවරත්වයක් තිබුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමාටත් ඒ ගැන මතක ඇති. මොකද, ඒ

[ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා]

කාලයේ ඔබතුමා මුදල් නියෝජ්‍ය අමාත්‍යවරයා. ඔබතුමාත් ඒ ප්‍රයත්නයේ කොටස්කරුවෙකු වූ නිසා ඔබතුමාට එය හොඳින් මතක ඇති. නමුත්, 2019 වර්ෂය වන විට මොකද වුණේ? මීට ඉස්සෙල්ලා කථා කරපු පාර්ශ්ව දෙකම ඒ වෙච්ච දේට හවුල් වෙච්ච කණ්ඩායම්. 2019 වර්ෂය වන විට ඒ අය ණය බර වැඩි කර ගත්තා, ඇමෙරිකානු ඩොලර් බිලියන 35 දක්වා.

ඇමෙරිකානු ඩොලර් බිලියන 24ක්ව තිබුණු අපේ ණය බර, ඇමෙරිකානු ඩොලර් බිලියන 35 දක්වා වැඩි කර ගත්තා. හැබැයි දළ දේශීය නිෂ්පාදිතය වැඩි කර ගන්න පුළුවන් වුණේ, ඇමෙරිකානු ඩොලර් බිලියන 80 සිට 84 දක්වා පමණයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා විශේෂයෙන්ම ස්වෛරීත්ව බැඳුම්කරවල ණය බර සියයට 18 දක්වා වැඩි වුණා. සියයට 6.2 තිබුණු ස්වෛරීත්ව බැඳුම්කරවල ණය බර සියයට 18 දක්වා වැඩි වුණා; සියයට 5.8 තිබුණු පොලී අනුපාතය සියයට 7.8 දක්වා වැඩි කර ගත්තා. ඒ නිසා රටේ ණය ගෙවීමේදී servicing හැටියට ඩොලර් බිලියන 1ක පමණ වැඩිපුර මුදලක් අවුරුද්දකට ගෙවන්න සිදු වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ඒකෙන් ලබා ගත හැකි පාඩම තමයි, දළ දේශීය නිෂ්පාදිතය වැඩි කර නොගෙන ණය බර වැඩි කර ගත්තොත් එහි අවදානම බොහෝ වැඩි වන බව.

ඒ තත්ත්වයෙන් පැවැති රටක් තමයි අපි 2019 අග වනකොට භාර ගත්තේ. එදා රට භාර ගන්නකොටත් අපි දැනගෙන සිටියා, මේ තත්ත්වයේ තමයි රට තිබෙන්නේ කියලා. පවතින තත්ත්වය අනුව අලුත් විධියට හිතලා, ඒ ක්‍රමවේදය වෙනස් කරලා, මේ රට ඉදිරියට ගෙන යන්න කටයුතු කරන්න අපට සිදු වුණා. එහිදී අප කළ යුතුව තිබුණු දේ තමයි, නැවත වර්ධන වේගය වැඩි කර ගැනීම. පුළුවන් තරම් tax ගහලා වර්ධන වේගය වැඩි කර ගන්න බැහැ. සමහර අයට මෙය තේරෙන්නේ නැහැ. ඒ නිසා තමයි tax අඩු කළාම ඒ ගොල්ලෝ කෑ ගහන්නේ. ඒ ගොල්ලෝ හිතනවා tax ගහන්න, ගහන්න රජයේ ආදායම වැඩි වෙයි කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, tax අය කිරීමෙන් රජයේ ආදායම වැඩි වුණාට අනෙක් පැත්තෙන් පොලී අනුපාතය වැඩිවෙලා වියදම වැඩි වනවා නම්, tax ගහලා කිසි ප්‍රයෝජනයක් නැහැ. අපි ඒ ගැන දන්න නිසා අපට පුළුවන් වුණා tax අඩු කරලා, නැවත වරක් වර්ධන වේගය ඇති කරන්න.

කොවිඩ් වසංගතය නිසා අපට ලොකු ප්‍රශ්නයක් තිබුණා. අපට 2020 මාර්තු මාසයේ ඉඳලා රට වහන්න සිද්ධ වුණා. අපි දවස් 66ක් රට වසා තැබුවා. ඒ කාලය තුළ අපට සැහෙන පීඩනයකට මුහුණ පාන්න සිදු වුණා. පසුගිය අවුරුදු පහ තුළ පැවැති රජය ස්වෛරීත්ව බැඳුම්කර ඩොලර් බිලියන 10ක් නිකුත් කර තිබුණා. අපේ රටේ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 18ක් හෝ 20 විය යුතුව තිබුණා. අඩුම වශයෙන් ඩොලර් බිලියන 18කවත් සංචිත ප්‍රමාණයක් තිබිය යුතු වුණා. මා මහ බැංකු අධිපතිවරයාව සිට 2014 වසරේ අග එම තනතුරෙන් නික්ම යනකොට, රටේ තිබුණු සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 8.2යි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එම සංචිත ප්‍රමාණය අඩු වෙලා, ඩොලර් බිලියන 7.5ක සංචිත ප්‍රමාණයක් තමයි අපට භාර දුන්නේ. ඒ කියන්නේ, ඩොලර් බිලියන 10ක් ණයට අරගෙන, තිබුණු සංචිත ඩොලර් බිලියන 8ත් එකතු කරගෙන - ඩොලර් බිලියන 18ක් තිබිය යුතු තැන - අපට භාර දෙනකොට තිබුණේ ඩොලර් බිලියන 7.5ක සංචිත ප්‍රමාණයක් පමණයි. ඒ නිසා අපට යම් පීඩනයක් තිබුණා. ඒක කවුරු හෝ කෑ ගහලා කියන්න ඕනෑ නැහැ. අපිත් එය තේරුම් අරගෙන තිබෙනවා. ඒ පීඩනය නිසා තමයි අපට අරපිරිමැස්මෙන් කටයුතු කරන්න සිදු වුණේ. සමහර අවස්ථාවල අපට import restrictions පනවන්න සිදු වුණා. අපි එලෙස කටයුතු කළා. ඒ හරහා අපට රුපියල අවප්‍රමාණ වීම යම්තාක් දුරට පාලනය කර ගන්න පුළුවන් වුණා. නැත්නම් රුපියල අවප්‍රමාණ වීම අපට පාලනය කර ගන්න බැරි වනවා. එහෙම වුණා නම් අපට දැවැන්ත අර්බුදයකට මුහුණ දෙන්න සිදු වනවා.

අපි ගෙවිය යුතු සියලු ණය ගෙව්වා. අනෙකුත් සියලු අවශ්‍යතා වෙනුවෙන් ගෙවන්න තිබුණු මුදල් ගෙව්වා. එතුමන්ලා කිව්වා, "රජයට COVID-19 vaccines ගෙනෙන්න බැහැ, සල්ලි නැහැ" කියලා. බලාගෙන හිටියා, එහෙම වෙයි කියලා. එහෙම කෑ ගැහුවාට ඒ සියලු දේ කරන්න අපට පුළුවන් වුණා. ඒ අපේ තිබුණු මනා පාලනය නිසා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනදී අවශ්‍ය වෙන්නේ මනා පාලනය. ඒ පාලනය ඔස්සේ තමයි අපට මේ සියලු දේවල් කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. අපට ණය ගෙවන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම රටේ අවශ්‍යතා සපුරාලන්නට පුළුවන් වෙලා තිබෙනවා. ආර්ථික ක්‍රමවේද අනුව දිගින් දිගටම අපට කටයුතු කරගෙන යන්න පුළුවන් වෙලා තිබෙනවා.

අපි ඉදිරි කාලය තුළ දීත් ණය ගෙවනවා. එහෙම ණය ගෙව්වාම, 2020දී ස්වෛරීත්ව බැඳුම්කර තවදුරටත් අඩු වනවා. ඒ අනුව, 2021දී ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රමාණය සියයට 15 දක්වා අඩු වනවා. 2022දී එය සියයට 13 දක්වා අඩු වනවා. 2023දී එය සියයට 11 දක්වා අඩු වනවා. එලෙස ණය බර අඩු වීමෙන් අපට යම්කිසි ස්ථායිතාවක් ඇති කර ගන්න පුළුවන් වනවා. ඒක නිසා මේ කාලය තුළදී අපි යම් ආකාරයකට අරපිරිමැස්මකින් කටයුතු කරගෙන යනවා. ඒ වුණත් 2021 අග වෙන කොට අපේ රටේ සංචාරක ක්ෂේත්‍රය නැවත ඉදිරියට ගන්න අපි බලාපොරොත්තු වෙනවා. සියලුදෙනාට එන්නත් ලබා දුන්නාට පස්සේ සංචාරක ක්ෂේත්‍රය නැවත වතාවක් වර්ධනය කර ගන්න අපට පුළුවන් වෙයි. එහෙම වෙන කොට අලුතින් මුදල් මේ රටට ගලා එන නිසා, මේ තිබෙන තත්ත්වය මඟ හරවා ගෙන ඉදිරියට යන්න අපට පුළුවන් වෙනවා.

තවත් අය අපට උපදෙස් දෙනවා. උපදෙස් දෙන එකේ කිසිම වැරැද්දක් නැහැ. ඒ උපදෙස් දෙන අයට තිබෙන්නේ එකම එක උපදෙසයි. "යන්න IMF එකට" කියලා තමයි ඒ ගොල්ලන් කියන්නේ. ඒ ගොල්ලන්ට තේරෙන්නේ නැහැ, IMF එකට යන එක විතරක් නොවෙයි විකල්පය කියලා. තව විකල්ප තිබෙනවා. IMF එකට යන්නේ වෙන විකල්පයක් නැති කොට. අපට විකල්ප තිබෙනවා. අපි දිනපතාම ඒ විකල්ප ක්‍රියාත්මක කරවනවා. ඒ ක්‍රියාත්මක කිරීම තුළින් අපේ ආර්ථිකය තවදුරටත් වර්ධනය වෙන බව අපි දන්නවා. මේ අවුරුද්දේ සියයට පහක පමණ ආර්ථික වර්ධන වේගයක් අපට ඇති කර ගන්න පුළුවන් වෙනවා. එන අවුරුද්දේ ඊටත් වඩා වර්ධන වේගයක් අපට ඇති කර ගන්න පුළුවන් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක නිසා කිසිම කෙනෙක් බයක්, සැකක් තියා ගන්න අවශ්‍ය නැහැ, මේ රටේ ආර්ථික අර්බුදයක් ඇති වෙයි කියලා. එහෙම බලාපොරොත්තුවෙන් ඉන්න අයට ඒ සිහිනත් නැති වෙලා යනවා කියන එකත් මතක් කර දෙමින්, මට කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මනූෂ නානායක්කාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.19]

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම මේ කථාව කරද්දී සරත් වීරසේකර අමාත්‍යවරයාට මේ ස්ථානයේ ඉන්න කියලා මම ඉල්ලීමක් කළා. හැබැයි, කථාව කරන්න මගේ නම කියන කොටම එතුමා දොර ඇරගෙන එළියට යන්න ගියා. මම එතුමාට කියනවා, මාව ඇහෙනවා නම් ඉක්මනට මෙතැනට එන්න කියලා. මම එතුමා පිළිබඳ කථාවට එන්න ඉස්සෙල්ලා මේ කාරණය කියන්න ඕනෑ. අපේ අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා මහ බැංකුවේ අධිපතිවරයා විධියට අවුරුදු නවයක් හිටියා කියලා බොහොම ආඩම්බරයෙන් කිව්වා. එතුමාගේ ඒ ආඩම්බරකාර කාලය ගැන මතක් කරනකොට, සේවක අර්ථසාධක අරමුදලේ තිබුණු සල්ලිවලට මොකද වුණේ කියන එකයි අපට මතක් වෙන්නේ. ඒ සල්ලිවලින් එක එක විධියට සූදු කරන්න ගිහිල්ලා, pumping and dumping කරන්න ගිහිල්ලා, සේවක අර්ථසාධක අරමුදලට කොච්චර හානි වුණාද, ග්‍රීක් බැඳුම්කරවලින් කොච්චර හානි වුණාද කියලා අපට මතක් වෙනවා. ඉතිහාසයේ සිදු වූ ආර්ථිකයේ මෙන්ම මහ බැංකුවේ කඩාගෙන වැටීම් සියල්ල අපට මේ වෙලාවේ මතක් වෙනවා කියන එක මම සඳහන් කරන්න කැමැතියි.

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මම මහ බැංකුවේ හිටපු කාලය තුළදී අපේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 24 ඉඳලා 80 දක්වා වර්ධනය වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මහ බැංකුවෙන් යන කොට EPF එකේ තිබුණු unrealized profit එක බිලියන 20යි. Greek Bondsවලින් අපට යම්කිසි -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හරි. ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. තුන් ගුණයක්, හතර ගුණයක් බැඳුම්කර වංචා සිදු වුණේත් ඔය කියන කාලවලදී කියන එකත් මම මතක් කරන්න කැමැතියි. වංචා සිදු වෙන්න යනවා නම් ඒවා පිළිබඳව තොරතුරු පාර්ලිමේන්තුවේදී අනාවරණය කරන එකයි අපට කරන්න තිබෙන්නේ. "ඒවා එළියේ ගිහිල්ලා කථා කරන්න" කියන වණ්ඩිපාට් දමන එක නොවෙයි කරන්න ඕනෑ. ඒවා පාර්ලිමේන්තුව ඇතුළේ කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා මම ඒ කථාව පාර්ලිමේන්තුවේදී කිව්වාට පස්සේ හබරාදුව සහ අහංගම පොලිසි දෙකට කථා කරලා, "මනුෂ නානායක්කාරගේ පෙර වැරැදි මොනවාද, නඩු තිබෙන්නේ මොනවාද?" කියලා අහලා තිබුණා. මගේ පරණ රියැදුරෙකුටත් කථා කරලා අහලා තිබෙනවා, "වාහනය පැද්දේ මනුෂමද, වාහනය කාගේද?" කියලා. නැවත නඩුවක් පටලවන්න අවශ්‍ය වටපිටාව පරීක්ෂා කළා, කොහොමද මා අත්අඩංගුවට ගන්න පුළුවන් වෙන්නේ කියලා. ඊට්ත් කලින් CID එකටත් උපදෙස් දීලා තිබුණා, මා මොන ක්‍රමයකට හරි අත්අඩංගුවට ගන්න කියලා. අපි පාර්ලිමේන්තුවේදී ඒ කරුණු එළිදරව් කළාම අප අත් අඩංගුවට ගන්න හදනවා නම් මොකක්ද මේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය? මොකක්ද අපේ රටේ තිබෙන නිදහස? මුලින්ම මම ඒක මතක් කරන්න කැමැතියි.

එතුමාගේ කථාවේදී කිව්වා, මම සාවද්‍ය කරුණක් ඉදිරිපත් කළා කියලා. එතුමා කිව්වා, එතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක අරුණ මිස්සක අමරසේකර මහතා යථෝක්ත සමාගමේ සාමාජිකයෙක් නොවෙන බව. මේ search එක කළේ, 2021 ජූලි මාසයේ 13වැනි දා. ඒකේ තිබෙනවා, "Securatec Solutions" කියන සමාගමේ අරුණ අමරසේකර shareholder කෙනෙක් විධියට ඉන්නවා; the number of shares is, one කියලා. ඒ විස්තරය මා ළඟ තිබෙනවා. මම ඒක එදාත් සභාගත කළා. ඒ විතරක් නොවෙයි, මගේ ළඟ Form 20 තිබෙනවා. ඒ සියලු තොරතුරු මම එදාත් සභාගත කළා. ඔහු මේ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක්. අද එතුමා මේ පාර්ලිමේන්තුව නොමඟ යවන්න උත්සාහ කළා. එතුමා කිව්වා, මම ඒ කියපු කොම්පැනිය නොවෙයි ; Securatec එකේ නොවෙයි කියලා. Securatec විතරක් නොවෙයි, ධනවර්ධන කියන පුද්ගලයා සතුව a group of companies තිබෙනවා. Securatec Lanka (Pvt.) Limited කියන්නේ mother company එකක්. ඒ සමාගමට අනුබද්ධිතව Securatec Solutions (Pvt.) Limited, Securatec Engineering (Pvt.) Limited, Securatec International (Pvt.) Limited, Securatec Paradise (Pvt.) Limited ආදී වශයෙන් සමාගම් රාශියක් තිබෙනවා. එම සමාගමේ එක කොටස්කරුවෙක් විධියට තමයි අරුණ මිස්සක අමරසේකර ඉන්නේ. ඒක ධනවර්ධන කියන පුද්ගලයාට අයත් සමාගමක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ඇමතිතුමා කිව්වා, "ජේම්ස් කියන පුද්ගලයා ICTA එකෙන් දමපු පුද්ගලයෙක්. ඉතාම ස්වාධීන කමිටුවක් තමයි මේ පත් කර තිබෙන්නේ. එම ස්වාධීන කමිටුවේ සිටින කෙවින් අමින්ද ජේම්ස් කියන පුද්ගලයා මේ සමාගමට කිසිම සම්බන්ධයක් නැහැ." කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එදා -2018දී- ගත් වාර්තාව සභාගත කළා. ඔහු කොටස්කරුවෙක් විධියට එම සමාගමේ සේවය කර තිබෙනවා. දැන් ඔහු ඒකේ නැති වෙන්න පුළුවන්. හැබැයි, එම සමාගමේ හිටපු සේවකයෙක් තමයි දැන් මේ Technical Evaluation Committee එකට දමාගෙන තිබෙන්නේ. ඔහු තමයි දැන් tailor-made කළ කැබිනට් පත්‍රිකාව සහ ටෙන්ඩර් පත්‍රිකාව - tender notice එක - සකස් කරන්නේ කියන කාරණය මම තමුන්නාන්සේලාට මතක් කරනවා.

එතුමා තව කථාවක් කිව්වා, "පොලීසියට තවම මේ පිළිබඳව තොරතුරු වාර්තා කර නැහැ, මේ පිළිබඳව presentation එකක් කර නැහැ" කියලා. මම නම් එදා පාර්ලිමේන්තුවේදී හඬ පට ටික සභාගත කළේ නැහැ. නමුත් එතුමා හඬ පට ටික අසා තිබෙනවා. ඒ හඬ පටවල තිබෙන්නේ කලින් කථා කරපුවා කියලා එතුමා කිව්වා. හැබැයි, පොලීසියේ SSP Amarasekera සමඟ කථා කරන ඒවා, පොලීසියේ මෙම කටයුතු භාර නිලධාරියා සමාගමෙන් අයින් වුණු සේවකයෙකු සමඟ කථා කරන හැටි, අරුණ අමරසේකරගේ නිවසේදී ඇමතිතුමාට presentation එක ඉදිරිපත් කළ හැටි, - එතුමා කිව්වේ වෙන කොහේදීද ඉදිරිපත් කළා කියලායි. නැහැ, අරුණ අමරසේකරගේ ගෙදරදී තමයි මේ presentation එක ඉදිරිපත් කළේ. - ඇතුළු මේ presentation එකේ සියලු තොරතුරු මේ හඬ පට හරහා එළියට ආවා.

මේ documents හදද්දී කිව්වා, "මෙහෙම එකක් පොලීසියෙන් ඉදිරිපත් කර නැහැ." කියලා. මම එදා සභාගත කළා, "Modernizing and digitizing Sri Lanka Police" කියන document එක. Traffic Admin and Road Safety Division එකෙන් තමයි මේ document එක ඉදිරිපත් කරන්නේ. මේක පාදක කරගෙන තමයි මේ ටෙන්ඩර් පත්‍රිකාව හදන්නේ. මේ

[ගරු මනුෂ නානායක්කාර මහතා]

තාක්ෂණික උපකරණ සඳහා අවශ්‍ය කරුණු ඉදිරිපත් කරන්නේ පොලීසියේ SSPවරයා. දැනටත් ලංකාවේ speedometer එකක් පාවිච්චි වෙනවා, එම speedometer එකත් ලබා දීලා තිබෙන්නේ මේ ආයතනයම තමයි. ඒ ලබා දීපු speedometer වර්ගයම දිගටම පවත්වා ගෙන යෑම සඳහා -මෙහි ආරක්ෂිතභාවය පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා.- පොලීසියට ඉදිරිපත් කළ වාර්තාවේ ඇතුළත් කර තිබෙනවා එම company එකේ නමින්, එම specifications තිබෙන එම යන්ත්‍රයේම photograph එකක්. එහෙම තමයි මේ tender notice එක ඉදිරිපත් කර තිබෙන්නේ. එතකොට ඒක ගෙන්වන්න පුළුවන්, ඒ ගොල්ලන්ට විතරයි. ඒක ගෙන්වන්න පුළුවන් ඒ ගොල්ලන්ට විතරයි කියන එකේ, - ලංකාවේ ඒජන්තවරුන් ඔවුන් කියන එකේ- Securatec තමයි ඒකේ ඒජන්තවරුන් කියන එකේ සහතිකයත් මම **සභාගත*** කරනවා.

යම් පුද්ගල පිරිසකට අයිති, ඒ අයගේ සන්නාමය යටතේ පමණක් ගෙන්විය හැකි භාණ්ඩ ගෙන්වන්න කියලා තමයි මේ tender notice එකට දමන්න සූදානම් කර තිබෙන්නේ. ඒක තමයි පොලීසියට ඉදිරිපත් කළ වාර්තාවේ තිබෙන්නේ.

ඊට පසුව Hand-Held Radio LTE - Mission Critical Push to Talk, ඒ කියන්නේ walkie-talkie system එක, - අත් ගමන් කථන යන්ත්‍ර - අවශ්‍යයි කියාත් පොලීසියේ SSP සහ අරුණ අමරසේකරලා එකතු වෙලා හදපු වාර්තාවට දමා තිබෙනවා. ඒවා ගෙන්වන company එක අයිති වෙන්නේත් එම සමාගමටමයි. මේ තිබෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කළ එම ලිපිය. එම ආයතනය ලංකාවේ නියෝජිතයන් වශයෙන් පිළිගත් ලේඛනයත් මම **සභාගත*** කරනවා. .

ඒ විතරක් නොවෙයි, මත්ද්‍රව්‍ය සහ මත්පැන් පානය කළාම හඳුනා ගන්නා breathalyzer කියන උපකරණය ලබා ගැනීම සඳහාත් මේකට දමා තිබෙනවා, "මෙන්න මේ උපකරණය තමයි අපට ගන්න ඕනෑ" කියලා. එම උපකරණය මෙම සමාගම විසින්ම ලංකාවට ගෙන්වීම සඳහා නියෝජිතත්වය ලබා ගත් ලේඛනත් මම **සභාගත*** කරනවා.

මේ කරලා තිබෙන්නේ මොකක්ද? තනිකරම මේ සියලු දේවල් කර තිබෙන්නේ, මේ සියල්ල සූදානම් කර තිබෙන්නේ කවුරු හෝ කණ්ඩායමකට tailor-made, ඒ කියන්නේ ඔවුන්ගේ අවශ්‍යතාව පරිදි සකස් කළ tender notice එකක් සකස් කිරීමටයි. මේ හඬ පටවල තිබෙනවා, "පොලීසිය අවුරුද්දකට බිලියන 4.2ක ලාභයක් ගන්නවා, දඩ මුදල්වලින්. අන්න ඒ දඩ මුදල්වලින් මිලියන 83ක් මාසයකට ලැබෙන පරිදි අපි මේක හදමු, අපි ආණ්ඩුවට බරක් වෙන්නේ නැතුව පිට රටින් සල්ලි ගන්නේ නැතුව, මේ එන දඩ මුදල්වලින් මේ සල්ලි ටික අරගෙන මේ වැඩේ කරමු." කියලා. මේ හඬ පටවල සියලු කාරණා සඳහන් වෙලා තිබෙනවා. ඒකයි ලජ්ජා වෙලා තිබෙන්නේ මේ කාරණා පිළිබඳව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතකොට, එහෙමයි ඒ වැරැද්ද සිදු වෙන්නේ.

පොලීසිය digitalize කිරීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. පොලීසියේ නිලධාරින්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න ඕනෑ, බටා දෙන්න ඕනෑ, පොලීසියේ නිලධාරින්ට සලකන්න ඕනෑ. පොලීසියේ නිලධාරින්ට සලකන්න, ඒ කටයුතු කරන්න. ඒ අයට ශරීරයේ ගහන්න පුළුවන් කැමරා එකක් දෙන්න ඕනෑ, walkie-talkie එකක් දෙන්න ඕනෑ. ඒ සියල්ල කිරීම සම්බන්ධයෙන්, තාක්ෂණය එකතු කිරීම සම්බන්ධයෙන් අපට කිසිදු ගැටලුවක් නැහැ. ප්‍රශ්නය ඒක නොවෙයි. පොලීසියට ඒ උපකරණ ලබා ගැනීම කරන්නේ මහ ජනතාව ගෙවන දඩ මුදල්වලින්. මේ ගනුදෙනු හරහා යම්කිසි කුට ව්‍යාපාරිකයන් පිරිසක් සන්තර්පණය කිරීම සඳහා ඇමතිතුමා දැනුවත්ව හෝ නොදැනුවත්ව ඉඩ සලසා තිබෙනවාය කියලා මා එදා කිව්වා. හැබැයි, අද ඇමතිතුමා කළ ප්‍රකාශයත්, මට ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ කථා කරන්න ඉඩ නොදීමත් එක්ක මට කියන්න වෙනවා, ඇමතිතුමා දැනුවත්ව තමයි ඒ සියල්ල සිදු කරලා තිබෙන්නේ කියලා. එහෙම නොවෙයි නම්, ඒ තත්ත්වය එළි දක්වන්න එතුමාට ඉඩකඩ තිබුණා. ඇයි මගේ කට වැහුවේ? ඒ වෙලාවේ මගේ කට වැහුවේ, තොරතුරු ටික එළියට එන නිසායි. එම නිසා, එතුමා අද පාර්ලිමේන්තුවේදී කළ සම්පූර්ණ කථාව සත්‍යයෙන් තොර, පාර්ලිමේන්තුව නොමඟ යවනසුළු ප්‍රකාශයක් බව මා මේ වෙලාවේ සඳහන් කරනවා.

මට කනගාටුයි, එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබුණු ආයතන දෙකක් ගලවලා තිබෙනවා. වියත් මගෙන් තමයි මේ ආණ්ඩුව ඉස්සරහට ගෙනාවේ. " මේ 225දෙනාම එපා, අලුත් කට්ටියක් ගේමු, මේ 225දෙනාට වඩා වෙනස්, වියත් මගේ කට්ටිය තමයි ගෙනෙන්නේ" කියලා, වියත් මගේ සභාපතිවරයා විධියට කොළඹ දිස්ත්‍රික්කයේ වැඩිම ඡන්ද අරගෙනයි එතුමා පාර්ලිමේන්තුවට ආවේ. දේශප්‍රේමියකු විධියට, යුද්ධය ජයග්‍රහණය කරන්න සම්බන්ධ වුණු පුද්ගලයකු විධියට මා එතුමාට බොහොම කැමැතියි. හැබැයි, යුද්ධය ජයග්‍රහණය කරන්න සම්බන්ධ වුණු පුද්ගලයකු විධියට, ආනන්දීය පුතෙකු විධියට, මේ සිදුවන හොරකම් දිහා බලාගෙන, consultantsලා විධියට තමන්ගේ වටේ හොරු නඩයක් තියාගෙන ඉන්න එකද, ඒ කියපු සෞභාග්‍යයේ දැක්ම කියලා මා අහනවා. හැබැයි, අපට පුදුම වෙන්න දෙයක් නැහැ.

ග්‍රීක් බැඳුම්කර සිද්ධියට සම්බන්ධ යයි කියන කබ්රාල් මහත්මයාත් නිදහසේ ඉන්නකොට, නඩු අටකින් -අල්ලස් චෝදනාවලින්- සරණ ගුණවර්ධන නිදහස් වෙනකොට, තවත් කට්ටිය නඩුවලින් නිදහස් වෙනකොට මේක අරුමයක් නොවෙයි. ඒ වාගේම, ආයුධ එකට ගැටිලා, ආයුධවල අංක මැකෙනකොට, දිල්රුක්ෂි ඩයස්ගේ හඬ පට විකෘති කරලා, අවසානයේදී ඒ රාජ්‍ය සේවිකාවගෙන් පළිගන්න පුළුවන් කණ්ඩායම් ඉන්නකොට, මේවා ගැන පුදුම වෙන්න දෙයක් නැති බව කියමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දිවා ආහාර විවේකය සඳහා පස් වරු 1.30 වන තෙක් සභාවේ කටයුතු තාවකාලිකව අත් හිටුවනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ (ගරු අංගජන් රාමනාදන් මහතා) සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The Hon. Rohitha Abegunawardhana, please. You have 19 minutes.

[අ.භා.1.30]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Rohitha Abegunawardhana - Minister of Ports and Shipping)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අද සභාව කල් තබන අවස්ථාවේදී විවාදයට ගන්නේ, 2020 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව සම්බන්ධයෙන් අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව. යෝජනාව ඉදිරිපත් කරමින් ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කළ කථාවට අපි ඇහුම්කන් දුන්නා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එසේ ඇහුම්කන් දීමත් සමඟ මට මතක් වෙනවා, 2015 වසරට පෙර, ඔබතුමා ඒ වෙලාවේ පාර්ලිමේන්තුව නියෝජනය නොකළත්, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ රජය කාලයේ යුද්ධයත් අවසන් කරලා, රට සංවර්ධනය කරලා, ඉතාම හොඳ ආර්ථික වර්ධන වේගයක් ඇති කරලා තිබුණු අවස්ථාවේදීත් ජනාධිපතිවරණයට ලෑහැස්ති වනකොට -2014 වර්ෂයේදී- ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුව ඇතුළේ කළ කථා. ඒවා නැහැ කියන්න බැහැ, බැහැ කියන්න බැහැ. ඒවා හැන්සාඩ්ගත වෙලා තිබෙනවා. අද එතුමා කළ කථාවත් එක්ක හුහක් වෙලාවට ඒවා ගැළපෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මෙච්චර ප්‍රමාණයක මහ ණය බරක් තිබෙනවා කියලා එතුමා පෙන්නුවා, රට විනාශයි කිව්වා; සියල්ලම කිව්වා. එහෙම කියලා, එතුමන්ලා විකල්පය හැටියට මොකක්ද තෝරා ගත්තේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? එදා 2005දී තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට ආවේ. එතුමා තමයි 2015 වනතුරු අවුරුදු දහයක් රට පාලනය කරමින් පැවැති යුද්ධය අවසන් කරලා, රට එක්සේසත් කළ නායකයා; රට හදපු නායකයා.

එවැනි දෙයක් කරලා තිබියදීත්, විකල්පයක් හැටියට අද මේ යෝජනාව ඉදිරිපත් කරපු අනුර දිසානායක මන්ත්‍රීතුමන්ලාගේ විකල්පය වුණේ මොකක්ද? ඒ ආණ්ඩුව වෙනස් කරමින්, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති හැටියට පත් කරන්නත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිතුමා හැටියට පත් කරන්නත් කටයුතු කරමින් යහ පාලන ආණ්ඩුව හදාගත්තා. එතුමා මේ සභා ගැබේ නොසිටියත් මම කියන්න ඕනෑ, ඉදිරිපත් කරන කරුණු කාරණා අනුව, බුද්ධි මට්ටම අනුව, ආර්ථික දැනීම අනුව එතුමාට තිබුණා එතුමන්ලා විසින්ම හදාගත් ආණ්ඩුවට කියලා ඔය ප්‍රශ්න ටික විසඳාගන්න. මොකද, එතුමන්ලාට ඒකෙන් බැහැර වෙන්න බැහැ. යහ පාලන ආණ්ඩුව හැදීමේ කොටස්කරුවෝ තුන්දෙනායි. ඒ කොටස්කරුවෝ තුන්දෙනාගෙන් එක කොටස්කරුවෙක් තමයි ජනතා විමුක්ති පෙරමුණ. එතකොට, ජනතා විමුක්ති පෙරමුණ විසින් හදාගත් යහ පාලන ආණ්ඩුවට පුළුවන්කමක් තිබුණා, අද අපට ලබා දුන් මෙම ප්‍රශ්න ටික 2015 ආණ්ඩුවට කියලා ඒ ආණ්ඩුව යටතේ ආර්ථිකය නිවැරැදි මඟ අරගෙන යන්න. ඒ විධියට නිවැරැදි මඟ ගියා නම්, ඒ විධියට ආණ්ඩුව පාලනය කළා නම්, අද මේ ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ. හැබැයි, එතුමන්ලා 2015 ජනවාරි 8වැනි දා හදපු ආණ්ඩුව තුළ, අනුර කුමාර දිසානායක, රනිල් වික්‍රමසිංහ, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එකතුවෙලා හදපු ආණ්ඩුව තුළ 2015 පෙබරවාරි 22වැනි දා වෙනකොට මහ බැංකු කොල්ලයක් සිදුවෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. රුපියල් බිලියන 1,000ක කොල්ලයක් වෙනවා. එම නිසා එතුමා අද ඉදිරිපත් කරපු මේ වාර්තාව හදනකොට ඒ බිලියන 1,000ත් එකතු කරන්න තිබුණා. ඒ කියන්නේ, රටේ ආර්ථිකයේ යම් පසුබෑමක් තිබෙනවා නම්, හොරකම් කරපු බිලියන 1,000ත් මේකට එන්න ඕනෑ. හැබැයි, ඒ ගැන කියැවුණේ නැහැ. ඒ ගැනත් මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම 2019 නොවැම්බර් මාසයේ අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට හැටනවලක්ෂයක් ජනතාව ඡන්දය දීලා එතුමා ජනාධිපති බවට පත් කළා. කෙටි කාලයක් ඇතුළත -මාස තුනක් යන්න ඉස්සෙල්ලා- ගෝලීය වසංගතයකට මුහුණ දෙන්න අපට සිද්ධ වුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 2020 පෙබරවාරි මාසය, මාර්තු මාසය වෙනකොට මෙම ගෝලීය වසංගතයට මුහුණ දෙන්න අපට සිද්ධ වුණා. ඒක අපි හැමෝටම අලුත් අත්දැකීමක්. අලුත් අත්දැකීමට මුහුණ දෙනකොට මොකක්ද අපට සිද්ධ වුණේ? මේ රෝගයේ භයානක තත්ත්වය කොච්චරද කියලා අපි මුළු ලෝකයෙන්ම දැක්කා. එම නිසා අපට රට වහන්න සිද්ධ වුණා. මාස තුනකට ආසන්න කාලයක් සම්පූර්ණයෙන්ම රට වහලා තියන්න සිද්ධ වුණා. රට වැහුවාට පස්සේ මොකක්ද වෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? විශේෂයෙන්ම අපේ අපනයන ක්ෂේත්‍රයේ අඩුවීමක් වුණා. කර්මාන්තශාලා වහලා දාන්න සිද්ධ වුණා. ඒ විතරක් නොවෙයි, සංචාරක කර්මාන්තයෙන් අපේ රටට විදේශ විනිමය ලැබුණා. අද එම කර්මාන්තය ඩොලර් එකකවත් ආදායමක් ලැබෙන්නේ නැති තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඒවා සිදු වුණේ කොහොමද? කොවිඩ් වසංගතය ආවේ ආණ්ඩුවේ වරදින්ද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? නැහැ. එය ලෝකයේ හැම රටකටම ආපු ගෝලීය වසංගතයක්. ඒ තුළින් අපට මොනවාද සිද්ධ වුණේ? අපේ අපනයන අඩුවෙලා, සංචාරක කර්මාන්තය කඩා වැටිලා, අපේ ආණ්ඩුවට ආදායම් ලැබෙන ප්‍රධාන ආයතන - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව- තුන්දේම ආදායම අඩු වුණා. එසේ අඩු වෙන්න හේතුව මොකක්ද? රට වහලා තිබෙනකොට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගිහිල්ලා ආදායම් බදු එකතු කරන්න පුළුවන්ද? රට වහලා, කර්මාන්තශාලා වහලා තිබියදී ආදායම් බදු එකතු කිරීමක් වෙන්නේ නැහැ. ඒ වාගේම ආනයන සීමා කරලා තිබෙනවා. ආනයන සීමා කිරීමත් සමඟම ශ්‍රී ලංකා රේගුවේ ආදායමත් අඩුවෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොවිඩ් වසංගතයත් එක්කයි ඒ සියල්ල සිද්ධ වෙන්නේ. එම අර්බුදවලට තමයි අපි මුහුණ දුන්නේ. එම අර්බුදවලට මුහුණ දෙන ගමන් අපි මොනවාද කළේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා, මහින්ද රාජපක්ෂ අගමැතිතුමා ප්‍රමුඛ අපේ රජය මේ වසංගතයට මුහුණ දුන්නේ කොහොමද? රජයක් හැටියට එම වසංගතයට මුහුණ දීමේ වැඩ පිළිවෙළට අපි ලෑහැස්ති වුණා. කොවිඩ් වසංගතය ඇවිල්ලා අවුරුදු එකහමාරක් ගතවෙන කොට,

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

රට කොච්චර වහලා තිබුණත්, ආර්ථික වශයෙන් මොන ප්‍රශ්නය ආවත්, අපි එකම රාජ්‍ය සේවකයෙකුගේවත් පඩිය රුපියලකින්වත් අඩු කරලා තිබෙනවාද? අද වෙනකොට ගුරුවරුන්ගේ වැටුප් විෂමතාවක් තිබෙනවා. ආණ්ඩුවක් හැටියට අපි ඒක පිළිගන්නවා.

ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව ඉවත් කළ යුතුයි. ගුරුවරුන්ගේ විතරක් නොවෙයි, වෙනත් වෘත්තීන්වලත් වැටුප් විෂමතා තිබෙනවා. මේකට අවුරුදු 24ක ඉතිහාසයක් තිබෙනවා. හැබැයි, නියමිත වෙලාවට තමන්ගේ පඩි පැකට්ටුව හම්බ වෙන තත්ත්වයක් අපි ඇති කර තිබෙනවා. එය ආණ්ඩුවක වගකීම. ආණ්ඩුවක් හැටියට අපි එය ඉටු කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොවිඩ් - 19 වසංගත තත්ත්වය තුළ පෞද්ගලික අංශය වේවා, අනෙක් අංශ වේවා මොන යම් හෝ තැනක ඉන්නවා නම් ඔවුන්ට නොලැබෙන, ඔවුන්ට ජීවත් වෙන්න තිබෙන අපහසුතා නිසා ආණ්ඩුවක් හැටියට අපි පවුල් ලක්ෂ 72කට රුපියල් 5,000 ගණනේ තුන් වතාවක් ලබා දුන්නා. මම මුලින් කියපු ආදායම් අඩුවීමත් එක්ක අභියෝග තමයි අපට භාර ගන්න තියෙන්නේ. ඒ අභියෝගය අපි භාරගෙන තිබෙනවා. කොවිඩ් - 19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් අපට මොනවාද කරන්න තියෙන්නේ? PCR පරීක්ෂණ කරන්න ඕනෑ. PCR පරීක්ෂණ වෙනුවෙන් විශාල මුදලක් යොදවන්න වෙනවා. රෝහල් ඇඳන් ප්‍රමාණය වැඩි කරන්න ඕනෑ; නිරෝධායන මධ්‍යස්ථාන වැඩි කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගමක නිරෝධායනය වෙන පවුලක කෙනෙකුට රුපියල් 10,000ක වියළි සලාක මල්ලක් ගිහිල්ලා දෙන්න ඕනෑ. මේ සියල්ල රජය කරනවා. ආදායම් අඩු වෙලා කියලා රජය PCR කරන එක නැවැත්වූවාද, ආදායම් අඩු වෙලා කියලා රෝහල් ඇඳන් ප්‍රමාණය වැඩි කරන එක නැවැත්වූවාද, ආදායම් අඩු වෙලා කියලා නිරෝධායනය වන ඒ අයට රුපියල් 10,000ක් ගෙවන එක අඩු කරලා තිබෙනවාද? නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ සියල්ලම අපි කරනවා. හැබැයි, මේවා අඛණ්ඩව කරන්න නම් අපි ඉතා හොඳින් එම කටයුතු කළමනාකරණය කළ යුතුයි. ආණ්ඩුවක් හැටියට අපි ඒක කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වන විට අර්බුදකාරී කොවිඩ් -19 ගෝලීය වසංගතය වෙනුවෙන් අපි රුපියල් බිලියන 250කට ආසන්න මුදලක් ආණ්ඩුවක් හැටියට වියදම් කර තිබෙනවා. බලන්න, කොපමණ මුදලක්ද? අපේ වාර්ෂික ආදායම දිහා බැලුවාම, එම ආදායමින් මේ වන විට හරියටම 1/4ක් පමණ මේ සඳහා වියදම් කර තිබෙනවා. මේවා අභියෝග. හැබැයි එම අභියෝග තිබුණත්, අපට රට ඉදිරියට ගෙනයන්න සිදු වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. රට ඉදිරියට ගෙනයෑමේදී අපි දැක්කා, ලෝකයේ හැම රටකටම කොවිඩ් - 19 වසංගත තත්ත්වයට එකම විසඳුම එන්නත ලබාදීම බව. එන්නත ලබාදීම අපි කළ යුතු දෙයක්. එන්නත ලබාදීමේදී අපි දැක්කා, නොයෙක් වෙලාවට විපක්ෂය චෝදනා කළ බව. "එන්නත ගෙනෙන්න සල්ලි නැහැ. එන්නත ගෙනෙන්නේ නැහැ. එන්නත ගහන්නේ නැහැ" කියමින් විපක්ෂය එහෙම උත්සාහයක යෙදුණා. හැබැයි, ආණ්ඩුවක් හැටියට අතිගරු ජනාධිපතිතුමා එම වගකීම හරියට කරන්න භාර ගත්තා. එතුමා ඒ සම්බන්ධයෙන් කැප වුණා; ඒ සම්බන්ධයෙන් තමන්ගේ වගකීම ඉටු කළා. ඒ වගකීම ඉටු කරලා, එන්නත් ලබාදීම අද ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. එන්නත තිබුණත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද සමහර මිනිස්සු එන්නත්කරණය කරගන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එන්නත ලබාදීම ක්‍රියාත්මක වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා දන්නවා, ඔබතුමා නියෝජනය කරන යාපන දිස්ත්‍රික්කයේත් මේ වෙනකොට සියයට 60ට වැඩි ප්‍රමාණයකට එන්නත ලබා දී තිබෙන බව. අපේ රටේ - 'ඇස්ට්‍රාසෙනිකා', 'සිනෝෆාම්', 'ස්පුට්නික් V', 'ෆයිසර්', 'මොඩර්නා'- කියන එන්නත් - වර්ග 5ක් ලබා දෙනවා. අපි හොයලා බැලුවාම, ඇමෙරිකාව වාගේ රටවල එන්නත් වර්ග 2යි තිබෙන්නේ. ලෝකයේ බලවත්ම රට ඇමෙරිකාව. එන්නත් හදන රටවල එන්නත් 2ක් ලබාදෙනකොට ලංකාවේ එන්නත් වර්ග 5ක් ලබා දෙනවා. ඒ වාගේම, අපි "සිනොවැක්" එන්නත ලංකාවේ නිෂ්පාදනය කරන්න අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමේ කටයුතුවලට යොමු වෙලා තිබෙනවා. එය රජයක වගකීම. හැබැයි, අපි ඒක කරනවා. අගෝස්තු මාසය අවසන් වෙන කොට අවුරුදු 30න් ඉහළ සියලුදෙනාම එන්නත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ජනාධිපතිතුමාගේ බලාපොරොත්තුව අවුරුදු 18න් වැඩි අනෙක් අයත් එන්නත්කරණයට ලක් කරන්නයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ වෙනකොටත් කර්මාන්තශාලා, ත්‍රිරෝද රථ වැනි ඒවායේ වැඩ කරන සියලුදෙනාට එන්නත ලබා දී තිබෙනවා. ඔවුන් අවුරුදු 18ට වැඩි අය. රජයක් හැටියට අපි ඒ අභියෝගය භාරගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ වාගේ තත්ත්වයක් තුළ අද නොයෙකුත් වැඩ වර්ජන ක්‍රියාත්මක වෙන අයුරු අපි දැක්කා. විශේෂයෙන්ම ගුරුවරුන්ගේ වැඩ වර්ජනය. ගුරුවරුන්ගේ වැඩ වර්ජනය වෙලාවේ අපි මේ කාරණය මතක් කරන්න ඕනෑ. අපි දන්නවා කොවිඩ් - 19 වසංගත ප්‍රශ්නය නිසා පෞද්ගලික අංශයේ සේවකයන්ගේ රැකියා නැති වුණු බව. ඔවුන්ට රැකියා අහිමි වුණා. වැටුපෙන් හරියට සියයට 50ක් තමයි සමහර අයට ලැබුණේ. එවැනි අභියෝග රාශියකට මුහුණ දෙන්න ඔවුන්ට සිද්ධ වෙලා තිබෙනවා. මේක අපි හැම කෙනෙක්ම තේරුම් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුවක් හැටියට අපි ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව පිළිබඳ ප්‍රශ්නය තේරුම්ගෙන තිබියදීත්, දැන් ඇති වෙලා තත්ත්වය මොකක්ද කියලා බලන්න. කොවිඩ්-19 වසංගතය තිබෙන වෙලාවේ, සෞඛ්‍ය උපදෙස් සත පහකට ගණන් ගන්නේ නැතිව, විශාල සෙනඟක් පාරට ඇවිල්ලා උද්ඝෝෂණ කරනවා. දැන් මොන පොකුර ද හැදෙන්න යන්නේ? අපි දැක්කානේ, මීට කලින් කොවිඩ් පොකුරු හැදිච්ච හැටි. පැලියගොඩ මාළු වෙළෙඳ පොළේ පොකුර හැදුණා; සිංහල අලුත් අවුරුදු පොකුර හැදුණා; බ්‍රැන්ඩික්ස් පොකුර හැදුණා. ඊළඟට හැදෙන්නේ ස්ටාලින් පොකුර. ජෝසප් ස්ටාලින් පොකුර තමයි ඊළඟට හදන්න යන්නේ. මට පෙනෙන විධියට මේ උද්ඝෝෂණය සාර්ථක නැහැ; ඒ වුණාට කොවිඩ් වසංගතය බෙදා දීමේ වැඩේ නම් සාර්ථකව යනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොවිඩ් වසංගතය බෙදා දීමේ වැඩේ නම් කිසිම අඩුවක් නැතිව කෙරෙනවා. ඒක ක්‍රියාත්මක වනවා. මොකක්ද මේ සිද්ධ වන්නේ? මේ උද්ඝෝෂණ දේශපාලනීකරණය කරලායි තිබෙන්නේ. ඒ අයගේ ඉල්ලීම් සම්බන්ධයෙන් ආණ්ඩුව අවධානය යොමු කර ඒවා පිළිගෙන තිබියදී, රටේ ආර්ථික තත්ත්වය ගැන හොඳට පැහැදිලි කර තිබියදී, ඊට ගැළපෙන විධියට ක්‍රියාත්මක වෙන්න හදන කොට, මේක වෙන පැත්තකට හරවන්නේ කොහොමද කියලා බලනවා. අපි මේක පැහැදිලි ලෙස කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ආණ්ඩුවේ මුදල් ඇමතිවරයා හැටියට ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා වගකීම බාර ගත්තා. එතුමා ඒ වගකීම බාරගෙන තවම මාසයක් ගත වෙලාත් නැහැ. ඒ කාලය තුළ එතුමා කැබිනට් මණ්ඩලය දැනුවත් කරමින් තමන්ගේ වගකීම හරියාකාරව ඉටු කරනවා. මේ අවුරුද්දේ මාස 7ක් ගෙවී තිබෙන වෙලාවේ අර කියාපු ආර්ථික අභියෝග දිහා බලමින්, ඉතාම හොඳින් ඒ ගැන අධ්‍යයනය කරමින්, ඒවාට මුහුණ දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළයි එතුමා ක්‍රියාත්මක කරන්නේ. අන්න ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම තුළ අපි මේ අභියෝගය ජය ගන්නවා, ගරු නියෝජ්‍ය

කාරක සභාපතිතුමනි. අපට ඒක කරන්න පුළුවන්. අපි ඉතිහාසයේත් එවැනි අභියෝග ජය ගත්ත ආණ්ඩුවක්. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා 2005දී ආණ්ඩුව අරගෙන අපි ඒ අභියෝගය බාර ගත්තා. ත්‍රස්තවාදය යුද්ධයෙන් අවසන් කරන්න ඕනෑ, ඉවත් කරන්න ඕනෑ කියන ඒ තීන්දුව එදා අපි ගත්තා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ කාලයේ මීට වඩා සංචිත අඩු වුණා. අද නම්, සමහර තීන්දු ගන්නකොට දවසක්, දෙකක් කල් දාන්න පුළුවන්. සමහර දේවල් මාසයක් වුණත් කල් දාන්න පුළුවන්, "පොඩ්ඩක් ඉන්න, මුදල් ලැබුණාම කරන්නම්." කියලා. යුද්ධය වෙලාවේ එහෙම කරන්න පුළුවන් ද? යුද්ධය වෙලාවේ අපේ රණ විරුවාට අවශ්‍ය ආයුධ ටික ගෙනත් දුන්නේ නැත්නම්, ඒ තීන්දුව එවෙලේම නොගත්තා නම් අපට කඳවුරු 4ක්, 5ක් අහිමි වෙනවා. එහෙම වුණා නම් ත්‍රස්තවාදීන් ඇවිල්ලා අපේ කඳවුරු ටික විනාශ කරනවා. ඒ නිසා අපට ඒ තීන්දු තීරණ කල් දමන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඉතිහාසයේ අපේ ආණ්ඩුව තීන්දු ගත්තේ එහෙමයි. භය නැති නායකයෝ, කොන්ද පණ තිබෙන නායකයෝ හැටියට තීන්දු තීරණ ගත්තා. ඒ නිසා තමයි අද උතුරු-නැඟෙනහිර සහ රටේ මිනිසුන්ට ත්‍රස්තවාදයක් නැතිව හැමෝටම සහජීවනයෙන්, සමගියෙන් ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් ගොඩ නැඟුණේ. අපට මේ අවස්ථාවේ ලැබුණේ දෙවැනි අභියෝගයයි. අපි මේ අභියෝගයත් භාරගෙන තිබෙනවා. එය අපි බාර ගන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, ඒ බාර ගත්තු අභියෝගය අපි ජයග්‍රහණය කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මේ කථා කරන වෙලාවේ නොයෙක් විවේචන ගොඩ නැඟුණා. සමහර විවේචන දිහා බැලුවාම අපට පුදුමයි. අද උදේ විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් කර, රාජ්‍ය සේවයට කැඳවීම ගැන කරුණු ඉදිරිපත් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක පැත්තකින් කියනවා, රටේ ආර්ථිකය කඩා වැටෙනවා කියලා. අනෙක් පැත්තෙන් අපි රාජ්‍ය සේවකයා සේවයට කැඳවනකොට, රාජ්‍ය සේවකයා කොටස් වශයෙන් කැඳවන්න කියලා යෝජනා ගෙනෙනවා. මොකක්ද මේ කරන්නේ? රට වහගෙන අපට මේ විධියට යන්න පුළුවන් ද? කොවිඩ් වසංගතය ඉවර වෙන දවස කවදා ද කියලා කවුද දන්නේ? එහෙම කියන්න පුළුවන්කමක් තිබෙන්නේ කාටද? විපක්ෂයේ එක්කෙනෙක් හෝ කියන්න, "අහවල් දවසේ තමයි කොවිඩ් වසංගතය ඉවර වෙන්නේ, ඒ දවසින් පස්සේ අපි වැඩ පටන් ගනිමු." කියලා. එහෙම කියන්න පුළුවන්කමක් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දැක්කා යෝජනා එන ආකාරය. අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයා කියනවා, අපේ රටේ පාඩු ලබන ආයතන තිබෙනවා කියලා. පාඩු ලබන ආයතන තිබෙනවා; ඒවා පාඩු ලබනවා කියලා දැඩි ලෙස කියනවා. ඔව්, ඒක ඇත්ත. හැබැයි, පාඩු ලබන ආයතනයක් ප්‍රතිව්‍යුහගත කරන්න ගියොත්, යම් ආයෝජකයෙක් ගෙනැල්ලා ඒ ආයතනය රැක ගන්න උත්සාහ කළොත්, ආපහු පෝස්ටර් ගහලා, බැනර් අල්ලාගෙන නැවත පාරට එනවා. බලන්නකෝ, මේ වැඩේ කොහොමද කියලා. විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරනකොට කියනවා, "පාඩු ලබන ආයතන තිබෙනවා, ඒවා වහන්න ඕනෑ." කියලා. හැබැයි, ඒ ආයතනයක් ප්‍රතිව්‍යුහගත කරන්න ගියාම කියනවා, "රාජ්‍ය සම්පත් විකුණාගෙන කනවා" කියලා. මොකක්ද මේකට හේතුව?

හේතුව, කුහකකම, වෛරය, ඊර්ෂ්‍යාව සහ ක්‍රෝධයයි. වෙන මොනවත් නොවෙයි. ඒ හතර තිබෙන තෙක් කවදාවත් මේ රට හදන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි හොඳ දෙයට හොඳයි කියන්න පුරුදු වන්න ඕනෑ. නමුත්, එතුමන්ලා තුළ එහෙම මානසිකත්වයක් හැදිලාත් නැහැ; එහෙම මානසිකත්වයක් හැදෙන්න පුළුවන්කමකුත් නැහැ. ඒ නිසා තමයි එතුමන්ලා මේ දේවල් කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප ඉදිරියේ තිබෙන අභියෝගයත් එක්ක අපි කරපු දේවල් ටිකත් පැහැදිලිව කියන්න ඕනෑ. යහ පාලන ආණ්ඩුව පැවැති කාලයේ ලිප්ටන් වටරවුමේදී ගුටි කාපු, දෙකේ දෙකේ පොලුවලින් ඔළු පළා ගත් උපාධිධාරීන් 60,000කට අතිගරු ජනාධිපතිතුමා පත්වීම් ලබා දුන්නා. ඒ වාගේම, අපොස සාමාන්‍ය පෙළ විභාගය අසමත්, ගමේ සිටින අහිංසක කෙල්ලෝ කොල්ලෝ ලක්ෂයකට රැකියා ලබා දුන්නා. ඒ වාගේම, රුවන්පුර අධිවේගී මාර්ගය වැනි අධිවේගී මාර්ගවල වැඩ කටයුතු ආරම්භ කළා, කාපට් මාර්ග ලක්ෂයක වැඩ ආරම්භ කළා, ජාතික පාසල්වල වැඩ කටයුතු ආරම්භ කළා. මේ වනකොට ඒ වැඩ කටයුතු ක්‍රියාත්මක වනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "දැන් කොවිඩ් තිබෙනවා, පාරවල් හදන්නේ නැහැ, අධිවේගී මාර්ග හදන්නේ නැහැ, අපි සියලු සංවර්ධන කටයුතු නවත්වනවා, කොවිඩ් අවසන් වුණාට පස්සේ මේවා කරනවා" කියලා අපට කියන්න බැහැ. අපි ආර්ථිකය ගැන ඊට වඩා බුද්ධියකින් කල්පනා කළ යුතුයි. ඒ වගකීම අපට ඉටු කරන්න පුළුවන් බව අපි බොහොම වගකීමෙන් කියනවා. ඒ වගකීම ඉටු කරන්නයි අපි රජය භාර ගත්තේ. එතුමන්ලා අපට ආණ්ඩුව දුන්නේ විල්ලුද පලසක් උඩ, රෝස මල් යහනාවක තියලා නොවෙයි. එතුමන්ලා අපට ආණ්ඩුව දුන්නේ ඉවර කරන්න තිබුණු ඔක්කෝම ඉවර කරලා, දණ ගස්වලායි. මේ කථා කරන ආර්ථික ඔස්තාර්ලාගේ කාලයේ එක ගෝලීය වසංගතයක්වත් තිබුණා ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට වෙන් වූ කාලය අවසන් වී ගෙන යන නිසා ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාගේ වෙලාවෙන් මට තව විනාඩි දෙකක් දෙන්න.

2015දී පැවැති යහ පාලන ආණ්ඩුව සමයේ ගෝලීය වසංගතයක් තිබුණාද? මහින්ද රාජපක්ෂ මහත්මයා ආණ්ඩුව භාර දෙනකොට ආර්ථිකයේ තිබුණු තත්ත්වය මොකක්ද? එතුමා මේ රට වැඩ බිමක් බවට පරිවර්තනය කරලායි භාර දුන්නේ. එදා යුද්ධයක් තිබුණාද? නැහැ. එදා භාර දුන්නේ හොඳ රටක්. ඒ දීපු හොඳ රට හප කරලා, කාලා, විනාශ කරලායි ආපහු අපේ අතට භාර දුන්නේ. ඊට පස්සේ අපට ගෝලීය වසංගතයකටත් මුහුණ දෙන්න සිද්ධ වුණා. එවැනි තත්ත්වයක් තිබියදීයි මේ කියන කාරණා ටික අපි ඉටු කළේ.

අපි දැක්කා, විපක්ෂ නායකවරයා නිවාස ඇමතිවරයා හැටියට කටයුතු කළ කාලයේ නිවාස හැදූ ආකාරය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ හැම ග්‍රාම නිලධාරි වසමකම දැන් ගෙයක් හැදෙනවා. මේ වනකොට ගම් 14,000ක ගෙවල් 14,000ක් හැදෙනවා. අනේ! ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා නියෝජනය කරන යාපනය දිස්ත්‍රික්කයේ ගෙවල් 14,000ක් හැදෙන කොට, ගෙවල් 14,000ක් හදනවා කියලා පෝස්ටර් ගහලා තිබුණාද? මා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ පෝස්ටර් ගහලා තිබෙනවාද? නැහැ. නමුත්, අහිංසක මිනිසුන්ට අපි ගෙවල් 14,000ක් හදලා දෙනවා. හැබැයි, ඉස්සර හදන්නේ ගෙවල් 24යි, පෝස්ටර් 24,000ක් ගහනවා. නැඟෙනහිර පළාතේ මඩකළපුව පැත්තේ එහෙමත් ඒ දවස්වල පෝස්ටර් ගහලා තිබෙනවා මා දැක්කා. ඒ වාගේම, ඒ ගම්වලට නම් දැම්මා. ඒ ගහපු සමරු ඵලකවලට ගිය වියදමින් විතරක් තවත් ගෙවල් 1,000ක් හදන්න තිබුණා. ඒ වාගේම, සමරු පොත් ගැහුවා. ඒවා කළේ වෙන කවුරුවත් නොවෙයි, වත්මන් විපක්ෂ නායකතුමායි. ඒ, එතුමන්ලා වැඩ කරපු හැටි. මේ, අපි වැඩ කරන හැටි. අපි එක සමරු ඵලකයක් ගහන්නේ නැතිව, එක පෝස්ටරයක් ගහන්නේ නැතිව, එක තොරණක් ගහලා නැතිව, cut-out එකක්වත් ගහලා නැතිව, එක සමරු පොතක්වත් ගහලා

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

නැතිව ගෙවල් 14,000ක් හදනවා. දැන් ඒ වැඩ ක්‍රියාත්මක වනවා. මේ ක්‍රමය දිහා බලාගෙන ඉන්න බැරිවයි අද විපක්ෂය මේ වාගේ චෝදනා එල්ල කරන්නේ. අවසාන වශයෙන් මම මේ කරුණත් කියන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණේ නායකතුමා වන ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා සභාව කල් තබන යෝජනාව ඉදිරිපත් කරමින් කථා කරද්දී අපේ ණය ගැන කිව්වා. ට්‍රිලියන ගණනාවක ණය තිබෙනවා කිව්වා. ඔව්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. රජයක් වුණාම ණය ගන්නවා. රජයක් නොවෙයි, සාමාන්‍ය ගමක සිටින දියුණු වන ඕනෑම කෙනෙක් ණය ගන්නවා. ණය ගෙව්වාම අවසානයේ ඔහුගේ වත්කම ඉතිරි වනවා. ඒවා එහෙම තමයි. අභියෝග ජය ගන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණේ ඉන්න කවුරුවත් ජීවිතේට 'බුල්ටෝ' කඩයක්වත් කරලා නැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය. බුල්ටෝ කඩයක්වත් කරන්න එපායැ. පුංචි කඩයක් දාලා, බුල්ටෝ ටිකක් වික්කා නම් ලැබුණේ මෙච්චරයි, මෙපමණ ඉතිරි වුණා කියලා දන්නවා. එහෙමවත් කරලා නැහැ. එම නිසා ඒ අය කවදාවත් ණය ගන්නේ නැහැ. හැබැයි, එතුමන්ලා කියන මේ ණයවලට අවසාන වශයෙන් තව දෙයක් එකතු වෙන්න ඕනෑ. ඒ, 1971දී සහ 1988-89 දී සිදු වූ දේවල්. ගණන් හදන කොට ඒවාත් මේ ණයවලට එකතු වන්න ඕනෑ. ඒක හරි නේද? ඒවා එකතු වෙන්න ඕනෑ නේද? ගිනි තැබූ SLTB බස් ටිකේ වටිනාකම එකතු වන්න ඕනෑ නේද? විනාශ කළ transformers ටිකේ වටිනාකම එකතු වන්න ඕනෑ නේද? විනාශ කළ ප්‍රාදේශීය සභා කාර්යාලවල වටිනාකමත් එකතු වන්න ඕනෑ නේද? මේ සියල්ලම එකතු වන්න ඕනෑ. නැති වූ මානව සම්පත ගැන මම කියන්නේ නැහැ. අම්මා, දරුවෝ බලාගෙන ඉන්නකොට තාත්තා එළියට අරගෙන ගිහිල්ලා තාත්තාගේ බෙල්ල කැපූ යුගයක් තිබුණා. දැන් ඒ යුගය නැහැ. ඒ කාලයේ ගොවිජනසේවා කාර්යාල එකක්වත් ඉතිරි කළේ නැහැ. නමුත් අද එතුමන්ලා පොහොර ගැන කථා කරනවා. අද සභාව කල් තබන අවස්ථාවේ ගෙන ආ මේ යෝජනාව පිළිබඳ විවාදයේදී එම යුගය ගැනත් මා එතුමන්ලාට මතක් කර දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම තවත් කාරණයක් කියන්න කැමැතියි. අපේ නව මුදල් ඇමති ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා අභියෝගවලට කවදත් කැමැති කෙනෙක්. අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා, ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමා, නව මුදල් අමාත්‍යතුමා ඇතුළු අපේ රජය අද තිබෙන අභියෝග භාරගෙන, මේ රට යුද්ධයෙන් බේරා ගත්තා වාගේ කොවිඩ් වසංගතයෙනුත් බේරාගෙන, ආර්ථික වශයෙනුත් අනිවාර්යයෙන් දියුණු කරනවා කියන පණිවුඩය මම ලබා දෙනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have nine minutes.

[අ.භා. 1.52]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
අද සභාව කල් තබන අවස්ථාවේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඉතාම වැදගත් මාතෘකාවක් පිළිබඳ යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. එය ඇත්තටම ඉතා වැදගත් මාතෘකාවක්. එම යෝජනාව ස්ථිර කළා, සමඟි ජන බලවේගයේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. සභාව කල් තැබීමේ යෝජනාව දෙවන වර ස්ථිර කිරීමක් අවශ්‍ය නොවුණත් මෙය කාලීන මාතෘකාවක් නිසා දෙමළ ජාතික සන්ධානය වශයෙන් මමත් එය ස්ථිර කරනවා. හැබැයි, මෙච්චර වැදගත් මාතෘකාවක් ගැන කථා කරන්න දවසක විවාදයක් විතරයි ලබා දීලා තිබෙන්නේ. ඒ ගැන ඇත්තටම බොහොම දුකයි. අද දිවා භෝජන වෙලාවත් මේ පිළිබඳව කථා කරන්න ලබා දුන්නා නම් මීට වඩා දෙයක් රටේ ජනතාවට කියන්න තිබුණා.

මට පෙර කථා කරපු ගරු ඇමතිතුමා බුල්ටෝ විකිණීම සහ ආර්ථිකය ගැන කථා කළා. අද තිබෙන ලොකුම ප්‍රශ්නය මේ ආණ්ඩුව බුල්ටෝ කඩයක් කරනවා වාගේ මේ රට ගෙන යන එකයි කියන කාරණය මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි. ඇත්තටම මා කථා කරන්න හිටපු කාරණා බොහොමයක් අද උදේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී ප්‍රකාශ කළ නිසා මම ඒවා නැවත මතක් කරන්න යන්නේ නැහැ. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් ඒ වාගේම කරුණු කීපයක් කියා තිබුණා. ඒ නිසා මම නැවත ඒවා repeat කරන්නේ නැහැ.

මම මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ සහ මේ රටේ ජනතාවගේ අවධානය මීට අවුරුද්දකට පෙර පැවැති මහ මැතිවරණය කෙරෙහි යොමු කරවන්න කැමැතියි. මීට හරියටම අවුරුද්දකට පෙර අද වාගේ දවසක මඩකලපුව දිස්ත්‍රික්කයේ තිබුණු වාතාවරණය මට හොඳට මතකයි. ඒ දිනය අද කියලා ගත්තොත්, හරියටම තවත් දවස් දෙකකින් ඡන්දය පැවැත්වීමට නියමිතව තිබෙනවා. ඒ ඡන්දයට දවස් දෙකකට පෙර, එනම් මීට අවුරුද්දකට කලින් හරියටම අද වාගේ දවසක අරක්කු, බියර් බෝතල් ලොරි පිටින් ගෙනිහිල්ලා බංකර් හදලා වාගේ ගෙවල්වල ගොඩ ගසා තිබුණා. ඡන්දය ලබා ගන්න එදා අරක්කු බෝතල් බංකර් වාගේ ගොඩ ගැසුවා. ඒ සමහර තැන් ගැන මම දන්නවා. එදා අරක්කු ගොඩ ගහපු තැන් ගැන අපි කිව්වත්, ඒවා ඇල්ලුවේ නැහැ. ඒවා කරපු කට්ටිය කවුද කියලා අපි දන්නවා. ඒ වාගේම, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සංවිධායකවරයෙක් ගිය අවුරුද්දේ අද වාගේ දවසක රුපියල් 1,000 කොළ envelopes අස්සේ දමමිනුයි සිටියේ. එතුමා ඒ envelopes එක්කම හසු වුණා, කලවංචිකුඩි සරස්වතී විද්‍යාලයේ polling booth එක ඉස්සරහ සිටියදී. මම පැෆරල් සංවිධානයට කථා කළාම ඔවුන් ඇවිල්ලා, එතුමා එතැනින් ඉවත් කළා. මා හිතන විදියට, මීට අවුරුද්දකට කලින් අද වාගේ දවසක දාපු රුපියල් 1,000 කොළ සහිත envelopes තමයි ඡන්දය දවසේ polling booth එක ඉස්සරහ එතුමා බෙදුවේ.

ඒ වාගේම තමයි, කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව කැලණි ගඟෙන් නයෙක් මතු වුණා කියලා සතුටු වෙලා - ඒ දිහා බලා confuse වෙලා - ඡන්දය දෙන්න ලැස්ති වුණේත් ගිය අවුරුද්දේ අද වාගේ දවසක. ඇත්තටම තව ජන කොටසක් අරක්කුවලට වත්, රුපියල් 1,000 කොළවලට වත්, කැලණි ගඟෙන් මතු වෙච්ච නයා ගැනවත් හිතලා නොවෙයි ඡන්දය දුන්නේ. නටන්න බැරි මිනිහාට පොළොව ඇදයි කියනවා වාගේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් නැතිව මට මේ රට ගෙන යන්න බැහැ කියලා ජනාධිපතිතුමා කියපු කථාව විශ්වාස කරලා, ජනාධිපතිතුමාට මේ රටේ තුනෙන් දෙකක බලයක් සහිත ආණ්ඩුවක් ලැබුණොත් එතුමා මහ බැංකුවේ හොරු ටික අල්ලයි කියා විශ්වාස කරලා යම්කිසි කණ්ඩායමක් ජනාධිපතිතුමා වෙනුවෙන් ඡන්දය දෙන්න පසු ගිය අවුරුද්දේ අද වාගේ දවසක ලැස්ති වෙලා හිටියා. Easter attack එකේ මහ මොළකරු අල්ලයි කියා විශ්වාසයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ඡන්දය දෙන්න තවත් පිරිසක් මීට අවුරුද්දකට කලින් අද වාගේ දවසක plan කරගෙන හිටියාය කියන එකත් කියන්න ඕනෑ.

අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුණේ ධීවර සංගමයක රැස්වීමකට මම පසු ගිය සතියේ ගියා. මුහුදේ ගිහිල්ලා ධීවරයන්ගේ මාළු හොරකම් කරගෙන එන පිරිසක් සම්බන්ධව ඒ ධීවර සංගමයේ රැස්වීමේදී සාකච්ඡා වුණා. එහෙම මාළු හොරකම් කරන අයගේ නම්, ඒ බෝට්ටුවල අංක හා පොලීසිය දමපු entries ඔක්කොම ඇතුළත් file එකක් මා ළඟ තිබෙනවා. කවුරුන් හෝ කැමැති නම් ඒ file එක අරගෙන ඔවුන් අල්ලන්න. පොලීසිය භාර ඇමතිවරයා දැන් මේ ගරු සභාවේ නැහැ. මාළු හොරකම් කරන්න යන ඒ කට්ටියවත් අල්ලන්න බැරි මේ ආණ්ඩුව මහ බැංකු හොරු අල්ලන්නේ කොහොමද; Easter attack එකේ මහ මොළකරු අල්ලන්නේ කොහොමද? මා ළඟ තිබෙනවා ඒ මාළු හොරකම කරන අයගේ නම් ටික. එහෙම මාළු හොරකම් කරන අය 25 දෙනෙක් ඉන්නවා. මඩකලපුව, අම්පාර කියන දිස්ත්‍රික්ක දෙකේම මාළු හොරකම් කිරීමේ කටයුත්තේ යෙදී ඉන්නේ 25ක්, 30ක් වාගේ පිරිසක්. ඒ අයගේ නම් එක්ක විස්තර මම ලබා දෙන්නම්. ඒ ගොල්ලන්ගේ ඡායාරූපත් තිබෙනවා. අල්ලාගෙන ආපු මාළු පොලීසියේ අයටයි, නාවික හමුදාවේ නිලධාරීන්ටයි පගාව වශයෙන් දෙන ඡායාරූප තිබෙනවා. නමුත් ඔවුන් අල්ලන්න බැරි මේ ආණ්ඩුව මහ බැංකු හොරු අල්ලන්නේ කොහොමද? මහ බැංකු හොරු අල්ලයි කියා විශ්වාසයෙන් ඡන්දය දීපු මිනිස්සුත් අද රවටලායි තිබෙන්නේ.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මගේත්, අපේ පක්ෂයේත් මතය මා කියන්නම්. කොයි අවස්ථාවකවත් මේ ආණ්ඩුව පෙරළන්න අපේ බලාපොරොත්තුවක් නැහැ. විපක්ෂයේ සමහර අයගේ මතය තමයි, මේ ආණ්ඩුව කොහොම හරි පෙරළා දමා බලයට එන එක; තමන්ට බලය ගන්නා එක. හැබැයි, පක්ෂයක් වශයෙන් බලයට ඒම හෝ මේ ආණ්ඩුව අස්ථාවර කිරීම හෝ ආණ්ඩුව පෙරළීම නොවෙයි අපේ පරමාර්ථය. අපේ පරමාර්ථය තමයි, ජනතාවගේ ගැටලු විසඳා ගැනීම. මම පාර්ලිමේන්තුවේදී කළ මගේ පළමුවැනි කථාවේදීම කිව්වා, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තිබෙන ආණ්ඩුවක් කියන්නේ, ප්‍රශ්න විසඳන්න පුළුවන් ආණ්ඩුවක් බව. අපි සියලුදෙනාම දන්නවා, අපි කැමැති වුණත්, අකැමැති වුණත් ජනාධිපතිතුමාට තව අවුරුදු තුනක කාලයක් තිබෙනවා කියලා.

මේ පාර්ලිමේන්තුව විසුරුවා හරින්නත් පුළුවන් තව අවුරුදු එකහමාරකින්. ඒකත්, ආණ්ඩු පක්ෂය කැමැති වුණොත් විතරයි. එහෙම නැත්නම්, මේ ආණ්ඩුවට තව අවුරුදු හතරක් තිබෙනවා. අපි මේ අවස්ථාවේ බලන්නේ, අපි හැම වෙලේම කථා කරන්නේ ආණ්ඩුව පෙරළන්නවත්, ආණ්ඩුවට මඩ ගහන්නවත් නොවෙයි, ජනතාවගේ ගැටලු විසඳා ගන්නයි. එහෙම නැතුව "ආණ්ඩුව පෙරළීම" කියන එකම චේතනාව මත නොවෙයි අපි මෙතැන කථා කරන්නේ.

අද මේ තිබෙන යම් යම් ගැටලු අප විසඳා ගත්තේ නැත්නම් මොකද වෙන්නේ? ශ්‍රී ලංකාවේ යම්කිසි කාලයක තිබුණා, high-class, middle-class, low-class කියලා ආර්ථික මට්ටම අනුව - economy-wise - බෙදීමක්. හැබැයි, අද පන්ති දෙකයි ඇති වෙන්නේ. එක පන්තියක් තමයි, මේ ආණ්ඩුවට, රාජපක්ෂ ආණ්ඩුවට හිතවත් මුදල් තිබෙන පන්තිය. අනෙක් පන්තිය තමයි, සල්ලි නැති ශ්‍රී ලාංකීය පන්තිය. ඒ පන්ති දෙකයි මේ රටේ ඇති වෙන්නේ. අපට ඒක ඉතාම පැහැදිලිව කියන්න පුළුවන්.

ඇත්තටම අද ලංකාවේ ඩොලර් නැහැ. මම කියන්න ඕනෑ, import කරන අය ගැන. Imports ගැන කියන විට කියන්න ඕනෑ, imports ලංකාවේ ban කළාට ලංකාවෙන් අපනයනය කරන දේවල් නිෂ්පාදනය කරන්න raw materials අවශ්‍ය බව. ඒ කියන්නේ, අපනයන කර්මාන්තය කරගෙන යන්න imports අවශ්‍යයි; raw materials ඕනෑ. ඒ raw materials ලංකාවට import කරද්දී සාමාන්‍යයෙන් එන්නේ "Documents against Payment" කියන පදනම යටතේ. අද නැව් මඟින් අමුද්‍රව්‍ය ගෙන්වන සුළු ව්‍යාපාරිකයන්ට ලංකාවේ වරායවලදී demurrage හැටියට රුපියල් 80,000ක්, 90,000ක් විතර ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ අය, පොඩි ව්‍යාපාරිකයෝ. සමහර විට ඒ ගොල්ලන්ගේ මුළු ලාභයම රුපියල් ලක්ෂ දෙකයි, තුනයි. ඒකෙනුත් රුපියල් 80,000ක්, 90,000ක් මේ ආණ්ඩුවට ඩොලර් නැති ගැටලුව නිසා වියදම් කරන්න සිදු වීමෙන් මොකක්ද වෙන්නේ? ඒ බිස්නස් එක කරන අයට තව ටික කාලයක් යද්දී ඒ බිස්නස් එක කරන්න බැරි වෙයි. දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරයෙකු වන මට එක call එකකින් මඩකලපුව දිස්ත්‍රික්කයට Canadian Dollars සියක්දහසක් - Canadian Dollars 100,000 - මෙට account එකකට ගේන්න පුළුවන්. මා ඒ ආයෝජනය කරලා පෙන්නුවොත්, එන්නේ ඒ ආයෝජනය විතරක් නොවෙයි. තවත් ආයෝජන ගලාගෙන එනවා. මොකද, initial investmentsවලින් පසුව තව ආයෝජන එනවා. ඒක කරන්න දෙන්නේ නැත්තේ කවුද? මේ ආණ්ඩු පක්ෂයේ මඩකලපුව දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපති පිල්ලෙයාන්. අද මුදල් ඇමතිතුමාගේ විෂයයට අදාළ මේ විවාදයේදී මුදල් ඇමතිතුමා මේ ගැන සොයා බලන්න ඕනෑ.

ඒ වාගේම තමයි, ලීසිං ගෙවාගෙන බිස්නස් කරපු අයට moratoriums තුනක් දුන්නා කිව්වා. නමුත් අද ඒ අයට ගෙවන්න loans හතරක් තිබෙනවා. ලොකු loan එකයි; moratoriums තුනයි. එතකොට loans හතරක් ගෙවන තත්ත්වයට අද ඔවුන් පත් වෙලා තිබෙනවා. Moratorium එක ගෙවන්න ඕනෑ; ඒකට පොලියත් ගෙවන්න ඕනෑ කියා මුල් කාලයේදීම කිව්වා නම්, සමහර විට ඒ අයට ඒ asset එක විකුණා දමා ණයකාරයෙකු නොවී ඉන්න තිබුණා. අද ඔවුන් විශාල ණයකාරයන් වෙලා. ඒ නිසා මුදල් ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා moratoriumsවලට තිබෙන interest එක waive off කරන්න කියලා.

අපි අද තරුණ තරුණියන්ට කියනවා, රජයේ රස්සා සොයන්නේ නැතුව පෞද්ගලික ක්ෂේත්‍රයේ රස්සාවලට යන්න කියලා. පෞද්ගලික ක්ෂේත්‍රයේ රැකියා කළාම fund එකක් දෙනවා, retirement එකේදී. ඒ මිනිස්සු ඒ fund එක අරගෙන ගිහිල්ලා මොකක්ද කරන්නේ? ඒ ගොල්ලන් හැමෝම ඇලෝසියස්ලා නොවෙයි නේ; එහෙම නැත්නම්, ආණ්ඩුවත් එක්ක හිතවත්කම් තියාගෙන invest කරන්න දන්නා කට්ටිය නොවෙයි නේ. ඒ වාගේ මිනිස්සු ගිහිල්ලා මොකක්ද කරන්නේ? ඒ අය අවුරුදු 60 පැන්නාම ගිහිල්ලා බැංකුවේ fixed deposit එකක් දානවා. එය රුපියල් ලක්ෂ 15කට අඩු නම් විතරයි අද සියයට 10ක, 15ක පොලියක් ගෙවන්නේ.

එතැනින් එහාට සියයට 3යි, 4යි පොලිය ගෙවන්නේ. රුපියල් ලක්ෂ 50ක විතර fund එකක් ලැබුණු මනුස්සයෙක් බැංකුවේ සල්ලි දාලා, ඒ සල්ලිවලින් ජීවත් වුණා. ඒ මනුස්සයා අද පාරේ ඉන්නේ. මොකද, ඒ මනුස්සයාට අදායමක් නැහැ. Pensionවල විෂමතා තිබෙනවා. මට කියන්න තවත් බොහෝ දේවල් තිබෙනවා. හැබැයි, මට ලැබී තිබෙන කාලය ප්‍රමාණවත් නැහැ. ඒ නිසා මම තවත් එක් දෙයක් කියලා මගේ කථාව අවසන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ ජනතාවට vaccines ලබා දීම ගැන මම ඇත්තටම සතුටු වෙනවා. සාමාන්‍යයෙන් vaccines ලබා දෙනවා කියන්නේ රජයක යුතුකමක්. මේ vaccines ලබා දීම ලංකාවේ ජනතාවට කරන උදව්වක් නොවෙයි, රජයක් වශයෙන් යුතුකමක්. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමාත්, Central Bank Report එක ගැන කථා

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

කරද්දී යුද්ධය ගැන සඳහන් කළා. සාමාන්‍යයෙන් කථා කරද්දීත් යුද්ධය ගැන තමයි කියන්නේ. මේ වාගේ අවස්ථාවක රජයේ vaccination drive එක පොඩ්ඩක් හරියට කරගෙන යන එක ගැන අද මට ඇත්තටම සතුටුයි. මොකද, මම දැක්කා ජනාධිපතිතුමාට හිතවත් මාධ්‍ය ආයතනයක ප්‍රධානියෙක් ඇවිල්ලා මාධ්‍ය සාකච්ඡාවක කිව්වා, "සර් ෆේල්, සර් පාස්" කියන එක මරු concept එකක්. හැබැයි, ඡන්දයක් ළං වෙලා ඒ concept එක ඇවිල්ලා තිබුණා නම් එය capitalize කරන්න පුළුවන්" කියලා. ජනාධිපතිතුමාට හිතවත් රජයේ මාධ්‍ය ආයතනයක කටයුතු කරන පුද්ගලයකු වන ඔහු මේක concept එකක් වශයෙන් තමයි බලන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, Sir. I am winding up.

මේ රජය vaccination drive එක අද වනවිට කරගෙන යන නිසා, එම vaccination drive එක ගැන විතරක් කථා කරන කුලප්පුවක් ඇති කරගෙන තිබෙනවා. නැත්නම්, ඉෂාලිනීගේ මරණය තියාගෙන වතුකරයේ දෙමළ ජනතාවයි, මුස්ලිම් ජනතාවයි අතර riot එකක් ඇති කරලා, මේ දෙගොල්ලන්ට ගහ ගන්න දීලා, ගෙවල් ගිනි තියා ගන්න දීලා ඊට පස්සේ සිංහල ජනතාවට කියයි, "දැක්කා ද, මේ රට පාලනය කරන්න නායකයෙක් ඉන්න නිසා තමයි මේ riot එක අපි පාලනය කර ගත්තේ" කියලා. ඒ ජනතාවත් සතුටු කරන්න පුළුවන් තත්ත්වයක් ඇති කර ගනියි. හොඳ වෙලාවට මැතිවරණයක් නැත්තේ. හොඳ වෙලාවට vaccination drive එක තියෙන්නේ. නැත්නම් අද ලංකාව තුළ දමිළ, මුස්ලිම් ජනතාව අතර riot එකක් ඇති වෙනවා. මොකද, රජයේ ඇමතිවරු තමයි අද මේ වෙනුවෙන් උද්ඝෝෂණය කරන්නේ. රජයේ ඉන්න අය උද්ඝෝෂණය කරන්න අවශ්‍ය නැහැ. ඔවුන්ට නීතිය අනුව කටයුතු කරන එක එච්චර ලොකු දෙයක් නොවෙයි. ඒ නිසා මේ දේත් කියලා, සියලුදෙනාටම - [බාධා කිරීමක්] කෑ ගහන්න එපා, පොඩ්ඩක් ඉන්න. මම කිව්වා නේ. මම කියන්නේ ආණ්ඩුව පෙරළන්න නෙමෙයි. මම කියන්නේ මේ ආණ්ඩුවේ වැරදි හදා ගෙන ලංකාවට සුබ අනාගතයක් හදන්න පුළුවන් විධියක්. මේ වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තියා ගෙන මේ ආණ්ඩුව හොඳ ආර්ථිකයක් හදන්නේ කොහොමද?

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. B.Y.G. Rathnasekara. You have 11 minutes.

[අ.භා. 2.02]

**ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා**
(மாண்புமிகு பீ.வை.ஜீ. ரத்னசேக்கர)
(The Hon B. Y. G. Rathnasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා. අද ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා මහ බැංකුව 2020 වර්ෂයට අදාළව නිකුත් කර තිබෙන වාර්තාව පදනම් කරගෙන විවාදයකට යෝජනාවක් ඉදිරිපත් කළා. හැබැයි, ඒ යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේ ඉඳලා මේ දක්වාම විපක්ෂයේ කථා ටික අපි අහගෙන හිටියා. අපි නම් ආණ්ඩු පක්ෂය. අපි ආණ්ඩුව කරගෙන යන විධියක් තිබෙනවා. විපක්ෂය මේ විවාදය තුළදී අඩුපාඩු ටිකක් ගැන කියනවා; මහ බැංකු වාර්තාව ගැන කියනවා; ආර්ථිකය ගැන කියනවා; බිඳ වැටුණු ඒවා ගැන කියනවා. හැබැයි, අඩුම ගණනේ මෙන්න මේ ගැටලුවට විසඳුමක් වශයෙන් මෙන්න මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න කියලා පුංචි හෝ යෝජනාවක් ඉදිරිපත් කරනවා මම කිසිදු අවස්ථාවක, ඒ කිසිදු කථාවක දැක්කේ නැහැ. ඇත්තටම ලෙඩේ දැන ගත්තාට වැඩක් නැහැ, බෙහෙතක් නැත්නම්.

මේ විපක්ෂය අදත් කරන්නේ මොකක්ද? මහ බැංකු වාර්තාව ගත්තාම ඕනෑ කෙනෙකුට අකුරු කියවන්න පුළුවන්; ඕනෑ කෙනෙකුට ඉලක්කම් කියවන්න පුළුවන්. මේ මහ බැංකු වාර්තාව කියවලා තේරුම් ගන්න පුළුවන්. අද උදේ ඉඳන් මෙතැන ඉලක්කම් හරඹයක් තිබුණා. ඒ නිසා මේ තිබෙන ඉලක්කම් ටික බොහොම ලස්සනට කියන්න පුළුවන්. අපටත් ඒ ඉලක්කම් ටික එහෙම්මම කියන්න පුළුවන්. අපේ ආනයනය වැඩි වුණා, අපනයන අඩු වුණා, ඒ නිසා වෙළෙඳ ශේෂය 2020 වන විට මිලියන 16,055යි කියලා ඉලක්කමක් කියන්න පුළුවන්කම අපටත් තිබෙනවා. විදේශ සෘජු ආයෝජන අපනයන සාරාංශය ගත්තොත්, 2019 ඇහලුම් අපනයනයෙන් විතරක් අපට ඇමෙරිකානු ඩොලර් මිලියන 5,206ක් ලැබුණා. නමුත් ඒක 2020 වන විට ඩොලර් මිලියන 3,936ක් දක්වා අඩු වුණා. ආනයන සාරාංශය ගත්තොත්, 2020 අවුරුද්දේ ආනයන සඳහා ඩොලර් මිලියන 16,055ක් වැය කරන්න සිද්ධ වුණා. සමස්ත මුළු ආනයන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 16,055ක් වෙද්දී, බොරතෙල්වලට විතරක් ඇමෙරිකානු ඩොලර් මිලියන 583ක්, පිරිපහදු නිෂ්පාදන සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 1,742ක් වශයෙන් 2020 අවුරුද්ද සඳහා අපට වැය කරන්න සිද්ධ වුණා.

රාජ්‍ය ආදායම අඩුවුණා, රාජ්‍ය වියදම වැඩිවුණා. ඒ ඉලක්කම් ටික තිබෙනවා. "2019දී විදේශ නියුක්ති හා ප්‍රේෂණ 6,717ක් ලැබුණා. හැබැයි, 2020දී එය 7,104ක් බවට පරිවර්තනය වෙලා වැඩි වුණා" කියලා මේ විධියට සංඛ්‍යාලේඛන ටික අපට කියන්න පුළුවන්. ඕනෑම අකුරු දන්නා කෙනෙකුට මහ බැංකු වාර්තාව අරගෙන මේ සංඛ්‍යාලේඛන ටික කියවාගන්න පුළුවන්. 2020 අවුරුද්දේ ආර්ථිකයේ යම් පසුබෑමක් තිබෙනවාය කියන එක ලංකාවට විතරක් නොවෙයි සමස්ත ලෝකයටම පොදු වූ කාරණාවක්. එම නිසා ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ අපි හැම කෙනෙක්ම අවිවාදයෙන් පිළිගන්නවා, 2020 අවුරුද්දේ ආර්ථිකය පසුබෑමකට ලක් වුණාය කියන කාරණය. මේ පසුබෑමට සාධාරණ වූ හේතු තිබෙනවා. ඒක අපි කවුරුත් දන්නවා. හැබැයි, අපි නැවත නැවතත් මතක් කරනවා, 2015දී අපි ආණ්ඩුව භාර දුන්නේ, රාජපක්ෂ යුගය අවසන් කරලා බව. මේ රටේ පැවැති යුද්ධය සම්පූර්ණයෙන්ම අවසන් කරලා, අතිවිශාල ධනස්කන්ධයක් යුද්ධය වෙනුවෙන් වියදම් කරපු එක නවත්වලා, ආර්ථික සංවර්ධන වේගය සියයට 6කට ආසන්න ප්‍රමාණයකට ගෙනැල්ලා, රටේ හැම තැනම වැඩ බිමක් බවට පරිවර්තනය වෙලා තිබුණු අවස්ථාවක ආණ්ඩුව භාර දීලාත් පසුගිය අවුරුදු 4 1/2ක වාගේ කාල සීමාව තුළ පැවැති ආණ්ඩුව ආර්ථික වර්ධන වේගය සියයට 2.3ක් දක්වා අඩු කරලා, විදේශ විනිමය හිඟය, වෙළෙඳ ශේෂය හිඟය ඒ විධියටම වර්ධනය වෙන තත්ත්වයකට

ගෙනාවේ ඇයි කියන කාරණාවත් අපට අහන්න පුළුවන්. ඒ වාගේම ලංකා ඉතිහාසයේ කවදාවත් නොවුණු මට්ටමට බදු වැඩි කරලා, රජයේ බදු ආදායම අතිවිශාල ප්‍රතිශතයකින් ඉහළ දමලාත් ඒ කාල වකවානුව තුළ ආර්ථිකය හරි තත්ත්වයට ගෙනෙන්න බැරිවුණේ ඇයි කියන කාරණාවත් අපට අහන්න පුළුවන්. 2020 අවුරුද්ද වෙනකොට අපි මේ තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් කළා. පාර්ලිමේන්තු මැතිවරණය තියලා, අපේ ආණ්ඩුව පිහිටුවලා තවම අවුරුද්දක් ගතවෙලා නැහැ. දැනට මාස 11ක පමණ කාලයක් ගත වෙලා තිබෙනවා. අපි එදා දිවුරුම් දුන්නේත් මුඛ ආවරණයක් දමාගෙන. අදටත් අපි ඉන්නේ එහෙමයි. අදටත් අපට සෙනඟ 50ක් 60ක් මුණ ගැහිලා යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බැහැ.

අද ගමට යන්න විධියක් නැහැ, මිනිස්සු එක්ක කථා කරන්න විධියක් නැහැ. මේක අපේ රටේ විතරක් වුණා නම් අපට යම්කිසි සහනයක් තිබෙනවා. එහෙම වුණා නම් ලෝකයේ අනෙක් රටවල් අපට උදව් කරයි, අපට විතරක් මෙහෙම හානියක් වුණා කියලා. නමුත්, සමස්ත ලෝකයේම දැවැන්ත රටවල් පවා සම්පූර්ණයෙන්ම ඇද වැටුණු දැවැන්ත ව්‍යසනයක් හමුවේ තමයි අපි මේ අවුරුද්ද තුළ මේ රටේ කටයුතු කර ගෙන ගියේ. විපක්ෂය මේ ගැන සතුටු වෙන්න ඕනෑ. මේ මට්ටමින් හෝ අපි මනා කළමනාකරණයක් කළ නිසා තමයි අද මේ මහා ව්‍යසනය තුළ ලංකාවේ මරණ සංඛ්‍යාව අවම මට්ටමේ තියාගන්න පුළුවන්කම ලැබුණේ. රජයක් හැටියට අපේ මනා ආර්ථික කළමනාකරණය නිසා තමයි මේ මට්ටමින් හෝ ආර්ථිකය දුවන්න පුළුවන් වෙලා තිබෙන්නේ. කෙනෙකුට හිතෙන්න පුළුවන් ආණ්ඩුව අසාර්ථකයි; ෆේල් කියලා. මේ වාගේ කථා කියනවා. හැබැයි, සාමාන්‍ය තත්ත්වයක් තුළදී ආර්ථිකය ක්‍රියාත්මක වෙන විධියයි, මේ වාගේ ලෝක ව්‍යසන තත්ත්වයක් තුළදී ආර්ථිකය ක්‍රියාත්මක වෙන විධියයි අතරේ ලොකු වෙනසක් තිබෙනවා.

හැම දාම හැම දේම හැරෙන හැරෙන පැත්තට විවේචනය කරන්න පමණක් සීමා වුණු විපක්ෂයක් අපට තිබෙනවා. අපේ ආණ්ඩුව ඉතාම හොඳ චේතනාවෙන් කාබනික පොහොර පිළිබඳ යෝජනාව ගෙනාවා. රටේ සමස්ත මහජනයා විනාශ වෙන්න යන එක වළැක්වීම සඳහා රසායනික පොහොර ගෙන ඒම නවත්වා, කාබනික කෘෂිකර්මය පැත්තට හැරෙමු කියන යෝජනාව අතිගරු ජනාධිපතිතුමා ගෙන ආවා. එය දැන් ක්‍රියාත්මක කරමින් යනවා. ක්ෂණිකව අපට කාබනික පොහොර භාවිතය පැත්තට හැරෙන්න බැරිවෙයි. ඒ නිසා සමහර අංශවලට යම්කිසි නිදහසක් දීලා තිබෙනවා, යම් පොහොර ප්‍රමාණයක් ආනයනය කිරීමේ හැකියාවක් තිබෙනවාද කියලා බලන්න. අද මේක විවේචනයට ලක්කර තිබෙනවා, "ජනාධිපතිතුමා කිව්වා, කිසිසේත්ම මේක කරන්නේ නැහැ කියලා. හැබැයි දැන් සමහර අංශවලට පොහොර ආනයනයට නිදහස දීලා තිබෙනවා" කියලා. ආර්ථිකය තුළ හැම දාම අපි ගත්ත තීරණයක් සරල රේඛාවක යන්න බැහැ. පරිසරය වෙනස් වෙනවා. එම නිසා ඕනෑම කළමනාකරණ තීරණයක් ගන්නකොට, අපි මුහුණ දීලා තිබෙන පාරිසරික වෙනස්කම් පිළිබඳවත් විශ්ලේෂණය කරන්න සිදු වෙනවා. පාරිසරික වෙනස්කම් සිද්ධ වෙනකොට අපි ගත්ත ඇතැම් තීරණ වෙනස් කරන්න සිද්ධ වෙනවා. මේක කළමනාකරණයේ මූලිකාංගයක්. එමනිසා කළමනාකරුවෙක් නිසි පරිදි කළමනාකරණය කරනකොට, පාරිසරික වෙනස්කම් පිළිබඳව විශ්ලේෂණය කරනවා. පරිසරය නිරන්තරයෙන් වෙනස් වෙනවා. නිරන්තරයෙන් පරිසරය වෙනස් වන තත්ත්වය තුළ අපේ උපායශීලි උපක්‍රම අනිවාර්යයෙන්ම වෙනස් කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා අපි රසායනික පොහොර මේ රටට ගේන්නේ නැහැ. කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘති දැන් සාර්ථකව ක්‍රියාත්මක වනවා. මේ වනකොට කාබනික පොහොර නිෂ්පාදනය සඳහා අතිවිශාල පිරිසක් ලියා පදිංචි වෙලා තිබෙනවා. දැන් කාබනික පොහොර නිෂ්පාදනයට සහ කාබනික කෘෂි කර්මාන්තය පැත්තට රට හැරෙමින් තිබෙනවා. එය ඉතා සතුටුදායක තත්ත්වයක්. නමුත්, එහි ගැටලු තියෙයි; ප්‍රශ්න තියෙයි. ප්‍රශ්න ඇති වන අවස්ථාවලදී අපි ඒවාට මුහුණ දෙනවා.

සමහර අය කිව්වා, "විදේශ විනිමය හිඟයක් තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ඉල්ලීම් කරන්න" කියලා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගැන අපි දන්නවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
දැන් ගරු මන්ත්‍රීතුමා කියපු කාරණයක් ගැන මට පොඩි විග්‍රහයක් අවශ්‍යයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් කිව්වා මේ රටට රසායනික පොහොර ගේන්නේ නැහැ කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

**ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා**
(மாண்புமிகு பீ.வை.ஜீ. ரத்னசேக்கர)
(The Hon B. Y. G. Rathnasekara)
රසායනික පොහොර සම්බන්ධ තීරණය අපි අවශ්‍ය වුණොත් වෙනස් කරනවා. අවශ්‍ය වුණොත්, ඉදිරියේදී තීරණය වෙනස් කරනවා. ඒ අවශ්‍යතාව පරිදි. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒක තමයි මේ ඔබතුමාට කියන්නේ. වචනයක් කිව්වාට, ඒක සාදාකාලිකව ඒ විධියටම ක්‍රියාත්මක කරනවා නොවෙයි. ඒක වෙනස් කරන්න සිද්ධ වෙන්න පුළුවන්. ඒකට තමයි කළමනාකරණය කියන්නේ. අපි අවශ්‍යතාව පරිදි උපාය මාර්ග වෙනස් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කියමින් සිටියේ, සමහර අය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ඉල්ලීම් කරන්න කියන බවයි. අපි අවශ්‍ය වුණොත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ඉල්ලීම් කරනවා. ඒ කරන්නම දෙයක් නැත්නම්. හැබැයි, ඒ අපේ අන්තිම විකල්පය; කරන්නම දෙයක් නැති වුණොත් ගන්නා පියවර. මොකද, අපි දන්නවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගියාම සිද්ධ වන දේ. ඇතැම් විට, රුපියලේ අගය මීට වඩා බාල්දු වෙයි; ඩොලරයේ අගය තවත් ඉහළ යයි; පොලී අනුපාතය දැවැන්ත ලෙස ඉහළ යයි. එම ප්‍රතිඵලවලට අපි මේ අවස්ථාවේ කැමැති නැහැ. ඒ නිසා අපි ඒ යෝජනාවට එකඟ නැහැ. ඒ නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත අපි යන්නේ, තිබෙන අන්තිම විකල්පය හැටියටයි.

ඊළඟට අපේ ගරු මන්ත්‍රීවරයෙක් ඇහුවා, "රටවල් 43ක් දැන් iPhones නිෂ්පාදනය කරනවා. අපි නිෂ්පාදනය නොකරන්නේ ඇයි" කියලා. අපි මේ ආණ්ඩුව භාරගෙන තවම මාස 11යි. අපට iPhones නිෂ්පාදනයට තබා මේ ආර්ථිකය හැඩගස්වා ගැනීම සඳහා අපි හිතාගෙන හිටපු සැලැස්මවත් නිසි පරිදි ක්‍රියාත්මක කර ගන්න වාතාවරණයක් තිබුණේ නැහැ. හැබැයි, පසුගිය අවුරුදු හතරහමාර තුළ ලෝක ව්‍යසනයක් නැතුව, යුද්ධයක් නැතිව, රට සාමකාමීව තිබුණා. එතකොට iPhones නොවෙයි, ඕනෑ දෙයක් නිෂ්පාදනය කරන්න තිබුණා. යහ පාලන ආණ්ඩුව iPhones නිෂ්පාදනය කරන්න හැදුවා, Volkswagen වාහන නිෂ්පාදනය කරන්න හැදුවා. හැබැයි, අපි දැක්කේ නැහැ ඒ කිසිදු නිෂ්පාදනයක් සිදු වුණු බවක්. ඒ ඉතා අසාර්ථක ආණ්ඩු කාලයක්. දැන් ඇතැම්

[ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා]

ගරු මන්ත්‍රීවරු කියනවා, "ආණ්ඩුව බදු ආදායම අඩු කර ගත්තා" කියලා. කථාව ඇත්ත. අපි මේ රට භාර ගන්නකොට මේ රටේ ආර්ථිකය මැරිලා තිබුණේ; ආර්ථික ගමන එක තැන හිර වෙලා, එක තැන් පල් වෙලා තිබුණේ. මේ ආර්ථිකයට ක්ෂණික උත්තේජනයක් දීමේ අවශ්‍යතාව තිබුණා. ඒ නිසා මේ ආර්ථිකයට උත්තේජනයක් දීමේ අදහසින් කවුරුත් බලාපොරොත්තු නොවුණු විධියට ඉතා සැලසුම් සහගතව බදු අඩු කළා.

උපයන විට ගෙවීමේ බද්ද - PAYE tax - කියන්නේ බද්දක් නොවෙයි, බදු එකතු කරන ක්‍රමයක්. එය ක්‍රියාත්මක කළ යුතුයි කියන එකයි මගේත් පෞද්ගලික අදහස. සමහර විට අපට පාඩු සිද්ධ වෙයි. හැබැයි, අපි බදු අඩු කළේ බොහොම සද්චේතනාවෙන්. දැන් විපක්ෂය කියනවා, බදු පනවන්න කියලා. අපි බදු අඩු කරනකොට එතුමන්ලා දැන් කියනවා, බදු පනවන්න කියලා. සීනි බද්ද ශත 25ක් වීම ගැන විවේචනය කරනවා. හැබැයි, සීනි මිල ඉහළ යනකොට ඊට විරුද්ධව කථා කරනවා. හුදෙක් විපක්ෂය පවතින කාරණාවක් විවේචනය කරනවා මිස යෝජනා ඉදිරිපත් කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. බුද්ධිමත් සභාවක් නම් ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය එකතුවෙලා ඇතිවෙලා තිබෙන මේ අර්බුදකාරී තත්ත්වයෙන් රට ගොඩගන්න යෝජනා ඉදිරිපත් කරන්න ඕනෑ. තමුන්නාන්සේලා මහා ප්‍රාඥයෝ නම් රටේ ආර්ථිකය මේ ව්‍යසනකාරී තත්ත්වයෙන් ගොඩගන්න අඩු ගානේ එක් මන්ත්‍රීවරයෙක් එක යෝජනාව බැගින් හෝ මේ විවාදයේදී ඉදිරිපත් කරන්න කියලා මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට යෝජනා කරනවා. එතකොට රට පිළිගනියි, මේ අයට වැඩ පිළිවෙළක් තිබෙනවා සහ රට ගොඩගන්න අදහසක් තිබෙනවා කියලා. ඒ නිසා මෙම විවාදය අවසන් වීමට පෙර හෝ තමුන්නාන්සේලාගේ යෝජනා ටික ඉදිරිපත් කරන්න කියලා මම විපක්ෂයට කාරුණිකව ආරාධනා කරනවා. එතකොට අපි ආණ්ඩුවක් හැටියට ඒ යෝජනා සලකා බලන්නම්. යෝජනා නොව, හුදෙක් විවේචන පමණක් නම් ඉදිරිපත් කරන්නේ ජනතාව ඒවා පිළිගන්නේ නැති බවත් මා මතක් කර සිටිනවා. අපේ ආණ්ඩුව අවශ්‍ය තැනදී අවශ්‍ය පරිදි උපාය, උපාය මාර්ග වෙනස් කරමින්, නිසි කළමනාකරණයකින් යුතුව ඉදිරියේදී ක්‍රියා කරනවා කියන ප්‍රතිඥාව මේ අවස්ථාවේ ලබා දෙමින්, මම නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Kabir Hashim. You have 11 minutes.

Before he starts, will an Hon. Member propose the Hon. Sanjeeva Edirimanna to the Chair?

**ගරු කනක හේරත් මහතා (සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கனக ஹேரத் - கம்பனித் தோட்டங்களை மறுசீரமைத்தல், தேயிலை மற்றும் இறப்பர் தோட்டங்கள் சார்ந்த பயிர்ச்செய்கை, தொழிற்சாலைகளை நவீனமயப் படுத்தல் மற்றும் தேயிலை மற்றும் இறப்பர் ஏற்றுமதி மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanaka Herath - State Minister of Company Estate Reforms, Tea and Rubber Estates Related Crops Cultivation and Factories Modernization and Tea and Rubber Export Promotion)
Sir, I propose that the Hon. Sanjeeva Edirimanna do now take the Chair.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)

*විසින් ස්ථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව එදිරිමාන්න මහතා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. SANJEEVA EDIRIMANNA *took the Chair.*

[අ.භා. 2.14]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්තුතියි.

මුලින්ම, මට පෙර කථා කරපු ගරු ගුණපාල රත්නසේකර මන්ත්‍රීතුමාට මතක් කර දෙන්න ඕනෑ රටේ ඇති වෙලා තිබෙන මේ ආර්ථික ප්‍රශ්නය -අර්බුදය- කොවිඩ් වසංගතය නිසා නොව, රජයේ අවපාලනය නිසාම ඇති වුවක් බව. අපි මෙය එක වතාවක් නොවෙයි, දහ වතාවක් විතර කියා තිබෙනවා. ඒක අපි දිගින් දිගටම ඔප්පු කරලාත් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාජ මාධ්‍ය තුළ පළ වෙලා තිබුණු සාකච්ඡාවකින් කොටසක් උපුටාගෙන මම කථාව ආරම්භ කරන්න කැමැතියි. ළඟදී දවසක ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ ඡන්දයක් තිබුණා. ඒ ප්‍රාන්ත ඡන්දයෙන් පසුව අලුතින් මුදල් ඇමතිවරයා හැටියට පත් වුණේ DMK පක්ෂයේ ආචාර්ය පලනිවේල් තියාගරාජන්. එතුමා මුදල් ඇමතිවරයා හැටියට නම් වුණා. එතුමාට Engineering උපාධියක් තිබෙනවා; MBA - Finance උපාධියක් තිබෙනවා. ඒ වාගේම, එතුමා banker කෙනෙක්. ඡන්දය දිනලා මුදල් ඇමතිකම භාර ගත්තාම මාධ්‍ය එතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා, "Lockdown සහ කොවිඩ් වසංගත තත්ත්වය පිළිබඳව ඔබ මොකක්ද කරන්නේ?" කියලා. එතුමා කියනවා, "පළමුව DMK රජයේ කැබිනට් තීන්දුව අනුව සෑම දිස්ත්‍රික්කයකම එක් අමාත්‍යවරයෙකුට අපි ඒ දිස්ත්‍රික්කය භාරව වසංගතය පාලනය කිරීමට කටයුතු කරන්න උපදෙස් දෙනවා" කියලා. දැන් මේ ආණ්ඩුවට අවුරුදු එකහමාරයි, තමන්ගේ දේශපාලන නායකත්වයත් තිබෙනවා. හැබැයි, ඒ වාගේ වැඩ පිළිවෙළකටවත් යන්න බැරි වුණා. ඒ අනාගතේ පළමුවැනි තැන.

ඒ ඇමතිවරයාගෙන් -ආචාර්ය පලනිවේල් තියාගරාජන් මහතාගෙන්- තව ප්‍රශ්නයක් අහනවා. "කොවිඩ් එක හැර, ඔබතුමා මුදල් ඇමතිවරයා හැටියට මොකක්ද ආර්ථිකය සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ගන්නා පියවර, පාරවල්, ගොඩනැඟිලි, පාලම් ගැන මොකක්ද කරන්නේ?" කියලා. එතුමා ඒකට දෙන උත්තරය තමයි, "අපේ ජීවිත කාලය පුරාම එක්වරක් පමණක් දකින්නට ලැබෙන වසංගතයකින් අපේ මිනිස්සු සිය ගණනක් මැරෙද්දී අපේ ආණ්ඩුවේ තීරණය ඉතාම පැහැදිලියි.

අපේ උත්සාහය සියයට සියයක් සහ අපේ ප්‍රතිපාදන සියයට සියයක්ම වසංගතය පාලනය කිරීමටයි; එන්නත ලබා දීමටයි. අධිවේගී මාර්ග, බෝක්කු, ගොඩනැඟිලි හදන එක අපි පසුවට දාගන්න තීරණය කෙරුවා" කියලා. ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ආණ්ඩුවටත්, මහ බැංකුවේ, භාණ්ඩාගාරයේ නිලධාරින්ටත්, මැති-ඇමතිවරුන්ටත්, මන්ත්‍රීවරුන්ටත් මේකෙන් හොඳ පාඩමක් ඉගෙන ගන්න පුළුවන්. මෙතැනදී තමයි ආණ්ඩුව පළමු වරද කළේ. අවුරුදු එකහමාරක් තිස්සේ අපට තිබුණු ප්‍රතිපාදන මේ වසංගතය පාලනය කරන්නට, එන්නත ලබා ගැනීමට පාවිච්චි කරන්නේ නැතුව මොකක්ද කළේ? ගුවන් පාලම් ගහන්නට මුල්ගල් තැබුවා. යුද්ධයක් නැති කාලයේ කෝටි ගණනක මුදල් ණයට අරගෙන ඩොලර් මිලියන 50ක් වියදම් කරලා කෆීර් ගුවන් යානා අලුත්වැඩියා කරන්න කටයුතු කළා. ඒ වාගේම ටැංකි කිහිපයක් හදන්න සල්ලි කෝටි ගණනක් වෙන් කරන්නට කටයුතු කළා.

හැබැයි, අවුරුදු එකහමාරක් තිස්සේ මේ රටේ මිනිස්සු වසංගතයෙන් මැරෙද්දී එන්නත ගෙනෙන්නට ආණ්ඩුවට බැරි වුණු එක මහා කනගාටුවක්. මේකෙන් පාඩමක් ඉගෙන ගන්න මේ අය දැන ගන්න ඕනෑ කියලා මම මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ බැංකුව මේ රටේ ආර්ථිකයට සුක්කානමක් වාගේ. ඒ සුක්කානම වාගේ තිබෙන මහ බැංකුව තමයි රටේ ආර්ථිකය යන දිශාව නිවැරදිව තීරණය කරන්නේ. හැබැයි, සාමාන්‍යයෙන් සුක්කානමක් හැරෙන පැත්තට තමයි රෝද හැරෙන්නේ නැත්නම් කැරකෙන්නේ. අවාසනාවකට අපේ රටේ තිබෙන තත්ත්වය මත රෝද කැරකෙන පැත්තට තමයි සුක්කානම කැරකෙන්නේ. මොකද ආණ්ඩුව කියන දේ තමයි මහ බැංකුව කරන්නේ. ඒක තමයි ලොකුම ප්‍රශ්නය. මේ ආණ්ඩුව කරපු පළමුවැනි වරද එන්නත වෙලාවට දුන්නේ නැති එක.

දෙවෙනි වරද තමයි, ආණ්ඩුව බලයට ආපු ගමන් පළමුවෙන්ම රාජ්‍ය ආදායම කපා හැරපු එක. බදු ආදායම සම්පූර්ණයෙන්ම කපා හැරියා. PAYE Tax ලෙස ලක්ෂ තුන, හතරක් බදු ගෙවන අයගෙන් බදු අය කිරීම නතර කළා. ඒ වාගේම ලොකු සමාගම්වල -සුපිරි සමාගම්, කෝටි ගණනක් උපයන සමාගම්වල- බදු අඩු කළා. ඒක නිසා ගිය වසරේ රජයට රුපියල් කෝටි 60,000ක පාඩුවක් ඇති කළා. කෝටි 60,000ක්! වැට් එකෙන්ම කෝටි 30,000ක් නැති වුණා. සමස්තයක් වශයෙන් වැට් එක අඩු වුණේ සියයට 40කින්. වැට් එක සියයට 40කින් අඩු වුණා නම් ඒකට සාපේක්ෂව බඩු මිල සියයට 40කින් අඩු වෙන්න ඕනෑ. ඒ වාසිය මිනිසුන්ගේ සාක්කුවට යන්න ඕනෑ. හැබැයි, තඹ සතයකින් කිසි දෙයක් අඩු වුණේ නැහැ, වැඩි වුණා මිස. එතකොට ඒ කෝටි 30,000 වාසිය කාටද ගියේ? ඒක ගියේ, වෙළෙඳුන්ට; ගජමිතුරන්ට; එහෙම නැත්නම් අතරමැදියන්ට. ඒක තමයි ලොකුම වැරැද්ද. ඒ දෙවැනි වරද කරපු වෙලාවේවත් ආණ්ඩුවට මහ බැංකුව නිවැරදි උපදෙස් දුන්නේ නැහැ. අද පවතින විදේශ විනිමය අර්බුදයේ ආරම්භය එතැනයි. මේ රටේ විදේශ විනිමය බංකොලොත් වීමේ ප්‍රශ්නය පටන් ගන්නේ එතැනින්. මොකද ජාත්‍යන්තරයේ තිබෙන ශ්‍රේණිගත කිරීමේ ආයතන තුනක්ම ශ්‍රී ලංකාව කෙළින්ම downgrade කළා; පහත දැම්මා. එහෙම දාපු ගමන් අපේ රටට පිට රටින් ගන්න පුළුවන් ණය නැති වුණා. අපි කෙරෙහි ජාත්‍යන්තරය තුළ තිබුණු විශ්වාසය නැති වුණා. ඒකෙන් තමයි රුපියල වැටෙන්න පටන් ගත්තේ. ඒ වගකීම මහ බැංකුවත් ගන්න ඕනෑ. මහ බැංකුව ඒ වෙලාවේදී නිහඬව හිටියා. මහ බැංකුව - [බාධා කිරීමක්] තේරෙන්නේ නැත්නම් පොඞ්ඩක් ශබ්ද නැතුව ඉන්නකෝ. මේවා ඔබතුමාට තේරෙන්නේ නැහැ.

හැබැයි, ඒ වෙලාවේ මහ බැංකුව නිහඬව හිටියා. 1971දී ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මැතිතුමා මුදල් ඇමතිවරයා හැටියට වැඩ කරනකොට, එතුමා ශ්‍රී ලංකා මහ බැංකුවට ගිහිල්ලා කථාවක් කළා. එතුමා මුදල් ඇමති. හැබැයි, එතුමා මහ බැංකුවට ගිහිල්ලා කිව්වේ, "මහ බැංකුවේ වගකීම රජයට ප්‍රශංසා කිරීම, වර්ණනා කිරීම නොවෙයි. තමන්ගේ රාජකාරිය සහ වගකීම තමයි ඉතා අපක්ෂපාතිව රජය හරි මඟට යොමු කිරීම." කියලායි. හැබැයි, කියන්න කනගාටුයි, අපේ මහ බැංකුව රජය වෙනුවෙන් කඩේ යනවා. ඒක තමයි දුකම දෙය. මහ බැංකුවේ අධිපති මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතා මම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව හදාරන කොට මට ඉගැන්වූවා; මම කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධිය කරද්දී එතුමා මට ඉගැන්වූවා. මම එතුමාට ගරු කරනවා. හැබැයි, එතුමා ගෙන යන යල් පැනපු, අතාර්කික, අසාර්ථක ප්‍රතිපත්ති අපි අනුමත කරන්නේ නැහැ. අපි ඒවා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. මොකද, මහාචාර්යතුමා - [බාධා කිරීමක්] මහ බැංකු අධිපතිවරයා කියනවා, [බාධා කිරීමක්]

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද රීති ප්‍රශ්නය, ගරු මන්ත්‍රීතුමා?

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු මන්ත්‍රීතුමනි, මට ලබා දී තිබෙන **කාලය** ගන්න එපා.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව පැවති කාලයේ අර්ජුන මහේන්ද්‍රන් ආණ්ඩුවට කඩේ ගියේ නැද්ද? මහ බැංකු කොල්ලය සිද්ධ වුණේ ඒ කාලයේ නොවෙයිද? දැන් ඔබතුමන්ලා ඒ තර්කය - [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා උත්තර දෙන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු මන්ත්‍රීතුමනි, මහාචාර්යතුමා 2021 ජුනි මාසයේ 28වැනි දා නිල ප්‍රකාශයක් කර තිබෙනවා, "අද වෙනකොට මේ රටේ විදේශ විනිමය අර්බුදයක් පවතින්නේ නැහැ. මේ වෙනකොට දේශපාලනඥයෝ, සමපේක්ෂකයෝ, මාධ්‍යකරුවෝ බිල්ලෝ මවනවා" කියලා. රටේ විදේශ විනිමය අර්බුදයක් තිබෙනවාය කියන එක කවුරුත් දන්නවා; පොඩි දරුවෙක් වුණත් දන්නවා. ඇත්තටම නොමළ ගෙදරකින් අබ ඇටයක් සොයා ගන්නවා හා සමානයි අද ලංකාවේ ගෙදරකින් ඩොලර් නෝට්ටුවක් සොයා ගැනීම. ඒක තමයි ඇත්ත තත්ත්වය. [බාධා කිරීම්] අද ආණ්ඩුව සිහි බුද්ධියෙන්ද, කථා කරන්නේ කියන එක තමයි මගේ ප්‍රශ්නය. අද ඩොලරයක් රුපියල් 230කට, රුපියල් 235කට ගන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව කියනවා ප්‍රශ්නයක් නැහැ කියලා. ශ්‍රී ලංකා මහ බැංකුවේ ලේඛන හා දත්ත අනුව - මා ළඟ ලේඛනයක් තිබෙනවා. Sri Lanka Development Bonds and ISB ලේඛනය අනුව මට පෙන්වන්න පුළුවන්, ගෙවන්න තිබෙන ණය ගත්තාම, [බාධා කිරීමක්] අද සිට මාස දොළහක් අතර -අවුරුද්දක කාල සීමාවක් අතර- ගෙවීමට තිබෙන මුළු විදේශ ණය ප්‍රමාණය. ඒ අනුව

[ගරු කබීර් හෂීම් මහතා]

ගෙවන්න තිබෙන මුළු ණය මුදල සහ පොලිය එකතු කළාම ඩොලර් බිලියන හයක් අවුරුද්දක් ඇතුළත අපි ගෙවන්නට ඕනෑ. ඩොලර් බිලියන හයක්! මේ වෙනකොට එක වසරකදී අපේ ආනයනවලට අවම වශයෙන් ඩොලර් බිලියන 18ක් ඕනෑ වෙනවා. හැබැයි, අපේ අපනයන උපරිම ඩොලර් බිලියන 10ත්, 12ත් අතර හිර වෙලා තිබෙන්නේ. එතැනත් ඩොලර් බිලියන හයක පරතරයක් තිබෙනවා. ඒ හයයි, අර හයයි ගත්තාම ඩොලර් බිලියන දොළහයි. අපේ විදේශ සංචිතය තිබෙන්නේ ඩොලර් බිලියන තුනක් විතර. අපි මේ වසර තුළ මේ අර්බුදයට මුහුණ දෙන්නේ කොහොමද කියලා මම අහන්න කැමැතියි. හැබැයි, ප්‍රශ්නය වෙන්නේ ගෙවන්න තිබෙන ණය ප්‍රමාණය නොවෙයි. [බාධා කිරීම්] ප්‍රශ්නය තිබෙන්නේ - [බාධා කිරීම්] මේ මන්ත්‍රීවරුන් හොඳට අහගන්න. රජය අනුගමනය කරන, ණය ගෙවන්න යන වැඩ පිළිවෙළ පිළිබඳවයි ප්‍රශ්නය තිබෙන්නේ. එම වැඩ පිළිවෙළ මොකක්ද, මේ ණය ගෙවන්නේ කොහොමද කියලා අහනකොට - [බාධා කිරීම්] අහගන්න. විදේශ විනිමය අර්බුදයක් තිබෙනවා. කොහොමද, මේ ණය ගෙවන්නේ කියලා ඇහුවාම, නිවාඩ් කබ්රාල් මැතිතුමා "EconomyNext" එකට දුන් උත්තරය මොකක්ද? "අයියෝ! ඕක simple. අපට ඒක ගෙවා ගන්න පුළුවන්" කිව්වා. [බාධා කිරීම්] මේක අහගන්න. රෙදි ඇඳගෙන ද මෙතැන ඉන්නේ කියන්න. [බාධා කිරීම්] "අපට ඒක simple; මහ තැපැල් කාර්යාලය විකුණනවා; ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය විකුණනවා; ට්‍රැක්ටර් සංස්ථාව විකුණනවා" කියනවා. තමුන්නාන්සේලාට අයිතියක් තිබෙනවාද එහෙම කියන්න?

ඔබතුමන්ලාගේ "සෞභාග්‍යයේ දැක්ම" තුළ තිබෙන්නේ මොකක්ද? මොකක්ද ඒකෙන් කියන්නේ? ඒකේ කියනවා, "රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ ශක්තිමත් පෞද්ගලික අංශයක් මෙන්ම, ශක්තිමත් රාජ්‍ය අංශයක්ද පැවතීම අවශ්‍යයි. අපේ රාජ්‍ය ව්‍යවසායන් කිසි සේත් පෞද්ගලීකරණයට ලක් කරන්නේ නැත." කියලා. එහෙමයි ඒකේ තියා තිබෙන්නේ. කිසි සේත් පෞද්ගලීකරණයට ලක් කරන්නේ නැත කිව්වාට කරන්නේ ඒක. තමුන්නාන්සේලා කියන්න, තමුන්නාන්සේලාගේ වරම මොකක්ද? තමුන්නාන්සේලාට සදාචාර අයිතියක් නැහැ. රටේ විනිමය අර්බුදයක් ඇති කරලා අපේ දේපොළ ටික විකුණනවා. වරාය නගරය චීනයට දුන්නා; ආපු ගමන් ගාලු මුවදොර අක්කර තුනක් චීනයට විකුණුවා; බටහිර පර්යන්තය ඉන්දියාවට දෙනවා; [බාධා කිරීමක්] විදේශ බලවේගයකට තෙල් පිරිපහදුව දෙන්න ලැහැස්තියි. සෙලෙන්දිවා කොම්පැනිය හදලා - [බාධා කිරීම්] ඊයේ -පෙරේදා පත්තරේ headline එකේ දැම්මේ මොකක්ද? ඕමාන් රජයට නැත්නම් කටාර් රජයට අපේ Air Force Headquarters දෙන්න යනවා. [බාධා කිරීමක්] රෙදි ඇඳගෙනද මේවා කථා කරන්නේ? ලක්දනවි, වෙස්ට් කෝස්ට් බලාගාර ඇමෙරිකාවට දෙනවා. [බාධා කිරීමක්]

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
Sir, I rise to a point of Order.

ඔබතුමන්ලා රෙදි ඇඳිල්ල ගැන කථා කරනවා. හම්බන්තොට වරාය අවුරුදු 198කට දෙනකොට ඔබතුමා රෙදි ඇඳගෙනද හිටියේ? [බාධා කිරීමක්]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ස්වාභාවික ද්‍රව වායු - එල්එන්ජී - බලාගාරය ඇමෙරිකාවට ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. එතකොට රට විකුණලාද, මේ ණය ටික ගෙවන්න යන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මම තව විනාඩියයි ගන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එතකොට පී.බී. ජයසුන්දර මහත්මයා කියනවා, "IMF එකට යන්නේ නැහැ; IMF is not the answer" කියලා. විමල් වීරවංශ ඇමතිතුමා එක එක දේවල් කිව්වාට, එතුමාගේ කටට සීනි දමන්න ඕනෑ. 2013දී එතුමා කිව්වා, "අපේ ආණ්ඩුවේ ඉන්නේ ආර්ථික ඝාතකයෝ" කියලා. එතුමා ඒ කිව්වේ, නිවාඩ් කබ්රාල්ටයි, පී.බී. ජයසුන්දරටයි. පී.බී. ජයසුන්දර කියනවා, IMF එකට යන්න ඕනෑ නැහැ කියලා. හැබැයි, නිවාඩ් කබ්රාල් කියනවා, අපි රටේ දේපළ විකුණලා ඔක්කොම ගෙවනවා කියලා. ඒක හරිද? එහෙම ප්‍රශ්න විසඳන්න ආණ්ඩුවට සදාචාරාත්මක අයිතියක් තිබෙනවාද? මා අහන්නේ මේකයි. අපි IMF එකට ගියාම ඒ ගොල්ලන් දෙන පොලිය සියයට 0.1යි. ඒකටත් සහන කාලයක් දෙනවා, අවුරුදු ගානකින් ගෙවන්න. හැබැයි, අපි dollar swap එක චීනයෙන් ගන්නවා, බංග්ලාදේශයෙන් ගන්නවා, ඉන්දියාවෙන් ගන්නවා. [බාධා කිරීමක්] එතකොට පොලිය සියයට දහයක් ගෙවන්න වෙනවා. එතකොට බංග්ලාදේශය IMF එකෙන් ඩොලර් මිලියන 708ක් ගන්නවා, සියයට 0.1 පොලියට. එහෙම අරගෙන අපට ඩොලර් මිලියන 200ක් දෙනවා, සියයට 10 පොලියට. අපේ අයට ඔළුවක් තිබෙනවාද? මොකක්ද, අපේ රටට කරන්නේ? මේ වාගේ අර්බුදයක් තිබෙනකොට, මීටත් එහා අර්බුදයකට අපේ රට තල්ලු කරන ආර්ථික ඝාතකයන්ද අපේ රට පාලනය කරන්නේ කියලා මා අහන්න කැමැතියි. ඒකෙනුත් ගහන්නේ පොඩි මිනිසුන්ටයි. මොකද, අද පොඩි කොම්පැනි, සමාගම් ඩොලර් එකක් ගන්න බැංකුවලට ගියාම ඩොලර් නැහැ කියනවා. ප්ලාස්ටික් භාණ්ඩ හදන කොම්පැනි, ඖෂධ නිෂ්පාදනය කරන කොම්පැනිවලට අවශ්‍ය අමුද්‍රව්‍ය ගෙන්වන්න බැරි වෙලා තිබෙනවා; ඩොලර් නැතුව හිඟමනේ යන තත්ත්වයට පත්වෙලා තිබෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩයනා ගමගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.27]

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි. ඇත්තටම අද විවාදයට ගන්නා 2020 මහ බැංකු වාර්තාව ගැන මා වචන කිහිපයක් කියන්න ඕනෑ. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා මැරිලා ඉපදිලාද මේ කථා කරන්නේ කියලා මා දන්නේ නැහැ. එතුමන්ලා කියනවා, කොවිඩ් වසනයෙන් පසුව තමයි ආර්ථිකය කඩා වැටුණේ කියලා. නැහැ. කොවිඩ් වසනයෙන් පසුව නොවෙයි, ආර්ථිකය මේ තත්ත්වයට පත්වුණේ, පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසුවයි. සංචාරක ව්‍යාපාරය කඩා වැටුණේ එතැනින් පසුවයි. එතැනින් පටන් ගත් විදේශ විනිමය නොලැබීමේ ප්‍රශ්නය දිගටම තිබෙනවා. ඊට පසුව

තමයි කොවිඩ් වසංගතය ඇවිල්ලා ඒක වඩාත්ම worse තත්ත්වයකට පත් වුණේ. ඒක යහ පාලන ආණ්ඩුව කාලය තුළදී සිදුවුණු දෙයක්; මේ ආණ්ඩුව කාලය තුළ නොවෙයි. නමුත් මට කියන්න තිබෙන්නේ මේකයි. අද මේ පෙන්වන තරම් ආර්ථිකයේ අර්බුදයක් තිබුණත්, මේ පෙන්වන තරම් යකා කළු නැහැ. අද මුළු ලෝකයම ආර්ථික අර්බුදයකට ලක්වෙලා තිබෙන වෙලාවේ ලංකාව exception එකක් වෙන්න විධියක් නැහැ. මොකද, රටක් හැටියට අපත් ඒ ආර්ථික අර්බුදයට ලක් වෙනවා. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටක් විධියට, ණය බරින් මිදිලා නැති රටක් විධියට අපිත් ඒ තත්ත්වයට මුහුණ දෙන්න ඕනෑ. ඒක නිසා ඒ ප්‍රශ්නය තිබෙනවා.

අනෙක් කාරණය, අපේ විදේශ ශ්‍රමිකයන්ගෙන් ලැබෙන සියලු විදේශ විනිමය අද අපට නැති වෙලා තිබෙනවා. මොකද, කොවිඩ් ප්‍රශ්නය නිසා විදේශ ශ්‍රමිකයන් නැවත ගෙන්වා ගන්න අපට සිදු වුණා. ඒ නිසා අපට ඒ ලැබෙන මුදල් ටිකත් නැති වුණා. ඊටත් එහා ගිය කාරණා සහිතව මේ ප්‍රශ්නයට උත්තර දෙන්න පුළුවන්, මේ ගැන කථා කරන්න පුළුවන් ආර්ථික විශ්ලේෂකයෝ බොහොමයක් අපේ ආණ්ඩුව තුළ ඉන්නවා.

අද රට තුළ දැවෙන ප්‍රශ්නයක් තිබෙනවා. අද ජනතාව කැළඹීමට පත්වෙලා තිබෙන කාරණයක් තිබෙනවා. ඒ තමයි අර අහිංසක දැරිවියගේ මරණය. පිලිස්සී මැරුණු ඒ අහිංසක දැරිවිය මැරුවාද, මැරුණාද කියලා අපි දන්නේ නැහැ; සියදිවි නසා ගත්තාද කියලා අපි දන්නේ නැහැ. නමුත් ඒ සිදුවීම අද රට තුළ විශාල ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා; ජාත්‍යන්තරය තුළ විශාල ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. ඒක තවත් හාස්‍යයට කරුණක් වන්නේ, 2021 කියන්නේ International Year for the Elimination of Child Labour නිසායි. මේ වාගේ වසරක රැල්ලක් වාගේ අපේ රට තුළ ළමයින්ට සිදුවන දේවල් ගැන, ළමයින් මෙහෙකාර සේවයට යෙදවීම ගැන අද මා කථා කරන්න කැමැතියි. මොකද, ඒ දරුවන් මුස්ලිම්ද, දෙමළද, සිංහලද, බර්ගර්ද කියලා මට අදාළ නැහැ. ඒ, අවුරුදු දහසයක අහිංසක දරුවෙකුගේ ජීවිතයක්. අපේ අතිගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය අනුව- කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු පියල් නිශාන්ත ද සිල්වා මැතිතුමා සමඟ අප සියලුදෙනාම කථා වුණු විධියට, මේවා තවම මාධ්‍යයට ගිහිල්ලා නැහැ.

නමුත්, අතිගරු ජනාධිපතිතුමාගේ නිර්දේශයක් අනුව අපි, අවුරුදු 18ට අඩු කිසිම දරුවෙක් -ගැහැණු දරුවෙක් තියා පිරිමි දරුවෙක්වත්- කිසිම ගෙදරක මෙහෙකාර සේවයේ යෙදවීම සම්පූර්ණයෙන් තහනම් කරලා නීතියක් ගේනවා. එයට අදාළ සියලු අණ පනත් වෙනස් කරලා මේ රටේ දරුවන් ආරක්ෂා කරන්න කටයුතු කරනවා. මොකද, ඉෂාලිනී කියන දැරියට වෙච්ච සිදුවීම තවත් දරුවකුට සිදු නොවීමට වග බලා ගැනීමේ වගකීම රජය භාරගත යුතුයි. මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකුගේ නිවසකයි ඒ දේ සිද්ධ වෙලා තිබෙන්නේ. දැනට ඒ පිළිබඳව පරීක්ෂණයක් කරගෙන යනවා. එම පරීක්ෂණ කටයුතු වැඩිකල් අදින්නේ නැතිව අවශ්‍ය කටයුතු කළ යුතුයි. මම පොලිස්පතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, එම ප්‍රශ්නය තව සති දෙකක් ඇතළත විසඳන්න කියලා. මේක තවතවත් දිගට ඇදගෙන යා යුතු ප්‍රශ්නයක් නොවෙයි.

මේක එක් සිදුවීමක් පමණයි. අපි මේ කථා කරන මොහොතේත් අවුරුදු 18ට අඩු ළමයින් ඕනෑ තරම් -දහස් ගණන්- මෙහෙකාර සේවයේ යොදවමින් තිබෙනවා; අපචාරයට ලක්වෙනවා; ලිංගික හිංසනවලට ලක්වෙනවා. මේ දේ නැවැත්විය යුතුයි. අපේ අහිංසක දරුවන්ට තව දුරටත් මේ රට තුළ මේ වාගේ දේවල් සිද්ධ වෙන්න ඉඩ දෙන්න බැහැ. දෙමව්පියෝ හැටියට, මේ රටේ නීති සම්පාදනය කරන මන්ත්‍රීවරු හැටියට අපි සියලුදෙනාම මේ පිළිබඳ වගකීම භාරගත යුතුයි. දරුවාගේ දෙමව්පියන්ට විතරක් නොවෙයි, ඒ වගකීම තිබෙන්නේ.

ඒ වාගේම, ඉෂාලිනී දැරියගේ දෙමව්පියන්ටත් ඒ වගකීමෙන් ගැලවෙන්න දෙන්න බැහැ. මොකද, ඒ දෙමව්පියෝත් හොඳටම දන්නවා, ඒ දරුවාගේ වයස කීයද කියලා. දරුවා මෙහෙකාර සේවයට යවනකොට ඒ දෙමව්පියෝත් ඒ ගැන දන්නවා. එසේ දැනගෙනයි මේ විධියට කටයුතු කරලා තිබෙන්නේ. එහෙම නම්, ඔවුනුත් ඒ වග කීමෙන් කොටසක් භාරගත යුතුමයි. මේ රජයෙන්, ඒ වාගේම පොලිස්පතිතුමාගෙන් සහ කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. අපි මේ කථා කරන මොහොතේත් කොළඹ තිබෙන බොහෝ නිවෙස්වල මෙහෙකාර සේවයේ යොදවන අවුරුදු 16ට වඩා අඩු වයසේ දරුවෝ ඉන්නවා; අපචාරවලට ලක්වන දරුවෝ ඉන්නවා. ඒවා ගැන අපි සොයා බලන්න ඕනෑ. පසුගිය කාලයේ අවුරුදු 15ක දැරිවියක් අපයෝජනයට ලක් වුණා කියා අපට අහන්න ලැබුණා. මානසික ආබාධයක් තිබෙන අවුරුදු 14ක දැරිවියක් අපයෝජනයට ලක් වුණා. ගැහැණු ළමයින්ට පමණක් නොවෙයි, මේ දේ සිද්ධ වෙන්නේ. මේ රටේ පිරිමි දරුවන්ටත් මෙවැනි දේවල් සිද්ධ වෙනවා.

පොළොන්නරුව පැත්තේත් එවැනි සිද්ධියක් වුණා. පොලිසියට ඒක තවමත් විසඳාගන්න බැරිවෙලා තිබෙනවා. ඇයි ඒ? එම ප්‍රශ්නය විසඳිය යුතුයි. එම ප්‍රශ්නය විසඳන්න කියලා මම පොලිස්පතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. දරුවෝ කියන්නේ අපේ රටේ සම්පත්. ඔවුන් තමයි මේ රටේ අනාගතය. අපි මේ රට භාර දෙන්න යන්නේ මොන වගේ දරු පරපුරකටද? අපි 225දෙනාම මේ වගකීම ගන්න ඕනෑ. වගකීම අරගෙන මෙවැනි දේවල් ඉදිරියේදී සිදු නොවන පරිදි වැඩ කරන්න අවශ්‍යයි. ඒ සඳහා නීති සම්පාදනය කළ යුතුයි. මම ගරු අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ළමා අපහරණයට, ළමයින්ගේ මානසික හිංසනවලට විශේෂයෙන් ලිංගික හිංසනවලට එරෙහිව දැඩි නීති රීති පනවන්න කියලා. පනත් සංශෝධනය කරන්න අවශ්‍ය නම් ඒවා සංශෝධනය කරන්න. ඒ සඳහා තමයි අපි ඉන්නේ. මේ 225දෙනා පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ මේ රටේ අහිංසක දරුවන්, කාන්තාවන් ඇතුළු සියලු ජනතාව වෙනුවෙන්. එහෙම නම් අපි මේ දේ කළ යුතුයි. අපි දෙමව්පියෝ, වැඩිහිටියෝ, අපි මේ රටේ වග කිවයුතු පුරවැසියෝ. දෙමළ ද, සිංහල ද, මුස්ලිම් ද කියන එක අපට අදාළ නැහැ.

ඒ වාගේම මා ඉල්ලා සිටිනවා, ළමා ලිංගික අපහරණ සිදු කරන වූදිතයන් පිළිබඳ offenders' list එකක් හදන්න කියලා. එය සැදිය යුතුයි. අනෙක් හැම රටකම තිබෙනවා වාගේ paedophile list එකක් අපේ රටේත් හදන්න ඕනෑ. දරුවන් ලිංගික අපයෝජනයට ලක් කරන ඒ පාපතර මිනිසුන්ගේ නම් එම paedophile list එකට යා යුතුයි. ඒක තමයි පිට රටවල system එක. ඒ වාගේ list එකකට නම වැටුණාට පස්සේ තමන්ගේ දරුවාටවත් තමන් ළඟට එන්න බැහැ. Name and shame. ඒක තමයි මේ රට තුළත් සිදු විය යුත්තේ. අපේ රටේ අහිංසක දරුවන්ට මෙවැනි දේවල් සිදුවන හැටි අපි අවුරුදු ගණනක් තිස්සේ බලාගෙන ඉන්නවා. මෙය එක සිද්ධියක් පමණයි. මේ වගේ සිදුවීම් තව තවත් ඉදිරියට යා යුතු නැහැ.

එම අපරාධය ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාගේ නිවසේ සිදු වුණු අපරාධයක් කියා අපි හිතනවා. ඒක මිනී මැරුමක් ද, එහෙම නැත්නම් සිය දිවි නසා ගැනීමක් ද කියන්න අපි තවම දන්නේ නැහැ. එම අපරාධයට සම්බන්ධ වැරැදිකරුවන්ට - perpetratorsලාට - අනිවාර්යයෙන්ම දඬුවම් දිය යුතුයි. මොකද,

[ගරු ඩයනා ගමගේ මහත්මිය]

මේ වාගේ අහිංසක දැරිවියක් ගෙනැල්ලා මෙහෙකාර සේවයේ යොදවා මේ වාගේ කෲර වධ හිංසා දෙන්න කාටවත් කිසිම අයිතියක් නැහැ. රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාටත් දරුවන් ඉන්නවා. මෙම අපරාධයට අදාළව දැනට රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින අයට දරුවන් ඉන්නවා. එක්කෙනෙක් නොවෙයි එතැන ඉන්නේ. එතැන සිටින කිහිපදෙනෙක් මෙම අපරාධයට සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ ගොල්ලන්ට දරුවන් ඉන්නවා, ඒ දැරියගේ වයසටත් වඩා අඩු, වැඩි. ඉතින් දෙමව්පියන් විධියට ඒගොල්ලන්ට හැඟීමක් නැද්ද? මේ සම්බන්ධයෙන් අනිවාර්යයෙන් නීතිය ක්‍රියාත්මක කළ යුතුයි. රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා මේ රටේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන කෙනෙක්. එතුමාගේ නිවසේ මේ වාගේ දෙයක් - [බාධා කිරීමක්] මේ, එතුමාගේ නිවසේ මෙහෙකාර සේවයේ යොදවපු දැරිවියක්. ඉතින්, එතුමාට ගරු කළ හැකිද කාටවත්? එතුමා මහ ජනතාව නියෝජනය කරන්නේ කොහොමද? එතුමාගේ නිවසේ මේ වාගේ වැරැදි වැඩක් සිද්ධ වෙලා තියෙද්දී එතුමා මේ රටේ ජනතාව නියෝජනය කරන්නේ කොහොමද? එතුමා පාරට බැහැලා තවත් දරුවෙකු වෙනුවෙන්, තවත් අම්මා කෙනෙක්, තාත්තා කෙනෙක් වෙනුවෙන් කථා කරන්නේ කොහොමද? එතුමා ඒ සියලු දේම වගකීම භාරගත යුතුයි කියා මා කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා තවත් යෝජනාවක් ගෙනෙන්න කැමැතියි. පිට රටවල තියෙනවා වාගේ, මේ රටේ ළමා අධිකරණය සහ ළමා ආරක්ෂක අධිකාරිය තුළ social services සඳහා වෙනම section එකක් හදන්න ඕනෑ. එතැනින් මේ ළමයින් අධීක්ෂණය විය යුතුයි. අනෙක් රටවල මේ දේ සිද්ධ වෙනවා. මේ වාගේ අවස්ථාවක, මේ වාගේ ව්‍යසන වන වෙලාවක අපේ රට තුළත් මේ දේ සිද්ධ විය යුතුයි. ඒ වෙනුවෙන් social services department එකක් වෙනම අපේ රටේ හැදෙන්න ඕනෑ. ඒ social services department එක හැදිලා, මේ රට තුළ සිටින අනාරක්ෂිත සෑම දරුවකුම ඒ හරහා monitor විය යුතුයි. මේ social services department කියන එක හදලා, රටේ සිටින අනාරක්ෂිත දරුවන් එහි ලියාපදිංචි කරලා, ඔවුන්ගේ නම, ගම, දෙමව්පියන්, addresses, NIC numbers යනාදී සියලු කාරණා එහි ඇතුළත් කරලා ඒ දරුවන්ගේ තත්ත්වය monitor කළ යුතුයි. ලිංගික අපයෝජනයට ලක් වුණු, මානසික ආබාධයකින් පෙළෙන අවුරුදු 14ක එම දැරිවිය ඒ වාගේ අනාරක්ෂිත තත්ත්වයකට දමපු දෙමව්පියන් ද ඒකට වගකිව යුතුයි. අපි දුප්පත් රටක්. මේ රටේ දරිද්‍රතාව තිබෙන බව අපි දන්නවා. නමුත් එහෙම කියලා අහිංසක පොඩි ළමයින් මෙහෙකාර සේවයේ යොදවන එක සම්පූර්ණයෙන් වැරැදියි.

අද අතිගරු ජනාධිපතිතුමාගේ නිර්දේශ මත මේ සම්බන්ධයෙන් නීති සම්පාදනය වෙමින් පවතිනවා. මේ සියලු දේ ඉදිරියේදී වෙනස් වෙන බව මම කියන්න කැමැතියි. ඉදිරියේදී මෙවැනි දේවල්වලට මේ රජය ඉඩ තියන්නේ නැහැ. මේ ආණ්ඩුව මේ වැරැදි සියල්ල නිවැරැදි කරනවාය කියන කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි, මූලාසනාරූඪ ගර මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.38]

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා මහ බැංකුවේ 2020 වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යෝජනාව ගැන කථා කරන්න අවස්ථාව ලැබීම සතුටට කරුණක්. අප රටට නිදහස ලැබුණේ 1948දීයි. 1948 සිට මේ දක්වා වූ වසර 73ක් තුළ අප රට මුහුණ දුන් අර්බුදවලින් දරුණුම ආර්ථික අර්බුදයට මේ අවස්ථාවේදී අපේ රට මුහුණ දී තිබෙනවා. මෙයට ප්‍රධානම හේතුව කොවිඩ් -19 වසංගත තත්ත්වය පමණක් නොවෙයි. මෙම රජයේ අකාර්යක්ෂම මූල්‍ය පාලනයත් මේ සඳහා බලපා තිබෙනවා.

අපේ රට මේ වන විට විශාල ණය අර්බුදයකට මුහුණ පා තිබෙනවා. ඒ වාගේම තමයි 1950න් පස්සේ ඇති වූ විශාලම අය වැය පරතරයටත් අප මුහුණ දී තිබෙනවා. දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ඉතා අඩුම රාජ්‍ය ආදායම තිබෙන වසර බවට 2020 වසර පත් වෙලා තිබෙනවා. 1950දී දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව අපේ රටේ රාජ්‍ය ආදායම සියයට 16ක් වෙලා තිබුණා. අපේ රටේ ඉතිහාසය තුළ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව රාජ්‍ය ආදායම වැඩිම වෙලා තිබුණේ 1978 වසරේ. එය සියයට 28.6ක්. 1994 වසරේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 20.6ක් වුණු රාජ්‍ය ආදායම, 2020 වසර වෙද්දී ඉතිහාසයේ පළමුවැනි වතාවට සියයට 10කට වඩා අඩු වෙලා එය දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 9.6ක් දක්වා අඩු වෙලා තිබෙනවා. 2020 අය වැයේදී රාජ්‍ය ආදායම වශයෙන් රජය බලාපොරොත්තු වුණා, රුපියල් බිලියන 1,588ක්. නමුත් ලැබුණේ රුපියල් බිලියන 1,350 යි. බිලියන දෙසීය ගණනක අඩුවක් තිබෙනවා.

1980 වර්ෂයේදී අපේ රටේ අය වැය පරතරය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට සෘණ 19.2ක් වෙලා තිබුණා. ඉන් පසුව මෑත ඉතිහාසයේ 2001 වසරේ අය වැය පරතරය සියයට සෘණ 10.2ක් වෙලා තිබුණා. නමුත් මේ වන විට අය වැය පරතරය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 11.1ක් බවට පත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ අපේ රට ඉදිරියට යන්නේ කොහොමද? මේ වන විට විදේශ විනිමය සංචිත ශීඝ්‍රයෙන් පහත වැටිලා පිට රටින් ආනයනය කිරීම සඳහා අපට අවශ්‍ය විදේශ විනිමය මාසයකට, දෙකකට වඩා නොමැති තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ණයවර ලිපි විවෘත කිරීමට නොහැකිව මේ වන විට වරායේ කන්ටේනර් දහස් ගණනක් හිර වෙලා තිබෙනවා. ඒ, වාණිජ බැංකුවල ඩොලර් හිඟය නිසා. අපේ රටේ තිබෙන ප්‍රශ්නය තමයි, මේ වන විට රාජ්‍ය ආදායම වාගේ දෙගුණයකට, තුන්ගුණයකට වඩා රාජ්‍ය වියදම වැඩි වෙලා තිබීම. 2020 වසරේ රාජ්‍ය ආදායම රුපියල් බිලියන 1,350යි. ඒ කියන්නේ, රුපියල් කෝටි 135,000යි. රාජ්‍ය වියදම බිලියන 4,800යි. ඒ කියන්නේ, කෝටි 480,000යි. එතකොට රාජ්‍ය ආදායම කෝටි 135,000ක්ව තිබියදී, කෝටි 480,000ක රාජ්‍ය වියදමක් කරන්නේ කොහොමද? මේක තමයි තිබෙන විශාලම ප්‍රශ්නය. ඒ නිසා මේ රට ණය ගැනීමට පුරුදු වෙලා, මේ වන විට විශාල ණය ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. 2019 වර්ෂය වෙද්දී රාජ්‍ය ණය වශයෙන් තිබුණා රුපියල් කෝටි 1,300,000ක්. නමුත් දැන් ඒක රුපියල් කෝටි 1,500,000ක් බවට පත් වෙලා තිබෙනවා. 2020 සහ 2021 වර්ෂ තමයි ලංකා ඉතිහාසයේ වැඩිම ණය ගත් වසර දෙක බවට පත් වෙලා තිබෙන්නේ. 2020 වසරේ පාර්ලිමේන්තුවේදී අය වැයෙන් සම්මත කරවා ගත්තා රුපියල් බිලියන 2,850ක් ණය වශයෙන් ගන්න. ඒ කියන්නේ, රුපියල් කෝටි 285,000ක්.

නමුත්, අපට ණය වාරික, පොලිය ගෙවන්න තිබුණා රුපියල් කෝටි 200,000ක්. කෝටි 200,000ක් ණය වාරික, පොලිය ගෙවන්න තිබියදී, 2020 වසරේදී කෝටි 285,000ක් ණය ගැනීම සඳහා පාර්ලිමේන්තුවෙන් අනුමත කරවාගත්තා.

2021 වසරේ අපේ ණය වාරික පොලිය ගෙවන්න තිබුණේ කෝටි 215,000යි. ඒ කියන්නේ, බිලියන 2,150යි. නමුත්, පාර්ලිමේන්තුවේදී අපි අනුමත කරවා ගත්තා බිලියන 2,950ක් ණය වශයෙන් ගැනීමට. ඒ කියන්නේ, කෝටි 295,000ක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වසර දෙක තමයි ලංකා ඉතිහාසයේ වැඩිම ණය ගත් අවුරුදු දෙක. මේ වන විට රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 101ක් වෙලා තිබෙනවා කියලා රජය කියනවා. නමුත් අපි කියනවා, ඒක සියයට 101ක් නොවෙයි, 108ක් කියලා. අපේ රටේ රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 108ක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම, රජය මේ ණය කළඹට එකතු කරලා නැහැ, බිලියන 1,430ක් වන රජයේ අනුබද්ධ ආයතන ගත් ණය. රාජ්‍ය ණය කළඹට එකතු වුණේ නැති කෝටි 143,000ක ණය ප්‍රමාණයක් තිබෙනවා. ඒකත් එකතු වුණොත් කෝටි 1,600,000කටත් වැඩි ප්‍රමාණයක් රාජ්‍ය ණය ලෙස තිබෙනවා. මේවා අනිවාර්යයෙන්ම රජය ගෙවිය යුතු ණය. මේ තත්ත්වය තුළ රාජ්‍ය ආදායම වාගේ තුන්ගුණයක වියදමක් තිබෙනවා. අපේ රටේ වත්කම, දළ දේශීය නිෂ්පාදනය 2019 වසරේ ඩොලර් බිලියන 84.6ක් වුණා. වර්ෂ 2019-2020 කාලයේදී ඩොලර් එකක් තිබුණේ සාමාන්‍යයෙන් රුපියල් 180ට, 185ට. ඒ විධියට ගනිද්දී එවකට දළ දේශීය නිෂ්පාදනය සාමාන්‍යයෙන් කෝටි 1,400,000ක් විතර වනවා. අද වෙද්දී අපේ රටේ වත්කම, දළ දේශීය නිෂ්පාදනය 2019 වර්ෂයට සාපේක්ෂව ඩොලර් බිලියන 80 දක්වා අඩු වෙලා තිබෙනවා. 2020 වසරේ දළ දේශීය නිෂ්පාදනය, අපේ රටේ සමස්ත වත්කම ඩොලර් බිලියන 80යි. ඒ වසරේදී ඩොලර් එකක් රුපියල් 185යි. එහෙම බැලුවාම අපේ රටේ සමස්ත වත්කම රුපියල් කෝටි 1,480,000ක් පමණයි. රටේ සමස්ත වත්කම රුපියල් කෝටි 1,480,000ක් වෙද්දී, අපේ රටේ සමස්ත ණය ප්‍රමාණය රජය පවසන පරිදි රුපියල් කෝටි 1,500,000කටත් වඩා වැඩි වෙලා තිබෙනවා. අනෙක් රාජ්‍ය ආයතන ගත් ණය ප්‍රමාණයත් එක්ක බැලුවාම එය රුපියල් කෝටි 1,600,000ක් පමණ වෙනවා. එතකොට දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 105ක්, 106ක් පමණ රාජ්‍ය ණය තිබෙනවා. එහෙම නම්, ආදායමට වඩා තුන්ගුණයක් විතර ණය ගෙවන්න තිබියදී, අපේ ආදායමට වඩා වියදම වැඩි වෙලා තිබියදී, අපේ රටේ සමස්ත වත්කමටත් වඩා වැඩි ප්‍රමාණයක් ණය වෙලා තිබෙන නිසා තමයි ශ්‍රේණිගත කිරීම් සිදු කරන ආයතනවලින් අපේ රට මේ වන විට පහළට දාලා තිබෙන්නේ.

රටක මූල්‍ය ස්ථාවරත්වය බලන්න ක්‍රමවේද කීපයක් තිබෙනවා. ආයෝජකයෙකු අපේ රටට ඇවිල්ලා ආයෝජනය කරද්දී ඔවුන් බලනවා, ඒ ණය ශ්‍රේණිගත කිරීම් ආයතන මේ රටට දීලා තිබෙන ශ්‍රේණිය කුමක්ද කියා. මේ වන විට ණය ශ්‍රේණිගත කිරීම් ආයතන තුනකින් අපේ රට ඉතා පහළට දාලා තිබෙනවා.

මේ වසර වන විට S & P ණය ශ්‍රේණිගත කිරීමට අනුව ලංකාව CCC plus තත්ත්වයට දමා තිබෙනවා; Moody's Investors Service එක Caa1 තත්ත්වයට දමා තිබෙනවා; Fitch Ratings, CCC තත්ත්වයට දමා තිබෙනවා. මේ තත්ත්වයෙන් පහළට වැටුණොත් අපේ රට බංකොලොත් රටක් බවට පත් වෙනවා. ලෝකයේ අද මෙවැනි තත්ත්වයේ පවතින රටවල් තුනක් පමණයි තිබෙන්නේ. කියුබාව, කොංගෝව සහ මොසැම්බික් රාජ්‍ය පමණයි ණය ශ්‍රේණිගත කිරීම්වලදී මේ තත්ත්වයට පහළට දමා තිබෙන්නේ. මේ තත්ත්වය තුළ අපට ණය ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ ආයෝජකයෝ මේ රටට එන්නේ නැහැ. ආයෝජකයන් නොපැමිණීම නිසා අපට විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ තමයි, ඩොලර් ප්‍රශ්නය, සංචිත ප්‍රශ්නය. කොවිඩ් ප්‍රශ්නයත් එක්ක අපේ රටට එන සංචාරකයෝ සංඛ්‍යාව අඩු වෙලා තිබෙනවා. ඊයේ පෙරේදා වෙළෙඳ ඇමතිතුමා එක්ක කළ සාකච්ඡාවකදී ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා අහනවා මම දැක්කා, මේකට තිබෙන උත්තරය මොකක්ද කියලා. වෙළෙඳ ඇමතිතුමා කිව්වා, "අපි රට විවෘත කරනවා. රට විවෘත කළාම සංචාරකයෝ එනවා. එතකොට සංචාරකයෝ ඩොලර් ගේනවා. මේ රටේ වියදම් කරද්දී ඒ ඩොලර් රුපියල් බවට පත් වෙනවා. ඒවා සංචිතවලට එකතු වෙනවා" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවට වැඩිම සංචාරකයන් ආවේ 2018 වසරේ. ඒ, විසිහතර ලක්ෂයක්. ඒ වෙලාවේ අපට හම්බ වුණේ ඩොලර් බිලියන 4යි. දැන් අපේ රටට සංචාරකයන් එන්නේ නැතිව ඩොලර් හොයා ගන්නේ කොහොමද? මේ තත්ත්වය හමුවේ පසු ගිය කාලය තුළ ආනයනය සීමා කළා. හැබැයි, ආනයනය සීමා කිරීම තුළත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වැඩියෙන් ගෙනැල්ලා තිබෙනවා. ඒ අනුව, සීනි, පොල්තෙල්, කොත්තමල්ලි, කරවල, පිටි, සෝයා බෝංචි, උම්බලකඩ, හාල්මැස්සන් ආදි දේවල් විශාල ප්‍රමාණයක් 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වසරේ වැඩියෙන් ගෙනැල්ලා තිබෙනවා. ඒ අනුව, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගේන්නත් වැඩියෙන් මුදල් වියදම් වෙලා තිබෙනවා. ඩොලර් එකේ රුපියල් අගය වැඩි වීම පමණක් නොවෙයි, එම භාණ්ඩ ගෙන්වන්න වැය වන ඩොලර් ප්‍රමාණයත් අද වැඩි වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ අද වෙද්දී අපේ ඩොලර් සංචිත බිලියන 2.5කට පමණ අඩු වෙලා තිබෙනවා. එයින් රත්තරන් තොග තිබෙනවා, ඩොලර් මිලියන 500ක. ඒ රත්තරන් විකුණන්නේ නැතිව මුදල් කර ගන්න බැහැ. ඩොලර් සංචිත බිලියන 2.5ක්ව තිබියදී මාසයකට ආනයනය සඳහා ඩොලර් බිලියනයක් වියදම් වෙනවා. මේ අවුරුද්දට අපට වියදම් කරන්න තව මාස 5ක් තිබෙනවා. එතකොට, මේ මාස 5 තුළ තවත් ඩොලර් බිලියනයක් අපි ණය වශයෙන් ගෙවන්න ඕනෑ. පිට රටවලින් බඩු ගේන්න ඉදිරි මාස 5ට තව ඩොලර් බිලියන 5කුත් ඕනෑ. එතකොට ඉදිරි මාස 5ට ඔක්කෝම ඩොලර් බිලියන 6ක් අපට ඕනෑ. නමුත්, අපට තිබෙන්නේ ඩොලර් බිලියන 2.5යි. ඩොලර් නැති නිසා ඉදිරියේදී අපට මොන තරම් නම් ප්‍රශ්න ඇති වෙයිද? මේ වන විට අපේ ඛනිජ තෙල් බිල වශයෙන් ගෙවන්න තිබෙනවා, තවත් ඩොලර් බිලියන 1.3ක් පමණ. ඒකටත් ඩොලර් අවශ්‍යයි. අපි දැන් අතමාරු විධියට බංග්ලාදේශයෙන් ඩොලර් මිලියන 250ක් ඉල්ලන්න යනවා. අපට ආරංචි විධියට මේ වන කොට බංග්ලාදේශය ලංකාවෙන් එන telephone callsවලට answer කරන්නේත් නැතිලු. ඒ ගොල්ලන් අපට සල්ලි දෙන්න යන්නේ ඒ ගොල්ලන්ගේ prestige එක තියාගෙන, 'අපි ලංකාවටත් ණය දුන්නා' කියලා. නමුත්, ඒවා මාස තුන හතරේ අතමාරු. සාර්ක් සංවිධානය විසිනුත් අපට ඩොලර් මිලියන 400ක් දෙන්න යනවා. ඒක දෙන්නේ මාස 6කට. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල -IMF- තවත් ඩොලර් මිලියන 800ක් ලබා දෙන්න නියමිතයි. නමුත්, ඒ ඩොලර් මිලියන 800 මේ අවුරුද්දේ හම්බ වෙන්නේ නැහැ. ඒක හම්බ වෙන්නේ ලබන අවුරුද්දේ. මේ තත්ත්වය තුළ මේ වසර අවසාන වෙද්දී අපට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වනවා. ඒක තේරුම් ගෙන වෙන්න ඇති, රසායනික පොහොර ප්‍රශ්නයත් එක්ක රටේ ආහාර හිඟයක් ඇති වෙයි කියන භයට වෙන්න ඇති, රසායනික පොහොර ආනයනය කිරීම තහනම් කිරීමේ තීරණය කවදාවත් ආපහු වෙනස් කරන්නේ නැහැ කියපු අතිගරු ජනාධිපතිතුමා රසායනික පොහොර ආනයනය කිරීමට ආපසු තීරණය කරන්න ඇත්තේ. ඒ සඳහා දැන් ගැසට් පත්‍රයක් ද නිකුත් කර තිබෙන බව ආරංචියි. හැබැයි, මේ ගැසට් එක නිකුත් කරද්දී වකුගඩු පිළිබඳ ප්‍රශ්නය අමතක වෙන්න ඇති. රසායනික පොහොර නිසා වකුගඩු නරක් වෙලා ජනතාව මැරෙනවා කියලා කිඹුල් කඳුළු හෙළපු ආණ්ඩුව දැන් ඒ ගැසට් එක reverse කරලා රසායනික පොහොර ගේන්න නැවත ගැසට් එකක් නිකුත් කර තිබෙන බව අපට ආරංචි වෙලා තිබෙනවා.

[ගරු අශෝක් අබේසිංහ මහතා]

රජයක යුතුකම වන්නේ ජනතාව ජීවත් කරවීම. ඒ නිසා අපි රජයට -ආණ්ඩුවට- කියනවා, මේ රටේ ජනතාව ජීවත් කරවීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. එසේ නැති වුණොත්, මේ ආණ්ඩුවට ඡන්දය දුන් 69 ලක්ෂයක් වූ ජනතාව ඇතුළුව දෙකෝටි විසිලක්ෂයක් වූ සමස්ත ජනතාවට විශාල ප්‍රශ්නයක් ඇති වනවා. මේ දවස්වල කිරි පිටි හිඟයි, ගෑස් හිඟයි. මේ සියලු භාණ්ඩ හිඟය නිසා ජනතාවට අද විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ. විනාඩි 10ක් තිබෙනවා, ඔබ වහන්සේට.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මට විනාඩි 12ක් තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි දෙකක් අඩු කර තිබෙනවා, අපේ ගෞරවනීය ස්වාමීන් වහන්ස.

[අ.භා. 2.49]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා, ශ්‍රී ලංකා මහ බැංකුවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කරුණු පිළිබඳ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක්. එතුමා පැහැදිලි කරපු විධියට අපේ රට තුළ ඉතා බරපතළ ආර්ථික අර්බුදයක් තිබෙනවා. එතුමා ඉදිරිපත් කරපු සංඛ්‍යා ලේඛන ගැන, දත්ත ගැන ආණ්ඩුව උත්තර ලබාදෙයි.

මේ අවස්ථාවේදී මුදල් ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා විධිමත් විධියට ඒ සඳහා උත්තර ලබා දෙයි කියා මම බලාපොරොත්තු වෙනවා. අපි දන්නවා, මේ ආර්ථික අර්බුදය ලංකාවේ පමණක් නොව, මුළු ලෝකයේම තිබෙන බව. ඒක කොරෝනා නිසා ඇති වෙච්ච ආර්ථික අර්බුදයක් කියලා සමහර අය කියනවා. නැහැ, මේ ආර්ථික අර්බුදය ලෝකයේ ඉතා ගැඹුරු අර්බුදයක් බවට පත් වුණා. අපි දන්නවා, 2013දී ග්‍රීසියේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටුණු බව. ලෙබනන් ආර්ථිකය 2017දී දැවැන්ත -අතිමහත්- අර්බුදයකට මුහුණ දෙන්න පටන් ගත්තා. එක්සත් ජනපදය විශාල මූල්‍ය අර්බුදයකට මුහුණ දුන්නා. ජපානය 2017දී දැවැන්ත මූල්‍ය අර්බුදයකට මුහුණ දුන්නා. ඒ රටවල් මූල්‍ය අර්බුදයකට මුහුණ දුන්නේ කොරෝනා නිසා හෝ වෙනත් ප්‍රශ්නයක් නිසා නොවෙයි, ලෝක ආර්ථිකය තුළ ඇතිවෙලා තිබෙන ප්‍රවණතාව නිසායි.

ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකාව වාගේ රටකට ඇති වෙන්න අර්බුදයක් නැහැ. ශ්‍රී ලංකාව කියන්නේ අර්බුදයක්මයි. ණය බරින් මිරිකුණු, ණය නැත්නම් ජීවත් වෙන්න බැරි, හිඟන තත්ත්වයකට වැටුණු රටක් බවට අපේ රට පත්වෙලා තිබෙනවා. ඒ නිසා 2005 හෝ 2000 හෝ චන්ද්‍රිකා මැතිනියගේ යුගය ගත්තොත් 1994ට පසු යුගය පිළිබඳව හෝ කිසි කෙනෙකුට උදාන වාක්‍ය නඟන්න බැහැ; "2002 - 2004 මරු, ෂෝක්, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා හා ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා බලයට පත් වුණු යුගය ඊට වඩා හොඳයි" කියලා කාටවත් උදාන වාක්‍යය කියන්න බැහැ. ගැඹුරු ආර්ථික අර්බුදයක් ලෝකයේ තිබෙනවා. විශේෂයෙන්ම කොරෝනා වයිරස් තත්ත්වයත්, සහරාන්ගේ බෝම්බයත් නිසා ලංකාව ක්ෂණික අර්බුදයකට මුහුණ දුන්නා. සංචාරක කර්මාන්තය ඉබේම වාගේ ඩොලර් බිලියන හතකට වර්ධනයවෙලා තිබුණා. නමුත්, සංචාරක කර්මාන්තය අද වනකොට සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටිලා තිබෙනවා. විශේෂයෙන් මැද පෙරදිග රටවල් වාගේම කොරියාව සහ වෙනත් රටවල ජීවත් වන අයගෙන් අපට වාර්ෂිකව ලැබුණු ඩොලර් බිලියන පහක වාගේ මුදල සෑහෙන ප්‍රමාණයකින් අඩු වුණා.

මට ලැබී ඇති කාල වේලාව බොහොම සීමිත නිසා මම කෙළින්ම කරුණු දෙක තුනක් කියන්නම්. ඩොලර් බිලියන පහක් අපි ගෙවන්න ඕනෑ, තෙල් සහ ගල් අඟුරු ගෙන්වන්න. මේ ඩොලර් බිලියන පහ අපි සොයා ගන්නේ කොහොමද? සංචාරක කර්මාන්තයෙන් අපට ඩොලර් බිලියන හතක් ආවා. තෙල් හා ගල් අඟුරු ගෙන්වන්න අපට විශාල මුදලක් වැය වනවා. ඊළඟට, වාහන හා අමතර කොටස් සඳහා අපට විශාල මුදලක් වැය වුණා. ඊට පස්සේ ඖෂධ සඳහා විශාල මුදලක් වැය වුණා. උදාහරණයක් හැටියට ගත්තොත්, ආහාර වර්ග සඳහා ඩොලර් බිලියන එක හමාරක පමණ මුදලක් අපට වාර්ෂිකව වියදම් කරන්න සිදු වුණා. ආහාර විතරක් නොවෙයි, අනෙක් අතිරේක ද්‍රව්‍යයත් ඒකට ඇතුළත් වනවා. රටක් හැටියට ගත්තාම මෙය විශාල මුදලක්.

ලංකාවේ භූමියෙන් අතිවිශාල භූමි ප්‍රමාණයක් නාගරීකරණයවෙලා තිබෙනවා. ඒ ප්‍රමාණය සියයට දහයක් වාගේ පුංචි ප්‍රමාණයක්. ශ්‍රී ලංකා භූමියෙන් සියයට අනූවක් තවම පවතින්නේ ගමක් වශයෙන්. ඒ වාගේම විශාල ජනතාවක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වනවා. මේ ගැන විශ්ලේෂණාත්මකව කරුණු කියන්න මට ලැබී ඇති කාලය ඉතා සීමිතයි. කෘෂි කර්මාන්තයේ දායකත්වය සියයට 27ක් පමණ වනවා. කෘෂි කර්මාන්තයෙන් අපි ලබා ගන්නා ආදායම සියයට හතක් වාගේ ඉතා අඩු ප්‍රමාණයකට පහත වැටිලා තිබෙනවා. ඔබතුමන්ලාට හිතා ගන්න පුළුවන්, එහෙම නම් ගොවියෝ කොච්චර දිළිඳු වෙන්න ඕනෑද කියලා. ගොවියා ආර්ථික වශයෙන් ලබා ගන්න ප්‍රමාණය අඩුවෙලා තිබෙනවා.

මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමිය වතුකරයේ තත්ත්වය පිළිබඳව කථා කළා. වතුකරයේ ජනතාව ඉතා කාලකණ්ණි ජීවිතයක් තමයි ගත කරන්නේ. මෙහෙකාර සේවයේ යොදා ගත් දැරිවියක් ගැන අද කථා කරනවා. ඇත්ත වශයෙන්ම ඒ වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වනවා වාගේම, වැරැදි කළ අයට දඬුවම් ලබා දීමත් අවශ්‍ය වනවා. ඒක අපේ රටට කරපු විශාල නින්දාවක්. ඒ සිද්ධිය එක් සිදුවීමක් පමණයි. එවැනි සිද්ධි විශාල ප්‍රමාණයක් තිබෙනවා. නමුත් ඒ පිළිබඳව නොවෙයි මම අද කථා කරන්නේ. අද මාතෘකාවට අදාළවයි මම කථා කරන්නේ. වතුකරයේ ජනතාව අපි පුරවැසියන් හැටියට පිළිගත යුතු වනවා වාගේම, ඒ අයට ගෞරවනීය ජීවිතයක් ලබා දෙන්නත් අවශ්‍ය වනවා.

අද තේ ආර්ථිකය ගැන කථා කරනවා. අද අපි දහලලා ඒකෙන් ඩොලර් මිලියන එකහමාරයි ගෙන්වන්නේ. Apparel industry එකෙන් මෙන්න මෙච්චර ගෙන්වනවා, අපට මෙච්චර ඩොලර් ගණනාවක් ලැබෙනවා කියන ඒවා ඔක්කොම අසත්‍යය. ඩොලර් බිලියන පහක් ලැබෙනවා කිව්වාට, අපි ගත්ත රෙදිවල මුදල ගියාට පස්සේ අපට ඩොලර් බිලියන එකහමාරක් වාගේ

මුදලක් තමයි ලැබෙන්නේ. මිලියනයක් -ලක්ෂ දහයක්- පමණ ඒ කර්මාන්තය වටා ජීවත් වනවා.

වරක් මුදල් ඇමතිතුමාම කිව්වා, අපට apparel industry එකට අවශ්‍ය රෙදි එව්වාට පස්සේ මුදල් ලැබෙන්නේ නැහැ කියලා. ඒ කියන්නේ, ජපානයෙන් රෙදි මිලදී ගැනීමේ හැකියාව සියයට 50කින් අඩුවෙලා තිබෙනවා. යුරෝපයෙන් රෙදි මිලදී ගැනීමේ හැකියාව අඩුවෙලා තිබෙනවා. මේ වාගේ දැවැන්ත කාර්මීකරණයක් මත අපි කර්මාන්ත පටන් ගත්තත් ඒවායින්වත් අපට උත්තර ලැබෙන්නේ නැහැ. එහෙනම් මොකක්ද උත්තරය? මට ලැබී ඇති කාලය අනුව මම ඒ ගැන කියන්නම්.

දැන් අපි ගොවිතැන පිළිබඳ ප්‍රතිපත්තියකට ආවා, "වස විසෙන් තොර ගොවිතැන" කියලා. මම හිතන්නේ විපක්ෂයෙන් ඒකට ලොකු විරෝධයක් ආවේ නැහැ. මම ඒ ගැන සතුටු වනවා. මොකද, ඒ අය Green Party එකත් එක්ක දැන් ගිවිසුමකුත් අත්සන් කරලා තිබෙනවා. නමුත් මේ ක්‍රමය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. සමහර අය කියනවා, ගිය වතාවේ කරන්න ගිහිල්ලා ඇන ගත්තා -කඩා වැටුණා- කියලා. නමුත් ගිය වර රසායනික පොහොර තහනම් කරන්න කිසිම තීන්දුවක් ගත්තේ නැහැ. ගොවීන්ට රසායනික පොහොර නොදී ඉන්න තීන්දුවක් ගත්තේ නැහැ. අපි කළේ හානිකරම වූ ග්ලයිෆොසේට් තහනම් කිරීම පමණයි. අපි අත්හදා බැලීම කළේ අක්කර 25,000ක වාගේ කුඩා භූමියක. ඒ නිසා ගිය වතාවේ සම්පූර්ණ කාබනික වගාවකට ගියා කියලා කියන්න බැහැ. නමුත් දැන් ජනාධිපතිතුමා ඉතා බරපතළ ආකාරයේ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ කැබිනට් පත්‍රිකාවට අනුව පුනර්ජනනීය බලශක්තියට යන්නත්, කෘෂි කර්මාන්තය සම්පූර්ණයෙන්ම organic බවට පත් කරන්නත් තීන්දුවක් අරගෙන තිබෙනවා. මේක ඉතා බරපතළ වාගේම විප්ලවීය තීන්දුවක්. ඊට මාස ගණනකට කලින් මේ ආණ්ඩුව යටතේම තීන්දුවක් ගත්තා, තවත් මෙගාවොට් 300ක ගල් අඟුරු බලාගාරයක් ඉදිකරන්න. මුළු ලෝකයේම ගල් අඟුරු බලාගාර වහද්දි, ලංකාවේ මෙගාවොට් 300ක ගල් අඟුරු බලාගාරයක් ඉදිකරන්න තීන්දුවක් ගත්තා.

මම හිතන විධියට අද අපේ මුදල් ඇමතිතුමාටත්, අනෙක් අයටත් කරන්න තිබෙන්නේ මෙපමණයි. ආණ්ඩුව මොකුත් කරන්න ඕනෑ නැහැ. ලංකා විදුලිබල මණ්ඩලයට කියන්න, මිනිසුන්ට නිදහසේ solar panels ඉදි කරගන්න ඉඩ දෙන්න කියලා. ජනාධිපතිතුමා මේ කටයුත්ත තීන්දු කළ විගස මගේ පිටරට සිටින ලාංකික මිත්‍රයන්, කෝටි ගණන් ධනය තිබෙන අය කැමති වුණා, organic කර්මාන්තයක් පටන් ගන්න. ඒගොල්ලන් නිතර මට කිව්වා, මේ කර්මාන්තය පටන් ගන්න අපි සල්ලි යොදවන්න කැමැතියි කියලා.

හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ රජය ගත් තීන්දුව ස්ථිරද, හරිද කියන එකයි. දැන් විපක්ෂය කියනවා, රසායනික පොහොර ගෙනෙන්න තීන්දුවක් ගත්තා කියලා. මම නම් දන්නේ නැහැ, රසායනික පොහොර ගෙනෙන්න තීන්දුවක් ගත්තාද නැද්ද කියලා. ඒක ආණ්ඩුවේ තීරණයක්. නමුත් මම එකක් කියන්න ඕනෑ, මේ වස විසෙන් තොර ගොවිතැනෙන් තමයි උත්තරය හම්බ වෙන්නේ. ඒක කරන ක්‍රමයේ යම් ප්‍රශ්න ඇති. ආණ්ඩුවට එය ඉක්මනින් ක්‍රියාවට නැංවීම පිළිබඳව ප්‍රශ්න ඇති. ඒක වෙනම කථාවක්. නමුත් මේ ආණ්ඩුව බලයේ හිටියත්, විපක්ෂය බලයේ හිටියත් එකම විකල්පය වශයෙන් අද මිනිස්සු කථා කරන්නේ මොනවාද? "අපට කන්න බොන්න ඕනෑ" කියන එකයි. 70 අර්බුදය කියන්නේ මොකක්ද? හාල් පෝලිම්. ඒ කියන්නේ ආහාර ප්‍රශ්නය. අක්කර ලක්ෂ 60ක් තිබෙන රටේ ආහාර ප්‍රශ්නයක් තිබෙනවා කියලා කියනවා නම්, ඒක අපේ පාලකයන්ගේ අදූරදර්ශී, අඥාන, ආත්මාර්ථකාමී බවේ ප්‍රතිඵලයක් මිසක් මේ රටේ ප්‍රශ්නයක් නොවෙයි.

අපේ ලංකාව පුරා අක්කර ලක්ෂ 20ක පමණ ජලජ භූමියක් තිබෙනවා. මේ ජලජ භූමිවලින් අපි අරගෙන තිබෙන ප්‍රතිඵලය මොකක්ද කියලා මම අහන්න කැමැතියි. අපි මේවායින් කිසිම වැඩක් අරගෙන නැහැ. ඊළඟට, ගල් අඟුරු තිබෙන රටවල් ගත්තොත්, ජර්මනිය තමයි ඊට හොඳම උදාහරණය. අපට කොන්ද පණ ඇතිව තීරණයක් ගන්න බැරි වුණා. 2017 චීනය, ස්විට්සර්ලන්තය වාගේ රටවල් ඉතා පැහැදිලි තීරණ ගත්තා. 2025 වෙනකොට බීජිං නගරයේ ගමන් කරන සියලු කාර් රථ සියයට 100ක් electricityවලින් දුවන තත්ත්වයට පත් කරලා තිබෙනවා. අද ඉන්ධන වියදම වැඩියි. පිටරටට සල්ලි ඇදී යන මාර්ග තිබෙනවා. ඒ එක මාර්ගයක් තමයි ඉන්ධන සඳහා වැය වන මුදල. වාහන සඳහා අපට විශාල ඉන්ධන ප්‍රමාණයක් වැය වනවා. බලශක්තියට විශාල ඉන්ධන ප්‍රමාණයක් වැය වනවා. මේ දෙක නවත්වා ගන්න තිබෙන ක්‍රමය මොකක්ද? අපට ආහාරයි, තෙල් ප්‍රශ්නයයි විසඳන්න පුළුවන් නම් ආර්ථිකයේ එක පැත්තක් විසඳෙනවා. මේ ගැටලු විසඳන්න නම් සල්ලි හොයන්නේ කොහොමද? සල්ලි හොයන්න ඕනෑ තරම් ක්‍රම තිබෙනවා. ගිය ආණ්ඩුව කාලයේ ඉන්දියාවෙන් මිලියන 100ක් දුන්නා, solar panels ගන්න කියලා. නමුත් ඒකෙන් ශත පහක වැඩක් ගත්තේ නැහැ. ගිය ආණ්ඩුව කාලයේ චීනයෙන් රුපියල් මිලියන 100ක් හම්බ වුණා, solar panels සවි කරන්න කියලා. ඒකෙන් ශත පහක වැඩක් ගිය ආණ්ඩුව කාලයේ ගත්තේ නැහැ. ඒවාට ඉඩ දුන්නේ නැහැ. දැන් මේ ආණ්ඩුව Green Credit යටතේ කොච්චර loans අරගෙන තිබෙනවාද? අපේ සමහර loans අපි විදේශවලින් අරගෙන තිබෙන්නේ සියයට 8ක පොලියට. ඒක ගිය ආණ්ඩුවත් කරලා තිබෙනවා; මේ ආණ්ඩුවත් කරලා තිබෙනවා. ඉතින් මෙච්චර ලස්සන රටක් මේ තරම් ණය කන්දක හිර කරලා, අපි අන්ධයෝ වාගේ අතපත ගාමින් ඉන්නවා නම්, කිසිම ආණ්ඩුවකට උදන් අනන්න බැහැ.

ඒක පුද්ගල ආදායම කියන්නේ මොකක්ද? ඒක පට්ට බොරුවක්; අමු අළු බොරුවක්. ලෝකයෙන් ණය අරගෙන අපේ සාක්කුවට දාලා කියනවා, හැම කෙනාගේම ආර්ථිකය වර්ධනය වෙලා කියලා. පසු ගිය ආණ්ඩු, 2010 -2015 ආණ්ඩුව කෑ ගැහුවා, "අපි ලොකු ආර්ථික වර්ධනයක් ලැබුවා" කියලා. පට්ට බොරු. ඊළඟට රනිල් - මෛත්‍රී ආණ්ඩුව කිව්වා, "මාර ආර්ථික වර්ධන වේගයක් තිබෙනවා, දැන් නඟිනවා" කියලා. ඒක සම්පූර්ණයෙන් අසත්‍යයක්. ඒ නිසා ආර්ථික වර්ධන වේගය කියන එක දැන් ලෝකයේ පිළිගන්නා නිර්ණායකයක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද නිර්ණායක මනින ක්‍රමයක් තිබෙනවා. මේ නිර්ණායක මොනවාද? මිනිසුන්ගේ සෞඛ්‍ය, ප්‍රතිශක්තිකරණ හැකියාව, මිනිසුන්ගේ ආයු කාලය, මිනිසුන් සතුටින් ඉන්න එක - Happiness Index - කියන මෙන්න මේවා තමයි ආර්ථික දත්ත හැටියට ගන්නේ. මේවා ගැන අපි කිසිම සැලකිල්ලක් යොමු කරලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කෙළින් කිව්වොත්, මේ රට ගොඩ ගන්න පුළුවන් එකම ක්‍රමය ප්‍රවාහනයටත්, සෞඛ්‍යයටත්, බලශක්තියටත් විසඳුම් සෙවීමයි.

ගොවිතැන පැත්තෙන් ගත්තොත්, අපි ගත් ඒ පියවර ජයග්‍රහණය කරවන්න අපි ආසාවෙන් ඉන්නවා. රටට ආදරය කරන මිනිස්සු මහා බලාපොරොත්තුවක් තියාගෙන ඉන්නවා, මේ මහ පොළොව සුවපත් කරන්නට. නමුත් අපට ඒකට වැඩ පිළිවෙළක් නැහැ. ආණ්ඩුව තීන්දුවක් ගත්තා නම්, විපක්ෂය ඇතුළු අප සියලුදෙනාම කිසිම වාද භේදයකින් තොරව එක්වී විප්ලවයක් හැටියට මේ පොළොව සුවපත් කරලා අපේ ජනතාව රෝගී වීමෙන් ගලවා ගන්න ඕනෑ. 2005දී 5,000ක් වූ පිළිකා රෝගීන්ගේ ප්‍රමාණය අද 26,000ක් වෙලා තිබෙනවා. අද ලක්ෂයකට වැඩි වකුගඩු රෝගීන් පිරිසක් ඉන්නවා. මේ සංඛ්‍යා ලේඛන අසත්‍යයි කියන්න පුළුවන් කාටද? මෙයට බහුතරයක් සාධක වන්නේ අපි ගෙනාපු රසායනික පොහොර සහ හෙළන ලද උග්‍ර විෂ බවත් ඉතා පැහැදිලිව ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් පවා වාර්තා ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපේ හාමුදුරුවනේ, කථාව අවසන් කරමු.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අවසාන කරනවා.

මේ රටේ දැවැන්ත ආර්ථික අර්බුදයක් තිබෙනවා. අපි ණය ගත්තේ මොනවාටද? Expressways හදලා අපට ඇති වැඩක් තිබෙනවාද? ක්‍රිකට් පිට්ටනි හදලා වැඩක් තිබෙනවාද? අපි වාගේ දුප්පත් රටකට ගැළපෙන ආර්ථිකය මොකක්ද කියලා ගිය ආණ්ඩුව හරි තීරණයක් ගත්තෙත් නැහැ; මේ ආණ්ඩුව හරි තීරණයක් ගත්තෙත් නැහැ. අපි ආණ්ඩුවේ ඉඳගෙන ඉතා පැහැදිලිව කියනවා, "හරි තීරණය ගන්න, ජනතාව සූදානම්" කියලා. මේ කොරෝනා ආර්ථික අර්බුදය ආශිර්වාදයක් කරගෙන අපට නැඟිටින්න පුළුවන් බව කියමින් මගේ කථාව අවසාන කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.01]

**ගරු දයාසිරි ජයසේකර මහතා (බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - பத்திக், கைத்தறி துணிகள் மற்றும் உள்நாட்டு ஆடை உற்பத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - State Minister of Batik, Handloom and Local Apparel Products)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මහ බැංකුවේ වාර්ෂික වාර්තාව පිළිබඳ ඇති කරන ලද සංවාදයට සම්බන්ධ වෙන්න ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. රටේ ආර්ථිකය පිළිබඳව අද විපක්ෂය විසින් විවිධ අදහස් මතු කළා. මම හිතන්නේ එතුමන්ලාට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි අපේ මුදල් සංචිතය පිළිබඳව තිබෙන අර්බුදය. සංචිත එකතු කර ගන්න අපටත් පුළුවන්. පුළුවන් තරම් ණය අරගෙන සංචිත වැඩි කර ගන්න පුළුවන්. සංචිත වැඩි කර ගත්තා කියලා අපට සන්තෝෂ වෙන්න බැහැ. මොකද හේතුව, ඊට වඩා වැඩි ගණනක ණය අපට ඒ වෙනුවෙන් ගෙවන්න සිදු වෙන නිසා. විශේෂයෙන්ම ඒ ගත්ත හැම ණයකටම තව තවත් වැඩි වැඩියෙන් එකතු කරලා, ඒ මුදල් ප්‍රමාණය ගෙවන්න සිදු වෙන තත්ත්වයක් අද අපට ඇති වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන් රටට එන බර කොයි තරම් ප්‍රමාණයක්ද කියන එක ගැන අපි සියලුදෙනා කල්පනා කරන්න ඕනෑ. අපි deposit එකක් තියා ගෙන, වෙන තැන්වලින් ණය ගන්නවා වාගේ වැඩක් තමයි මේ කරන්නේ. පසුගිය කාල වකවානුව තුළ අපේ ආර්ථික වැඩ පිළිවෙළ හරහා මූලික වශයෙන් මිනිසුන්ගේ අතට මුදල් එන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන එක අපි දැක්කා. අපේ ආණ්ඩුව එනකොට ලංකාවේ හැම තැනකම leasing companiesවල වාහන ගාල් කරලා තිබුණා. ක්‍රමානුකූලව අතට මුදල් එන ක්‍රමවේදය, අතිගරු ජනාධිපතිතුමා ගෙනාපු tax benefit එක, එහෙමත් නැත්නම් බදු අය කිරීමේ ක්‍රමවේදය යම්කිසි විධියක ක්‍රමානුකූල ලිහිල් කිරීමේ ප්‍රතිපත්තියක් විධියට තමයි ඇති වුණේ. නමුත්, අවාසනාවකට ඒ තත්ත්වය තුළ, ආර්ථික වශයෙන් ගන්න තිබුණු ඒ ශක්තිය පහළ මට්ටමේ හිටපු අපේ ව්‍යාපාරිකයන්ට ගන්න ලැබුණේ නැහැ. මේ කොවිඩ් අර්බුදයත් එක්ක ඔවුන් සම්පූර්ණයෙන් විශාල කඩා වැටීමකට ලක් වුණා. ඒ නිසා තමයි පෞද්ගලිකව ගත්ත ආදායම් බදු ප්‍රමාණය - personal income tax - අඩු කරලා, VAT ප්‍රමාණය අඩු කරලා නැවතත් රට තුළ මුදල් සංසරණය වෙන ක්‍රමවේදයක් ඇති කළේ. පසු ගිය කාල වකවානුව තුළ, -2019 අග වෙනකොට, නැත්නම් මැද හරිය වෙනකොට- මිනිස්සු තමන්ගේ මුදල් ටික එළියට දාන්නේ නැතිව, සංසරණය කරන්නේ නැතිව තමන්ගේ අතේ තියා ගැනීම තුළ විශාල අර්බුදයක් ඇති වුණා. අපි ඒ තත්ත්වය අයින් කරන්න තමයි මේ ක්‍රියාදාමය පටන් ගත්තේ. නමුත්, අවාසනාවකට අපට කොවිඩ් අර්බුදයකට මුහුණ දෙන්න සිදු වුණා. මේ අර්බුදය ලංකාවේ ආණ්ඩුව ගෙනාපු අර්බුදයක් නොවෙයි, මෙය ලෝකයේ හැම තැනකම ඇති වුණු අර්බුදයක්. නමුත්, අපි ඒ රෝගයට සාර්ථකව, ක්‍රමානුකූලව මුහුණ දෙමින් ඉන්නවා. ජනතාවට vaccines ලබා දීමේ වැඩ පිළිවෙළ ලෝකයේ රටවල් ගණනාවක් අතුරින් ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරන රටක් බවට අපි පත්වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය සති කිහිපය තුළ මුදල් ඇමතිතුමා අපි සියලුදෙනාම ගෙන්වලා අපනයන - exports - වැඩි කර ගන්නේ කොහොමද කියලා සාකච්ඡා කළා. මට මතකයි ඒ කාලයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා -ඉරාන් වික්‍රමරත්න මැතිතුමන්ලාගේ නායකතුමා- කිව්වේ, ඩොලර් බිලියන 15ත්-20ත් අතර ප්‍රමාණයක් අපනයන - exports - වැඩි කර ගන්න කථා කර ගන්න කියලා. හැබැයි, ඊට අවශ්‍යකරන හයිය දුන්නේ නැහැ. මේක තමයි තිබුණු ප්‍රධාන ප්‍රශ්නය. අපනයනය කරන්න, අපනයනය කරන්න, ලබන අවුරුද්ද වන විට අපට ඩොලර් බිලියන 15ක්, 20ක් ඕනෑ කියලා මිනිසුන්ට තර්ජනය කළාට වැඩක් නැහැ. පසුගිය සතියේ බැසිල් රාජපක්ෂ මැතිතුමාත්, අපිත් කථා කළා ඇත්තටම ඒ ගොල්ලන්ට තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා. සියලු අපනයන ක්ෂේත්‍ර එකින් එක අරගෙන එතුමා අපිත් එක්ක සාකච්ඡා කළා. රෙදිපිළි අපනයනය කරන්නේ කොහොමද? ඒ සම්බන්ධව තිබෙන ප්‍රශ්න ටික ආණ්ඩුවක් විධියට විසඳන්නේ කොහොමද? ඊළඟට, අනෙකුත් භෝග පිළිබඳවත් කථා කළා. විශේෂයෙන් තේ, පොල්, රබර් යන භෝග සම්බන්ධයෙන් ඒවාට අදාළ අමාත්‍යාංශ ගෙන්වලා සාකච්ඡා කළා. මේ විධියට හැම අමාත්‍යාංශයකින්ම අපනයන ආදායමක් ලබා ගන්නේ කොහොමද කියන ක්‍රියාදාමය පිළිබඳව පසුගිය සති කිහිපය තිස්සේ ම එතුමා සාකච්ඡා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට සංචාරක ව්‍යාපාරය ගැන සාකච්ඡා කළා. අපි නැවතත් සංචාරක ව්‍යාපාරය නංවා ගන්නේ කොහොමද? පසුගිය අවුරුද්ද වන විට අපේ රටට සංචාරකයන් ඇවිල්ලා තිබෙන්නේ 15,000යි. අද අපි ක්‍රමානුකූලව මේ vaccine එක ජනතාවට ලබා දෙමින් පවතිනවා. එය සාර්ථක වුණු ගමන් නැවත ලංකාවේ සංචාරක ව්‍යාපාරය නංවන්න වැඩ පිළිවෙළක් අපි ඉතා ඉක්මනින් සකස් කරනවා. හැම අවුරුද්දේම සංචාරක ව්‍යාපාරයෙන් ඩොලර් බිලියන 3ත්, 4.5ත් අතර ප්‍රමාණයක් අපි බලාපොරොත්තු වෙනවා, බොහෝ අවුරුදුවල අපට ඒ ප්‍රමාණය ලැබිලා තිබෙනවා. ඒ වාගේම ලංකාවේ ඉන්න අය හැම අවුරුද්දකම පිට රටට ගිහිල්ලා වියදම් කරනවා ඩොලර් බිලියන 1.5ක් - US Dollars 1.5 billion. මේ විධියට එළියට යන මුදල් ප්‍රමාණය වාගේ කිහිප ගුණයක් රට තුළට ගෙන්වා ගන්නේ කොහොමද කියන අභියෝගය තමයි අප ඉදිරියේ තිබෙන්නේ. ඒකට තමයි අපි මේ උත්සහ ගන්නේ; ක්‍රමානුකූලව, සංචාරක ව්‍යාපාරය නැවත ඉදිරියට ගෙන යෑමේ වැඩ පිළිවෙළ සකස් කරන්නේ. ඒ සඳහා අවශ්‍ය නීති රීති සකස් කරලා, ලිහිල් කළ යුතු නීති රීති ලිහිල් කරලා මේ රටට සංචාරකයන් ගෙන්වාගෙන වැඩි ආදායමක් ලබන්න පුළුවන් වැඩ පිළිවෙළක් අපි සකස් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, cash flow එක ගැනත් යමක් කියන්න මම කැමැතියි. අපි අදත් උත්සාහ කරන්නේ මිනිසුන්ගේ අතට පුළුවන් තරම් මුදල් යන විධියේ වැඩ පිළිවෙළක් සකස් කරන්නයි. අපි දන්නවා ලෝකයේ අනෙක් රටවල ඇතිවෙලා

තිබෙන තත්ත්වය. ගිය සතියේ චීනයේ ඇති කරපු තත්ත්වය මොකක්ද? චීනයේ මහ බැංකුව, අනිකුත් බැංකු අතර රඳවාගෙන තිබුණු ප්‍රතිශතය සියයට 50කින් අඩු කළා. ඒ ගොල්ලන්ට කිව්වා ව්‍යාපාරිකයන්ට, මිනිසුන්ට පුළුවන් තරම් මුදල් දෙන්න කියලා. එම නිසා තමයි ඒ ආර්ථිකය ක්‍රමානුකූලව ශක්තිමත් වුණේ.

අපි පසුගිය කාලයේ stimulus packages හරහා අපේ ව්‍යාපාරිකයන්ට ශක්තිය දුන්නා. ඒ ණය දුන්නේ සියයට හතරක පොළියට. ප්‍රධාන බැංකුකරුවා විධියට මහ බැංකුව තමන්ගේ අවශේෂ බැංකුවලට ඉඩ දුන්නා රඳවා ගැනීම් යම්කිසි ප්‍රමාණයකට අඩු කරලා, -ඒ risk එක මහ බැංකුව අරගෙන- ණය දෙන්න පටන් ගන්න. ඒ හරහා නැවත ක්‍රමානුකූලව ආර්ථිකය නැඟිටිනවාය කියලා කිව්වා. ඒක තමයි අපි කළ යුත්තේ. ඒකෙන් තමයි අපට ආර්ථික වර්ධනයක් ඇති කර ගන්න හැකි වෙන්නේ. මිනිස්සු බය නැතිව invest කරන්නේ, ව්‍යාපාරවලට මුදල් යොදවන්නේ එවැනි වැඩ පිළිවෙළක් හරහායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද එන ගමන් හර්ෂ ද සිල්වා මැතිතුමාගේ කථාව අහගෙන හිටියා. එතුමා කිව්වා ආර්ථිකය තියෙන්න ඕනෑ ආවෘත නම් ආවෘතව, විවෘත නම් විවෘතව කියලා. එහෙම ආර්ථික නැහැ. ඉස්සර තමයි ආර්ථිකය විවෘත නම් විවෘතව තිබුණේ, ආවෘත නම් ආවෘතව තිබුණේ. අපි දන්නවා, Lehman Brothers කඩා වැටුණේ 2011දී බව. ඇමෙරිකාවේ ජනාධිපතිවරයා විධියට බැරක් ඔබාමා මැතිතුමා එදා මොනවාද කිව්වේ? එතුමා කිව්වා, ලෝකයේ ධනේශ්වර ආර්ථිකයක් තිබෙන ඇමෙරිකාවේ ආණ්ඩුවටත් සමහර වෙලාවට මේවා බේරා ගන්න මැදිහත් වෙන්න සිද්ධ වෙනවා කියලා. ඒ විධියට තමයි ඒ ගොල්ලන් සම්පූර්ණයෙන්ම Lehman Brothers තමන් අතට අරගෙන, එහි වගකීම අරගෙන ඒක කඩා වැටීම නතර කෙරුවේ. මට තවම හිතා ගන්න බැහැ හර්ෂ ද සිල්වා මැතිතුමා ඉන්නේ මොන යුගයේද කියලා. ඒ වාගේම මම දන්නේ නැහැ, ඉරාන් වික්‍රමරත්න මැතිතුමා මොන මතයේද ඉන්නේ කියලා. කෙසේ වෙතත්, සමගි ජන බලවේගයේ එක එක්කෙනාගෙන් ආර්ථික දර්ශනය ගැන අහුවොත් ඒ මත එකිනෙකට වෙනස්. උදාහරණයක් ගත්තොත්, හර්ෂ ද සිල්වා මැතිතුමා කියන්නේ ආර්ථිකය විවෘත නම් විවෘත, ආවෘත නම් ආවෘත කියලා. බය නැතුව අපි එක දෙයක් කියන්න ඕනෑ. ඊළඟට, ඉරාන් වික්‍රමරත්න මැතිතුමාගෙන් ඇහුවාම, ජනතාව ගැන ටිකක් හිතන කෙනෙක් විධියට එතුමා කියනවා, "නැහැ අපි පොඩ්ඩක් ජනතාව ගැනත් හිතලා මේ විවෘත ආර්ථික ක්‍රමයම ගෙනියන්නේ නැතුව හොඳ දෙයක් කරන්න ඕනෑ" කියලා. කබීර් හෂීම් මැතිතුමාගෙන් ඇහුවාම එතුමා තව එකක් කියනවා. අපේ විපක්ෂ නායකතුමාගෙන් ඇහුවොත්, "නැහැ, නැහැ, ජනතාවාදී ආර්ථිකයක් තමයි අපි කරන්නේ. අපි හැම වෙලාවකම ජනතාවටම විතරක් මුදල් ටික දීලා නිකන් ඉන්න ඕනෑ" යනුවෙන් කියලා, අන්න ඒ ආර්ථිකය ගැනත් කියන්න පුළුවන්. කිසිම ආර්ථික වැඩ පිළිවෙළක් නැති තත්ත්වයක් තමයි අද සමගි ජන බලවේගය තුළ තිබෙන්නේ. එක එක කාලවලට එක එක කථා කියලා වැඩක් නැහැ. අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත්, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාත් අද යථාර්ථවාදී ක්‍රියාදාමයක් ඉදිරියට ගෙනැත් තිබෙනවා. පළමුවෙනි වතාවට ලංකාවේ මුදල් ඇමති කෙනෙක් කිව්වා, "මම මුදල් නැති ඇමති" කියලා. එයින් අදහස් කෙරුවේ ඉදිරියේදී ශක්තිමත් ආර්ථිකයක් හදා ගන්න ඕනෑය කියන කාරණයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Moody's ශ්‍රේණිගත කිරීම සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වය ගැනත් මම කියන්න ඕනෑ. මම දැක්කා අපේ ගරු අශෝක් අබේසිංහ මැතිතුමා මේ ශ්‍රේණිගත කිරීමේ ප්‍රශ්නය ගැන කියනවා. මතක තියා ගන්න, 2020 වර්ෂයේ සැප්තැම්බර් 28වැනි දාත් මේ වාගේම දෙයක් වුණා. අපට ණය ගෙවන්න තිබුණේ 2020 ඔක්තෝබර් 4වැනි දා. එදිනට ඩොලර් බිලියන එකක් අපිට ගෙවන්න තිබුණා. ඒකට දවස් 4කට කලින් Moody's එක අපව පල්ලෙහාට දැම්මා. දැන් ණය ගෙවන්න දින කිහිපයක් තිබියදී ආපසු අපි පල්ලෙහාට දමන වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. Moody's එක අපි පල්ලෙහාට දැම්මාට කමක් නැහැ, අපට ඒක ඉහළ නංවාගන්න පුළුවන්. අපි බලන්නේ රටේ මුදල් සංසරණය පුළුවන් තරම් වැඩි කරන්න මිස සංචිත එකතු කරලා ගොඩ ගහගන්න නොවෙයි. අපට වුවමනා කරලා තිබෙන්නේ මිනිසුන් නැවත ව්‍යාපාර පටන් ගන්න තැනට පත් කරන්නයි. කොවිඩ් වසංගතයෙන් වැටුණු රට ඉදිරියට ගෙන යන්න නම් අලුත් වැඩ පිළිවෙළවල් යටතේ රට ඇතුළට මුදල් ටිකක් ගේන්න ඕනෑ. අන්න ඒ ක්‍රියාදාමය තමයි අපි ක්‍රියාත්මක කරන්න හදන්නේ.

විශේෂයෙන්ම ආණ්ඩුවක් විධියට අද අපට පුළුවන් වෙලා තිබෙනවා ජීවන වියදම ස්ථාවරව තියාගන්න.

අද ලංකාවේ බැංකු පොලී අනුපාතය ඉතා අඩු මට්ටමකට ඇවිත් තිබෙනවා. රටේ උද්ධමනය වැඩි වෙලා කියනවා. නමුත්, ආහාර කාණ්ඩවල මිල ගණන් පිළිබඳව කථා කළොත්, ජීවන වියදම් දර්ශකය අනුව ජුනි මාසයේ සියයට 11.3 තිබුණු උද්ධමනය ජූලි මාසයේ සියයට 11 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, මිනිසුන්ට කන්න බොන්න තිබෙන ආහාර ටිකේ උද්ධමනය අඩු වෙලා තිබෙනවා. ආහාර නොවන කාණ්ඩවල උද්ධමනය සියයට 2.5 සිට සියයට 3.2 දක්වා වැඩි වෙලා තිබෙනවා. ජීවන වියදම් දර්ශකය අනුව පෙනී යනවා, අපට උද්ධමන වේගය සියයට 5.7ක මට්ටමක තබා ගන්න යම්කිසි විධියකින් හැකියාව ලැබී තිබෙන බව. අපට ටික කාලයක් මේ අර්බුදයට මුහුණ දෙන්න සිද්ධ වෙයි. අපි ඉතිහාසයේදීත් මේ වාගේ අර්බුදවලට මුහුණ දී තිබෙනවා. රටක් විධියට අපට වුවමනා කරන්නේ, වැටිච්ච ආර්ථිකය නැවත වතාවක් ගොඩ ගන්න ක්‍රමානුකූලව ස්ථාවර වැඩ පිළිවෙළක් හදන්නයි. ඒ සඳහා විදේශ ආයෝජන ගෙන්වා ගැනීමේ, සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීමේ සහ අපනයන ආර්ථිකය ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළ සකස් කර ඉදිරියට ගෙන යන්නයි අපේ බලාපොරොත්තුව. ඒ වැඩ පිළිවෙළ ශක්තිමත් කිරීම සඳහා අපි හැම විටම ශක්තිය දෙනවාය කියන කාරණයත් මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.12]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර රාජ්‍ය ඇමතිතුමා කිව්වා, "අද කථා කරන්නේ සමඟි ජන බලවේගයේ වැඩ පිළිවෙළ" කියලා. අද මාතෘකාව, ඒක නොවෙයි. ඒක අපි කලට වේලාවට කරමු. ඒ ගැන මම එතුමාට පිළිතුරු දෙන්න යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සමහර උදවියට අමාරුවෙන් ආහාර වේලක් හොයාගෙන යාන්තමින් බඩගින්න නිවා ගන්නයි වෙලා තිබෙන්නේ. අද තාක්ෂණය ගැන හුඟක් කථා කරනවා, කයිවාරු ගහනවා. නමුත්, online අධ්‍යාපනය ලබා

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

ගන්න දරුවන්ට ගස් දිගේ බඩ ගාන්න සිදු වෙලා තිබෙනවා. රැකියා අහිමි වුණු අය අද තම දරු පවුල පෝෂණය කරන්න විශාල අරගළයක් ගෙන යනවා. පසුගිය රජය කාලයේ වාහනයකින් ගමන් කරන්න වාගේම, ජනතාවට හොඳ ජීවන මට්ටමකුත් තිබුණා. අද වාහනයෙන්වත් ගමන් කරන්න බැරි තත්ත්වයකුයි තිබෙන්නේ. මීට දවස් තුන-හතරකට කලින් මාධ්‍යවේදියෙක් මට කිව්වා, "බිරිඳ රට ගියා. සල්ලි ගන්න ATM machine එකට debit card එක දාපුවාම ඩොලර් 100වත් ගන්න බැරි වුණා" කියලා. මොකද, ඩොලර් 100ත් තහනම් කර තිබෙන බවයි ඔහු සඳහන් කළේ. දැන් කම්කරුවන්ට සතිපතා වැටුපවත් ලැබෙන්නේ නැහැ. රසායනික පොහොර ගෙන්වීම තහනම් කිරීම නිසා ගොවි මහතුන් අද කනස්සල්ලට පත් වෙලා ඉන්නවා. රජය නැවතත් හිතලා ඒ තීරණය වෙනස් කර තිබෙනවාද නැද්ද කියලා මම දන්නේ නැහැ. අද ජීවන වියදම ඉහළ ගිහින් තිබෙනවා. පෙට්‍රල් මිල ඉහළ ගිහින් තිබෙනවා. අද රට තුළ ප්‍රශ්න විශාල ප්‍රමාණයක් තිබෙනවා. අද රජයේ ආදායම අඩු වෙලා තිබෙන බව පාසල් යන දරුවෙකුට වුණත් තේරෙනවා. අද ලැබෙන ආදායමින් සියයට 70ක් යන්නේ සේවා පොලී ගෙවීමට කියන කාරණයත් සඳහන් කරන්නට ඕනෑ. ආදායමින් වැඩිම ප්‍රතිශතයක් පොලී ගෙවන, ලෝකයේ අංක එකට ඉන්න රට ලෙබනනයයි. ලංකාව තමයි එහි දෙවැනි ස්ථානයට පත් වෙලා තිබෙන්නේ. මේ අර්බුදයෙන් ගොඩ එන්න අපි මොනවාද කළ යුත්තේ? මට මුලින් හිතුණේ, මේකට විසඳුම ඇමතිවරු මාරු කිරීම නොවෙයි, ප්‍රතිපත්ති වෙනස් කිරීම කියලායි. නමුත්, අද උදේ කථා කරපු ගරු ඇමතිවරයෙක් කිව්වා, "විපක්ෂය ලෙඩේ කියනවා. හැබැයි, ලෙඩේට බෙහෙත කියන්නේ නැහැ" කියලා. ඒ කථාව ඇහුණාට පස්සේ මට හිතුණා, බෙහෙත කියලා වැඩක් නැහැ. ඇත්තටම කළ යුත්තේ දොස්තර මහත්තයා වෙනස් කිරීම කියලා.

ලංකාව ගැටලු දෙකකට මුහුණ පා තිබෙනවා. රටේ ද්විත්ව අර්බුදයක් තිබෙනවා. එකක්, අපේ ජාතික වියදම ආදායමට වඩා වැඩි වීම. ඒක තමයි ලොකුම ගැටලුව. මේක අද-ඊයේ ඇති වූ ප්‍රශ්නයක් නොවෙයි. 1990 සිට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට ගත්තාම සාමාන්‍යයෙන් සියයට 7.6ක හිඟයක් තිබෙනවා. 1995 ඉඳලා බැලුවොත් දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ආදායම පහත වැටෙමින් පවතිනවා. 2006 ඉඳලා 2014 දක්වා ජනාධිපති මහින්ද රාජපක්ෂගේ රජය කාලයේ, රටේ ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට සියයට 17.3 සිට සියයට 11.6 දක්වා ක්‍රමානුකූලව පහත වැටී තිබෙනවා. දැන් ඒ ප්‍රශ්නය උග්‍ර වෙලායි තිබෙන්නේ. කොහොම වුණත් අපේ රජය 2018 වනකොට අපි ඒ සඳහා යොමු වුණා. අපි කිව්වා, "ආදායම වැඩි කරන්න ඕනෑ. අය වැය පරතරය අඩු කරන්න ඕනෑ" කියලා. එය මූලිකව කළ යුතු දෙයක්. ඒ නිසා, අපි එහෙම කරන්න ඕනෑය කිව්වා. අපට පුළුවන් වුණා, ඒක කරන්න. 2018 වර්ෂය වෙන කොට රටේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට ගත්තාම සියයට 13.5කට වැඩි කරගන්න අපට පුළුවන් වුණා. ඊට පස්සේ ඇති වුණු කුමන්ත්‍රණය හේතුවෙන් එය සියයට 12.6කට විතර පහළට ආවා.

දෙවැනි ව්‍යුහාත්මක ගැටලුව තමයි, අපේ ආනයන - අපනයන පරතරය, current account එකේ තිබෙන හිඟය. 2000 වසරේ සිට දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස අපනයනය දිගටම වැටිලා තිබෙනවා. ඒ ගැටලු දෙකේ ප්‍රතිඵලයක් නිසා තමයි අපට ජාත්‍යන්තරව හා දේශීයව ණය ගන්න සිදුවෙලා තිබෙන්නේ. ඒ අවස්ථාවලදී මූලික ගැටලු විසඳන්න රජයන් යොමු වෙලා නැහැ. අපට තවමත් පෙනෙන්නේ නැහැ, මේ රජයත් එයට යොමු වෙලා තිබෙනවා කියලා. ප්‍රතිපත්තිවල වෙනසක් තිබෙනවා නම් අපි බලාපොරොත්තු වෙනවා ඊළඟ අය වැයේදී ඒ ප්‍රතිපත්ති වෙනස ගැන අහන්න. 2007 වර්ෂයේදී අය වැය හිඟය පියවන්න ජාත්‍යන්තර වෙළෙඳ පොළට ගිහිල්ලා ISB ඩොලර් මිලියන 500ක් ගන්න කටයුතු කළේ, එදා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති හැටියට හිටපු, අද කථා කරපු රාජ්‍ය ඇමතිතුමායි. හැබැයි, එතුමා දැන් කියන කථාව වෙනස්. "අපට ජාත්‍යන්තර මුදල් අවශ්‍ය නැහැ" කියනවා. හැබැයි, එදා තමයි පළමුවැනි වතාවට ISB එක ගත්තේ. අපගේ මූල්‍ය හිඟය පියවා ගැනීමේ නව මූලාශ්‍රයක් මෙයින් ආරම්භ කළා. එම නිසා 2007 වර්ෂයේ ඉඳලා අපි අධික පොලී අනුපාතවලින් ඩොලර් ණය දිගින් දිගටම අරගෙන තිබෙනවා. මෙන්න මේකයි ප්‍රශ්නය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුද අපේ රටට ඇවිල්ලා ආයෝජනය කරන්නේ? අපි ණයට අරගෙන සුදු අලි මැව්වා. සුදු අලි කියන්නේ සාමාන්‍යයෙන් ප්‍රතිලාභයක් කෙළින්ම නොලැබෙන ආයෝජන. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව අපට චීනයෙන් ලැබුණු දීමනාවක්. දීමනාවෙන් හැදුවාට කමක් නැහැ. නමුත්, හම්බන්තොට "මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය", කොළඹ "නෙළුම් පොකුණ" ණයවලින් හදන එක සුදුසු තීරණ නොවෙයි. අනාගතයේ වුණත් ණයක් ගත්තොත් අපි ඒ ණය යොදවන්න ඕනෑ ආදායම් උපයන ක්‍රියාමාර්ගවලටයි. අපි කාටත් මතකයි, 2018 වර්ෂයේ අවසාන කාර්තුව වන විට අපේ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 7.8ක් වුණු බව. එනමුත් කුමන්ත්‍රණය තිබුණු කාලය තුළදී බිලියනයකින් ඒක අඩු වුණා. ඒ කුමන්ත්‍රණය තිබුණු කාලය තුළදී රුපියල, රුපියල් 10කින් අවප්‍රමාණ වුණා. දළ දේශීය නිෂ්පාදනය ගැන කථා කරලා කියනවා, පසුගිය රජය කාලයේ දළ දේශීය නිෂ්පාදනය පහළට ආවා කියලා. 2018 වර්ෂයේ තුන්වැනි කාර්තුව වන තුරු දළ දේශීය නිෂ්පාදනයේ සාමාන්‍ය වර්ධනය සියයට 4.3යි. ඒක හැම දෙනාම දන්නවා. පාස්කු ප්‍රහාරය මත්තේ අපේ-

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
Sir, I rise to a point of Order.

ගරු හිටපු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියපු කාරණයක් සම්බන්ධව පොඩි ප්‍රශ්නයක් අහන්න ඕනෑ. ඔබතුමන්ලා ගත්තු ණයවලින් ගිය අවුරුදු හතරහමාර ඇතුළත මහා පරිමාණ ව්‍යාපෘති කීයක් ආරම්භ කළාද? ඔබතුමා කියන්න කෝ.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
අපි කථා කරන කොට හැම දාම ඔබතුමා නැඟිටලා බාධා කරනවා. තර්ක කරන්න ඕනෑ නම් තර්ක කරන්න එන්න, හරි තැනට. Disturb කරන්න එපා. අපි කාටවත් disturb කළේ නැහැ.

"අපේ රටේ විදේශ සංචිත බැස්සා. 2015 වර්ෂයේ ඉඳලා 2018 වර්ෂය වෙනකල් දළ දේශීය නිෂ්පාදනය වැටුණා" කියලා අසත්‍යයක් කියාගෙන, කියාගෙන යනවා. නමුත් ඇත්තට දළ දේශීය නිෂ්පාදනය ප්‍රතිශතයක් වශයෙන් සියයට 4.3කින් ඉහළ ගියා. සාමාන්‍යය අගය ඒකයි. පාස්කු ඉරුදින ප්‍රහාරයට ඉස්සෙල්ලා කුමන්ත්‍රණය නිසා තමයි ලොකු ප්‍රශ්නයක් ඇති වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය කියන්න ඕනෑ. ජාතික ගිණුම්කරණය සඳහා අපි නවීකරණය කරන ලද මුදල් පනත් කෙටුම්පතක් ගෙනාවා. ගිණුම් ක්‍රමය වෙනස් කළා. නමුත් මොනවාද වුණේ? ඒකෙන් ක්‍රමානුකූලව ආදායම ඉහළට ගියා. නමුත් මොනවාද මේ ගොල්ලන් කරන්නේ? ශ්‍රී ලංකා මහ බැංකුවෙන් කරන්නේ මොනවාද? ශ්‍රී ලංකා මහබැංකු වාර්තාවේ ගණිතමය විජ්ජා කිහිපයක් තිබෙනවා. මේක කියන්නම අවශ්‍ය කාරණයක්. ඒ වාර්තාවෙන් පෙන්නුවා, 2020 වර්ෂයේ වියදම අඩු

වෙලා තිබෙනවා කියලා. ජාතික වියදම දිගටම ගණනය කළේ, cash basis එකකට; accrual basis එකට කළේ නැහැ. මේ අවුරුද්දේ වෙනස් කරලා 2020 වර්ෂයේ ගෙවන රුපියල් බිලියන 420ක් 2019 වර්ෂයට දාලා තමයි ඒක පෙන්නුවේ.

ගිණුම් ක්‍රමය වෙනස් කරලා තමයි අය වැය හිඟය සියයට 11යි කියලා පෙන්නුවේ. ඇත්තටම අය වැය හිඟය සියයට 14යි. එහෙම බැලුවොත් අවුරුදු 38කින් වාර්තා කළ වැඩිම අය වැය හිඟය තමයි ඔය වාර්තාවේ තිබෙන්නේ. ඊළඟට තව විජ්ජාවක් පෙන්නුවා. 2020 වසරේදී, අපේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට ගත්තාම මුළු ණය ප්‍රමාණය 101යි කියලා පෙන්නුවා. ඇත්තටම අපේ රාජ්‍ය ව්‍යවසාය එකතු කළොත්, ඒක 109කට ඉහළ යනවා. ඊට අමතරව තවත් දේවල් තිබෙනවා. උදාහරණයක් ගත්තොත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ රුපියල් බිලියන 345ක ණය තිබුණා. නමුත්, 2019 වසරින් පසු 2020 වසර වෙනකොට ඒක තවත් සියයට 16කින් ඉහළ ගියා. 2019දී රුපියල් බිලියන 297ක් ලෙස තිබුණු ණය ප්‍රමාණය බිලියන 345ක් දක්වා ඉහළ ගියා. ලෝකයේ තෙල් මිල අඩුවෙන්ම තිබුණු අවුරුද්දේයි ණය ප්‍රමාණය එසේ ඉහළට ගියේ. අපි එදා lockdown එකක සිටියේ. තෙල් පාවිච්චි කළේත් නැහැ. ඒත් ණය ප්‍රමාණය ඉහළ ගිහින් තිබෙනවා. තෙල් මිල පහළට ගියා. නමුත් පාරිභෝගිකයාට ඒකේ වාසිය ලැබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තාව තුළ තුන්වැනි විජ්ජාවකුත් තිබුණා. අපේ විදේශ ණය ගැනීම් පහළ ගිහිල්ලා තිබෙනවා කිව්වා. නමුත් ඇත්ත වශයෙන්ම මේක විජ්ජාවක්; ඉලක්කම් විජ්ජාවක්. මෙම වාර්තාවේ 142වන පිටුවේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර - ISB - වෙළෙඳ පොළ වටිනාකමට තමයි දමා තිබෙන්නේ. නමුත් ඇත්තටම මුහුණත වටිනාකමයි දමන්න ඕනෑ. ඊයේ පෙරේදා අපි ඩොලර් බිලියනයක් ගෙව්වා. එසේ ගෙවනකොට මුහුණත වටිනාකමේ ප්‍රමාණය තමයි ගෙව්වේ. මුහුණත වටිනාකම තමයි දමන්න ඕනෑ. මුහුණත වටිනාකම දැම්මොත් ඇත්තටම විදේශ ණය ප්‍රමාණය තවත් ඉහළට යනවා. මම මේවා කියන්න හේතුව මේකයි. රටක් ගොඩනඟන කොට ආයෝජකයන් තුළ විශ්වාසයක් ඇති කරන්න ඕනෑ. ඒ නිසා තමුන්නාන්සේලා මේ වාගේ ගේම් ගහන්න එපා, විජ්ජා කරන්න එපා. අපිව ශ්‍රේණිගත කරන සමාගම් තුළ අපි කෙරෙහි විශ්වාසය ඇති කරන්න ඕනෑ. ආයෝජකයන් බලන්නේ ඒ දෙසයි. දැන් අලුත් මුදල් ඇමතිවරයෙක් සිටිනවා. එතුමාට යම් කිසි කාල පරාසයක් දිය යුතුයි. අපි බලාපොරොත්තු වෙනවා,මේ කරන සෙල්ලම් නතර කරලා, ඇත්තටම රට තුළ විශ්වාසය ඇති කරලා කටයුතු කරයි කියලා. මම මුදල් මණ්ඩලයේ සාමාජිකයන්ට කියනවා, මහ බැංකුවේ ස්වාධීනත්වය රකින්න කියලා. එහෙම කළොත් තමයි රට තුළ ආයෝජනය කරන්න ආයෝජකයන් තුළ විශ්වාසයක් ඇති වෙන්නේ.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුමිත් උඩුකුඹුර මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.24]

**ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල්තබන අවස්ථාවේ ඉදිරිපත් කළ 2020 වසරේ මහ බැංකු වාර්තාව පිළිබඳ යෝජනාවට අදාළ විවාදය පැවැත්වෙන මේ මොහොතේ මටත් අදහස් දක්වන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා.

විපක්ෂය අදහස් දක්වද්දී මට මතක් වුණේ ප්‍රදීපා ධර්මදාස මහත්මිය ගායනා කරන ගීතයක කොටසක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක තමයි, "තෙපි නොවේද, පව්කාරයිනි..." කියන පද පේළිය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ ම්ලේච්ඡ දේශපාලන ඉතිහාසයක් තිබෙන, අපේ රටේ ආර්ථිකය මුළුමනින්ම විනාශ කළ එක්සත් ජාතික පක්ෂය තුළින් බිහි වුණු සමගි ජන බලවේගයත්, ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණ තුළින් බිහි වුණු ජාතික ජන බලවේගයත් අද අපේ ආණ්ඩුවට නොයෙක් චෝදනා එල්ල කරමින් අදහස් දැක්වූවා. ඒ පක්ෂවල සාමාජිකයන්ට සදාචාරාත්මක අයිතියක් නැහැ, අපේ ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරන්න. අපේ රටේ පරමාදර්ශී නායකයා වන මහින්ද රාජපක්ෂ මැතිතුමා තිස් වසරක සාපලත් යුද්ධය අවසන් කරලා, අපේ රටට සාමය උදා කර දීලා, මේ රටේ යෝධ සංවර්ධන පෙරළියක් ඇති කරලා, අපේ රට දවසින් දවස දියුණු වෙන රටක් බවට පරිවර්තනය කරලා, ආසියාවේ චීනයට පමණක් දෙවැනි ආර්ථිකයක් එක්කයි 2015 වසර වනවිට මේ රට යහ පාලන ආණ්ඩුව යැයි කියා ගත් අයට භාර දුන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යහ පාලනය ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරනවා කියලා, මේ රටේ වංචාව, හොරකම, දූෂණය අවසන් කරනවා කියලා මේ රටේ ජනතාව රවටා බලය අරගෙන මාස තුනක් ගත වනවිට ලංකා ඉතිහාසයේ දැවැන්තම හොරකම ක්‍රියාත්මක කළා; මහ බැංකුව කොල්ල කෑවා. ඔවුන් එසේ මහ බැංකුව කොල්ල කෑවාම, වර්තමාන ආණ්ඩුවේ සිටින අපේ ඇමතිවරු එදා ඊට එරෙහිව සටන් කරද්දී, අද සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව ගෙනා අනුර කුමාර දිසානායක මහත්මයලා කළේ මොකක්ද? තමන්ගේ පක්ෂයේ නායකයා බොරැල්ල කනත්තට ගෙන ගොස් අමු අමුවේ පුච්චපු පක්ෂයත් එක්ක එතුමන්ලා හිරිකිතයක් නැතුව හිට ගත්තා; රනිල් වික්‍රමසිංහ මහත්මයා රැක්කා. හැබැයි, අද එතුමන්ලා මහ ලොකුවට කථා කරනවා. අද කිව්වා, "ආණ්ඩුවේ ඇමතිවරු බ්‍රෝකර්ලා" කියලා. මම මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී කියන්න කැමැතියි, අද දේශපාලනයේ ඉන්න අංක එකේ බ්‍රෝකර් අනුර කුමාර දිසානායක බව. එක්සත් ජාතික පක්ෂයත් එක්ක ආණ්ඩුව කරද්දී එක්සත් ජාතික පක්ෂය රැක්කේ කොහොමද කියලා අපි දැක්කා නේ. අදත් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා. වැඩිපුර මුදල් හම්බ වෙන පැත්තට තමයි කථා කරන්නේ.

අද අපේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කාබනික පොහොර ගොවිතැනට ජනතාව ඒක රාශි කරද්දී ඒ වැඩ පිළිවෙළත් කකුලෙන් අදිනවා. ඒ විධියේ හොඳ වැඩ පිළිවෙළක් කරන්න යද්දී ඔය වාගේ දේවල් තමයි කරන්නේ. පොහොර සමාගම් වෙනුවෙන් පෙනී සිටිනවා. අනුර දිසානායක මන්ත්‍රීතුමන්ලාගේ වැඩ පිළිවෙළ ගැන මේ රටේ ජනතාව දන්නවා. ඒක නිසා තමයි එතුමන්ලාට හිමි වෙලා තිබුණු පාර්ලිමේන්තු ආසන හය පසුගිය මහ මැතිවරණයේදී ආසන තුන දක්වා බැස්සුවේ. මේ රටට කරන විනාශය නිසා ඊළඟ මහ මැතිවරණයේදී ඒ ආසන තුන ආසන එක දක්වා අඩු වේවි කියලා අපි හිතනවා. එතුමන්ලා අද ලජ්ජා නැතුව ආර්ථිකය ගැන, බැංකු ගැන කථා කරනවා. එතුමන්ලාගේ පක්ෂය ඉතිහාසයේ මේ රටේ බැංකු හතළිහක් කොල්ල කෑවා; ජාතික සම්පත්, ජාතික දේපළ විනාශ කළා; ලංගම බස් 550ක් ගිනි තැබුවා. ඊළඟට, රටේ ආර්ථිකය විනාශ කළා; transformers ටිකට ගිනි තැබුවා; ගොවිජන සේවා මධ්‍යස්ථානවලට ගිනි තැබුවා; තැපැල් කන්තෝරුවලට ගිනි තැබුවා; කෝච්චිවලට ගිනි තැබුවා; පාර්ලිමේන්තුවටත් බෝම්බ ගැහුවා. ඒ දේපළ විනාශ කරන ගමන්, රාජ්‍ය සේවකයන් ඇතුළු මහ ජනතාව 6,500 දෙනෙක් මැරුවා. ඒ අය මැරුවේ ඉතාම අමානුෂික ලෙසයි. අපේ ස්වාමීන් වහන්සේලා තිස්නමක් මැරුවා; පූජකවරු මැරුවා; තරුණයෝ හැටදහසක් මරා දැම්මා. එහෙම ඉතිහාසයක් තිබෙන පක්ෂයක් තමයි අද ඉස්සරහට ඇවිල්ලා මහ ලොකුවට ගණන් හදලා කථා කරන්නේ.

[ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කථා කරපු ඒ අය තමයි පසුගිය යහ පාලන ආණ්ඩුව කළේ. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා බැසිල් රාජපක්ෂ මැතිතුමා එක්ක එකතු වෙලා චීනයට පමණක් දෙවැනි වන ලෙසට ඔසවා තැබූ අපේ රටේ ආර්ථික වර්ධන වේගය එතුමන්ලා පහළට වැට්ටුවා; රටේ ආර්ථිකය විනාශ කළා; අවසානයේදී රටේ ආර්ථිකය ඇෆ්ගනිස්ථානයට පමණක් ඉහළට ගෙනාවා. එහෙම තමයි ඒ අය රට කළේ. මේ රටේ හැම ක්ෂේත්‍රයක්ම කඩා වැටුණා. බදු පිට බදු ගැහුවා. පන්සලේ පිං කැටේටත් බදු ගැහුවා. එහෙම තමයි ඒ කට්ටිය ආර්ථිකය කළමනාකරණය කළේ. අවසානයේදී බෝම්බ පත්තුවෙලා, 300දෙනෙක් එක තැන මැරිලා, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යුගයට -අවුරුදු දහයකට- පසුව අපේ රටේ මිනිසුන්ට මර බිය දැනුණාට පසුවයි යහ පාලන ආණ්ඩුව අවසන් වුණේ. අපේ වාසනාවට අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපති ධුරයට පත් වුණා. එතුමා අද අපේ රටටත් බලපා තිබෙන මේ ගෝලීය කොවිඩ් වසංගතය නිසා ඇති වී තිබෙන තත්ත්වය හමුවේ හැම කටයුත්තක්ම ඉතාම නිවැරදිව කළමනාකරණය කරමින් සිටිනවා. මේ රටේ ජනතාව මරණයෙන් ගලවාගෙන එතුමා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරද්දී ඒකත් කකුලෙන් අදිනවා මේ අය. ගුරුවරුන්ගේ වැටුප් විෂමතාවක් ගැන කියමින් අද මේ මොකක්ද කරන්නේ? අහිංසක ගුරුවරු දෙසියයක් -තුන්සියයක් පාරට බැස්සාම, එතැනට ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් යවලා, පක්ෂවල සාමාජිකයන් යවලා කොරෝනා වයිරසය බෝ කරන්න හදනවා. ඒක තමයි ඇත්ත කථාව. කොරෝනා වයිරසය බෝ කරලා මිනිස්සු මරන්න හදනවා. මිනිස්සු මැරුණාම ඒ මිනිය මතින් දේශපාලනය කරන්නයි විපක්ෂය හදන්නේ.

අපි රටේ ජනතාවට ආදරෙයි නම්, මේ රටේ මිනිසුන්ගේ ජීවිතවලට ආදරෙයි නම් මේ කොවිඩ් වසංගතයෙන් ජනතාව බේරා ගන්න අපි හැමෝම මේ මොහොතේ සාමූහිකව එකතු වෙන්න ඕනෑ. හැබැයි, විපක්ෂය ඒ කාර්ය භාරය නොවෙයි කරන්නේ; අද මේ රටේ අපි හැමෝම මුහුණ දීලා තිබෙන කොවිඩ් වසංගතයෙන් ජනතාව බේරා ගන්න එකතු වෙන එක නොවෙයි ඒ අය කරන්නේ. අපේ ජීවිත කාලය තුළ අපි දැක්ක භයානකම ව්‍යසනය මේ කොවිඩ් ව්‍යසනයයි. අපේ ජීවිත කාලය තුළ අපි මීට කලින් මේ වාගේ වසංගත රෝගයකට මුහුණ දීලා නැහැ. මේ රෝගයෙන් අද ලෝකයේ රටවල ජනතාව දහස් ගණනින් මැරෙනවා. අපි විපක්ෂයෙන් ඉල්ලනවා, බොරුවට මාධ්‍ය සංදර්ශන පවත්වන්න එපා කියලා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ ගෙන යන වැඩ පිළිවෙළට ඔබතුමන්ලා උදවු කරන්න.

අද ලෝකයේ වේගයෙන්ම එන්නත්කරණය සිදුකරන රටක් හැටියට ශ්‍රී ලංකාව නම් වෙලා තිබෙනවා. මුලින්ම මේ අය කිව්වා අපේ ආණ්ඩුවට එන්නත ගෙනෙන්න බැහැ කියලා. දැන් එන්නත ජනතාවට ලබා දීලා අපි නිවැරදි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරද්දී ඒකට උදවු කරන්නේත් නැහැ, කකුලෙන් අදිනවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත්, මහින්ද රාජපක්ෂ අපේ අග්‍රාමාත්‍යතුමාත්, අපේ ආණ්ඩුවත් මේ ගෝලීය කොවිඩ් වසංගතය හමුවේ ජනතාවගේ සංවර්ධන අවශ්‍යතා එකක්වත් පස්සට දමලා නැහැ. ඒක තමයි වෙනස. ඒකට තමයි මේ කට්ටිය ඊර්ෂ්‍යා කරන්නේ. අද රටේ අධිවේගී මාර්ග හැදෙනවා; ගුවන් පාලම් හැදෙනවා; ගමේ බෝක්කු, පාලම් හැදෙනවා; ජාතික පාසල් දහසක් නිර්මාණය වෙනවා.

උපාධිය ගත් දරුවෝ යහ පාලන ආණ්ඩුව කාලයේ එම ආණ්ඩුවෙන් බැට කමින් සිටියේ. අපේ ආණ්ඩුව ඒ දරුවන් 60,000කට රැකියා ලබා දුන්නා. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට අපොස සාමාන්‍ය පෙළ අසමත්, අපේ ගම්වල සිටින අහිංසක, දුප්පත් දෙමව්පියන්ගේ දරුවන් ලක්ෂයක් සඳහා අපි රැකියා නිර්මාණය කළා. දැන් එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා. බදු ප්‍රතිශත අඩු කරලා මේ රටේ වැටිලා තිබුණු ව්‍යාපාරික ක්ෂේත්‍රය අපි නඟා සිටුවුවා. බදු අඩු කරලා ජනතාවට අවශ්‍ය හයිය දුන්නා. ඒ වාගේම, ණය පොලී අනුපාත අඩු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරද්දී විපක්ෂය ඉතාම පහත්, කුහක දේශපාලනයක් තමයි ක්‍රියාත්මක කරන්නේ. අපි ඉතාම වගකීමෙන් මේ කාරණය කියනවා. අපේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශය භාර ගෙන සිටින බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත් මේ කොවිඩ් වසංගතය අවසන් කරලා අපේ රට ඉතාම ශක්තිමත් ලෙස දියුණු කරමින් ලෝකයේ තිබෙන ප්‍රබල රාජ්‍යයක් බවට පත් කරනවා. ඒ පණිවුඩය ලබා දෙමින්, මට කාලය ලබා දුන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Velu Kumar. You have seven minutes.

[අ.භා. 3.32]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින පැවැත්වෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ 2020 වාර්ෂික වාර්තාව පිළිබඳ විවාදයේදී මට පෙර මේ විවාදයට එක් වූ ගරු මන්ත්‍රීතුමාට මම විශේෂයන්ම කිව යුතු කාරණයක් තිබෙනවා. මෙම විවාදයට එක් වෙමින් ඉතා නිහතමානීව කරුණු ඉදිරිපත් කරන බව කියපු එතුමාට මම මෙන්න මේ කාරණය මතක් කරන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයට ආවේ මහ බැංකුව කොල්ල කාපු හොරු ටික අල්ලා ගන්නවා කියමින්. මෙච්චර කාලයක් මහ බැංකු කොල්ලයේ හොරු ටිකට නිදැල්ලේ සිටීමට ඉඩ හැරලා ඔබතුමන්ලා මොනවාද කරන්නේ කියන කාරණය මතක් කරගන්න. දෙවැනි කාරණය මෙයයි. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා- [බාධා කිරීමක්] ඔබතුමන්ලාට සීනි වංචාව අමතකද? සීනි වංචාවෙන් සිදු වුණු පාඩුව රුපියල් බිලියන 15කට වැඩියි. ඒකත් මතක් කරගන්න. ඒකත් මතක තබාගෙන ඔබතුමා කරුණු ඉදිරිපත් කළා නම් හොඳයි.

අද මේ විවාදයේදී 2019 අවුරුද්දෙන් පසුව, එනම් 2020-2021 කාල පරිච්ඡේදයට අදාළව අහන්න අපට ප්‍රශ්න කිපයක් තිබෙනවා. ඇමතිවරු ආණ්ඩු පක්ෂයේ ඉඳලා අපෙන් අහනවා, විපක්ෂය යෝජනා කරන ආර්ථික ක්‍රමය මොකක්ද කියලා. ඒකම තමයි අපිත් ආණ්ඩුවෙන් අහන්නේ. මේ ආණ්ඩුව දැනට අනුගමනය කරගෙන යන ආර්ථික ප්‍රතිපත්තිය මොකක්ද, මුදල් ප්‍රතිපත්තිය -Monetary Policy එක - මොකක්ද කියන ප්‍රශ්නය තමයි අපටත් අහන්න වෙලා තිබෙන්නේ. ආණ්ඩුව විටෙක කියනවා, "අපි ආනයන ටික නතර කරනවා, දේශීය නිෂ්පාදන වැඩි කරනවා" කියලා. ඒක හොඳයි. දැන් ආනයන ටික නතර කරලා තිබෙනවා. දේශීය නිෂ්පාදන වැඩි කරනවා නම්, එම දේශීය නිෂ්පාදන වැඩි කරන්නට අරගෙන තිබෙන පියවර මොකක්ද? රසායනික පොහොර ආනයනය නතර කරලා තිබෙනවා. කෘෂි කර්මාන්තයට අවශ්‍ය අනෙකුත් රසායනික ද්‍රව්‍ය ටික ආනයනය නතර කර තිබෙනවා. ඒ වාගේම වාහන, යන්ත්‍ර සූත්‍ර - industrial goods - ගෙන්වන්න බැහැ. ඒවා ආනයනයත්

නතර කර තිබෙනවා. ඒ අනුව, රටේ ආනයනයත් නතර කර තිබෙනවා. රටේ නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ වුණත් නිෂ්පාදන සිදු කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ ටික ලබා ගන්නත් බැහැ; ඒවා ලබා දෙන්නේත් නැහැ. එහෙම නම් ප්‍රතිපත්ති එකකට එකක් ගැටෙන තත්ත්වයක් තිබෙන්නේ. ඒ හින්දා ඔබතුමන්ලාට වත් තේරෙනවාද, මේ තිබෙන ආර්ථික ක්‍රමය මොකක්ද කියලා?

අපි දන්නවා, මේ ආර්ථිකයේ විශාල කඩා වැටීමක් තිබෙන බව. එම කඩා වැටීම තුළ විශේෂයෙන්ම රට විශාල ණය උගුලක හිර වෙලා තිබෙන බව අපි කියන්න ඕනෑ. අපි දන්නවා, 2020 වසරේ විතරක් රුපියල් ට්‍රිලියන 2කට ආසන්න ණය ප්‍රමාණයක් අරගෙන තිබෙන බව. 2021 වසරේ රුපියල් ට්‍රිලියන 2ක, ට්‍රිලියන 3ක ණය ප්‍රමාණයක් ලබා ගන්න ඕනෑ. ඩොලර් බිලියන 3ක්ව තිබුණු සංචිතවලට ඊයේ පෙරේදා වන කොට මොකක්ද වුණේ කියලා අපි දන්නවා. ඒකෙන් Sovereign Bonds වලට තවත් බිලියනයක් ගෙවපු ගමන් මොකද වුණේ? දැන් රජය කියනවා, "අපි වෙලාවට ගෙවීම් කළා. ඒවා හරි" කියලා. හම්බ කරලාද ගෙවලා තිබෙන්නේ? දැනට තිබෙන මුදලින් ගෙවලා තිබෙනවා. විදේශ සංචිතවලත් ඩොලර් බිලියන 2කට වඩා අඩු ප්‍රමාණයක් තමයි දැන් තිබෙන්නේ. මේ ආර්ථික ක්‍රමය මොකක්ද? මේ ආර්ථිකය තුළ ක්‍රියාත්මක කරන මුදල් ප්‍රතිපත්තිය මොකක්ද? දිගින් දිගටම සල්ලි අච්චු ගහන එකද ආණ්ඩුවේ Monetary Policy එක? මොකක්ද මේ ක්‍රමය?

මේ ආණ්ඩුවේ ඉන්න, මේ ආර්ථිකය කළමනාකරණය කරන, ආර්ථිකය ඉදිරියට ගෙන යන ආර්ථික විශේෂඥයන් ඒක ගැන කියන්න ඕනෑ. අපෙන් අහන්න ඉස්සෙල්ලා ඔබතුමන්ලා දැනට කරන දේ කියන්න. අපේ ආණ්ඩුවක් ආවාම අපි ආර්ථිකය හරියාකාරව කළමනාකරණය කරන බව මම කියනවා. අද ඩොලර් ප්‍රශ්නයක් තිබෙනවා. මේ ඔක්කෝටම හේතුව ඒකයි. නමුත්, ආණ්ඩුව දැන් කොළය වහලා ගහන්නේ. දැන් ආනයනය නතර කර තිබන්නේ, රසායනික පොහොර ටික ගෙන්වන එක නතර කර තිබෙන්නේ, මේ රටට අවශ්‍ය භාණ්ඩ ටික ගෙනෙන්නේ නැතුව තිබෙන්නේ ආණ්ඩුවට තිබෙන ඩොලර් ප්‍රශ්නය නිසායි. ආණ්ඩුවට මේ ඩොලර් ප්‍රශ්නය විසඳාගන්න බැහැ. මහ බැංකුව අද වන කොට ඩොලරයක exchange rate එක ලෙස රුපියල් 200කට ආසන්න ගණනක් කියනවා. ඒ වුණාට, අප සාමාන්‍යයෙන් ගිහින් බැලුවාම, ඩොලරයේ අගය රුපියල් 225යි, 230යි. ඒ වාගේම, ව්‍යාපාරිකයන් ගත්තොත්, import order එකක් place කරලා, දවස් ගණනක් ඉන්න ඕනෑ. ඩොලර් ටික දැන් හොයනවා. සල්ලි ටික බැඳලා ඩොලර් ටික හොයාගන්න සති ගණනක් ඉන්න වෙනවා. මේ අර්බුදයට ආණ්ඩුවට තියෙන විසඳුම මොකක්ද කියන එක මේ ආණ්ඩුව මේ රටට හෙළිදරව් කරන්න ඕනෑ. මේ ණය උගුලෙන් එළියට එන්නේ කොහොමද? මේ ඩොලර් ප්‍රශ්නය විසඳා ගන්නේ කොහොමද? ඒකට තිබෙන ක්‍රමය මොකක්ද?

අපි දන්නවා, දැන් භාණ්ඩ ආනයනය කරන්නේ නැති බව. අපේ රටේ කෘෂිකර්මය කඩා වැටිලා තිබෙනවා. හාල් ටික නිෂ්පාදනය කර ගන්න, එළවලු ටික නිෂ්පාදනය කර ගන්න, පලතුරු ටික නිෂ්පාදනය කර ගන්න තියෙන අවස්ථා ඔක්කොම දැන් කඩාකප්පල් වෙලා තිබෙන්නේ. එහෙම නම්, ඉතුරු මාස හය තුළ මේ රටේ කෑම බීම සපයා ගැනීම සම්බන්ධයෙන් ඇති වන තත්ත්වය මොකක්ද කියන ප්‍රශ්නයට උත්තරයක් මේ රජය ලබා දෙන්න ඕනෑ.

අද අපේ රට තුළ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා තිබෙන්නේ. ළමයින් තමන්ගේ online අධ්‍යාපනය ලබා ගන්නට විඳින දුක අපි ඔක්කෝම දකිනවා. ඒ ප්‍රශ්නය වාගේම, ගුරුවරුන්ගේ ප්‍රශ්නයත් අද අපි දකිනවා. අද උදේ මේ ගරු සභාවේදී වාර්තා වුණු පරිදි ගුරුවරුන්ගේ පඩිය කිසිසේත්ම වැඩි කරලා දෙන්නට බැහැ කියා රජය කියනවා. මම කියනවා, ඒක ඉතාම අසාධාරණ ප්‍රකාශයක් කියලා. ගුරුවරුන්ගේ ඉල්ලීම සාධාරණ ඉල්ලීමක්. තමන්ගේ සාධාරණ අයිතීන් ඉල්ලා ගුරුවරුන් පාරට බැස්සාම රජය කියනවා, "ඔන්න කොවිඩ් පොකුරක් හදනවා" කියලා. ඒ වුණාට රජය නම් දිගින් දිගටම උත්සව කරනවා. ඒවායෙන් කොවිඩ් පොකුරු හැදෙන්නේ නැද්ද? රජය උත්සව පවත්වනවා. ඒකට නම් ප්‍රශ්නයක් නැහැ. නමුත්, ගුරුවරුන් තමන්ගේ අයිතිවාසිකම් ඉල්ලුවොත්, තමන්ගේ පඩිය වැඩි කරලා ඉල්ලුවොත්, තමන් කරන වෘත්තියට අවශ්‍ය දේ ඉල්ලුවොත් "කොවිඩ් - 19 ආසාදනය වෙනවා. කොවිඩ් පොකුරක් හැදෙනවා" කියනවා.

මම රජයට විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. අද ගුරු සේවයට බැඳුණු අයෙකුට -ගුරු සේවයේ 3 පන්තියේ II ශ්‍රේණියට බැඳුණු අයෙකුට- රුපියල් 29,240ක් තරම් සොච්චමක් තමයි මාසික පඩිය හැටියට හම්බ වෙන්නේ. ග්‍රාමීය ප්‍රදේශ, ඒ වාගේම වතු ප්‍රදේශ ගත්තාම, පාසල් තිබෙන්නේ දුර ඈත බව අපි දන්නවා. ඒ ප්‍රදේශවලට public transport නැහැ. එතකොට ගුරුවරුන්ට ත්‍රිවිලර් එකක් අරගෙන යන්න වෙනවා. එතකොට දවසකට ගමන් වියදම රුපියල් 500යි, 750යි. ඒ නිසා මාසය යන කොට තමන්ගේ පඩියෙන් භාගයක්ම -අඩක්ම- ඉවර වෙලායි තිබෙන්නේ. ඉතින්, ගුරුවරු ජීවත් වෙන්නේ කොහොමද, තමන්ගේ වෘත්තිය කරගෙන යන්නේ කොහොමද? ඒ හින්දා අපි කියනවා, ගුරුවරුන්ගේ මේ ඉල්ලීම ඉතාම සාධාරණ එකක් බව.

පසු ගිය යහ පාලන ආණ්ඩුව කාලයේ අපි දිගින් දිගටම පඩි වැඩි කිරීම කළා. රජය කොවිඩ් පොකුරු හැදෙනවා කියලා මහ හරින්නේ නැතුව අපේ රටේ දූ දරුවන්ගේ අනාගතය ඉදිරියට ගෙන යන ගුරුවරුන්ට අවශ්‍ය පඩි වැඩි කිරීම කරන්න ඕනෑ, ගුරුවරුන්ගේ ඒ අවශ්‍යතාව ඉටු කර දෙන්න ඕනෑ කියා ගුරුවරුන්ගේ පැත්තේ ඉඳලා අපි කියනවා. එහෙම නැත්නම්, මේ ආර්ථිකය කළමනාකරණය කරන්නට බැහැ, ආර්ථිකය ඉදිරියට ගෙන යන්නට බැහැ කියන එක රජය පිළිගන්න ඕනෑ. අනාගතයේ අපේ රට භාර ගන්න සිටින දූ දරුවන්ගේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම කඩාකප්පල් වී ගෙන යන්නේ. මේකට උත්තරයක් හොයා ගන්න බැරි නම් මේ රජයට තිබෙන හැකියාව මොකක්ද කියා අපට ප්‍රශ්න කරන්න වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, you have exceeded your time. Please wind up now.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

Okay, Sir.

ගුරුවරුන් වෙත දොස් පවරන්නේ නැතුව ගුරුවරුන්ගේ ඉල්ලීම ඉටු කරන එක රජයේ වගකීම. ඒ ඉල්ලීම ඉටු කරන ලෙස මම ඉල්ලා සිටිනවා. එහෙම බැරි නම්, මේ ආර්ථිකයේ ඇත්තම තත්ත්වය මේ රටට හෙළි කරන්න, තමන්ට බැහැ කියන එක ඔප්පු කරන්න කියලා මම කියනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.40]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2020 වර්ෂයේ මහ බැංකු වාර්තාව පිළිබඳ සාකච්ඡා කරන මේ අවස්ථාවේ අදහස් දැක්වීමට ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම මට පෙර කථා කළ මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායම ගුරු වැටුප් සම්බන්ධයෙන් කිඹුල් කඳුළු හෙළන්න පටන් ගෙන තිබෙනවා. "අවුරුදු 24ක් තිස්සේ විසඳුණේ නැති ප්‍රශ්නයක් වෙනුවෙන් තමයි අපි මේ පාරට බැහැලා ඉන්නේ" කියා ඒ උද්ඝෝෂණය කරන ගුරුවරුන් කියනවා නම්, කිඹුල් කඳුළු හෙළන විපක්ෂයෙන් අපි ඉතා පැහැදිලිව අහන්න ඕනෑ, තමුන්නාන්සේලා ආණ්ඩුව කරපු අවුරුදු 5 තුළ මෙම ප්‍රශ්නය විසඳන්න බැරි වුණේ ඇයි කියලා. ඔය කියන විධියේ ශක්තිමත් ආර්ථිකයක් තිබුණා නම්, ඒ ආර්ථිකය හරහා මේ රටේ මහ ජනතාව තුළට අවශ්‍ය මුදල් ප්‍රමාණය ගලා යන ක්‍රමවේද හදලා තිබුණා නම්, ණය ගන්නේ නැතිව රට දියුණු කරලා තිබුණා නම්, රාජ්‍ය සම්පත් ටික විකුණන්නේ නැතිව ආණ්ඩුවට ආයෝජනය කරලා තිබුණා නම් මේ ප්‍රශ්න මතු වෙන්නේ නැහැ. එතුමන්ලාගේ කටින්ම අද එය කියන එක හොඳයි. ඒ නිසා ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, මේක පිටුපස දේශපාලන හස්තයක් තිබෙනවාය කියන එක.

ඊළඟට, එතුමන්ලාම පිළිගන්න එක හොඳයි, මේ ඇති වෙලා තිබෙන ගුරුවරුන්ගේ උද්ඝෝෂණ මාලාව තුළින් මේ රටේ කොවිඩ්-19 ව්‍යාප්තිය ශීඝ්‍රව පැතිරෙනවා කියන එක. මෙන්න මේ කාරණාව පිළිබඳව අවධානය යොමු කිරීම තමයි අද රජයක් හැටියට කරලා තිබෙන්නේ. කොවිඩ්-19 පාලනය සම්බන්ධයෙන් වෙනත් රටවල් එක්ක බලද්දී, ලෝකයේ ඉදිරියෙන්ම සිටින රටක් බවට ශ්‍රී ලංකාව පත් කිරීමේ ගෞරවය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට හිමි වෙන්න ඕනෑ. එතුමාගේ දූරදර්ශී වැඩ පිළිවෙළ තුළ සහ සැලසුම් සහගත වැඩ පිළිවෙළ තුළ තමයි එන්නත්කරණයේදී අද ලෝකයේ දියුණු රටවලට වඩා ඉදිරියෙන් අපට ඉන්න පුළුවන් වෙලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! Will an Hon. Member propose the Hon. Velu Kumar to the Chair?

**ගරු සී.බී. රත්නායක මහතා (වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க - வனசீவராசிகள் மற்றும் வனப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Wildlife and Forest Conservation)

Sir, I propose that the Hon. Velu Kumar do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සංජීව එදිරිමාන්න මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SANJEEVA EDIRIMANNA *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද එන්නත්කරණය සාර්ථකව සිදු වෙනවා. මේ ඉල්ලීම් පිළිබඳව එන්නත්කරණය පටන් ගන්න ඉස්සෙල්ලා කථා කළේ නැහැ. එන්නත්කරණය පටන් ගන්නකම් ඇහුවේ, "කෝ එන්නත, කෝ එන්නත, කෝ එන්නත." කියලායි. ලෝකයේ තිබෙන සමහර එන්නත් අපේ රටේ අනුමත වෙලා නැතිව තිබියදී, අපේ රටේ ජනතාවට එම එන්නත් ලබා දෙන්න කියලා මේ විපක්ෂය ආණ්ඩුවට බලපෑම් කරන ආකාරය අපි දැක්කා. මේ රටේ එන්නත්කරණය සම්බන්ධයෙනුත්, කොවිඩ්-19 ව්‍යාප්තිය පාලනය කිරීම සම්බන්ධයෙනුත්, මුළු ලෝකයේම රටවල් අතරින් ශක්තිමත් රට බවටත්, ශක්තිමත් ආර්ථිකයක් වෙනුවෙන් විවෘත වන රට බවටත් ශ්‍රී ලංකාව පත්වීමේ ගෞරවය ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට ඉතාම නුදුරේදී හිමි වෙනවාය කියන කාරණාව ඉතා පැහැදිලිව අපි කියන්න ඕනෑ.

මූලාසනයට ගිය නිසා ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාට උත්තර දෙන්න බැහැ. හැබැයි, අපි ඔබතුමා කියපු කාරණා ටික අහගෙන හිටියා. ඔබතුමා ඇතුළු ඒ කණ්ඩායමෙන් අපි අහන්නේ මෙයයි. මේ රටේ ජනතාව සෞඛ්‍ය ආරක්ෂිතව ජීවත් වෙනවාට ඔබතුමන්ලා භය ඇයි? මේ රටේ ජනතාවට යහපත් දිවි පෙවෙතක් ගෙවන්න ඔබතුමන්ලා ඉඩ ලබා දෙන්නේ නැත්තේ ඇයි? මේ රටේ ආර්ථිකය බිඳවැටීම ආරම්භ වන්නේ COVID-19 වසංගතයත් එක්ක නොවෙයි.

මේ රටේ ආර්ථිකයේ ශක්තිමත්ම යුගය මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ යුගයේ තිබුණා වාගේම, මේ රටේ දුර්වලම ආර්ථිකයක් පැවැති යුගය බවට පත්වෙලා තිබුණේ ඔබතුමන්ලා ප්‍රමුඛ යහ පාලන ආණ්ඩු කාලය කියන එකත් අපි ඉතා පැහැදිලිව කියන්න ඕනෑ. ඒ නිසා ඔබතුමන්ලා අද එන්නත්කරණය වෙනුවෙන් කරන්න පුළුවන් සියලු බාධා කරනවා. ලෝකයේ වෙන කිසිම රටක එන්නත්කරණය හෝ සෞඛ්‍ය හේතූන් මත ඉල්ලීම් කරනවා ඇරෙන්න, වෙන කිසිම රටක මේ ආකාරයේ අසාධාරණ විධියට එක කොටසකගේ අයිතිවාසිකම් දිනා ගැනීමේ මුවාවෙන් දේශපාලන මුහුණුවරක් දීලා මුළු රටක්, සමස්ත ජනතාවක් අඳුරේ දමන ඔබතුමන්ලා වාගේ කණ්ඩායමක් අපි දැකලා නැහැ. මේ ප්‍රශ්නයට අපි විසඳුමක් ගෙනෙනවා. ඒක ඉතා පැහැදිලියි. මේ වන විට ජනාධිපතිතුමා, අගමැතිතුමා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය, ගරු බැසිල් රාජපක්ෂ මුදල් ඇමතිතුමා ප්‍රමුඛ රජය මේ ප්‍රශ්නයට විසඳුමක් ගෙනෙනවාය කියන පොරොන්දුව ලබා දීලා ඉවරයි. හැබැයි, ඔබතුමන්ලාගේ පරමාර්ථය මේ ප්‍රශ්නයට විසඳුම නොවෙයි. මේ ප්‍රශ්නයට විසඳුම දුන්නත්, ඔබතුමන්ලා කොවිඩ්-19 ව්‍යාප්තිය වේගවත් කරන්න තවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා, ගරු මන්ත්‍රීතුමා. ඒ නිසා කිඹුල් කඳුළු හෙළන්න එපා. ඔබතුමන්ලාගේ කාලයේ කළ යුතු යුතුකම් කොටස ඉටු කරන්නේ නැතිව, මේ අභියෝගාත්මක කාලයේ මේ රටේ පාලනය සම්බන්ධයෙන් ඔබතුමන්ලා විවේචනය කිරීම සාධාරණ නැහැ කියන එක අපි කියන්න ඕනෑ. ඔබතුමන්ලා කියනවා, මේ රටේ ආනයන සීමා කරලා, අපනයන වැඩි කරලා, දේශීය ආර්ථිකයක් ගැන කථා කරන්නේ අපට ගෙවීම් කරන්න ඩොලර්වල හිඟයක් තිබෙන නිසා කියලා. හැබැයි

මතක තියා ගන්න, මේ රටේ ආනයන සීමා කරන්න තීන්දු කළේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ජනාධිපතිවරණ අපේක්ෂකයා හැටියට ඉදිරිපත් වෙන මොහොතේ එතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළින් බව. ඒ නිසා ඔබතුමන්ලා කියනවා නම් මේ ආනයන සීමා කරලා අපනයනය වැඩි කරන්න ආණ්ඩුව පියවර ගන්නේ ඩොලර් හිඟයක් තිබෙන නිසා කියලා, ඒ ඩොලර් හිඟයේ වගකීම ඔබතුමන්ලා බාර ගන්න ඕනෑ. ඒ වාගේ පහත් විධියේ දේශපාලනයක් කරන්න එපා. අපේ රට දේශීය වශයෙන් වාගේම ආර්ථිකමය වශයෙනුත් ශක්තිමත් වෙන්න ඕනෑ.

අපි ඒ පියවර නොගෙන තිබුණා නම්, අද රටේ ඇතිවන තත්ත්වය මොකක්ද? අප ඇතුළු ලෝකයේ අනෙකුත් රටවල් සියල්ල මේ කොවිඩ්-19 වසංගතයට ගොදුරුවෙලා තිබෙනවා. මේ රටේ ජනතාව අද ජීවත්වෙලා ඉන්නේ ඔබතුමන්ලාට විරුද්ධව එදා ගෝඨාභය රාජපක්ෂ මහතාට ඡන්දය දුන් නිසායි. ඒ ගැන ඔබතුමන්ලා සතුටු වෙන්න. එතුමා එදා ජනාධිපතිවරණය ජයග්‍රහණය කළ නිසා තමයි අද මේ රටේ ජනතාව විශ්වසනීයත්වයක් එක්ක ජීවත්වෙලා ඉන්නේ. එදාවේල සපයා ගැනීමේදී අසීරුකම් තිබුණු කාලයක් මේ රටේ තිබුණා. හැබැයි, මේ COVID-19 වසංගතය ඇවිල්ලා රටම lock down කරලා තියෙද්දි, ඊට පසු සංචරණ සීමා ගෙනැල්ලා තියෙද්දි අපි ආණ්ඩුවක් හැටියට අභිංසක ජනතාව අමතක කළේ නැහැ. අපි ඔවුන්ට කෘෂි කර්මාන්තය කර ගෙන යන්න ඉඩ කඩ දුන්නා, අපි කර්මාන්ත ක්ෂේත්‍රයට ඉඩ කඩ දුන්නා, අපනයන ක්ෂේත්‍රයේ වැඩ කටයුතු කර ගෙන යන්න ඉඩ කඩ දුන්නා, නිෂ්පාදනයට ඉඩ කඩ දුන්නා. ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා කිව්වා, අද නිෂ්පාදන ක්‍රියාවලිය අඩපණ වෙලා තිබෙනවා නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ගේන්න බැරි නිසා කියලා. මම ඔබතුමන්ලාට අභියෝග කරනවා, අමුද්‍රව්‍ය හිඟය නිසා නිෂ්පාදන ක්ෂේත්‍රය අඩපණ වෙලා තිබෙන්නේ කොතැනද කියලා පුළුවන් නම් කියන්න කියලා. ඒ කාලයේ හොරකම් කරලා භාණ්ඩ ගෙනාවා, වැරදි HS Codes දමා භාණ්ඩ ගෙනාවා, රේගුව හරහා හරි පාරේ එන්නේ නැතිව රේගුවට පිටින් භාණ්ඩ ආවා. මෙන්න මේවා සියල්ල අපි නැවැත්වුවා. ඒ හොරකම් ටික නැවැත්වීම ගැන, හොර මාර්ගයෙන් අපේ රටට කුඩු ගෙන ඒම වැළැක්වීම ගැන, බදු නොගෙවා කරන ආනයන නැවැත්වීම ගැන සමහර විට අද විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන්ට රිදිලා ඇති. අපි දන්නවා, එතුමන්ලා ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට මේ හොර පාරවල් ගොඩක් හදාගෙන තිබුණු බව. ඒ නිසා අපට ඒ හොර පාරෙන් බඩු ගෙනාපු කණ්ඩායම ආරක්ෂා කිරීමේ වගකීමක් නැහැ. අපට තිබෙන්නේ මේ රටේ නිෂ්පාදනය වැඩි කිරීමේ වගකීම. අන්න ඒ වෙනුවෙන් අපි ගත් සෑම තීන්දුවක් වෙනුවෙන්ම අපි පෙනී සිටිනවාය කියන එක කියන්න ඕනෑ. ඒ නිසා ජනතාව තුළ බොරු භයක් ඇති කරන්න එපා.

අපට රටේ ණය ගෙවන්න බැහැයි කියලා ඔබතුමන්ලා අවුරුද්දක් තිස්සේ කිව්වා. ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරු, ඔබතුමන්ලාගේ පක්ෂයට සම්බන්ධ කණ්ඩායම් ගිහිල්ලා විදෙස් තානාපතිවරු හම්බ වුණා. ඔවුන් හම්බ වුණාම මොකක්ද කිව්වේ? රට බංකොලොත් වෙලා නැවත ණය ගෙවා ගන්න විධියක් නැහැ, රටේ ව්‍යාපාරයක් කර ගන්න බැහැ, ජීවත් වන්න බැහැ, කියලා ඔබතුමන්ලා බොරු බේගල් අතහැරියා. අවසානයේදී මොකක්ද වුණේ? පසුගිය දවස්වල බැඳුම්කර වෙනුවෙන් ගෙවන්න තිබුණු ඩොලර් බිලියනය අපට ගෙවා ගන්න බැරි වෙයි කියලා ඔබතුමන්ලා පුදුමාකාර සතුටකින් සිටියේ. නමුත්, අද ඔබතුමන්ලාගේ ඒ සියුම් සතුට බිඳ වැටී තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලාට ලොකු කනගාටුවක් ඇති.

අපි ආර්ථිකමය වශයෙන් තීන්දු රාශියක් ගත්තා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වුණු වහාම එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව අපි බදු අඩු කිරීම කළා. අපි VAT එක සියයට 8ට අඩු කළා. ආදායම් බදු ප්‍රතිශතය අඩු කළා. ආදායම් බද්දෙන් නිදහස් වන සීමාව අපි රුපියල් මිලියන 3 දක්වා අරගෙන ගියා. ඒ අරගෙන ගියේ වෙන දෙයක් නිසා නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම ගෙන ගිය නිසා තමයි අදටත් මේ රටේ ආර්ථිකය මේ මට්ටමින් හරි පවතින්නේ. ඔබතුමන්ලා අකමැත්තෙන් වුණත් ඒක පිළිගන්න. අද මේ රටේ ආර්ථිකය මේ තත්ත්වයෙන් හරි පවතින්නේ අමාරුම කාලය තුළ එදා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ගත් තීන්දුව නිසායි. එතුමාගේ තීන්දුව වුණේ මොකක්ද? මහා භාණ්ඩාගාරය ජනතාව අතේ තිබෙන හැම සතයම එකතු කරනවා වෙනුවට ඒ මුදල් ජනතාව තුළම -සමාජය තුළ, ආර්ථිකය තුළ- සැරිසරන්න ඉඩ දුන්නා. ඒ ඉඩ දීමේ ප්‍රතිඵලය නිසා තමයි අද මේ තරමින් හෝ ආර්ථිකය මේ මට්ටමට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපි බදු අඩු කළේ සැලැස්මක් නැතුව නොවෙයි. අපි බදු අඩු කළේ සැලැස්මක් ඇතුව. හැබැයි, අපි බදු අඩු කළේ කොවිඩ් වසංගත තත්ත්වයට පෙර. අපි බදු අඩු කළේ සැලැස්මක් ඇතුව ක්‍රියාත්මක වූ නිසායි.

අද අපි දකිනවා, මහ බැංකු වාර්තාව පිළිබඳව කථා කරන්න පටන් ගෙන තිබෙන අය ඔවුන්ගේ ආර්ථිකයේ ඇති වූ පසුබෑම ගැන අමතක කර තිබෙන බව. ඔබතුමන්ලා කියනවා, ඒ ශක්තිමත් ආර්ථිකයට හිමිකම් කියන්නේ යහ පාලන ආණ්ඩුව කියලා. අපි කියනවා, ඒක දුර්වලම ආර්ථිකය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික වර්ධන වේගය අතින් අපි දෙවෙනි වුණේ ඇෆ්ඝනිස්තානයට විතරයි. තව ටිකෙන් අපි ඇෆ්ඝනිස්තානයටත් වඩා පහළට වැටෙනවා. සියයට 7ක්ව තිබුණු ආර්ථික වර්ධන වේගය සියයට 2ට කඩා වට්ටපු කණ්ඩායමක් අද ආර්ථික කළමනාකරණය ගැන කථා කරනවා. මහ බැංකුව කොල්ල කෑම විතරක් නොවෙයි, පාස්කු ඉරිදා ප්‍රහාරය විතරක් නොවෙයි ආර්ථිකයට බලපෑම් ඇති කළේ.

ඊළඟට එම්සීසී ගිවිසුම. මේ ඔබතුමන්ලා කියපු දේවල්. එක් පැත්තකින් මහ බැංකු බැඳුම්කර වංචාව සිදු වුණා, ඔබතුමන්ලා බලයට ඇවිල්ලා මාස තුනක් ගත වනකොට. පළමුවැනි බැඳුම්කර වංචාව සිදු කරලා, ඒකෙන් උපයා ගත් ලාභයෙන් මැතිවරණයක් පවත්වලා, ජයග්‍රහණය කළා. ඒ සඳහා චෝදනා ලබපු අය සම්බන්ධයෙන් අද අධිකරණමය කටයුතු සිදු වනවා. පාස්කු ප්‍රහාරය සිදු වුණා. ඒ නිසා සමස්ත ආර්ථිකයම කඩා වැටුණා. ඒකේ වූදිතයන්ට කිසිම බලපෑමක් නැතිව අද අධිකරණ කටයුතු සිදු වනවා.

ඔබතුමන්ලා කිව්වා අපට එන්නත්කරණය සිදු කරන්න සල්ලි නැහැ, ලෝකයේ අනික් රටවල් රජයක් හැටියට අපට උදවු කරන්නේ නැහැ කියලා. නමුත් අද වන විට එන්නත්කරණය සාර්ථකව සිදු වෙනවා. අපි සල්ලිවලටත් එන්නත් ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම අනෙක් රටවලින් ප්‍රදාන වශයෙනුත් අපට එන්නත් ලැබිලා තිබෙනවා. ඔබතුමන්ලා කිව්වා චීනය විතරයි අපට උදවු කරන්න ඉන්නේ කියලා. හැබැයි, ලෝකයේ අනෙක් ප්‍රබල රටවල් අපට මේ කොවිඩ් - 19 වසංගත තත්ත්වය තුළ උදවු කරලා තිබෙනවා. ඔබතුමන්ලාගේ ප්‍රාර්ථනය වුණේ, කිසි රටකින් අපට උදවු නොලැබේවා කියන එකයි.

MCC ගිවිසුම අපි අවලංගු කළා. ඔබතුමන්ලා MCC ගිවිසුම අත්සන් කරලා තිබුණා නම්, අද ඇතිවෙන තත්ත්වය ගැන අපට හිතා ගන්න පුළුවන්. එදා අපට මේ රටේ තුනෙන් එකක ඉඩම් අයිතිය -වෙරළ- එල්ටීටීඊ ත්‍රස්තවාදය නිසා නැති වුණා. ඒ වාගේම, ඔබතුමන්ලාගේ MCC ගිවිසුම නිසා අහිමි වෙන්නට ගිය තුනෙන් එකක ඉඩම් අයිතියත් අපි වළක්වා ගත්තා. ඔබතුමන්ලා වරායේ නැඟෙනහිර පර්යන්තය විකුණන්න හැදුවා. නමුත් අපි ඒක නවත්වා ගත්තා. ඔබතුමන්ලා හම්බන්තොට වරාය වික්කා.

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

ඒකෙන් ලැබුණු ආදායමක් නැහැ. හම්බන්තොට වරාය විකිණීමෙන් ලැබුණු වාසිය මොකක්ද? මේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ වගකීම අපි භාරගෙන තිබෙනවා. අපි ජනතාවට සුරක්ෂිතව ජීවත් විය හැකි රටක් නිර්මාණය කරලා, ඔවුන්ට යහපත් අනාගතයක් ඇති කරනවා කියන කාරණය ඉතා පැහැදිලිව මතක් කරමින් මම නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்ததாக, கௌரவ க. வி. விக்னேஸ்வரன் அவர்கள். உங்களுக்கு 7 நிமிடங்கள் இருக்கின்றன.

[3.53 p.m.]

**ගරු සී.වී. විග්නේෂ්වරන් මහතා**
(மாண்புமிகு க.வி. விக்னேஸ்வரன்)
(The Hon. C.V. Wigneswaran)
Hon. Presiding Member, it is with a heavy heart that I rise to speak on the Annual Report of the Central Bank - 2020.

We are at the threshold of erasing our unblemished record with regard to debt repayment. If we default on any loan, it is likely to trigger cross-default across all our loans. That, as you can imagine, Sir, would be an unmitigated disaster. All our debtors would want us to settle our full liabilities immediately. Our cost of borrowing would increase beyond measure. We simply would not be able to borrow any more. Unless we become a vassal State to a country such as China, we simply would not be able to exist. We are bringing out gold coins to celebrate the 100th Anniversary of the Chinese Communist Party. Already many institutions have only Chinese name boards, not English, not Tamil, not even Sinhala. So, perhaps, preparation is already afoot to make us a distant province of China in anticipation of where we are heading. Have we forgotten what this means in terms of geopolitics? Do we want to cut off our nose to spite the face?

One particularly troubling matter is our inability to meet our recurring expenditure through Government revenues. The taxation policy that was introduced in 2020 significantly reduced Government revenue in terms of taxation. While this was no doubt beneficial to the ordinary citizen, the cost of living that has burst through the roof has more than offset any benefit from the changed policy in taxation. The result is that the Government coffers remain constantly under pressure with no economic growth. So, the problem is, we cannot even generate enough revenue to meet our loan obligations and effect the payment of salaries. This means that the Government cannot even maintain the *status quo* without resorting to further borrowing. Not only have we been caught in the debt trap, but it looks like we do not even want to get out of it, talking only politics to get one over on each other.

Recently, the Hon. Keheliya Rambukwella told the press that the Sri Lankan Government has paid US Dollar 1 billion as loan repayment or maybe, as bond repayment. He was proud of it. But, he has forgotten to tell us as to when the balance US Dollars 34 billion would be paid.

Be that as it may, I am told that Letters of Credit have been refused to certain institutions due to paucity of dollars. Our reserves have gone down to perilous levels. We may not be able to import petrol or diesel. I think it was the Hon. (Dr.) Wijeyananda Dahanayake who came to Parliament by bullock cart long ago when petrol prices went up. That was due to a price hike. But, the present situation is much worse. There will be neither petrol nor diesel even if you could afford to buy them.

We have been printing paper money recently at levels previously unheard of, setting daily, weekly and monthly records. Our currency is being propped up by artificial and extralegal means. The writing is on the wall and we are blissfully engaged in petty politics even in respect of the most vulnerable groups. Where have we brought our citizens to? We are prepared to play the fiddle like Nero while the flames of hunger, debt and despair ravage our fellow citizens.

The fertilizer imports were stopped saying that we must go for organic fertilizers locally, a noble idea, no doubt. But, such stoppage was not to save the people from chemical fertilizers; it was to save our dollars that the decision was taken, but like everything else, packaged in nationalist terms. Where is the scientific basis for such a decision? Which institution recommended such decision in such drastic terms to the Government? Which is the government organization that recommended such a dramatic shift overnight without any transitional period? Were studies conducted? Were projections made on the yields that would be expected with the introduction of the decision not to import chemical fertilizers? I am given to understand that the Government is considering importing rice from countries which use the same chemical fertilizers. That means, the Government stopped the import of chemical fertilizers not due to their concerns towards its citizens, but due to paucity of dollars. In any event, what steps have the Government taken to ensure a free flow of organic fertilizers? Would it not take at least three to four years for the earth to get used to organic fertilizers after using inorganic fertilizers for so long? Meanwhile, will production not come down drastically?

At the very least, is it not possible for this Government to tell its citizens the truth? Must everything be viewed through the lens of politics even at this perilous juncture in history? If I may refer to the situation in the Northern Province, the stoppage of fertilizer imports is going to have a long-term negative effect on our economy. Our Provincial GDP contribution in 2019 was only 4.7 per cent. So many years of war has had a deleterious effect on our economy. Added to that, the continuation of occupation of the Northern Province by the military has had a negative effect on our performance. Adding to the farmers' woes, the military is doing agriculture in the North and the East. This affects the

locals since the military is able to produce agricultural products cheaply with the several benefits they enjoy while the farmers find it difficult to produce and market their goods. In any event, no proper planning has been done to find markets for our local produce. I hope the new Minister of Agriculture would take effective steps for the farmers in the North to market their goods. The Northern economy is almost in a stagnant state. Hon. Minister Mahindananda Aluthgamage, who speaks our language too - he speaks Tamil - will no doubt help to alleviate the precarious state into which our farmers have fallen.

I have, time and again, advised my Sinhala Friends on both sides of the Parliament that they should take us, the Tamils, into confidence, solve our problems and invite investments from our diaspora. Our brethren abroad, including our Sinhalese brethren, would gladly bring in enough foreign currency to tide over the calamitous situation we are in. But, our Sinhala politicians are like the moths wanting to run into the burning light and burn themselves out. They are prepared to trust the Chinese, but not the Tamils.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු සී.වී. විග්නේෂ්වරන් මහතා**
(மாண்புமிகு க.வி. விக்னேஸ்வரன்)
(The Hon. C.V. Wigneswaran)
I am winding up, Sir.

Let me again appeal to the saner sections of our Sri Lankan Sinhala Buddhist intelligentsia to consider closing ranks with the Tamils and the Muslims and allow copious flow of capital into the country to tide over the serious foreign exchange problem we are facing today. This is the time to come together to save this country.

Thank you.

[අ.භා. 4.00]

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද උදෑසන ඉඳලා 1949 අංක 58 දරන මූල්‍ය නීති පනතේ 35 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය ඉදිරිපත් කරපු 71 වැනි වාර්ෂික වාර්තාව පිළිබඳව කරුණු සාකච්ඡා කරමින් හිටියා. හැබැයි අවාසනාවකට ඒ පිළිබඳ කථා කරන එක පැත්තකින් තියලා, අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ගමේ හිටපු හේරත් වාගේ පුළුවන් කාලයේ කාලා බීලා හොඳට ඉඳලා බැරි වනකොට සිල් ගන්නවා වාගේ කටයුතු කළ ආකාරය අපි දැක්කා. එතුමන්ලා වක්කඩේ හකුරු හංගලා, හකුරු හොයන්න පටන් ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ගෝලීය වසංගතයට මුහුණ දෙන්න අවශ්‍ය ප්‍රතිපත්තිමය කාරණා පිළිබඳව ගෞරවනීය සභාවේ වාද විවාදවලට මැදිහත් වීමයි කරන්නේ. නමුත් අවාසනාවකට අතීතකාමයෙන් පෙළෙන, මට දුන්නොත් නුඹට වඩා හොඳට කරන්න පුළුවන් කියලා හිතන කණ්ඩායමක් එක්ක එවැනි බුද්ධිමය වාද විවාදවලට සම්බන්ධ වෙන්න බැරි බවයි අපට වැටහුණේ. ලෝක ආර්ථිකය පසුගිය වසර දෙකක කාල සීමාව තුළ හැකිළෙමින් පවතිනවා අපි දැක්කා. අපට පෙනෙනවා, ලෝකයේ සමහර දියුණුම රටවල් මුළුමනින්ම වසා දමා තිබෙන බව. ඒ රටවල ආර්ථිකය අපේ ආර්ථිකය වාගේ සිය ගුණයක් විශාලයි. නමුත් අවාසනාවකට නිවැරදි ප්‍රතිපත්ති, තීන්දු තීරණ ගැනීමට නොහැකි වීමේ ප්‍රතිඵලයක් විධියට ඒ ආර්ථික එක තැන පල්වෙන තැනකට අද පත්වෙලා. ඒ නිසා අපට සිද්ධ වුණා, කුඩා ආර්ථිකයක් සහිත රටක් විධියට කිසියම් ආකාරයක ආරක්ෂිත ප්‍රතිපත්තියකට ගමන් කරන්න. ඒ නිසා ආනයන සීමා කිරීම්, අපනයන ධෛර්යවත් කිරීම්, රජය වෙළඳපොළ වෙත මැදිහත් වන ප්‍රමාණය වැඩි කිරීම් වාගේ විවිධ ක්‍රියාමාර්ග අපට ගන්න සිද්ධ වුණා, අවම වශයෙන් පවත්නා තත්ත්වයෙන්වත් ආර්ථිකය පවත්වාගෙන යන්න.

තමුන්නාන්සේලාට අමතක වෙච්ච තව කාරණයක් මතක් කරන්න කැමැතියි. ඒ තමයි අපි මේ ගෙවා දමමින් සිටින්නේ මෑත ඉතිහාසයේ ලෝක ආර්ථිකය මුහුණ දෙන දරුණුතම ආර්ථික ව්‍යසනයට කියන කාරණය. වෙන දා භාණ්ඩ මිල ඉහළ යෑම සහ සේවා වියුක්තිය පිළිබඳව අපි කථා කළා. නමුත් අපට පෙනෙනවා, අද සැපයුම පැත්තෙන් විශාල අර්බුදයක් තිබෙනවාය කියන කාරණය. ඒ නිසා ලෝකයේ බොහොමයක් රටවල් විවිධාකාර ආරක්ෂිත ප්‍රතිපත්ති වෙත ගමන් කරනවා. ශ්‍රී ලංකාව කුඩා රාජ්‍යයක්. අපි දන්නවා, අපි මිල නිර්මාණය කරන්නෙක් නොවන බව. Sri Lanka is not a price-maker; Sri Lanka is still a price-taker. ඒ නිසා අපි අනුගමනය කරන ප්‍රතිපත්ති රාමුව පිළිබඳ නිවැරදි අවබෝධයක් මේ ගෞරවනීය සභාවේ සැම දෙනා තුළම තිබිය යුතුයි. අපි කවර නම් වූ ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් තුළට ගමන් කළ යුතු ද කියන කාරණය තමයි මෙහිදී සාකච්ඡාවට ගත යුත්තේ. අපි දන්නවා, නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව පෙරට වඩා අපට දැනිලා තිබෙන බව. ආහාර සුරක්ෂිතතාව සඳහා වන ඉලක්කයට අපි ළඟා විය යුතු වෙනවා. අපි ඇති තරම් ආහාර නිෂ්පාදනය කරපු නිසා, අපට එවැනි හැකියාවක් තිබුණු නිසා තමයි අපට පුළුවන්කම ලැබුණේ හාමතේ කෙනෙක් හෝ මිය යන එක වළක්වන්න. මේ කාලසීමාව තුළ කිසිදු කෙනෙක් හාමතේ මිය ගියේ නැහැ; කුසගින්නේ මිය ගියේ නැහැ. ඒ නිසා ආණ්ඩුව කෘෂිකර්මාන්ත අංශය, දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා වන වැඩ පිළිවෙළ තෝරාගෙන හමාරයි. ඒ වාගේම අපට සිද්ධ වෙලා තිබෙනවා, සේවා ආර්ථිකය දිහා නැවත වාරයක් සැලකිල්ලෙන් බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට විදේශ විනිමය උපයා ගන්න තිබුණු ප්‍රධාන මාර්ගයක් තමයි සංචාරක ව්‍යාපාරය. ඇමෙරිකානු ඩොලර් බිලියන 5කට ආසන්න මුදලක් අපට ඒ හරහා ලබා ගන්න පුළුවන්කම ලැබුණා. අද මෙරටට විතරක් නොවෙයි, සංචාරකයෝ පැමිණෙන්නේ නැත්තේ. මුළු ලෝකයේම සංචාරක ව්‍යාපාරය අද අඩපණ වෙලා. සංචාරක කර්මාන්තයේ නිරත අය රුපියල් බිලියන තුන්සිය හැටපහක් රාජ්‍ය සහ පෞද්ගලික බැංකුවලට ගෙවන්න තිබෙනවා. කර්මාන්තය තිබෙන තැන තියාගන්න මසකට රුපියල් බිලියන තිහක් වියදම් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා රට විවෘත වූ වහාම සංචාරක කර්මාන්තය පණ ගැන්වී එනතුරු සංචාරක කර්මාන්තය ගැන අපට ලොකු බලාපොරොත්තුවක් තියාගන්න පුළුවන්කමක් නැහැ. විදේශිකයන් මෙරටට පැමිණෙන්නේ නැහැ වාගේම තමයි යම් යම් සීමාකම් නිසා දේශීය සංචාරකයන්ටත් පුළුවන්කමක් ලැබුණේ නැහැ, ආදායම් උත්පාදන මාර්ගයක් අපට සකස් කරලා දීලා සංචාරක කර්මාන්තය ප්‍රයෝජනයට ගන්න. ඒ නිසා තමයි අතිගරු ජනාධිපතිතුමා තීන්දු කළේ, "තමුන්නාන්සේලා එකඟ වෙන්න, අපට මේ වසංගතයෙන් එළියට

[ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා]

එන්න පුළුවන් එකම මාර්ගය මේ රටේ සෑම පුරවැසියෙකුම එන්නත්කරණයට භාජන කරන්න ඕනෑ" කියලා. තමුන්නාන්සේලා මහ පාරට මිනිස්සු ගෙනැල්ලා මේ ව්‍යායාමය වළක්වන්න උත්සාහ කරනවා. මේවාට කියන්නේ කුමන්ත්‍රණ කියලා. තමුන්නාන්සේලා 2015 කුමන්ත්‍රණය කරලා රට ගමන් කරපු මාර්ගය වෙනස් කළා. තමුන්නාන්සේලා පිළිගන්න, කවදා හෝ දවසක ඉතිහාසය ලියනකොට තමුන්නාන්සේලා හැමෝගේම නම් ලියාවි කියලා. අවුරුදු 3300ක ඉතිහාසයේ කුමන්ත්‍රණකරුවන් විධියට තමුන්නාන්සේලා හඳුනා ගනීවි. ඒ නිසා ආර්ථිකය නවීනත්වයට ගෙන යන්න, ආර්ථිකය නවීකරණය කරන්න මේ ගෞරවනීය සභාවට ප්‍රතිපත්තිමය කාරණා පිළිබඳ මීට වඩා වැඩි අවධානයක් යොමු කරන්න තිබෙනවා. අපටත් කියන්න පුළුවන් අපි තමයි හොඳටම කළේ කියලා. තමුන්නාන්සේලා හොඳටම කළා නම්, අපට හම්බ වුණේ හපයක් වෙන්නේ කොහොමද? තමුන්නාන්සේලා හොඳට කරපු ආකාරය ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ සඳහන් වෙනවා.

තමුන්නාන්සේලාට විදේශ සෘජු ආයෝජන කොච්චර ගෙනෙන්න පුළුවන්කමක් ලැබුණාද? තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ අවසාන මාස 14 තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන හතරහමාරක් මාස 18කින් ගෙවන්න ගත්ත බව තමුන්නාන්සේලා අමතක කරලා තිබෙන්නේ. ඒ නිසා තමුන්නාන්සේලා මෙරටේ ආර්ථිකය ගෙන යන්න පුළුවන් නරකම තැනට අරගෙන ගිහිල්ලා අද කියනවා, "අපට පුළුවන්කම තිබුණා, ඊට වඩා හොඳට කරන්න" කියලා. අපි භාර දෙනකොට තිබුණ රට, නැවත අපට භාර දෙනකොට හතරෙන් එකකට පහළට ගෙනැල්ලා තිබුණේ. ඒ නිසා ඉතා වගකීමෙන් යුතුව අපේ ආණ්ඩුව මූල්‍ය සහ පිස්කල් ප්‍රතිපත්තිය හසුරුවමින් ඉන්නවා. අපි ඕනෑ කෙනෙකුට විවේචන කරන්න පුළුවන්. මේවා පෞද්ගලික විවේචන නොවෙයි. අපි මේ අවස්ථාවේදී ශ්‍රී ලංකා මහ බැංකුවට ඒ ගෞරවය දෙන්න ඕනෑ. ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ප්‍රතිපත්ති හැසිරවීමේ දී සුවිශේෂී මැදිහත්වීමක් කළා. අවස්ථා ගණනාවක දී ආණ්ඩුවේ බැංකුව විධියට මහ බැංකුව මැදිහත් වෙලා ආර්ථිකය තුළ කිසියම් ස්ථාවරත්වයක් ගොඩනැඟීම සඳහා විශේෂ මැදිහත්වීමක් කළාය කියන එක අපි මේ අවස්ථාවේදී ගෞරවයෙන් සිහිපත් කළ යුතු වෙනවා. ඒ වාගේම තමයි පිස්කල් ප්‍රතිපත්තිය හැසිරවීමේ වගකීම තිබෙන්නේත් මුදල් අමාත්‍යාංශයටයි, මහා භාණ්ඩාගාරයටයි. අපට පෙනෙනවා නිවැරදි දිශාවට ගමන් කිරීම සඳහා වන ප්‍රතිපත්ති, තීන්දු හා තීරණ ගනිමින් ඉන්න බව. අපේ මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා දීර්ඝ වෙලාවක් වැඩ කරන ඇමතිවරයෙක් බව දන්නවා. එතුමා මේ සඳහා වන කැපවීම ඕනෑවටත් වඩා ඉහළින් මේ අවස්ථාවේ පෙන්නුම් කරලා තිබෙනවා. ඒ නිසා කලබල වෙන්න එපා. තව මාස කිහිපයක් යනකොට එන්නත්කරණ ක්‍රියාවලිය මුළුමනින් ම අවසන් වෙයි. තමුන්නාන්සේලා පාරේ බැහැලා උද්ඝෝෂණය කළොත් මහජනතාව ඒකට පාඩම් උගන්වයි. ඒ නිසා තමුන්නාන්සේලාට දැන් තිබෙන ප්‍රශ්නය තමයි, "අපි හොයා ගන්නා අලුත් සටන් පාඨය මොකක්ද" කියන එක.

ගුරුවරුන් පිළිබඳ දැන් බොහොම කනගාටුවෙන් කථා කරනවා. මමත් අවුරුදු 28ක් ගුරුවරයකු විධියට විශ්වවිද්‍යාලවල උගන්වපු කෙනෙක්. ඔව්, අපටත් ගුරුවරු පිළිබඳ කනස්සල්ලක් තිබෙනවා. අපිත් එතුමන්ලාගේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය පිළිබඳ සැලකිලිමත් වෙනවා. හැබැයි, මේක විශේෂ අවස්ථාවක්. ලෝකය ආර්ථිකය අර්බුදයක ඉන්නේ. ආර්ථිකය කිසියම් ආකාරයක අර්බුදයකට ගමන් කරමිනුයි තිබුණේ. පුළුවන්කමක් නැහැ රුපියල් බිලියන 56ක් මේ අවස්ථාවේ මේකට වියදම් කරන්න. මේක අවුරුදු දෙකක, තුනක වගකීමක් නොවෙයි. අවුරුදු 50ක, අවුරුදු 60ක වගකීමක්. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පැවැති කාලයේ දී මේ ප්‍රශ්නය තමුන්නාන්සේලාට විසඳන්න පුළුවන්කම තිබුණා. හැබැයි, අපි විසඳුම් සොයමින් ඉන්නවා. අපි මේ පිළිබඳ වෘත්තීය සමිති සමඟ කථා කරනවා. මේ ආණ්ඩුව විවෘතව කටයුතු කරන ආණ්ඩුවක්. මේ අවස්ථාව වනකොටත් උසස් අධ්‍යාපන අමාත්‍යතුමා අධ්‍යාපන අමාත්‍යාංශයේ දී මේ පිළිබඳව සාකච්ඡා කරමින් ඉන්නවා. ඒ නිසා තමුන්නාන්සේලා කිඹුල් කඳුළු හෙලන්න එපා. තමුන්නාන්සේලා ආර්ථිකය ගොඩනඟන්න ආණ්ඩුවට උදව් කරනවා කියන්නේ, උදේ 10.00 වෙනකොට පාර්ලිමේන්තුවට ඇවිල්ලා දවල්ට කාලා ගෙදර යන එක නොවෙයි. ඊට වඩා ලොකු වගකීමක් තිබෙනවා. කියන්න, කොයි දිශාවට ද ආර්ථිකය අරගෙන යන්න ඕනෑ. කවර උපායමාර්ග ද ඒ වෙනුවෙන් අනුගමනය කරන්න ඕනෑ. උදේ ඉඳලා කරපු ඔක්කෝම කථාවල කිව්වේ, අතීතකාමයට අදාළ දේවල්. "අපි කොල්ලෝ කාලයේ කරපු දේවල් මෙන්න මේවා" යි කිව්වා. තමුන්නාන්සේලා අපේ ගමේ හිටපු හේරත් මාමා වාගේ හැසිරෙන්න එපා. ඒ වෙනුවට ප්‍රතිපත්ති සංවාදයකට සහභාගී වෙන්න කියලා අපි ආරාධනා කරනවා. එවැනි ප්‍රතිපත්ති සංවාදයට සහභාගි වුණොත්, මේ රටේ මහජනතාව තමුන්නාන්සේලා ගෙදර යවන එකක් නැහැ. ලබන පාර මැතිවරණයේදී තමුන්නාන්සේලාට නැවත පාර්ලිමේන්තුවට එන්න පුළුවන්කම ලැබේවි.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[අ.භා. 4.09]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වේලාවේ රටේ පවතින ආර්ථික තත්ත්වය පිළිබඳ ප්‍රශ්නයට ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මහජන නියෝජිතයන්, -මැති ඇමතිවරුන්- මොන ආකාරයෙන් සුදු හුණු ගාන්න උත්සාහ කළත්, 2019 ජනාධිපතිවරණයෙන් පසු අවුරුදු දෙකක් මේ ආණ්ඩුව ක්‍රියා කරපු ආකාරය නිසායි අද මෙවැනි ආර්ථික අර්බුදයකට පත්වෙලා තිබෙන්නේ කියන කාරණය අපි පිළිගන්නට ඕනෑ.

2019 ජනාධිපතිවරණයෙන් පසු බලයට ඇවිල්ලා තමුන්නාන්සේලා මුලින්ම තමන්ගේ අත් බැඳ ගත්තා. ඒ තමයි, රජයට එන ආදායම් සියල්ල බදු අඩුකිරීම් තුළින් අහිමි කර ගැනීම. බදු අඩු කළාට අපි විරෝධය පානවා කියන එක නොවෙයි ඒකෙන් කියන්නේ. බදු අඩු කිරීමේ වාසිය සාමාන්‍ය ජනතාවට ලැබුණා නම් අපි හැමෝම සතුටු වෙනවා. නමුත්, ඒ බදු අඩු කිරීමේ වාසිය සාමාන්‍ය ජනතාවට ලැබුණේ නැහැ. සාමාන්‍ය ජනතාවට අවශ්‍ය භාණ්ඩ හෝ සේවාවල මිල ගණන් අඩු වුණේ නැහැ. නමුත්, මහා පරිමාණ ව්‍යාපාරවලින් රජයට ගෙවන බදු විශාල වශයෙන් අඩු වීම තුළ, තමන්ගේ හිත මිතුරන්ට ඒ බදු අඩු කිරීමේ වාසිය උපරිම වශයෙන් ලැබුණා. ඒ වාසිය සාමාන්‍ය ජනතාවට ලැබුණා නම් අපට හිත හදා ගන්න පුළුවන්. අඩු ගණනේ මේ රටේ දුප්පත් ජනතාවට හෝ ඒ වාසිය ලබා දුන්නා නම් අපට මේ ආණ්ඩුව කෙරෙහි ධනාත්මකව හිතන්න තිබුණා.

අපට දැන් රටක් හැටියට විශාල අර්බුදයකට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. රටේ ජනාධිපතිතුමාත් වීරයෙක් වාගේ කියන්නේ "අපි ණය ගෙව්වා" කියලායි. බලන්න කෝ මේ රට ආර්ථික වශයෙන් කුමන තැනකට වැටිලා තිබෙනවා ද කියලා? ඩොලර් බිලියනයක් ණය ගෙව්වා කියන කාරණය ට්විටර් ගිණුමේ, අනෙකුත් social mediaවල කියන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. යහ පාලන ආණ්ඩුව කාලයේ කෝටි-ප්‍රකෝටි

ගණන්, ඩොලර් බිලියන ගණන් ණය ගෙවලා ඇති. ඒ වුණාට එය මහා ලොකු වීර ක්‍රියාවක් හැටියට පිළිබිඹු කරලා නැහැ. අද ණය ගෙවන එක විශාල ජයග්‍රහණයක් හැටියට පෙන්නන්න උත්සාහ කරනවා.

ඒ විතරක් නොවෙයි. ආණ්ඩු පක්ෂයේ අමාත්‍යවරු කියනවා, "මේ කොරෝනා වසංගත තත්ත්වයේදී වුණත් අපි පඩි අඩු කළේ නැහැ" කියලා. දෙයි හාමුදුරුවනේ! දැන් මේ ආණ්ඩුව ඇවිල්ලා තිබෙන්නේ පඩි අඩු කරන එක නතර කරන්නද? පඩි අඩු කරන එක නතර කරන එක ගැන හිතලා නොවෙයි, මේ ආණ්ඩුව පත් කළේ. මේ ආණ්ඩුව පත් කරනකොට මේ රටේ ජනතාව, රජයේ සේවකයන්, විශ්‍රාමිකයන් හිතුවේ අපේ යහ පාලන ආණ්ඩුවට වඩා වැඩි දෙයක් මේ ආණ්ඩුවෙන් ලබා ගන්න පුළුවන් වෙයි කියලායි. අපි දන්නවා, මේ කොරෝනා වසංගතයත් එක්ක මේ රටට විතරක් නොවෙයි, ලෝකයටම අර්බුද රැසකට මුහුණ දෙන්න සිදු වුණු බව. නමුත්, මේ අර්බුද විසඳීමේ කටයුතු හොඳින් කළමනාකරණය කළා නම් අද අපට මේ වාගේ තත්ත්වයකට මුහුණ දෙන්න වෙන්නේ නැහැ.

අද මේ රට මුහුණ පා තිබෙන ලොකුම ආර්ථික ගැටලුව මොකක්ද කියලා අපි දන්නවා. මේ රටේ අඩුම ආදායම්ලාභී කොටසට ජීවත් වීමට පවා අපහසු තත්ත්වයක් අද උද්ගතව තිබෙනවා. මේ කොරෝනා වසංගතය නිසා රජය සංචරණ සීමා පනවමින්, lock down කිරීම් කළා. විශේෂයෙන් පසුගිය lockdown එකේදී අන්ත අසරණ තත්ත්වයට පත් වුණේ, දෛනිකව වැටුප් ගෙවමින් පවත්වාගෙන ගිය සුළු ව්‍යාපාරයි. සේවකයන් 1,000ක්, 2,000ක් වැඩ කරන කර්මාන්තශාලා ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන ගියා. නමුත්, සංචරණ සීමා තිබුණා. සංචරණ සීමා ඒ ආකාරයෙන් තිබියදීත් කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව අඩු වුණේ ඉතා සුළු ප්‍රමාණයකින්. පැනවූ සංචරණ සීමා හරියාකාරව ක්‍රියාත්මක නොවුණු නිසා තමයි අද නැවතත් කොවිඩ් වසංගතය ඉතා දරුණු තත්ත්වයෙන් පැතිරී තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පවතින මේ අර්බුදය රජය කළමනාකරණය කරන්න ඕනෑ. නමුත්, දැන් විපක්ෂයට චෝදනා කරනවා, මේ රටේ ජනතාව මහ පාරට ගෙනැල්ලා තවත් කොවිඩ් පොකුරු ඇති කරනවා කියලා. මේ රටේ ජනතාව අපි කියූ පමණින් පාරට බහින්නේ නැහැ. කොවිඩ් වසංගතයෙන් සිදු වන මරණ පෙනී පෙනී, ජනතාව පාරට බහින්නේ රටේ අර්බුද තත්ත්වයක් තිබෙන නිසායි.

දැන් රට තුළ පොහොර පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. අපට ඇත්තටම දැන් ගැටලුවක් තිබෙනවා, මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ගැන. මොකද, මේ ආණ්ඩුවේ අද තිබෙන ප්‍රතිපත්තිය නොවෙයි, හෙට තිබෙන්නේ. එතුමන්ලා කිව්වා, "රසායනික පොහොර ගෙන්වන්නේම නැහැ" කියලා. හැබැයි, දැන් අපට දැන ගන්න ලැබී තිබෙනවා, රසායනික පොහොර ගෙන එන්න ගැසට් නිවේදන නිකුත් කර තිබෙන බව. එහි ඇත්ත තත්ත්වය මොකක්ද කියලාත් අපි මුදල් රාජ්‍ය අමාත්‍යතුමාගෙන් දැන ගන්න කැමැතියි.

අද අපේ රටේ ජනතාව නොයෙක් ආකාරයෙන් පීඩාවට පත් කර තිබෙනවා. අද ගුරුවරු උද්ඝෝෂණය කරනවා. ආණ්ඩු පක්ෂයේ අය අහනවා, ගුරුවරුන්ගේ වැටුප් ප්‍රශ්නයට අපේ යහ පාලන රජය කාලයේ විසඳුම් ලබා නොදුන්නේ ඇයි කියලා. අපි ගුරුවරු ඇතුළු රජයේ සේවකයන් සියලු දෙනාගේ මූලික වැටුපට රුපියල් 10,000ක් එකතු කරලා, ඒ අයගේ වැටුප සියයට 107කින් වැඩි කළා. මේ රටේ ඉතිහාසයේ කවදාකවත් ඒ වාගේ පඩි වැඩි වීමක් රජයේ සේවකයන්ට ලබා දුන්නේ නැහැ. අපි ඒ වැටුප් වැඩි කිරීම ගුරුවරුන්ට පමණක් සීමා කළේ නැහැ. සමස්ත රජයේ සේවකයන්ගේම වැටුප් වැඩි කළා. තමුන්නාන්සේලා දැන් කියනවා, "ගුරුවරුන්ගේ ඒ ඉල්ලීම් සාධාරණයි. ඒවාට එකඟයි" කියලා. ඔවුන්ගේ ඉල්ලීම් සාධාරණ නම්, ඒවාට එකඟ නම්, කරුණාකර ඒ ඉල්ලීම් ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කරන්න. රටේ ආර්ථිකයේ පවතින මේ අර්බුදය නිසා ඒ කටයුත්ත ඉටු කරන්න බැරි බව ඔබතුමන්ලා කියනවා. රටේ ආර්ථිකයේ අර්බුදයක් තිබෙනවා නම් නගර 100ක් අලංකරණය කරන්න බිලියන ගණනක් මුදල් වෙන් කරන්නේ කොහොමද? එහෙම නම් මාර්ග කාපට් කරන්න, අධිවේගී මාර්ග හදන්න රුපියල් කෝටි ප්‍රකෝටි ගණනක් මේ වෙලාවේ වැය කරන්නේ ඇයි? රටේ තිබෙන මේ ප්‍රශ්න ටික හඳුනාගෙන, ඒවාට විසඳුම් දෙන්න ඕනෑ නම් තමුන්නාන්සේලා අවංකව නිසි තීන්දු අරගන්න. එහෙම වුණොත්, මේ රටේ ජනතාව පාරට බහින්නේ නැහැ කියලා ප්‍රකාශ කරමින්, මම නවතිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.20]

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමා යහ පාලන රජය ගුරුවරුන්ගේ වැටුප සියයට 107කින් වැඩි කළා කියලා ඉතා දරුණු අසත්‍යයක් සමාජගත කරන්න උත්සාහ කළා. අපේ ගුරුවරු මේ කථාව අහගෙන ඉන්නවා නම්, මම ඒ අයට කියන්න ඕනෑ, මේ වාගේ මුසාවාද විපක්ෂයෙන් අපට අනන්තවත් ඇසෙන බව. විපක්ෂයේ මන්ත්‍රීවරු අහසට ගල් ගහනවා වාගේ කියන මෙවැනි කථාවල කෙළවරක් නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වේ, සියයට 107කින් රජයේ සේවකයන්ගේ වැටුප වැඩි කළා කියලායි.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ මේ අවලාද නැඟීම අඛණ්ඩව සිද්ධ වනවා.

අපේ රටේ ගුරු මව්වරුන් සහ ගුරු පියවරුන් අවුරුදු 24ක් තිස්සේ සාධාරණ ඉල්ලීමක් ඉදිරිපත් කළා. එය, අදටත් මේ රටේ පවතින සාකච්ඡාවක් බවට පත් වෙලා තිබෙනවා.

අපේ අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමා ඒ ප්‍රශ්නවලට විසඳුම් ලබා දීම වෙනුවෙන් වන යෝජනාවලියක් මේ ආණ්ඩුව බිහි කිරීමට පෙර අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයට ඇතුළත් කළා. ඒ අනුව, කාලයක් ලබාගෙන ඒ ප්‍රශ්න ක්‍රමානුකූලව විසඳීම සඳහා වන යෝජනාවලියක් ද පසු ගිය දා ආණ්ඩුව ඉදිරිපත් කළා. ඒ නිසා ගුරු මව්වරුන්, ගුරු පියවරුන් අද මේ කෑ ගහලා කියන කථාව පිළිබඳ සංවේදී වෙච්ච ආණ්ඩුව වර්තමාන ආණ්ඩුව බව අපි කියනවා. ඒ නිසා තමයි ඒ කාරණය අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයටත් ඇතුළත් කළේ. විපක්ෂය ඔය කියන තරමට පසු ගිය ආණ්ඩුව පඩි වැඩි කිරීම් කළා නම් අද මෙවැනි ප්‍රශ්නයක් නැහැ. මේ විපක්ෂය හැසිරෙන ආකාරය දිහා බලන කොට පෙනෙන්නේ, ඒ අය අද කථා කරන්නේ නින්දෙන් ඇහැ ඇරුණා වාගේ; මැරිලා ඉපදුණා වාගේ කියලායි. අද උදය වරුවේ ඉඳලා මහ බැංකු වාර්තාව පිළිබඳව එතුමන්ලා කථා කරන්නේ, එතුමන්ලා ආර්ථික

[ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා]

ඔස්තාර්ලා විධියට පසු ගිය ඉතිහාසයේ ක්‍රියා කළ ආකාරයටයි. නමුත්, මහ බැංකු වාර්තාව ප්‍රකාශ කරන ඇත්ත මොකක්ද?

අප 2014 වර්ෂයේ ආණ්ඩුව භාර දෙන කොට අපේ රටේ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන වේගය සියයට 5ක් ලෙසයි තිබුණේ. මෙතුමන්ලාගේ ආණ්ඩුව 2019 වර්ෂය වන කොට එය සියයට 2.3ට අඩු කළා. ඒ කාලයේ මේ වාගේ කොරෝනා වසංගතයක් තිබුණාද? ලෝකයේ පසු ගිය අවුරුදු 100 තුළම මේ වාගේ දරුණු වසංගතයක් තිබුණාද? මේ මහා ලොකු ආර්ථික ඔස්තාර්ලාට පුළුවන් වුණේ, එම සියයට 5 වර්ධන වේගය සියයට 2.3ට පල්ලම් බස්වන්නයි. මෙතුමන්ලාගේ ආණ්ඩුව කෘෂිකාර්මික අංශයේ වර්ධන වේගය සියයට 4.6 ඉඳලා සියයට 1ට බැස්වුවා; කාර්මික අංශයේ වර්ධනය සියයට 4.7 ඉඳලා සියයට 2.6ට බැස්වුවා; සේවා අංශයේ වර්ධනය සියයට 4.8 ඉඳලා සියයට 2.2ට බැස්වුවා. ආයෝජනය මනින්නේ දළ දේශීය නිෂ්පාදනයට අනුපාතිකවයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පසු ගිය ආණ්ඩුව එය සියයට 32.3 ඉඳලා සියයට 26.8ට බැස්වුවා; ජාතික ඉතුරුම් අනුපාතය සියයට 29.8 ඉඳලා සියයට 24.4ට බැස්වුවා; රුපියල් 130ට තිබුණු ඩොලරය 2019 වර්ෂය වන කොට රුපියල් 178.78ට නැංවුවා; රජයේ ණය බර දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 72.3 ඉඳලා සියයට 86.8ට නැංවුවා. එහෙම නම්, මේ ආර්ථික ඔස්තාර්ලා අද තමයි ඉපදිලා තිබෙන්නේ. පසු ගිය අවුරුදු පහේම මෙතුමන්ලා ජීවත් වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැට් බද්ද අඩු කරලා, ආදායම් බදු අඩු කරලා, බදු ප්‍රමාණ සහ බදු සීමා ප්‍රතිශත අඩු කරලා අපි උත්සාහ කළේ මොකටද? මේ රටේ ව්‍යාපාරිකයාට, නිෂ්පාදකයාට සහනයක් ලබා දීමට, ඒ හරහා සාමාන්‍ය මිනිසුන්ගේ බදු බර අඩු කිරීමට, භාණ්ඩවල මිල ගණන් අඩු කිරීමට තමයි අපි උත්සාහ කළේ. 2019 වර්ෂයේ වැට් බද්දෙන් රුපියල් බිලියන 443ක් ආණ්ඩුවට ලැබුණා. 2020 වර්ෂයේදී රුපියල් බිලියන 233 යි ලැබුණේ. 2019 වර්ෂයේදී ආදායම් බද්දෙන් රුපියල් බිලියන 427ක් ලැබුණා. 2020 වර්ෂයේදී රුපියල් බිලියන 268 යි ලැබුණේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! Will an Hon. Member propose the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam to the Chair.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - வர்த்தக அமைச்சர்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Trade)
Sir, I propose that the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON.VELU KUMAR *left the Chair, and* THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please continue with your speech.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජනතාව මේ ආණ්ඩුව කෙරෙහි අකලංක විශ්වාසයක් තැබුවා. රජය ආදායම් බදු අඩු කිරීම, වැට් බදු අඩු කිරීම, අනෙකුත් බදු ප්‍රතිශත අඩු කිරීම කළේ ඇයි කියා අපේ රටේ ජනතාවට අපි කියන්න ඕනෑ. සාමාන්‍ය ජනතාව පරිහරණය කරන බඩුවල මිල අඩු කරන්න නම්, බදු බර අඩු කරන්න නම් බදු ප්‍රතිශත අඩු කරන්න ඕනෑ. විපක්ෂයේ අය බදු පිළිබඳව අද උදේ කියපු දේවල්, ඒ වාගේම ඊයේ කියපු දේවල් අපි අහගෙන හිටියා. මේ රටේ ආදායම් මූලයන් පිළිබඳ කථා නොකරන විපක්ෂය අද කියන්නේ මොකක්ද? විශේෂයෙන් මට කලින් කථා කරපු මන්ත්‍රීවරයා ප්‍රමුඛ සමඟි ජන බලවේගය, ජනතා විමුක්ති පෙරමුණ, ඒ වාගේම එළියේ ඉන්න පෙරටුගාමීන් ඇතුළු සියලුදෙනා කියනවා, "බදු අය කරගන්න බැරි වෙච්ච අයගෙන් බදු අය කරගත්තා නම් මේ අවුරුද්දේ විතරක් රුපියල් බිලියන 105ක් ලැබෙනවා" කියලා. මම ජාගොඩ මැතිතුමාට කියනවා, අපේ රටේ පුනරාවර්තන වියදම විතරක් වර්ෂයකට සාමාන්‍යයෙන් රුපියල් බිලියන 2,500කට වඩා වැඩි ප්‍රමාණයක් වන බව. එය, රුපියල් බිලියන 2,548ක් ලෙසයි ශ්‍රී ලංකා මහ බැංකුවේ 2020 වාර්ෂික වාර්තාවේ සඳහන් කර තිබෙන්නේ. අපි කියනවා, රුපියල් බිලියන 105ක් වූ ඒ බදු මුදල අප අය කර ගත යුතු බව. ඒ සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ක්‍රියා කරනවා. නමුත් මම අහනවා, විපක්ෂය ආණ්ඩුවට කියන්නේ ආදායම් වැඩි කරගැනීම පිළිබඳ සාධාරණ උත්සාහයක් ගන්න කියන කථාවද කියලා. අය කර නොගත් බදු අය කර ගැනීමට, බදු නොගෙවන අය බදු දැලට හසු කර ගැනීමට, ඒ අයගෙන් බදු ලබා ගැනීමට නව මුදල් ඇමතිතුමා මුදල් පනතට අදාළ සංශෝධනයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්න ඕනෑ මේකයි. විපක්ෂය මේ මහ බැංකු වාර්තාවත් පාවිච්චි කරලා මොකක්ද කියන්නේ? ඔවුන් සාධාරණ විවේචනයක්ද මේ ඉදිරිපත් කරන්නේ? මේ අය නිතරම කරන්නේ තමන්ගේ හිතේ වෙන දෙයක් තබාගෙන වංචනික අදහසක් ඉදිරිපත් කරන එකයි. ඔවුන් කියන්නේ, මේ ආදායම් මූලයන් වර්ධනය කර ගැනීමට කිසිදු අවස්ථාවක් ලබා නොදෙන ආකාරයේ කථායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ තිබෙන්නේ, වර්ග කිලෝමීටර 65,610ක් පමණ වන භූමි ප්‍රමාණයක් බව අපි දන්නවා. මේ කුඩා භූමියේ ඉඳලා ලෝක ආර්ථිකය ජය ගන්නේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැනුම කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩ නඟන්න ඕනෑ. මේ රට ශික්ෂිත ශ්‍රම බලකායක් සිටින රටක්. මේ රටේ මිනිසුන්ගේ, දරුවන්ගේ අධ්‍යාපනික දැනුම හරහා ලෝක මට්ටමින් ආදායම් උපයා ගන්න අපට පුළුවන්. ඒ සඳහා අපට පෞද්ගලික විශ්වවිද්‍යාල සංකල්පයට යන්න වෙනවා. පෞද්ගලික විශ්වවිද්‍යාල එක්ක යන ගමනේදී අප උත්සාහ කරන්න ඕනෑ කුමක් සඳහාද? අප උත්සාහ කළ යුත්තේ, රජයේ දැඩි නියාමනය හමුවේ ඒ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ළමුන්ට ලබා දීමටයි. මේ රටේ ළමයින්ගේ පමණක් නොවෙයි, ජාත්‍යන්තරයේත් දැනුම් කේන්ද්‍රය බවට මේ රට පත් කර ගන්න අපි උත්සාහ නොකරන්නේ ඇයි? එය ආදායම් මූලයක් නේද? එවිට අපේ රටේ සාමාන්‍ය දරුවන්ට නොමිලයේ ලබා දෙන අධ්‍යාපනය තවත් ශක්තිමත්ව ලබා දෙන්න පුළුවන් නේද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියනවා, රාජ්‍ය පෞද්ගලික

හවුල් ක්‍රියාකාරිත්වයකට යන්න අපට සිදු වන බව. දැනට කොළඹ ඉදිවන ගුවන් මාර්ග, Port City ආදී ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේ විදේශ ආයෝජන මඟින්. ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු විපක්ෂයේ සිටින අනෙකුත් බලවේගවලින් මම අහනවා, මේ රට ගොඩ ගත හැකි ආදායම් මූලයන් පිළිබඳව ඔබතුමන්ලා අවංකව ප්‍රකාශ කරන්නේ නැත්තේ ඇයි කියලා. මේ රට ගොඩ ගන්න සාධාරණ, අවංක වුවමනාවක් ඔබතුමන්ලාට තිබෙනවා නම්, මේ රටේ ආදායම ජනනය කිරීමට මේ වෙලාවේ අප කළ යුත්තේ මොනවාද කියලා කරුණාකර පෙන්වා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි Port City ව්‍යාපෘතිය ආරම්භ කරන්න ක්‍රියා කළා; කොළඹ වරායේ නැඟෙනහිර ජැටිය පිළිබඳ සාධනීය ප්‍රතිපත්ති මාලාවක් ගෙනාවා; ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි පිළිබඳ සාධනීය ප්‍රතිපත්ති මාලාවක් ගෙනාවා. නමුත්, මේ කිසිදු ආදායම් මූලයක් පිළිබඳව එතුමන්ලා කියන්නේ නැහැ.

ලෝකයේ හැම ආණ්ඩුවක්ම කොරෝනා වසංගතය නිසා අද වන කොට බිත්තියට හේත්තු වෙලා තිබෙන්නේ. ඒ හැම ආණ්ඩුවක්ම එසේ බිත්තියට හේත්තු වෙලා තිබෙන මේ වෙලාවේ විපක්ෂයේ අය උත්සාහ කරන්නේ මේ රටේ ජනතාව උසි ගන්වා, පාරට ඇද දමන්නයි. කොරෝනා වසංගතයෙන් ජනතාවගේ දිවි ගලවා ගන්න අතිගරු ජනාධිපතිතුමා එන්නත්කරණ වැඩසටහන රට පුරා ක්‍රියාත්මක කරනවා. මිලිටරිකරණයක් ගැන කියමින් විපක්ෂය ආණ්ඩුවට චෝදනා එල්ල කරනවා. නමුත් ඊයේ රාත්‍රියේත් කොළඹ සියලු ජනයා වෙත ඇස්ට්‍රාසෙනෙකා එන්නතේ දෙවැනි මාත්‍රාව ලබා දීමට හමුදාව කටයුතු කළ හැටි අපි දැක්කා. මිලිටරිකරණය හරහා එදා යුද්ධය ජය ගත්තා වාගේම, එන්නත්වලින් රට සුවපත් කරන්නත් රජය ක්‍රියා කරනවා; යුද්ධ හමුදාව ක්‍රියා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියයට තුනේ කණ්ඩායමට අපි කියනවා, ඔබතුමන්ලා නැති ප්‍රශ්න මවා පාමින්, මේ රටේ මහ ජනතාව පාරට බස්වා, උසි ගන්වා උත්සාහ කරන්නේ මේ රටේ මිනිසුන් විනාශයේ මුව විටට ගෙන එන්නයි කියලා. අපේ රටේ ජනතාවගේ හිත සුව පිණිස රජය ගන්නා උත්සාහයන්ට උදව් කරන්න; ආදායම් මූලයන් පෙන්වා දෙන්න කාරුණික වන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Weerasumana Weerasinghe. You have ten minutes.

[අ.භා. 4.30]

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක ආර්ථිකයේ කැඩපත තමයි මහ බැංකු වාර්තාව. මහ බැංකු වාර්තාවෙන් පෙන්නුම් කරන ප්‍රතිබිම්බය රටේ ආර්ථික තත්ත්වයයි. රටක ආර්ථිකයේ ඉදිරි ගමන් මග, ආර්ථිකයේ හැසිරීම වාගේම ආර්ථිකය ගමන් කළ යුතු දිශානතිය ගැන කියවන්න ඉඩක් ලැබෙන්නේ මහ බැංකු වාර්තාවෙන්. ඒ නිසා මහ බැංකු වාර්තාව පිළිබඳව කරන මේ විවාදය, සාම්ප්‍රදායිකව ගෙවී ගිය කාල පරිච්ඡේදය පිළිබඳ කථා කරනවාට වඩා ඉදිරි කාල පරිච්ඡේදයේදී අප මුහුණ දෙන අභියෝග පිළිබඳ කතිකා කරන සාකච්ඡාවක් බවට පත් විය යුතු බවයි මගේ හැඟීම.

2020 අවුරුද්දේ අපේ රටේ ආර්ථිකය ගැන සඳහන් කරන මහ බැංකු වාර්තාව පිළිබඳව කථා කරන්න ඉස්සෙල්ලා මම එක කාරණයක් සඳහන් කරන්න ඕනෑ. ලංකා ඉතිහාසයේ දැවැන්තම ආර්ථික අර්බුදයට මුහුණ දුන් අවුරුද්ද තමයි 2020 අවුරුද්ද. අප දන්නා ඉතිහාසයේ 1930-1935 කාල පරිච්ඡේදය තුළ මැලේරියා වසංගතය අපේ රටටත්, ලෝකයටත් උරුම වුණු වෙලාවේත් ලෝක ආර්ථික අර්බුදයක් නිර්මාණය වුණා. 1970 දශකයේ මුල් අවධියේ ලෝක ආර්ථික අර්බුදයක් නිර්මාණය වුණා. අපට මතකයි, 2000 වර්ෂයෙන් පසු දශකයේත් ලෝක ආර්ථික අර්බුදයක් නිර්මාණය වුණු බව. හැබැයි, මේ ගෝලීය වසංගත තත්ත්වයත්, ගෝලීය ආර්ථික අර්බුදයත් එක්ක ඉතිහාසයේ කවදාවත් නොවූ විරූ ආර්ථික අර්බුදයකට තමයි අප මුහුණ දෙන්නේ. ගෝලීය වසංගත තත්ත්වය සහ ගෝලීය ආර්ථික අර්බුදය තුළ අප දැකපු දෙයක් තිබෙනවා. ආර්ථික අර්බුදයක් කළමනාකරණය කරගන්න අසමත් වුණාම, එය සමාජ අර්බුදයක් බවට පත් වෙනවා.

එම නිසා රජයේත්, ආණ්ඩුවේත්, විශේෂයෙන්ම මහ බැංකුවේත් ප්‍රධාන වගකීම බවට පත් වෙන්නේ, මේ ආර්ථික අර්බුදය සමාජ අර්බුදයක් බවට පත්වෙන්න නොදී කළමනාකරණය කර ගැනීමයි. ඒ සම්බන්ධයෙන් මහ බැංකුවට ප්‍රධාන වගකීමක් පැවරෙනවා. මට මතකයි, ජනාධිපතිතුමා එක වෙලාවක මහ බැංකුවට කිව්වා, මේ ප්‍රශ්නවලට උත්තර හොයන්න මහන්සි වෙලා වැඩ කරන්න කියලා; මහ බැංකුව නොනිදන ආයතනයක් බවට පත් විය යුතුයි කියලා. ජනාධිපතිතුමා එදා ඒ කථාව කළ ගමන් මහ බැංකුව එළි වෙනතුරු ලයිට් දමාගෙන වැඩ කරනවා, සමාජ මාධ්‍ය තුළින් අපි දැක්කා. හැබැයි, අද එහෙම ලයිට් දමාගෙන වැඩ කරනවාද කියන එක ප්‍රශ්නයක්. මේ ආර්ථික අර්බුදවලට උත්තර හොයන්න මහ බැංකුව කටයුතු කරන තත්ත්වයක් පෙනෙන්න නැහැ. හැබැයි, වර්තමාන මහ බැංකු අධිපති මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මැතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. එතුමා අපේ රටේ ආර්ථික විද්‍යාඥයන් අතර ඉන්න ප්‍රාමාණික බුද්ධිමතෙක්. ඒ වාගේම, හිටපු මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මැතිතුමාත් ප්‍රාමාණික බුද්ධිමතෙක්. මේ රටේ ආර්ථිකය කළමනාකරණය කරන්න එතුමන්ලාගෙන් ලැබුණු දායකත්වයට මාගේ ගෞරවය, ස්තුතිය පුද කරනවා. හැබැයි, ඊට කලින් හිටපු මහ බැංකු අධිපතිවරයා වූ ඒ බහිරවයා කළ දැවැන්ත හානිය, විනාශය හේතුවෙන් අදටත් අපේ රටේ ආර්ථික දේහය කළමනාකරණය කරන්න බැරි තත්ත්වයට පත්වෙලා තිබෙනවා. එදා මහ බැංකුවට කළ විනාශයට, මේ රටේ මූල්‍ය පද්ධතියට කළ විනාශයට-අර්ජුන මහේන්ද්‍රන්ලා කළ විනාශයට- උත්තර හොයන්නවත්, ඔවුන්ට නිසි දඬුවම් දෙන්නවත් තවම අපට පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒ නිසා මේ රටේ ආර්ථිකයේ ප්‍රධාන මර්මස්ථානයක් වන මහ බැංකුවේ වර්තමාන අධිපතිවරයා "ජාත්‍යන්තර මූල්‍ය අරමුදල" කියන උගුලේ හිර වෙන්නේ නැතුව මේ රටේ ආර්ථිකය යම් ප්‍රමාණයකට කළමනාකරණය කිරීම පිළිබඳව අපේ ගෞරවය, ස්තුතිය පුද කරන්න ඕනෑ.

අකැමැත්තෙන් වුණත් කියන්න ඕනෑ තවත් කාරණාවක් තිබෙනවා, අපේ රටේ සිටින ආර්ථික විද්‍යාඥයන් සම්බන්ධව. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. ආර්ථික විද්‍යාඥයන්ගෙන් බහුතරයක් බටහිර ආර්ථික චින්තනයෙන් පෝෂණය ලබපු අය. ඒ, බටහිර ආර්ථික චින්තනයේ පෝෂණය ලබපු, අධ්‍යාපනය ලබපු අයගේ මොළ ටික හෝදලායි තිබෙන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - IMF - සහ ලෝක බැංකුව - World Bank එක. ඔවුන් තවමත් කල්පනා කරන්නේ, මෑත දශක තුන-හතරක කාල පරිච්ඡේදය තුළ මේ ලෝකයේ හැසිරීම් සම්බන්ධවයි. හැබැයි, මේ ලෝකයේ ගමන් මඟ වෙනස් වෙලා තිබෙනවාය කියන කාරණාව පිළිබඳව ඔවුන්

[ගරු වීරසුමන වීරසිංහ මහතා]

තවමත් හරියට කියවීමක් කරලා තිබෙනවාද කියන්න දන්නේ නැහැ. සියවස් පහකට පසුව අද ලෝකයේ බලවතා බවට ආසියාව පත් වෙලා තිබෙනවා. සියවස් පහකට පසුව අද ලෝකයේ බලවත්ම ආර්ථිකය තිබෙන්නේ ආසියාවේ. ඒ නිසා තමයි ආසියාවේ ආර්ථිකය යම් දිශානතියකට, යම් ගමන් මඟකට යන වැඩ පිළිවෙළක් අපේ වාගේ රටක සිද්ධ කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් වස්තුක තත්ත්වයන් සැහෙන්න අපේ රටේ නිර්මාණය වෙලා තිබෙන වෙලාවක් මේක. ඒ නිසා ලෝක ආර්ථික තත්ත්වයත් එක්ක තීන්දු ගැනීම මේ මොහොතේ ඉතාම වැදගත් කාරණාවක් බවට පත් වෙලා තිබෙනවා.

ආර්ථික විද්‍යාඥයන්ගේ කාර්යභාරය අපි මේ මොහොතේ සිහිපත් කරනවා. ආචාර්ය එන්.එම්. පෙරේරා, මහ බැංකුව සමඟ සම්බන්ධ වෙලා හිටපු ආචාර්ය ගාමිණී කොරෙයා වාගේ මහා ප්‍රාමාණික බුද්ධිමතුන්ගේ චින්තනයන් අවශ්‍ය වෙලාවක තමයි 2020 මහ බැංකු වාර්තාව ගැන අපි මේ කථා කරන්නේ. ඒ නිසා සාම්ප්‍රදායික කෝණවලින් ගැලවිලා මේ ගමන යන්න පුළුවන් නම් තමයි අපේ රටේ ආර්ථිකය ඔසවා තබන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා නැවත වතාවක් මහ බැංකු අධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා, IMF උගුලෙන් අප ගලවා ගන්න මේ මොහොත වෙනකල් සමත්වීම ගැන. මොකක්ද, IMF උගුල කියන්නේ? IMF උගුල කියන්නේ, හැම දාම ඔවුන් ණය දීලා අප කොන්දේසිවලට හිර කරන එක. ඒ කොන්දේසි, සුබසාධන කප්පාදු කරන සහ සමාජ සුබසාධන අහිමි කරන කොන්දේසි. අපට මෙතෙක් ඒ කාරණයෙන් ගැලවිලා ඉන්න පුළුවන්කම ලැබී තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ඉතිහාසයේ අවස්ථා ගණනාවක -වාර 14ක්, 15ක්- අපි ණය අරගෙන තිබෙනවා. මහින්ද රාජපක්ෂ රජයට, එහෙම නැත්නම් ගෝඨාභය රාජපක්ෂ රජයට මා ස්තුතිවන්ත වෙනවා, මේ කාල සීමාව තුළ IMF උගුලෙන් ගැලවිලා, ආර්ථික අමාරුකම් මධ්‍යයේත් ආර්ථිකය කළමනාකරණය කරගෙන ඉදිරියට යන්න අපට පුළුවන්කම ලැබීම සම්බන්ධව.

ඊළඟ කාරණය තමයි අපි කොහොමද රාජ්‍ය ආදායම වැඩි කර ගන්නේ කියන කාරණය. 1977 අපේ රටේ ආර්ථිකය අනුව අපේ රටේ දළ දේශීය නිෂ්පාදනය රාජ්‍ය ආදායමින් සියයට 24යි. හැබැයි ඒක ක්‍රමිකව අඩුවෙලා, 2019 වනකොට රාජ්‍ය ආදායම සියයට 9 දක්වා අඩු වුණා. ගරු අජිත් නිවාඩ් කබ්රාල් රාජ්‍ය ඇමතිතුමනි, මා විශ්වාස කරන්නේ මේ කොවිඩ් අර්බුදයත් එක්ක අද රාජ්‍ය ආදායම බින්දුවට බැහැලා කියලායි. රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමේ උපක්‍රමය තමයි ඊළඟ කාර්යභාරය බවට පත් වෙන්නේ. ඒ නිසා රාජ්‍ය ආදායම වැඩිකර ගැනීමේ ප්‍රධාන කාර්යභාරය වන බදු ප්‍රතිපත්තිය පිළිබඳව වෙනදාට වඩා සැලකිලිමත්ව මැදිහත් වෙන්න ඕනෑ. වර්තමාන මුදල් ඇමතිතුමා, මේ පිළිබඳව ප්‍රාමාණික ඕනෑකමක් තිබෙන පුද්ගලයකු විධියට අපට යම් විශ්වාසයක් තිබෙනවා. මේ රටේ බදු ප්‍රතිපත්තිය පිළිබඳව, නැවත ජාතික බදු ප්‍රතිපත්තියට තල්ලු වන කියවීමක අවශ්‍යතාව තමයි දැන් පෙන්නුම් කරලා තිබෙන්නේ.

මේ රටේ ආදායම ඔසවා තබන ප්‍රධාන කුලුනු තුන වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව යන කුලුනු තුනම දැන් අබලන් වෙලා තිබෙනවා. එම කුලුනුවලට දැන් මුක්කු ගහන්න සිදු වෙලා තිබෙනවා. එම නිසා මේ කුලුනු වහාම ප්‍රතිසංස්කරණය කරන්න අපට ඉඩ කඩ නොලැබුණොත්, අපේ රටේ ආදායම දැවැන්ත ලෙස තව තවත් ඛේදනීය තත්ත්වයකට පත් වෙන්න පුළුවන්. එම නිසා මේ කුලුනු තුන වෙනුවෙන් දැවැන්ත පරිවර්තනයක් සිදු කළ යුතුයි. අකමැත්තෙන් වුණත් කියන්න වෙනවා, අපි පසුගිය කාලයේ මොන තරම් උත්සාහ දැරුවා වුණත්, රාජ්‍ය ආදායම ඔසවා තබන එම ආයතන තුන ලංකාවේ දූෂිතම ආයතන ලැයිස්තුවේ ඉහළින්ම තිබෙන ආයතන බවට පත්වෙලා තිබෙන බව. මොන උපක්‍රම පාවිච්චි කළත් වැඩක් වුණාද? අපට මතකයි, අතිගරු ජනාධිපතිතුමා විසින් හමුදාවේ ඉහළම තනතුරක සිටි වැදගත් නිලධාරියකු රේගු දෙපාර්තමේන්තුවට පත් කළ බව. නමුත්, අවාසනාවකට එම ආයතනය ඇතුළත තිබෙන යන්ත්‍රණය තවමත් පරණ විධියටමයි ක්‍රියාත්මක වෙන්නේ. 'බෝතලය මාරු කළාට පරණ වයින්මයි' තිබෙන්නේ. එම නිසා මේ ආයතන පද්ධතිය වෙනස් කරන්න කටයුතු කළ යුතුයි.

අද මම කථා කරන තවත් එක් කාරණයක් තමයි, අපේ රටේ ආර්ථිකය ශක්තිමත්ව ඔසවා තබන ප්‍රධාන කාරණාවක් වන ඉතිරි කිරීම් පිළිබඳ කාරණය. ඒ සම්බන්ධයෙන් නිසි අවධානයක් නැති වුණු කාල පරිච්ඡේදයක් බවට මේ කාල පරිච්ඡේදය පත්වෙලා තිබෙනවා. අපේ රටේ ජනතාව ඉතුරුම්කරණයෙන් ගැලවිලා ගිහින් තිබෙනවා. ලෝකයේ දියුණු වුණු හැම රටකම දියුණුවේ ප්‍රධාන රහස බවට පත්වෙලා තිබෙන්නේ ඔවුන්ගේ ඉතුරුම් කොටසයි. අපට මතකයි, චීන විප්ලවයෙන් පස්සේ චීනය දියුණු වෙනකොට මිනිසුන්ට ආයාචනා කළා, මුදල් ඉතුරු කරන්න කියලා. ඒ මිනිස්සු තමන් ළඟ තිබුණු මුදල් සියල්ල ඉතුරු කළා. ඒ ඉතුරුම් තමයි රාජ්‍ය ආදායම බවට පත් වුණේ. අද අපේ රට ඉතුරුම්කරණය ගැන කිසිම කතිකාවක් කරන්නේ නැහැ. ඉතිරි කිරීම සඳහා හදපු බැංකුවක් වන ජාතික ඉතිරි කිරීමේ බැංකුව අද තවත් එක් වාණිජ බැංකුවක් විතරයි. අපේ පාසල් අවධිය තුළ අපට ඉතිරි කිරීම සඳහා පුරුද්දක් ඇති කළා. අපි ඉස්කෝලේ යනකොට මුදල් ඉතිරි කිරීම සඳහා තැපැල් කාර්යාලය මඟින් මුදල් එකතු කළා. අපි පොඩි කාලයේ බැංකු පොතක් ඇරලා දෙමවුපියෝ ඒකට මුදලක් දැම්මා. අද ඒවා කිසිවක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අද ඉතිරි කිරීම පුරුදු කිරීම සඳහා රට තල්ලු කරන්නේ නැත්නම්, ඉදිරියේ දී මේ රට දැවැන්ත ඛේදවාචකයකට තල්ලු වෙන්නට පුළුවන්. එම නිසා පාසල් පද්ධතිය තුළදී ඉතුරුම්කරණය පිළිබඳ වහ-වහා වැඩි මැදිහත් වීමක් කරන්න ඕනෑ. ඉතුරුම්කරණය කියන එක සමාජගත හුරුවක් බවට පත් කරන්නට ඕනෑ. හතළිස් තුන්ලක්ෂයක් වුණු සෑම පාසල් දරුවෙකුටම බැංකු පොතක් අනිවාර්ය කරන්න ඕනෑ, හැම දරුවෙකුටම කැටයක් ලබා දෙන්නට ඕනෑ. ඒ විධියට වාර්ෂිකව ඉතිරි කරන්න පුළුවන්කම ලැබුණොත්, එය මේ රටට දැවැන්ත ශක්තියක් වාගේම ඉතුරුම්කරණය පැත්තෙනුත් වැදගත් කාර්ය භාරයක් වේවි.

අවසාන වශයෙන්, මේ රටේ බැංකු පද්ධතිය පිළිබඳව නැවත නියාමනයක් සිදු වෙන්න ඕනෑය කියන කාරණයත් කියන්න ඕනෑ. අද තිබෙන බැංකු පද්ධතිය ස්ථාපිත කරන්න එදා ජීවිත පරිත්‍යාගයෙන් කැප වුණු නායකයන් කිහිපදෙනෙක් ඉන්නවා. ටී.බී. ඉලංගරත්න, ඇන්.ඇම්. පෙරේරා, ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක, ඒ වාගේම පිලිප් ගුණවර්ධන වගේ විද්වතුන් විසින් බිහි කළ බැංකු පද්ධතිය අද මූලික පරමාර්ථවලින් බැහැරව යනවා. කලින් කිව්වා වගේ, ජාතික ඉතිරි කිරීමේ බැංකුව අද ඉතිරි කිරීමේ බැංකුවක් නොවෙයි, වාණිජ බැංකුවක් බවට පත්වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වුණු කාලය දැන් අවසන්. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව සුළු වෙලාවක් ලබා දෙන්න, මම අවසන් කරන්නම්.

එදා මහජන බැංකුව ස්ථාපිත කළේ සංවර්ධන බැංකුවක් විධියටයි. අද ඒ බැංකුව සංවර්ධන බැංකුවක්ද? ඒක තවත් එක් වාණිජ බැංකුවක් විතරයි. එම නිසා බැංකු පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කරගන්න නැවත කියවීමක් කරන්න කියන කාරණාව සිහිපත් කරනවා. පසුගිය කාලයේ බැංකුවලින් විශාල වශයෙන් ණය ලබා දීම් සිද්ධවෙලා තිබෙනවා.  මහ බැංකුව නැවත විගණනය කරලා ඒ ගැන සොයා බලන්න.  අවාසනාව නම්, එම ණයවලින් අතිමහත් බහුතරයක් පාරිභෝගික ණය මිසක්, ආර්ථිකය ශක්තිමත් කරන කෘෂි කාර්මික ක්ෂේත්‍රය සඳහා, කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ලබා දුන් ණය නොවෙයි. එම නිසා ඒ ගැනත් කල්පනා කරන්න කියා ඉල්ලා සිටිනවා.

2019 දෙසැම්බර් මාසයේ අපි බදු සංශෝධන සම්බන්ධයෙන් බරපතළ තීන්දුවක් ගත්තා. ඒ තුළින් ප්‍රතිපත්තිමය වශයෙන් දැවැන්ත වෙනසක් සිද්ධ වුණා; ආර්ථිකයේ වෙනසක් සිද්ධ වුණා. මහ බැංකුවෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, එම බදු සහනයන් තව දුරටත් පවත්වාගෙන යා යුතුද කියලා නැවත කියවීමක් කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් සමයේදී මුළු රටම හතරගාතේ වැටෙද්දී,  ආර්ථිකය හතරගාතේ වැටෙද්දී,  සමාගම් කිහිපයක් අධිලාභ ප්‍රමාණයක් ලැබුවා. ලාභ ලැබූ එම සමාගම්වලින් යම් මුදල් ප්‍රමාණයක් රජයට ලැබෙන ආකාරයෙන් බදු සංශෝධනයක් ඇති කරන්න කියා ඉල්ලා සිටිනවා.  මට මේ කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට මගේ ගෞරවයත්, ස්තුතියත් පුද කරමින්,  2020 මහ බැංකු වාර්තාව 2021ටත්, ඉදිරි දශකයටත් කියවීමක් කරන මහ බැංකු වාර්තාවක් බවට පත් කරන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும்  உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Faizal Cassim. You have ten minutes.

[பி.ப. 4.41]

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைசால் காசிம்)
(The Hon. Faizal Cassim)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2020ஆம் ஆண்டுக்கான இலங்கை மத்திய வங்கியின் அறிக்கை பற்றிய சபை ஒத்திவைப்புவேளைப் பிரேரணை மீதான விவாதத்திலே பேச சந்தர்ப்பம் கிடைத்தமையையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். இது நிதி சம்பந்தப்பட்ட விடயமாக இருந்தாலும்கூட, இச்சந்தர்ப் பத்திலே எமது பிரதேசத்திலுள்ள பிரச்சினைகள் பற்றி சற்றுப் பேசலாமென்று நான் நினைக்கின்றேன். அதாவது, காரைதீவு பிரதேச சபையின் தவிசாளர் அவர்கள் எங்களுடைய நபிகள் நாயகம் அவர்களை அவமதித்து ஓர் அறிக்கையை விடுத்திருந்தார். இதுசம்பந்தமாக நானும் எமது கட்சியும் கண்டன அறிக்கையை வெளியிட்டதுடன், அவரை வன்மையாகக் கண்டிக்கின்றோம். அதுமட்டுமல்லாமல் ACMC, SLMC பிரதேச சபை உறுப்பினர் களுக்கும் நாங்கள் நன்றி கூறுகின்றோம். அவர்களின் முயற்சி வெற்றிபெற வேண்டுமென்றும் கேட்டுக்கொள்கின்றேன்.

அத்துடன், இந்த  சபையிலே நான் இன்னுமொரு கருத்தைக் கூறவிரும்புகின்றேன். EAM Maliban Textiles (Pvt.) Limited என்ற ஒரு தனியார் கம்பனி உரிமையாளர் இல்லியாஸ் அப்துல் கரீம் அவர்கள் இந்த நாட்டு மக்களுக்கு 300 மில்லியன் ரூபாய் பெறுமதியான Urology and Nephrology இற்கான மூன்று மாடிக் கட்டிடத்தை 143 கட்டிலுடனும்  13 ICU units உடனும் இந்த அரசாங்கத்திடம் கையளித்திருக்கின்றார். கடந்த அரசாங்கத்தில் நான் இராஜாங்க அமைச்சராக இருந்தபோது இந்த முயற்சியை மேற்கொண்டிருந்தோம். அதன் வெற்றி இப்போது இலங்கை நாட்டிலுள்ள மக்கள் அனைவருக்கும் கிடைத்திருப்பதை யிட்டு நாங்கள் மகிழ்ச்சியடைகின்றோம். அதுசம்பந்தமான ஆவண மொன்றினை நான் பாராளு மன்றத்திலே *சமர்ப்பிக்கின்றேன். அதனை *ஹன்சாட்*டில் சேர்த்துக்கொள்ளுமாறு கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, இன்று அனைவரினதும் பேசுபொருளாக COVID-19 உள்ளது. கடந்த அரசாங்கத்திலே வேலைக் கமர்த்தப்பட்ட டெங்கு உத்தியோகத்தர்கள் இன்னும் permanent ஆக்கப்படவில்லை. அவர்கள் 20,000 ரூபாய் சம்பளத்திற்காக இரவு பகலாக உழைத்துக் கொண்டிருக் கிறார்கள். நிறையப் போராட்டங்களை நடத்தியும்கூட இன்னும் அவர்களுக்கான நிரந்தர நியமனம் கிடைக்கப் படவில்லை. இரண்டு வருடங்களாக அவர்கள் டெங்கு நோயை கட்டுப்படுத்துவதற்குப் போராடியது போன்று COVID -19 பரவலைக் கட்டுப்படுத்துவதற்கும் இரவு பகலாகப் போராடிக்கொண்டிருக்கின்றார்கள். MOH அதிகாரி களுடனும் PHIமார்களுடனும் சேர்ந்து மிகவும் கஷ்டத்தின் மத்தியில் அவர்கள் கடமையாற்றுகின்றார்கள். இந்த இடத்திலே எமது நிதி இராஜாங்க அமைச்சர் அவர்கள் இருக்கின்றார்கள். அவர்களுடைய கோரிக்கையை நிறைவேற்றித்தர வேண்டு மென்று அவரிடம் கேட்டுக்கொள்கின்றேன். இவர்களுக்கு NVQ Level 4 தகைமையும் இருப்பதன் காரணமாக இவர்களுக்கான நிரந்தர நியமனத்தை வழங்க வேண்டுமென்று நான் இந்த இடத்திலே கேட்டுக் கொள்கின்றேன்.

அதுமட்டுமல்ல, எமது பகுதியிலேயுள்ள கிராம வைத்திய சாலைகளிலே, ஆதார வைத்தியசாலைகளிலே ஆளணிப் பற்றாக்குறை நிலவுவதால் மக்கள் கஷ்டப்படுவதை நாங்கள் காண்கின்றோம். வைத்தியசாலைகளுக்குச் சென்றால் அங்குள்ள குறைகளைப் பற்றி எங்களிடம் கூறுகின்றார்கள். ஆகவே, அரசாங்கத்திடம் நான் கேட்டுக்கொள்வது என்னவென்றால், ஓரிலட்சம் வேலைவாய்ப்பிலே அந்த ஆளணிப் பற்றாக்குறையை நிவர்த்திக்கவேண்டுமென்றுதான். அந்த வகையில், அவர்களுக் கான நியமனத்தை வழங்கி, COVID-19 இனை வெற்றி கொள்வதற்கு வைத்தியசாலை அதிகாரிகளுக்கு உதவி செய்ய வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

COVID-19 காரணமாக இந்த நாடு பொருளாதாரத்தை இழந்த நிலையில் காணப்படுகின்றது. இது சம்பந்தமாக நிறைய விடயங்கள் பேசப்பட்டன. எந்த விடயம் பேசப் பட்டாலும், உலக நாடுகளிலே பொருளாதாரம் வீழ்ச்சியடைந் திருப்பது மட்டு மல்லாது இலங்கையிலும் பொருளாதாரம் வீழ்ச்சியடைந் திருப்பதை நாங்கள் ஏற்றுக்கொள்ளத்தான் வேண்டும். இந்தப் பொருளாதார வீழ்ச்சியிலிருந்து மீட்சி பெறுவதற்காக அரசாங்கம் எல்லா நடவடிக்கைகளையும் எடுத்துக் கொண்டிருக்கின்றது. உதாரணமாக, இன்று நாட்டிலே சுற்றுலாத் துறையை மேம் படுத்துவதற்காக நிறைய வேலைத்திட்டங்களைச் சுற்றுலாத்துறை அமைச்சர் கொண்டுவந்திருக்கின்றார். இலங்கைக்கு வரும் சுற்றுலாப் பிரயாணிகளுக்கு மிகவும் குறைந்த நேரத்துக்குள் PCR பரிசோதனைகளைச் செய்வதற்குரிய வேலைத் திட்டமானது

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ෆයිසාල් කාසිම් මහතා]

அதிகாரிகளின் அலட்சியம் காரணமாக 6 மாத காலமாக இழுபட்டுக் கொண்டிருப்பதை நாங்கள் காண்கின்றோம். இது கவலைக்குரிய விடயம். நாட்டுக்கு வருமானத்தைப் பெறுவதற்காகச் சுற்றுலாப் பயணிகளை அழைத்துவர வேண்டுமென்று போராடிக்கொண்டிருக்கின்ற இந்தக் காலத்திலே, அதிகாரிகளின் அலட்சியம் காரணமாக அரசாங்கத்தின் முயற்சிக்கு வெற்றி கிடைக்காதிருப்பதாகக் கூறுகின்றார்கள். அதிகாரிகளின் முக்கிய கடமை என்னவென்றால், அரசாங்கம் என்ன முயற்சி எடுத்தாலும் அதனைக் காலம் தாழ்த்தாது உரிய நேரத்திலே செய்து முடிக்கவேண்டுமென்பதுதான். அவ்வாறு செய்தால் COVID-19 காரணமாகப் பாதிக்கப்பட்டுள்ள எமது பொருளாதாரத்தைக் கட்டியெழுப்ப முடியுமென்று நினைக்கின்றேன்.

அடுத்ததாக, இன்று சேதனப் பசளையைப் பற்றிப் பேசிக்கொண்டிருக்கின்றார்கள். எமது விவசாயிகள் கவலையாக இருக்கின்றார்கள். நானும் ஒரு விவசாயி. விவசாயிகளுடன் நாங்கள் கதைக்கும்போது, "Sir, அடுத்த போகத்துக்கு எங்களுக்குப் பசளை கிடைக்குமா? இல்லையா?" என்று அவர்கள் கேட்கிறார்கள். ලබන කන්නයට පොහොර හම්බ වෙයිද නැද්ද? ඒක තමයි ගොවියෝ අපෙන් පළමුවෙන්ම අහන්නේ. "உங்களுக்கு அடுத்த வருடம் கிடைக்கும்" என்று நாங்கள் கூறியிருக்கின்றோம். அதாவது, 2021ஆம் ஆண்டு முதலாம் கட்ட வேளாண்மைக்காகச் சேதனப் பசளை - compost - கிடைக்குமென்று கூறியிருக்கின்றோம். இருந்தாலும், இதில் வெற்றி பெற முடியாதென்று எமது விவசாயிகள் கூறுகின்றார்கள். அரசாங்கத்தின் இலட்சியத்தில் வெற்றி பெற முடியாது. ஏனென்றால், இந்தச் சேதனப் பசளைப் பாவனைக்கு இன்னும் நாங்கள் இயைபாக்கம் அடையவில்லை. ஏனைய விவசாயிகள் சாதாரணமாக 1 அந்தர் யூரியாவை எறிவார்களென்றால், எமது பிரதேசத்திலே உள்ளவர்கள் அதைவிட இன்னும் ¼ அந்தர் கூட எறிவார்கள். அப்படிப்பட்ட விவசாயிகள்தான் அவர்கள். சேதனப் பசளைப் பாவனையைக் கொண்டுவருவதன்மூலம் நெல் உற்பத்தியிலே தங்களால் வெற்றி பெற முடியாதென்று அவர்கள் கூறுகின்றார்கள். ஆகவே, அரசாங்கம் இதனைக் கவனத்திற் கொள்ளவேண்டியிருக்கின்றது. கிரமம் கிரமமாக அல்லது பயிர் பயிராக நாங்கள் இதனைக் கொண்டுவருவதன்மூலம் இதிலே வெற்றிபெற முடியும். அதாவது, முதற்கட்டமாக மரக்கறிச் செய்கையிலே, அதன் பின்னர் தென்னஞ் செய்கையிலே, அடுத்ததாகத் தேயிலை உற்பத்தியிலே என்று கட்டங்கட்டமாகக் கொண்டுவந்து கடைசியாக வேளாண்மைக்கு இந்தச் சேதனப் பசளைப் பாவனையைக் கொண்டுவந்தால் நாங்கள் இதிலே வெற்றி பெற முடியும். இது அரசாங்கம் கவனத்திற்கொள்ள வேண்டிய முக்கியமான விடயமாகும்.

இன்று எதிர்க்கட்சியைச் சேர்ந்த சிலர் onlineஇலே படிப்பது பற்றிப் பேசினார்கள். சென்ற அரசாங்கக் காலத்திலே சுவிஸ் அரசாங்கத்தின் நிதியுதவியுடன் 5ஆம் வகுப்புத் தொடக்கம் 12ஆம் வகுப்பு வரைக்கும் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, your time is over. Please wind up.

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

Sir, give me a few seconds, please.

அத்துடன், university மாணவர்கள் வரைக்கும் Tab கொடுப்பதற்காக ஒரு பெரிய projectஇனைக் கொடுத்திருந்தார்கள். ஆனால், அதை நிராகரித்துவிட்டார்கள். அது zero interest. 35 வருட repayment. அன்றிருந்த கல்வி அமைச்சு அதனை நிராகரித்துவிட்டது. அந்தத் திட்டத்தின் தாற்பரியத்தை அன்று உணராததால் இன்று நாங்கள் அது தொடர்பான பிரச்சினைகளுக்கு முகங்கொடுக்கின்றோம். ஆகவே, இவ்வாறான நல்ல திட்டங்கள் நாட்டுக்கு வரும்போது அவற்றைச் செயற்படுத்த வேண்டுமென்று கேட்டுக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. (Prof.) Charitha Herath. You have 10 minutes.

[අ.භා. 4.50]

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද මෙම වැදගත් යෝජනාව පිළිබඳ විවාදයට සහභාගි වෙන්න ලැබීම ගැන මා ඉතා සතුටට පත් වෙනවා. විශේෂයෙන්ම 2020 මහ බැංකු වාර්තාව සම්බන්ධව ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මෙම යෝජනාව එක පැත්තකින් අප විවාද කළ යුතුව තිබෙන්නේ, අපේ රටේ ඉතා වැදගත් ආයතනයක් විසින් වාර්ෂිකව ඉදිරිපත් කරන වාර්තාව මත පදනම් වෙලා අපේ දේශපාලන ප්‍රතිපත්ති තීරණ ගැනීමේ පළල් සභාවකට එහි තිබෙන දත්ත පාවිච්චි කරන්නේ කොහොමද කියන එක පිළිබඳ අදහසක් ඇතිවයි. එම නිසා අද උදේ මෙම යෝජනාව ස්ථිර කරපු අපේ මිත්‍ර හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඉතා පැහැදිලි ප්‍රශ්නයක් මතු කළා, ආණ්ඩුවේ මතවාදය මොකක්ද කියලා. මතවාදය කියලා එතුමා අපෙන් ඇහුවේ අපි ආර්ථිකය ගැන දරන්නේ මොන වාගේ අදහසක් ද කියන ප්‍රශ්නයයි. ඉතා පැහැදිලිව අපි එයට පිළිතුරු දිය යුතුයි. අපි දේශපාලන ව්‍යාපාරයක් විධියට විශ්වාස කරන්නේ වෙළෙඳ පොළයි, රාජ්‍යයයි කියන යන්ත්‍රණ දෙකම සමබරව ගෙනියන්න පුළුවන් ආර්ථිකයක් විසින් අද නිර්මාණය වී තිබෙන ගැටලු විසඳන්න පුළුවන් කියන එකයි. එම නිසා එය වෙළෙඳපොළ පළල් කරපු, රාජ්‍යය කුඩා කරපු පරණ එක්සත් ජාතික පක්ෂයේ ආකෘතිය නොවෙයි. ඒක වෙන විධියකට කිව්වොත්, 2002 වාගේ කාලයේ අපේ සමාජයේ අදහසක් තිබුණා, වී වෙනුවට රෝස මල් වවන ආර්ථිකයක් හදනවා කියා. අපි එහෙම කල්පනා කරන අය නොවෙයි. අපි, පුරන් කුඹුරු කියලා වගා කරන්න පුළුවන් කුඹුරු පුරවන ආර්ථිකයක් එක්ක ඉස්සරහට යන අය නොවෙයි. අපි පෞද්ගලික අංශය විශ්වාස කරනවා. පෞද්ගලික දේපළ පිළිබඳ අපේ බරපතළ විශ්වාසයක්, ගෞරවයක් තිබෙනවා. හැබැයි, එය රාජ්‍යය දිය කර හරින දිසාවකින් නොවෙයි. එම නිසා මම මේ සංවාදය, මේ සභාව ඉතා වැදගත් මතවාදී සංවාදයකට තල්ලු කරන්න ඕනෑ නිසා පැහැදිලිව මේ කාරණය කියනවා. මගේ මිත්‍ර ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නයට පැහැදිලි පිළිතුර මෙයයි. රාජ්‍යයයි, වෙළෙඳපොළයි සමාන්තරව ඉදිරියට ගෙනියන සමබර ආර්ථිකයක් - balanced economy - ගැන අපි විශ්වාස කරනවා.

අද අපි හැමෝම දන්නවා, සමහර තැන්වල අවිධිමත්ව පළල් රාජ්‍ය යන්ත්‍රණයක් හදලා තිබෙන බව. පසුගිය අවුරුදු 73ක නිදහස් ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රමය ඇතුළත විවිධ පන්නයේ රාජ්‍ය

යන්ත්‍රණ ඉස්සරහට ගෙනැල්ලා තිබෙනවා. එම නිසා අද සමාජයේ කල්පනාවක් තිබෙනවා, රැකියාවක් කියන්නේ රජයේ රැකියාවක් කියලා. මෙහෙම හිතිලා තිබෙන්නේ පෞද්ගලික අංශය සම්බන්ධව අපේ සමාජයේ - විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය වාගේ පෞද්ගලික අංශය ගැන වැඩි වශයෙන් කථා කරපු ආණ්ඩු හිටියාට මතවාදයක් විධියට ඒ පැත්ත ඉදිරියට ඇවිල්ලා නැහැ. 1977 ආර්ථික වෙනස, මතවාදී සමාජයේ තවම තිබෙන්නේ පිටගම්කාරයකු වාගෙයි. එම නිසා තමයි වෙළෙඳාම, එහෙම නැත්නම් වෙළෙඳ පොළ ටිකක් නරක දෙයක් වාගේ හිතෙන විධියට සමහරු කථා කරන්නේ. අපි එහෙම නැහැ. අපි විශ්වාස කරන්නේ රාජ්‍යයක සුබසාධනය පැත්තෙන් අධ්‍යාපනය, සෞඛ්‍ය, මහාමාර්ග වාගේ පැතිවලින් ඉදිරියට යන්න ඕනෑ බවයි. හැබැයි ඊට එහාට ගිය වෘත්තීය අවකාශය ඇතුළේ, තාක්ෂණ අවකාශය ඇතුළේ, අධ්‍යාපන අවකාශය ඇතුළේ පෞද්ගලික අංශයට විශාල ඉඩක් තිබෙනවා කියා අපි විශ්වාස කරනවා. අන්න ඒ ඉඩ ඉදිරියට ගන්න අපි බලනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රැකියා නිර්මාණය කරනවා කියන්නේ, ආණ්ඩුවේ රැකියා දෙන එකයි කියලා අපේ සමාජයේ අදහසක් තිබෙනවා. අපි හැම මැතිවරණයකදීම කියනවා, job creation කියලා. අපි රැකියා නිර්මාණය කරනවා කියන්නේ, ආණ්ඩුවේ රැකියා දෙනවා කියන එක නොවෙයි; රැකියා ලබන්න පුළුවන් ආර්ථිකයක් පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය යන්ත්‍රණයේ යන දෙකේම හදනවා කියන එකයි. සමාජයේත් මේ මතය වැරදියට තේරුම් ගන්න තැන් තිබෙනවා. සමහරු හිතනවා, රැකියා නිෂ්පාදනය කියලා දේශපාලන ශබ්ද කෝෂයේ තිබෙන්නේ, හැකිතාක් දුරට රජයේ ආයතනවලට පුද්ගලයෝ බඳවා ගන්න එකයි කියලා. ඒක එහෙම නොවෙයි. මට තර්ක කරන්න පුළුවන්, අපි කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත ගෙනාවේම රැකියා නිෂ්පාදනයේ එක වැදගත් පියවරක් හැටියට කියලා. වරාය නගරය පිළිබඳ සංකල්පය ගෙනාවේ අපේ ආණ්ඩුව; වරාය නගරය පිළිබඳ නීතිය ගෙනාවේ අපේ ආණ්ඩුව. එහෙම කළේ රැකියා නිෂ්පාදනය කියන ද්විතියික වැදගත් සංකල්පය සඳහා වූ ප්‍රාථමික තීන්දුවක්, ප්‍රාථමික ප්‍රතිපත්තියක් විධියටයි. ඒ නිසා අපි කල්පනා කරන්නේ, රැකියා නිෂ්පාදනය කියලා නිකම් ලාභයට රජයේ රැකියාවක් කාට හෝ දීලා රැකියා දුන්නයි කියලා ගණන් හදනවාට වඩා, රැකියා කියන පළල්, කලාපයේ ශක්තිමත්ව ඉස්සරහට ගන්න පුළුවන් ආර්ථිකයක් ගේනවා කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පාසල් ගුරුවරු මේ දවස්වල විශාල වශයෙන් පාරට එමින් තිබෙනවා. අධ්‍යාපන කටයුතුවල යෙදෙන ඒ සහෝදරවරුන්ට තමන්ගේ වැටුප් පිළිබඳ ගැටලුවක් තිබෙනවා කියලා අපි දන්නවා. ඒ වාගේම, ඒ වැටුප් පිළිබඳ ගැටලුව අවුරුදු විසි ගණනක් තිස්සේ විසඳන්න බැරි වුණා කියලාත් අපි දන්නවා. ඒ වාගේම, අපේ 1994 ආණ්ඩුවේ හිටපු රිචර්ඩ් පතිරණ ඇමතිතුමාගේ ඉතාම ඉදිරිගාමී ප්‍රතිපත්තියෙන් පස්සේ ඒ වාගේ ශක්තිමත්ව ගුරුවරුන්ට සලකන්න පුළුවන් ක්‍රමවේදයක් හැදුණේ නැහැ කියලාත් අපි දන්නවා. හැබැයි, අපි ඒක පිළිගන්න ගමන් අද අපි ඉන්නා තැන ගැන අවබෝධයක් ඇතිවයි පාරට එන්න ඕනෑ. ඒ ගුරුවරු ඔක්කෝම ජනතා විමුක්ති පෙරමුණේ අය හෝ අපේ ස්ටාලින් සහෝදරයාගේ අය කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. අපිත් එක්ක ඇත්තටම වැඩ කරපු සහෝදර ආචාර්යවරුත් එතැන ඉන්නවා. අපි ඒ සියලු දෙනාගෙන්ම ඉතාම කාරුණිකව ඉල්ලන්නේ මෙයයි. මේ ප්‍රශ්නය අපට තේරෙනවා. ඒ වාගේම, මේ ප්‍රශ්නය අපි විසඳනවා. හැබැයි, පළල් ක්‍රියා මාර්ගයක, ප්‍රතිපත්ති ක්‍රියා මාර්ගයක ඉඳලා මිසක, හෙට උදේට හතු පිපෙනවා වාගේ අපට මේ ප්‍රශ්නය ඒ ආකාරයෙන්ම විසඳන්න බැහැ කියන එක එතුමන්ලා පිළිගනීවි කියලා අපි විශ්වාස කරනවා.

රාජ්‍ය දේපළ, රාජ්‍ය ආයතන සහ රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේත් ඉතා පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා. රටේ ලොකු ගැටලුවක් තිබෙනවා. රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධව සමහර ගැටලු තත්ත්වය විසඳා ගන්නේ නැතිව මොන ආණ්ඩුවක් පත් වුණත් ඒ ආයතන ලාභ ලබන්න බැහැ. අද හුඟක් අය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බණිනවා. හැබැයි, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සම්බන්ධව අප තුළ තිබෙන ඒ විවේචන එක්කම ගැට ගැහිලා තවත් කාරණා තිබෙනවා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අද සිද්ධ වෙලා තිබෙනවා, විවිධ ක්ෂේත්‍රවල අයට ඉතාම අඩු මුදලට, එහෙම නැත්නම් සුබසාධන ආකෘතියක් ඇතුළත තමන් ගෙනෙන ඉන්ධන ටික දෙන්න. ඒකයි අපේ වර්තමාන මුදල් ඇමතිතුමා ඉතා පැහැදිලිව කිව්වේ, "ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වාගේ ආයතන අලුත්වැඩියා වෙන්නේ නැත්නම්, ප්‍රතිසංස්කරණය කර ගන්න බැරි වුණොත් අපට විශාල ගැටලුවකට යන්න වෙනවා" කියලා. ඒ වාගේම, ශ්‍රීලන්කන් ගුවන් සේවය පිළිබඳව අපි COPE එකේ බොහොම පැහැදිලිව සාකච්ඡා කෙරුවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාත් ඒ කමිටුවේ ඉන්න නිසා ඒ ගැන දන්නවා. ඒකේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ජාතිකමය වශයෙන් ගුවන් සේවයක් පවත්වා ගෙන යනවාය කියන අදහස නඩත්තු කරන්න දවසකට මිලියන ගණනක් අපි වියදම් කරමින් ඉන්නවා. [බාධා කිරීමක්]

මේ රටේ අහිංසක ජනතාව සීනි ටිකට, පිටි ටිකට ගෙවන බදුවලින් අපි ඩොලර් මිලියන ගණනක් මුහුදට හලනවා වාගේ නාස්තියක් කරමින් අද වනකොට එවැනි ආයතන පද්ධතියක් නඩත්තු කරනවා. එම නිසා ආර්ථිකය ගැන අපි සාකච්ඡා කළ යුත්තේ මෙන්න මේ පළල් ආකෘතිය තුළ සිටිමින්. රාජ්‍යය යටතේ තිබෙන ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කිරීම වාගේ ආකෘතීන් ගැන අපි අලුතින් කථා කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා අමාරු කාර්තුවක, ඉතා පැහැදිලි ප්‍රතිපත්ති මාලාවක් ගන්න මේ ගරු සභාවට හොඳ අඩිතාලමක් සපයන ආකාරයේ වාර්තාවක් ලෙස 2020 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව ඉදිරිපත්කොට තිබෙන බව ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය නිමා කරනවා. ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Sivagnanam Shritharan. You have eight minutes.

[பி.ப. 5.01]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இந்தச் சபையிலே எனக்கு முன்னர் பேசிய முஸ்லிம் சகோதரரான கௌரவ பைஸால் காசிம் அவர்கள் அம்பாறை மாவட்டத்தின் காரைதீவுப் பிரதேச சபையினுடைய தவிசாளர் கௌரவ ஜெயசிறில் தொடர்பில் ஒரு கருத்தைப் பதிவுசெய்திருந்தார். மட்டக்களப்பு, அம்பாறை மாவட்டங் களில், குறிப்பாகக் கிழக்கு மாகாணத்திலே இன்று தமிழ், முஸ்லிம் மக்கள் எவ்வளவோ நெருக்கடிகளுக்கும் துன்பங்களுக்கும் மத்தியில் ஒரு நீண்டகால உறவோடு, "பிட்டும் தேங்காய்ப்பூவும் போல" ஊர்களுக்கிடையிலே இருக்கின்ற தொடர்புகளின் அடிப்படையில் ஒற்றுமையாக வாழ்ந்துகொண்டிருக்கிறார்கள். இவ்வாறான சூழலில், இன்றைய நவீன தொழில்நுட்ப சாதனங்களினூடாக அவர் குறிப்பிடும் ஏதோவொரு சம்பவம் நடைபெற்றிருக்கிறது. ஆனால், அது உண்மையா, பொய்யா? அது சட்ட ரீதியாக

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

ஆராயப்பட்டதா? உறுதிப்படுத்தப்பட்டதா? அல்லது ஜெயசிறில் அவர்களால்தான் அந்தச் செய்தி இடப்பட்டதா? அவரால்தான் share பண்ணப்பட்டதா? என்று எதுவும் உறுதிப்படுத்தப்படாமல், இந்த நாட்டினுடைய உயர்ந்த சபையிலே ஒரு கௌரவ உறுப்பினர் ஒரு பிரதேச சபை யினுடைய தவிசாளர் பற்றிய பதிவை மேற்கொள்வது மிக வேதனையைத் தருகிறது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முஸ்லிம் சமூகம் பல்வேறுபட்ட நெருக்கடிகளை எதிர்கொண்டபொழுது, குறிப்பாக 'கொவிட்' தொற்றினால் இறந்த அவர்களுடைய ஜனாஸாக்கள் எரிக்கப் பட்டபொழுது தமிழ்ச் சமூகமாகிய நாங்கள் துணிந்துநின்று அவர்களுக்காக ஊர்வலங்களை நடத்தியிருக்கிறோம்; போராடியிருக்கிறோம்; நீங்கள்கூட அதற்கு எதிராகக் குரல் கொடுத்தீர்கள். நாங்கள் துன்பப்பட்ட காலங்களில் அவர்கள் எங்களுக்கு அளித்ததைவிட, அதிகமான ஆதரவை நாங்கள் அவர்களுக்கு வழங்கியிருக்கிறோம். இன்றும் நாங்கள் அவர்களோடு நிற்கிறோம். ஆகையால், ஒரு விடயத்தைச் சரியாக ஆராயாமல், சரியாக எடைபோடாமல் இந்தச் சபையிலே கூறி, இனங்களுக்கிடையில் குரோதத்தையும் விரோதத்தையும் வளர்க்கவேண்டாமென நான் இந்தச் சபையினூடாக கௌரவ பைசால் காசிம் அவர்களைத் தயவாகக் கேட்டுக்கொள்கின்றேன். அவர் இனிமேலும் சரியாக ஆராய்ந்து பேச வேண்டும். அவ்வாறின்றி ஒருவரைப் பற்றித் தேவையற்ற முறையிலே, அதுவும் இந்த உயர்ந்த சபையிலே பேசியது நாகரிகமற்றது என்பதை நான் இங்கு பதிவுசெய்கின்றேன்.

அடுத்து, அண்மையிலே வடக்கு மாகாணத்துக்கான பிரதம செயலாளரை இந்த அரசு நியமித்தது. வடக்கு, கிழக்கிலே வாழுகின்ற தமிழர்கள் 70 - 80 ஆண்டுகளாகத் தங்களுடைய உரிமைக்காகப் போராடிவருகிறார்கள். இன்று கிட்டத்தட்ட 08 தசாப்தங்களைக் கடந்தும் அந்த உரிமையானது கிடைக்காத நிலையில், சிங்களத் தலைவர்களுடைய தூரநோக்கற்ற, தீர்க்கதரிசனப் பார்வையற்ற செயற்பாடுகளால் வடக்கிலும் கிழக்கிலும் வாழுகின்ற தமிழர்கள் அவர்களோடு சேர்ந்து வாழலாமா, இல்லையா? இலங்கை என்ற நாட்டுக்குள் நாங்களும் ஓர் அங்கமாக இருக்கிறோமா, இல்லையா? என்றவாறான எண்ணங்களோடுதான் வாழ்ந்து கொண்டிருக் கிறார்கள். இந்த நாடு சட்டங்களாலும் யாப்புக்களாலும் ஒன்றிணைக்கப்பட்டிருக்கிறதே தவிர, மனங்களால் இன்னும் தமிழர்களும் சிங்களவர்களும் இணைந்து வாழவில்லை என்பதை இந்த நாட்டிலே இருக்கின்ற தலைவர்கள் முதலிலே புரிந்துகொள்ளவேண்டும். அப்பொழுதுதான் இந்த நாட்டில் புரையோடிப்போயிருக்கிற அடிப்படைப் பிரச்சினைக்குத் தீர்வுகாண முடியும்.

1940களில் சிங்கப்பூர், ஜப்பான் போன்ற நாடுகளோடு ஒப்பிடுகின்றபொழுது, இலங்கையானது பொருளாதார வளர்ச்சியில் ஓர் உயர்ந்த நிலையில் இருந்தது என்றுதான் நாங்கள் எல்லோரும் சொல்கின்றோம். அவ்வாறு இருந்த இலங்கையால் கிட்டத்தட்ட 80 ஆண்டுகள் கடந்தும் பொருளாதாரத்திலே ஒரு சிங்கப்பூராக, ஒரு ஜப்பானாக, ஒரு கொரியாவாக ஏன் வளர முடியாமற்போனது? இந்த நாட்டை ஆட்சி செய்த சிங்களத் தலைவர்களுக்கு ஏனைய இனங்களை அரவணைத்துச் செல்லத் தெரியவில்லை; அவர்களால் இனச் சமத்துவத்தைப் பேண முடியவில்லை; இனங்களுக்கிடை யிலான ஒற்றுமையைக் கட்டிவளர்க்க முடியவில்லை. இவ்வாறு சிங்களத் தலைவர்கள் விட்ட தவறுகள் காரண மாகத்தான் இன்று இந்த நாட்டினுடைய பொருளாதாரம் அதலபாதாளத்துக்குள் சென்றுகொண்டிருக்கிறது. அதன் காரணமாகத்தான் இன்று நாங்கள் மத்திய வங்கியின் அறிக்கைமீது இந்தச் சபையிலே பேசிக்கொண்டிருக்கிறோம்.

இந்த நாட்டில் புரையோடிப்போயிருக்கின்ற இனப் பிரச் சினைக்கு ஒரு முற்றுப்புள்ளி வைக்கும் நோக்கில் 1987இலே இணைந்த வட - கிழக்குக்கென ஒரு மாகாண சபையை உருவாக்கி, அந்த மாகாண சபைக்கான பிரதம செயலாளர் தமிழராக இருக்கவேண்டும் என்ற அடிப்படையிலே கொண்டுவரப்பட்ட 13ஆவது திருத்தச் சட்டத்தைத் தூக்கிக் கடாசிவிட்டு, இன்று ஒரு சிங்களவரை - சிங்கள மொழி பேசுகின்றவரை - தமிழ் மொழி தெரியாத ஒருவரை வடக்கு மாகாணத்துக்கான பிரதம செயலாளராக இந்த அரசு நியமித்திருக்கிறது. இது ஓர் எதேச்சாதிகாரம்! இது ஒரு சர்வாதிகாரம்! "நான் சொல்வதைச் செய்! நான் சொன்னால் நீ கேட்க வேண்டும். நீங்கள் பேச முடியாது!" என்று மிக மமதையோடு செய்கின்ற ஒரு காரியம்! இவ்வாறானதொரு தலைமைத்துவத்தைக் கொண்டிருந்தால், இந்த நாடு உருப்படப்போவதில்லை; இந்த நாடு நீதியின் பாதையிலே செல்லப்போவதில்லை. இந்த நாடு ஒருபோதும் பொருளா தாரத்தில் வளர்ச்சியடைய முடியாமல் இன்னுமின்னும் கீழ் நோக்கிய நிலைக்குத்தான் செல்லவேண்டி வரும்.

நாங்கள் ஒரு காலத்தில் தனி நாடு கேட்டுப் போரா டினோம். ஆனால், இப்பொழுது இணைந்த வட - கிழக்கிலே சமஷ்டி அடிப்படையில் ஒரு தீர்வைக் கேட்கிறோம். இவ்வாறு தமிழ் மக்கள் போராடுகின்ற சூழலில், இந்த மண்ணிலே 60,000க்கும் மேற்பட்ட மாவீரர்கள் விதைக்கப்பட்டிருக் கிறார்கள்; 04 இலட்சத்துக்கும் மேற்பட்ட தமிழர்கள் கொல்லப்பட்டிருக்கிறார்கள்; அவர்களுடைய கோடான கோடி சொத்துக்கள் அழிக்கப்பட்டிருக்கின்றன. இவ்வளவுக்குப் பின்னரும், இந்த நாட்டின் அதியுத்தம ஜனாதிபதியோ, கௌரவ பிரதமர் அவர்களோ, அவர் சார்ந்த குடும்ப அரசியல்வாதிகளோ அல்லது சிங்களத் தலைவர்களோ இந்த நாட்டிலே தமிழர்களுடைய பிரச்சினைக்குத் தீர்வு எட்டப்பட வேண்டுமென்று சிந்தித்து, நியாயமான வழியில் செயற்படத் தவறினால், இந்த நாட்டினுடைய நிலைமை அதோ கதிதான்! இதற்குப் பல நாடுகள் உதாரணமாகும். இவ்வாறு வாழ்ந்த பல தலைவர்கள் காணாமலே போயிருக்கின்றார்கள். பல தலைவர்களை வரலாறு பேசுவதில்லை. ஆயுதம் இல்லாமல் நிராயுதபாணியாக நின்ற தமிழர்களைப் பார்த்து, "போர் என்றால் போர். சமாதானம் என்றால் சமாதானம்" என்று கோஷமிட்ட ஜே.ஆர். ஜயவர்தனவைப் பற்றி இன்றைக்கு யார் பேசுகின்றார்கள்? அவர் தொடங்கிய கட்சி, அவர் வளர்த்த கட்சி, அவர் உருவாக்கிய சட்டம், அவரால் கொண்டு வரப்பட்ட ஜனாதிபதி முறைமை இவையெல்லாம் இன்று கேள்விக்குட்படுத்தப்பட்டிருக்கின்றன. இன்றைக்கு அவருடைய கட்சியால் ஓர் ஆசனத்தைக்கூட வெல்ல முடியவில்லை. ராஜபக்ஷ குடும்பமும் இந்தப் பாடத்தைக் கற்றுக்கொள்ள வேண்டும். இந்த உலகத்திலும் சரி, இந்த நாட்டிலும் சரி, மமதையும் ஆணவமும் சர்வதிகாரமும் ஒருபோதும் நிலைத்துநிற்கப்போவதில்லை. முன்னாள் ஜனாதிபதி பிரேமதாஸ அவர்கள்கூட இதய சுத்தியோடு பேசவில்லை. அவருடைய காலத்திலும் மாகாண சபைக்குக் கொடுக்கப்பட்ட அதிகாரங்களைக் கொஞ்சம் கொஞ்சமாகப் பிடுங்கி எடுத்தாரே தவிர, தமிழர்களின் பிரச்சினைக்கான தீர்வைக் கொண்டுவரவில்லை. அவருக்கு பின்னர் வந்த ஜனாதிபதி டி.பி. விஜயதுங்க, "சிங்களவர்கள் ஒரு மரம் என்றால் தமிழர்கள் கொடிபோல படரலாமே தவிர, மரமாக இருக்க முடியாது" என்று சொன்னார். இவ்வாறு ஒவ்வொரு சிங்களத் தலைவர்களும் இனவாதம் பேசினார்கள். பௌத்த

அடிப்படைவாதத்தைச் சொன்னார்கள். சிங்கள பௌத்தத்தின் வாதத்தின் அடிப்படையிலே கோலோச்சுவதாகத்தான் அவர்களுடைய வரலாறுகள் இருந்தன.

தமிழ் பேசும் மக்கள் பெரும்பான்மையாக வாழுகின்ற வடக்கு, கிழக்கு மாகாணங்களில் நீங்கள் சிங்கள Governors ஐ நியமிக்கின்றீர்கள். ஆளுநரை நியமிப்பதாக இருந்தால் ஏன் மொழிச் சட்டத்தின்படி நியமிக்கவில்லை? இப்பொழுது வடக்கு மாகாணத்துக்கான பிரதம செயலாளரைக்கூட இவ்வாறுதான் நியமித்திருக்கின்றீர்கள். இந்த நியமனம் பெற்றவரைவிட வடக்கு மாகாணத்திலே கிட்டத்தட்ட 8 பேர் சிரேஷ்ட நிலையில் - senior level இல் இருக்கின்றார்கள். இவ்வாறிருக்க அவர்களைவிட junior level இல் இருக்கும் ஒருவரை Chief Secretary ஆக நியமனம் செய்வதென்பது எவ்வளவு மோசமான செயல்! இதனை இந்த நாட்டின் அதிகாரங்களைக் கொண்டவர்கள் தயவுசெய்து புரிந்து கொள்ளுங்கள்! இந்த நாட்டிலே புரையோடிப்போயிருக்கின்ற இனப் பிரச்சினைக்குத் தீர்வு காணுங்கள்! அவ்வாறு தீர்வு காணப்பட்டால் பசளைப் பிரச்சனையல்ல, இந்த நாட்டின் நிதிப் பிரச்சினையல்ல, இந்த நாட்டிலே வாழுகின்ற மக்களுடைய அனைத்துப் பொருளாதாரப் பிரச்சினைகளையும் மிக இலகுவாகத் தீர்க்க முடியும். இந்த நாடும் வளரும். இனங்களை மதியுங்கள்! தமிழர்களுடைய தனித்துவத்தை, கலாசாரத்தை, பண்பாட்டை, மொழி அடையாளத்தை மதியுங்கள்! அவர்களுடைய வரலாற்று ரீதியான நில அடையாளத்தை மதித்து, அவர்களையும் இந்த மண்ணின் ஒரு தேசிய இனமாக அங்கீகரிக்கின்ற எண்ணம் எப்பொழுது சிங்களத் தலைவர்களுடைய மனங்களிலும் சிங்கள மக்களுடைய மனங்களிலும் வருகின்றதோ அன்றுதான் இந்த நாட்டுக்கான விடிவும் நிம்மதியும் கிடைக்கும் என்பதைத் தயவுசெய்து புரிந்துகொள்ளுங்கள்! அதன் அடிப்படையில் நடக்க முயலுங்கள்! என்று கூறி, நிறைவுசெய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 21ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.09]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - வர்த்தக அமைச்சர்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Trade)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා මහ බැංකුවේ 2020 වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳ විවාදය අවසන් කරමින් ලංකා ආණ්ඩුව වෙනුවෙන් වචන කිහිපයක් එකතු කරන්න ලැබීම ගැන මම බෙහෙවින් සතුටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් නීති පනතේ රෙගුලාසි අනුව රටක ආර්ථිකයේ නිමැවුම, ආදායම, සේවා නියුක්තිය, මිල මට්ටම, ගෙවුම් ශේෂය, ඉතුරුම්, ආයෝජනය යනාදී සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පිළිබඳ තාක්ෂණික හා ආර්ථික විද්‍යාත්මක පදනමක් යටතේ සෑම වර්ෂයකදීම ඉදිරිපත් කළ යුතු වාර්තාව තමයි, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාව. ආණ්ඩුව කවුරු කළත් මුදල් නීති පනතට අනුව ඉදිරිපත් වන මේ වාර්තාවෙන් රටේ යථාර්ථවාදී ස්වරූපය පිළිබඳ විද්‍යාත්මක පදනමක් යටතේ කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඒ අතින් මේ වාර්තාවේ සුවිශේෂතාවක් තිබෙනවා. ලංකා ඉතිහාසයේ නිදහසින් පසුව තමයි අප වැඩිදෙනෙක් ඉපදී තිබෙන්නේ. අපගේ සංසාර ගමන තුළ මේ දක්වා මෙවැනි වාර්තා දෙකයි ඉදිරිපත් වී තිබෙන්නේ. එකක්, ශ්‍රී ලංකා මහ බැංකුවේ 2001 වාර්ෂික වාර්තාව. ඒ වාර්තාව ඉදිරිපත් වුණු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ ආණ්ඩුව සමයේ ආර්ථිකය සෘණ 1.5ක වාර්තාවක් තබා තිබුණා. අනෙක් වාර්තාව තමයි, මහ බැංකුවේ 2020 වර්ෂයේ වාර්තාව. මෙම වාර්තාව අනුව සාර්ව ආර්ථිකයේ සමස්ත ප්‍රතිඵලය තමයි, ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට ආර්ථික වර්ධන වේගය සෘණ 3.6ක් වී තිබීම. ඒ සම්බන්ධයෙන් කාටවත් විවේචනය කරන්න දෙයක් නැහැ. මුළු රටක් සම්පූර්ණයෙන් විනාශ වීම පිළිබඳ කතන්දරය තමයි ඒ ඉලක්කම්වල තිබෙන්නේ. පොඩි ප්‍රශ්නයකට තිබෙන්නේ, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුකරණයේ ප්‍රශ්නයක් නිසා මේ රට මේ විදියට වැටිලා තිබෙනවා කියා විපක්ෂය සිතන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක ඉතිහාසයේ කවදාවත් මෙවැනි දැවැන්ත වසංගතයක් පැවැති නැති බව අපි දන්නවා. මේ වසංගතය තුළ මනුෂ්‍ය ජීවිත ලක්ෂ 42ක් ලෝකයට අහිමි වෙලා තිබෙනවා. මුළු ලෝකයේම වරායවල් -නැව් තොට- ගුවන් තොටුපොළවල් වසා දමා තිබෙනවා; විවිධ ආකාරයෙන් සංචරණ සීමා පනවා තිබෙනවා; factories දස දහස් ගණනින් වැහිලා තිබෙනවා; කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත ජනතාවකට රැකියා, ආදායම් මාර්ග අහිමි වෙලා තිබෙනවා; බඩගින්න, මන්ද පෝෂණය වැඩි වෙලා තිබෙනවා. ලෝක දුප්පත්කම විශාල ලෙස වැඩි කරපු මහා ව්‍යසන කාලයක තමයි අප මේ පසු වන්නේ.

පුරාණයේ ආර්ථික විද්‍යාඥයෙක් සිටියා, "මෝල්තස්" කියලා. ඔහු, ආචීර්ණ කල්පික ආර්ථික විද්‍යාඥයෙක්. ඔහුගේ න්‍යායක් තිබුණා, 'මෝල්තස්ගේ න්‍යාය' කියලා. මෝල්තස් කිව්වා, රටක ආහාර නිෂ්පාදනය වැඩි වෙන්නේ සමාන්තර ශ්‍රේණියක ආකාරයට කියලා. එනම්, 2, 4, 6, 8 යනාදි වශයෙන් සමාන්තරව. ලෝක ජනගහනය වැඩි වන්නේ ගුණෝත්තර ශ්‍රේණියක ආකාරයට බව ඔහු කිව්වා. එනම්, 2, 4, 16 යනාදි වශයෙන්. මෙසේ ආහාර නිෂ්පාදනය සමාන්තරව වැඩි වන කොට, ගුණෝත්තර ශ්‍රේණියක ආකාරයට ජනගහනය වැඩි වන කොට, ඒ වැඩි වන ජනගහනය වසංගත, දුර්භික්ෂ, නායයාම් වැනි ස්වාභාවික උවදුරුවලින් සහ යුද්ධ වැනි වෙනත් දේ කරණකොටගෙන ස්වභාව ධර්මයා විසින් පාලනය කොට ජනගහනය තුලනය කරන බව මේ න්‍යායෙන් කියනවා. මේ න්‍යාය පිළිබඳව ආර්ථික විද්‍යාඥයන් අතර විශාල විවේචනයක් තිබුණා, එහෙම වෙන්නේ නැහැ කියලා. නමුත් මේ යන ක්‍රමය අනුව මට දැන් හිතෙනවා මෝල්තස් කියපු දේවල් ඇත්ත වේගෙන එනවා කියලා. මේ මුළු ලෝකයේ මහා බලවත්, ධනවත් රටවල් සියල්ලට 2020 වර්ෂයේදී මේ කොවිඩ්-19 වසංගතයෙන් බේරෙන්න බැරි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ ප්‍රධානම ආර්ථිකය හිමි ඇමෙරිකා එක්සත් ජනපදයේ 2020 වර්ෂයේ ආර්ථික වර්ධන වේගය සියයට සෘණ 3.5යි; ජර්මනියේ එය සියයට සෘණ 4.8යි; ප්‍රංශයේ සියයට සෘණ 8.0යි; ඉතාලියේ සියයට සෘණ 8.9යි; Spainවල සියයට සෘණ 10.8යි; ඉන්දියාවේ සියයට සෘණ 8.0යි; දකුණු අප්‍රිකාවේ සියයට සෘණ 7.0යි; ජපානයේ සියයට සෘණ 4.8යි; එක්සත් රාජධානියේ සියයට සෘණ 9.9යි; පිලිපීනයේ සියයට සෘණ 9.8යි; මාලදිවයිනේ සියයට සෘණ 32.2යි. චීනයේ හැර ලෝකයේ ලොකු, කුඩා සියලු රටවල ආර්ථික වර්ධන වේගය හැටියට තිබෙන්නේ මේ වාර්තාවේ තිබෙන සංඛ්‍යා දත්තම තමයි. චීනය විතරක් සියයට ධන 2.3ක ආර්ථික වර්ධන වේගයක් වාර්තා

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

කර තිබෙනවා. මේ වසංගත තත්ත්වය නිසා ලෝකයේ අනෙක් සියලු රටවල් ආර්ථික වශයෙන් කඩා වැටුණා. ලෝකයේ රටවල් අද අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ජනගහනයෙන් කිසිවෙකුත් එන්නත්කරණයට ලක් කරන්න බැරි වුණු රටවල් ලෝකයේ තිබෙනවා. නමුත්, අපේ අතිගරු ජනාධිපතිතුමාට මේ රටේ කෘතවේදී ජනතාව කෘතඥ විය යුතුයි. එතුමා මේ මනුෂ්‍ය ජීවිත බේරා ගැනීම සඳහා වන ව්‍යායාමයේදී දිනපතා වෙනම විශේෂිත ප්‍රයත්නයක් දරමින් කටයුතු කරනවා. දිළිඳු රටක් වුවත්, රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් විවිධ සම්බන්ධතා පවත්වා ගනිමින්, රාජ්‍ය නායකයන්ට සෘජුව කථා කරමින් මේ වන විට වැඩිම එන්නත් ප්‍රමාණයක් ලබා දීපු රටක් බවට ලංකාව ලෝක සෞඛ්‍ය සංවිධානයේ පැසසුමට ලක් වෙලා තිබෙනවා. ලංකාව පසු ගිය සතිය වන විට කොවිඩ් සඳහා වන පළමු එන්නත් මාත්‍රාව ජනගහනයෙන් මිලියන 8.2කට ලබා දී තිබෙනවා. ඒ අනුව ලංකාවේ ජනගහනයෙන් අවුරුදු 30ට වැඩි සියයට 72ක පිරිසක් මේ පළමු එන්නත ලබාගෙන තිබෙනවා. දෙවන එන්නත් මාත්‍රාව ලබාගෙන තිබෙනවා, මිලියන 1.8ක්. ඒ කියන්නේ, අවුරුදු 30ට වැඩි ජනගහනයෙන් සියයට 18ක් දෙවැනි එන්නතත ලබාගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ්-19 වසංගතය කරණකොටගෙන ලෝකයේ සිදු වන මරණ සංඛ්‍යාව අනුපාත වශයෙන් ගෙන සංසන්දනය කරන්න පුළුවන්. බ්‍රසීලයේ මරණ ප්‍රමාණය සියයට 7.9යි; රුසියාවේ සියයට 2.51යි; ප්‍රංශයේ සියයට 1.86යි; ඇමෙරිකා එක්සත් ජනපදයේ සියයට 1.78යි. ශ්‍රී ලංකාවේ කොවිඩ් මරණ සංඛ්‍යාව සියයට 1.39ක් වැනි පහළ අගයක පවත්වාගෙන යන්න පුළුවන්කම ලැබී තිබෙනවා.

අපි ඊළඟට ජනගහනයෙන් එන්නත්කරණයට ලක් වූ ප්‍රතිශත ගෙන බලමු. එහිදී ශ්‍රී ලංකාව තමයි ලෝක සටහනේ ඉහළින්ම ඉන්නේ. ලංකාව ජනගහනයෙන් සියයට 30.5කට එන්නත්කරණය සිදු කර තිබෙනවා. මෙවැනි දරුණු ව්‍යසනයක් යටතේ මේ රටේ දැවැන්ත විදේශ විනිමය අර්බුදයක් හා රාජ්‍ය මූල්‍ය අර්බුදයක් පැවැතියදීත් -ආර්ථිකමය වශයෙන් මෙවැනි දරුණු කඩා වැටීමක් තිබෙන අවස්ථාවකදීත්- ඒ සියල්ලට වඩා රටේ ජනතාවගේ ජීවිත උතුම් කියන පරමාර්ථය ඇතිව සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ආදි සියලු ජන කොටස්වලට ජාති, ආගම්, කුල භේදවලින් තොරව සාධාරණ ලෙස සලකමින්, ඔවුන්ගේ ජීවිත ගලවා ගැනීම සඳහා ආණ්ඩුව දරා තිබෙන ප්‍රයත්නය අප අගය කළ යුතු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථිකයේ මේ කඩා වැටීමට කොවිඩ් - 19 ප්‍රධානතම හේතුව වුණත්, පසුගිය යහ පාලන රජය කාලපරිච්ඡේදය තුළ ඇති වෙලා තිබුණු දැවැන්ත දේශපාලන අර්බුදය මීට බලපා තිබෙන බව අපි කනගාටුවෙන් වුණත් කිවයුතු වෙනවා. ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයා අතර තිබූ ද්වි සට්ටනය නිසා කැබිනට් මණ්ඩලය හා අනෙකුත් ක්‍රියාකාරින් අතර ප්‍රතිපත්තියක්, වැඩ පිළිවෙළක් දර්ශනයක් අනුව එකට ගමන් කළ නොහැකි තත්ත්වයක් ඇති කළා. "යා දෙක නොරත රත, එකට පැහීමක් නැත" යන්න කරණකොටගෙන ඉතිහාසයේ යහ පාලන රජය දිගින් දිගටම වාර්තා තබමින් සෑම වර්ෂයකදීම ඉකුත් වර්ෂයට වඩා වැඩියෙන් ආර්ථිකය පහළට ගෙන ගියා. 2015ට වඩා 2016, 2016ට වඩා 2017, 2017ට වඩා 2018, 2018ට වඩා 2019 වශයෙන් අඛණ්ඩව ලංකා ඉතිහාසයේ ආර්ථික වර්ධනය දිගටම පහත වැටුණු එකම ආණ්ඩුව බවට යහ පාලන රජය වාර්තාවක් තැබුවා. ඒ නිසා ප්‍රමාණවත් ලෙස ආර්ථිකය වැඩුණේ නැහැ. මහින්ද රාජපක්ෂ යුගය, සංවර්ධනයේ වඩාත්ම ස්වර්ණමය යුගය බවට පත් කරලා රට භාර දුන්නා. ඊට කලින්, ඉතිහාසය පුරාම නිදහස ලැබුණු දවසේ ඉඳන් ආර්ථිකයේ ප්‍රමාණය - the size of economy - ගත්තොත්, ඇමෙරිකානු ඩොලර් මිලියන 20ට වඩා අඩුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ 2000 වර්ෂයේදී සමස්ත නිෂ්පාදනයේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 16.6යි. මහින්ද රාජපක්ෂ යුගය ආරම්භ වීමෙන් පසු පළමු වතාවට 2010දී රටේ ආර්ථිකයේ ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් 56.7ට වැඩි වුණා. ඒ නිසා තමයි අඩු ආදායම් ලබමින් සිටි ලංකාව මැදි ආදායම් ලබන රටක් බවට පරිවර්තනය වුණේ. ඊට පසු 2014දී 79.4යි. ඒ කියන්නේ ඇමෙරිකානු ඩොලර් 80යි. ඇමෙරිකානු ඩොලර් 20කට තිබුණු ජාතික නිෂ්පාදනය ඇමෙරිකානු ඩොලර් 80 දක්වා වැඩි කරලා රට මහා පිම්මක් පන්නපු ලංකාවේ එකම රාජ්‍ය නායකයා මහින්ද රාජපක්ෂ මැතිතුමාය කියන එක අපි කෘතවේදීව සටහන් කළ යුතු වෙනවා. නමුත් තමුන්නාන්සේලා අවුරුදු හතරක් පහක් මේ රට ආණ්ඩු කළාට පස්සේ, 2019 වර්ෂයේදී ආර්ථිකයේ ප්‍රමාණය 84.3යි. දැන් 80යි. ඒ නිසා ආර්ථිකය තිබුණු තැනම ලැග සිටින තත්ත්වයක් තමයි නිර්මාණය වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1950 දී අපේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 140යි. 2004 දී තමයි පළමු වතාවට ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 1,000 ඉක්ම වූයේ. ලංකාවේ එක පුද්ගලයෙක් ලබන ආදායම ඩොලර් 1,000 මට්ටමට ගේන්න ගතවෙලා තිබෙන කාලය අවුරුදු 56ක්. අවුරුදු 56ක් තුළ ආණ්ඩු ඇති වෙලා තිබෙනවා; නැති වෙලා තිබෙනවා; මාරු වෙලා තිබෙනවා; මේ සභාවල විවිධ දේ කථා කරලා තිබෙනවා. නමුත් රට ඉස්සරහට ගියේ නැහැ. ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 1,000 පන්නන්න අපට අවුරුදු 56ක් ගත වුණා. නමුත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රට කඩන්නේ නැතුව, බෙදන්නේ නැතුව, සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සැමට බියෙන් හා සැකයෙන් තොරව කැමැති තැනක ජීවත් වෙන්න හා ජීවනෝපාය සලසා ගන්න පුළුවන් රටක් හදලා, මේ රට වැඩබිමක් බවට පත් කළා. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2014දී ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 3,853ක් වුණා. අවුරුදු 10ක් තුළදී ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 2,790කින් වැඩිවෙලා තිබෙනවා. නමුත් 2019දී කීයද? අපි රට භාරදෙනකොට ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 3,853යි. අපි ආපසු රට භාර ගන්නකොට එය ඇමෙරිකානු ඩොලර් 3,852යි. එක පුද්ගලයෙකුගේ ආදායම ඩොලරයකින් අඩු කරලා දීලා තිබෙනවා. ඇමෙරිකානු ඩොලර් 2,790කින් ඒක පුද්ගල ආදායම වැඩි කර දීපු මහින්ද රාජපක්ෂ යුගය වෙනුවට, තමුන්නාන්සේලා ඒකෙනුත් එක ඩොලරයක් අඩු කරලා දීලා කඩා වට්ටපු රටක් තමයි අපට ලබා දුන්නේ. ඒ අනුව සියයට 7.4ක ආර්ථික වර්ධන වේගයක් තිබුණු රටක් 2019 වෙනකොට සියයට 2.3ට අඩු වෙලා තිබෙන තත්ත්වයක් තුළ තමයි කොවිඩ් - 19 වසංගතය හරහා අපේ රටේ ආර්ථික වර්ධන වේගය මේ ප්‍රමාණයට අඩු වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි මුහුණ දෙන ප්‍රධාන ගැටලුව රාජ්‍ය මූල්‍යය පිළිබඳ තිබෙන දැවැන්ත අර්බුදයයි. නිදහසින් පසුව සෑම වර්ෂයකදීම, විශේෂයෙන්ම 1977න් පසුව හැම දාම අපි එදිනෙදා රජය පවත්වාගෙන යෑමේ වියදම් වැඩි කළා. ඒ වියදම තුළ වංචාවක්, දූෂණයක්, අක්‍රමිකතාවක් නැහැ. පුනරාවර්තන වියදම වූ කලී රජයක් එදිනෙදා පවත්වාගෙන යෑමේ කටයුතුවල දී දරනු ලබන වියදමයි. දරන වියදමේ ප්‍රතිඵලය වියදම දරන කාලයට පමණක් සීමා වනවා. ඒවා නැවත නැවතත් දැරිය යුතු ස්වරූපයේ වියදම්. එහි ප්‍රධාන වියදම තමයි වැටුප්. වැටුප් වාගේම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප. ඊළඟට රාජ්‍ය ණය සඳහා පොලී ගෙවන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුබසාධන වියදම් වන කුටුම්භ සහ අනෙකුත් සහනාධාර ගෙවන්න ඕනෑ. මේ නිසා සෑම වර්ෂයකදීම මේ පාර්ලිමේන්තුවට ගෙනෙන අය වැය ලේඛනවල වර්තන ගිණුමේ,

නැත්නම් ජංගම ගිණුමේ තිබෙන්නේ හිඟයක්. එදිනෙදා පවත්වා ගෙන යෑමට ප්‍රමාණවත් ආදායමක් කිසිම ආණ්ඩුවකට හොයා ගන්න බැහැ. විපක්ෂයේ සිටින මේ ගරු මන්ත්‍රීතුමන්ලා කැමති වුණත්, අකමැති වුණත් මේ යථාර්ථය පිළිගත යුතු වෙනවා. උදාහරණයක් වශයෙන් 1988දී ලංකාවේ වර්තන ගිණුමේ හිඟය රුපියල් මිලියන 4,383යි. 2015දී එය දෙලක්ෂ 46,779යි. සියයට 5,730කින් වර්තන ගිණුමේ හිඟය වැඩි වෙලා තිබෙනවා, එදිනෙදා පවත්වාගෙන යෑමේ වියදම් ලෙස. එතකොට 2020 වර්ෂයේ දී විශ්‍රාම වැටුප් නැතිව, වැටුප්වලට විතරක් වියදම රුපියල් බිලියන 794යි. [බාධා කිරීමක්] යෝජනා කරපු ඒවායේ නැහැ. මේ ටික අහගන්න. පොලිය 980යි. වර්තන සංක්‍රාම පැවරුම් 717යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ වියදම් තුන විතරක් 2,491යි. මේ මහ බැංකු වාර්තාවට අනුව ආදායම ලැබිලා තිබෙන්නේ බදුවලින් 1,216යි. එ් ලැබෙන 1,216ක බදු ආදායමින් 2,491ක් වියදම් කරන්නේ කොහොමද? ඒ, මදිවෙලා තිබෙන 1,275 ගැන, මේ තත්ත්වයෙන් මිදීම ගැන දැන් විපක්ෂයට තිබෙන යෝජනාව මොකක්ද? උදාහරණයක් වශයෙන්, 2014දී අපි වැටුප් හා විශ්‍රාම වැටුප් ගෙව්වාට පස්සේ රජයේ ආදායම රුපියල් බිලියන 1,216යි. 2020දී වැටුප් හා විශ්‍රාම වැටුප් රුපියල් බිලියන 1,052යි. බදු මඟින් උපදවන ආදායමින් සියයට 86ක් වැටුප් හා වේතනවලට ගෙවනවා.

දැන් තමුන්නාන්සේලා විවිධ පාර්ශ්ව එක්ක පාරට බැහැලා පුවරු අල්ලනවා, "දියව්, දියව් වැටුප් දියව්. දියව්, දියව් පොහොර දියව්. දියව් දියව් තව සහන දියව්" කියලා. ඕනෑ එකක් ආණ්ඩුවකට දෙන්න පුළුවන්. හැබැයි, ඒ දෙන දේ ආපසු ඒ ජනයාගෙන්ම ලබා ගැනීම හැර, ඒ සඳහා වෙනත් විකල්ප ක්‍රමයක් ලෝකයේ කොහේවත් රටක නැහැ. අපිට දෙන්න කියනවා වාගේම, අනෙක් පැත්තෙන් රජයට බල කරනවා ඒ මුදල ජනතාවගෙන් ගන්න කියලා. හූරලා, බදු පනවලා, දරා ගන්න බැරි කරලා ඒ මුදල් ටික ගන්න කියලායි කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් වශයෙන් කියනවා නම් මුළු රටේම බදු පනවලා, මහින්ද රාජපක්ෂ ආණ්ඩුව අවසන් වන විට බදු ආදායම තිබුණේ 1,050යි. 2019දී මේ ගොල්ලන් බලයෙන් ඉවත්වෙලා යනකොට බදු ආදායම තිබුණේ 1,734යි. ඒ කියන්නේ සියයට 153කින් බදු බර වැඩි කළා. විපක්ෂයේ සිටියදී අපි ඒකට කිව්වා, 'බදු දඩයමක්' කියලා. ඒ කියන්නේ දරා ගන්න බැරි බදු ප්‍රමාණයක් පැනෙව්වා. මේ දරා ගන්න බැරි බදු පදනම යටතේ බදු ගෙවා ගන්න බැරිව ජනතාව පාරට එනකොට, බදු ගෙවා ගන්න බැරිව සමහර මිනිස්සු සියදිවි නසා ගන්නකොට, බදු ගෙවා ගන්න බැරිව ව්‍යාපාර බංකොළොත් වෙනකොට, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ආපු ගමන් කළ හදිසි කාර්යය වුණේ, මේ බදු දඩයමින් ජනතාව මුදා ගත්ත එක. ඒ අනුව VAT එක සියයට 15 ඉඳන් සියයට 8 දක්වා අඩු කළා.

අපේ කාලය තුළදී බදු ආදායම බිලියන 518කින් අඩු වෙලා තිබෙනවා. සියයට 30ක්. එම නිසා මේ කාල පරිච්ඡේදය තුළදී අසාමාන්‍ය ණය බරක් ඇති කරගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2007 - 2014 මුළු කාල පරිච්ඡේදය තුළදීම සංවර්ධන බැඳුම්කරවලින් මහින්ද රාජපක්ෂ යුගයේදී ලබා ගෙන තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 5.5යි. අන්තිම අවුරුදු දෙකේ විතරක් සංවර්ධන බැඳුම්කරවලින් මේ ආණ්ඩුව ලබා ගෙන තිබෙනවා, ඩොලර් බිලියන 6.9ක්. ස්වෛරීත්ව බැඳුම්කරවලින් පමණක් ගත් ණය වශයෙන් 2030 වෙනකම් අපට ඇමෙරිකානු ඩොලර් බිලියන 13ක් ගෙවන්න තිබෙනවා. මේක දැවැන්ත අර්බුදයක්. එමනිසා විදේශ විනිමය රටට දැවැන්ත අර්බුදයක් බවට පත්වෙලා තිබෙනවා. ණය වාරික ගෙවන්න, අත්‍යවශ්‍ය ඛනිජ තෙල්, රසායනික ද්‍රව්‍ය, අනෙක් යෙදවුම් ගෙනෙන්න නම්, මේ විදේශ විනිමය අර්බුදයත්, රාජ්‍ය මූල්‍ය අර්බුදයත් තුළ අපි කාටත් යම්කිසි ප්‍රමාණයක කැප කිරීමක් කරන්න සිදු වෙනවා.

අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කියලා තිබෙනවා මම දැක්කා, ලෝකයේ වෙනත් රටවලුත් මේ වාගේ තත්ත්වයකදී වැටුප් වැඩි කිරීම නොවෙයි කළේ, වැටුප්වලින් කොටසක් පමණක් ගෙවීමයි කළේ කියලා. අදත් ලංකාවේ පෞද්ගලික අංශයේ ආයතන විසින් බොහෝ දෙනෙකුගේ රැකියා අවස්ථාව නැති කළේ නැහැ. අපි ඒ හාම්පුතුන්ට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. කොවිඩ් - 19 වසංගතය යටතේ ආයතනය වහලා තියෙද්දී රුපියල් 14,500යි මාසයකට දෙන්නේ. මේ රටේ ස්වයං රැකියාවල නියුතු අයගේ මුළු ආදායමම නැති වුණා. පෞද්ගලික අංශයේ සමහර අයගේ වැටුපෙන් භාගයයි ලැබෙන්නේ. නැතිනම්, රුපියල් 14,500යි ලැබෙන්නේ. එමනිසා අඩු ගණනේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ - අපි සියලුදෙනාගේ - වැටුපෙනුත් කොටසක් මේ කොවිඩ් - 19 වසංගතයෙන් බේරෙන්න පරිත්‍යාග කරන්නට අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා උදව් කරයි කියන විශ්වාසය ඇතිව මගේ වචන කීපය අවසන් කරනවා.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 අගෝස්තු 04 වන බදාදා පූ.භා. 10.00වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2021 ஓகஸ்ட் 04, புதன்கிழமை மு.ப.10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 10.00 a.m. on Wednesday, 04th August, 2021.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා කොළඹ 5 කිරුළපන මාවතේ
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත කළ හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை கொழும்பு 5, கிருலப்பனை மாவத்தையிலுள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
Kirulapone Avenue, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.